




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2565ක් වූ පොසොන් පුර තුදුස්වක තිථිය ලත් බුධ දින | කාණ්ඩය 112 | පත්‍රය 160 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත්පතකි | 2021 ජූනි 23 බදාදා




සාර භූමියේ හරිතාගාරය

අද පත්‍රය සමඟ

# යහපාලන රජය සමයේදී හොඳ වී සත්ත්ව ආහාරවලට දී කෝටි 248ක අලාභයක්

ස්වර්ණා විජේකෝන්, පහන් විජේසේකර

යහපාලන රජය සමයේදී පරිභෝජනය සඳහා සුදුසු වී, සත්ත්ව ආහාර ලෙස අඩු මිලට විකිණීම හේතුවෙන් රුපියල් බිලියන 2.48ක අලාභයක් සිදුව ඇතැයි කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (22) ප්‍රකාශ කළේය. පිට 6



# ලන්ච් ශීට් තහනම්



බුද්ධිකා ඉඹුලාන

ශ්‍රී ලංකාවේ විශාල පාරිසරික හානියකට හේතු වී තිබෙන සියලුම වර්ගවල ලන්ච් ශීට්( lunch sheet)තහනම් කිරීමට වහාම පියවර ගන්නැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් දී ඇත. පිට 6

# රේගු දඩ ආදායම කෝටි 6300ක් රජයට අහිමි වෙලා

සුභාෂිණී සේනානායක සහ භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

භාණ්ඩ නීති විරෝධී ලෙස ආනයන අපනයන කිරීමේදී රේගුව අත්අඩංගුවට ගෙන නියම කළ දඩ නොගෙවා අධිකරණයේ නඩු පැවරීම නිසා රජයට රුපියල් කෝටි 6300ක ආදායමක් අහිමිවී ඇත. පිට 6

# ගෘහස්ථ ගෑස් මිලේ වෙනසක් නෑ



නුවන් කොඩිකාර

ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල නොවෙනස්ව පවත්වාගෙන යා යුතු බවට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කළ බව ජනමාධ්‍ය ඇමැති, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා ඊයේ (22) පැවසීය.

ඒ අනුව ගෑස් සමාගම් නියෝජිතයන්, අදාළ රාජ්‍ය ආයතනවල හා බැංකු නියෝජිතයන්, කෙෂ්ත්‍ර විද්වතුන් සමඟ සාකච්ඡා කර ඇමැති මණ්ඩල අනුකාරක සභාව නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබෙන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් ඇමැතිවරයා කීවේය. පිට 6

# සම්බා මෙට්‍රික් ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට පියවර

ඇමැති ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල පිට 9

# සහන දෙන්න බැරි නම් ඉල්ලා අස් වෙන්න

සජිත් ප්‍රේමදාස පිට 6



# තැපැල ආදායම් වාර්තාවක් තබයි

නුවන් කොඩිකාර

ඉතිහාසයේ ප්‍රථම වතාවට ගත වූ පැය 48ක කාලය තුළ තැපැල් දෙපාර්තමේන්තුව වැඩිම ආදායම් ලැබීමට සමත්ව තිබෙන බව කැබිනට් ප්‍රකාශක, ජනමාධ්‍ය ඇමැති, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පැවසීය.

මෙම අසීරු කාලය තුළ නිහඬ සේවයක් කරන ආයතනයක් ලෙස තැපැල් දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය. පිට 6

# ලේක්හවුස්-මිහින්තලා ආලෝක පූජාව අද අගමැති ප්‍රධානත්වයෙන්

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

පනස් නවවන(59)වරටත් ඓතිහාසික මිහින්තලා රජමහා විහාරස්ථානය කේන්ද්‍රකර ගනිමින් පවත්වන මිහින්තලා -ලේක්හවුස් ආලෝක පූජා පුන්‍ය උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අද (23) ආරම්භවේ. පිට 6

# රනිල්ට විපක්ෂයේ ඉදිරි පෙළ අසුනක්



පිට 6

# ඉන්ධන මිල ඉහළ දැමීමට දෙජාස විරෝධය



පිට 6

# 21දා කොවිඩ් මරණ 71යි

## 209,296ක් පූර්ණ සුවය ලබති

භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

සංචරණ සීමා ඉවත් කළ පළමු දිනය වන පෙරේදා (21දා) වාර්තා වූ දෛනික කොවිඩ් ආසාදිත මරණ ගණන 71ක් බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා තහවුරු කළේය.

මේ අනුව මෙරට කොවිඩ්-19 වසංගතය ආරම්භ වූ දිනයේ සිට මේ දක්වා වාර්තා වූ සමස්ත කොවිඩ් ආසාදිත මරණ ගණන 2704ක් දක්වා ඉහළ ගොස් ඇති බව සෞඛ්‍ය අංශ දත්ත වාර්තාවල සඳහන් වෙයි. පිට 6

# කොවිඩ් කෙටුම්පත ගැන අධිකරණයට ඉදිරිපත් කළ පෙත්සමේ පිටපතක් ලැබුණා



ස්වර්ණා, පහන්

කොවිඩ්-19 තාවකාලික විධිවිධාන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති පෙත්සමක පිටපතක් තමන් වෙත ලැබී ඇතැයි කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවට ඊයේ (22) දැනුම් දුන්නේය. පිට 6

# ගම්මන්පිලට එරෙහි විශ්වාසභංගය බාර දෙයි

ස්වර්ණා විජේකෝන්, පහන් විජේසේකර

ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මහතාට එරෙහිව සමගි ජනබලවේගය ඉදිරිපත් කළ විශ්වාසභංග යෝජනාව ඊයේ (22) පෙරවරුවෙහි කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා වෙත බාර දී ඇත. පිට 6

# රියැදුරු බලපත්‍ර මුද්‍රණය හමුදාවට පැවරීමෙන් මසකට කෝටි 10ක් ඉතිරියි

පිට 9

# අද රෑ 10 සිට 25 තෙක් සංචරණ සීමා

රුවන්ත, භක්ති

කොවිඩ්-19 ව්‍යාප්තිය තවදුරටත් පාලනය කර ජන ජීවිතය යථාවත් කිරීමේ අරමුණින් අද (23දා) රාත්‍රී 10.00 සිට 25දා අලුයම 4.00 දක්වා දිවයින පුරා සංචරණ සීමා පැනවීමට පියවර ගන්නා බව කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය. පිට 6

# පාසල් 10,000කට 4G ආවරණය

## රජය තීරණය කරයි

නුවන් කොඩිකාර

පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට සන්නිවේදන පහසුකම් සැපයීමේ අරමුණින් මෙරට පාසල් 10,000කට ඉදිරි වසර දෙක ඇතුළත දී 4G ආවරණය ලබා දීමට රජය තීරණය කර තිබේ.

ඒ අනුව ඊට අදාළ ඇමැති මණ්ඩල සංදේශය මේ වන විටත් කෙටුම්පත් කර ඇතැයි තරුණ හා ක්‍රීඩා ඇමැති සහ ඩිජිටල් හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවසීය. පිට 6



# ඔක්සිජන් සිලින්ඩර් 125ක්-පාලක යන්ත්‍ර 10ක්
# කටාර් රාජ්‍යයෙන් මෙරටට පරිත්‍යාග කෙරේ

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් වසංගතට එරෙහිව ශ්‍රී ලංකාව ගෙන යන වැඩපිළිවෙළට සහාය දෙමින් ඔක්සිජන් සිලින්ඩර් 125ක් සහ ඔක්සිජන් පාලක යන්ත්‍ර 10ක් පරිත්‍යාග කිරීමට කටාර් රාජ්‍ය පියවර ගෙන තිබේ.

කොවිඩ් වසංගත තත්ත්වය තුරන් කිරීමට සෞඛ්‍ය අංශයේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් දෝහා හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයෙන් මේ උපකරණ කට්ටලය ශ්‍රී ලංකා රජය වෙත ගුවනින් එවා තිබෙන බව කටාර් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.




රටේ පවතින අර්බුදකාරී තත්ත්වය සලකා බලමින්, ශ්‍රී ලංකා තානාපති එම්. මෆාස් මොහිදීන් මහතාගේ ඉල්ලීම මත, එහි වාසය කරන ශ්‍රී ලාංකික ප්‍රජාව, සුබ පතන්නන් සහ දෝහා හි Watad Group Enterprises විසින් මේ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කර තිබේ. ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශයට ඔක්සිජන් සිලින්ඩර් සහ ඔක්සිජන් පාලක යන්ත්‍ර සහිත බහාලුම දුන් බව ද වසංගත තත්ත්වය තුළ හදිසි වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමට රජයේ රෝහල් අතර බෙදා හැරීමට අපේක්ෂා කරන බව ද එම අමාත්‍යාංශය කියයි.

තානාපති කාර්යාලයෙන් දැනටමත් ඔක්සිජන් සිලින්ඩර් 275ක්, නාඩි පරීක්ෂා කිරීමේ යන්ත්‍ර (Pulse Oximeters) 22ක් සහ ඔක්සිජන් පාලක යන්ත්‍ර 10ක් ශ්‍රී ලංකා සෞඛ්‍ය අංශයට දී ඇති අතර, එම කර්තව්‍ය ඉදිරියට ගෙන යෑමට අදහස් කරයි.

තානාපතිවරයාගේ ඉල්ලීම මත මේ භාණ්ඩ තොගය නොමිලේ ගුවනින් ප්‍රවාහනය කිරීමට තානාපති කාර්යාලය ශ්‍රී ලංකන් ගුවන් සේවය වෙත සිය ප්‍රණාමය පුද කරයි.

දෝහා හි ජීවත්වන ශ්‍රී ලාංකික ප්‍රජාව, අනුබද්ධිත ආයතන හා සුබ පතන්නන් විසින් දුන් අමිල සහාය මෙන්ම මේ කර්තව්‍ය වෙනුවෙන් දුන් දායකත්වයට ශ්‍රී ලංකා තානාපති කාර්යාලය ඔවුන් වෙත සිය හෘදයාංගම ප්‍රණාමය පිරිනමයි.

# පීඩාවට පත් වූවන්ට වියළි ආහාර



**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් හේතුවෙන් පීඩාවට පත්ව සිටින පවුල් 250කට වියළි ආහාර බෙදා දීම ගම්පහ, ජාත්‍යන්තර සාම මහා විහාරස්ථානයේ දී පැවැත්විණි.

සිංගප්පූරුවේ වැඩ වාසය කරන නාකුළුගමුවේ සුමන හිමිගේ සහ සරණ බෞද්ධ පදනමේ සභාපති සුනිල් විජේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන්, ගම්පහ ජාත්‍යන්තර සාම විහාරාධිපති ගෝනමැරියාවේ නන්දසිරි හිමියන්ගේ අනුශාසනා පරිදි සහ දිනූෂ රූපසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් මේ වැඩසටහන සංවිධාන කර තිබිණි.

මේ අවස්ථාවට ගම්පහ දිස්ත්‍රික් ලේකම් සුනිල් ජයලත්, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්වරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

වැල්ලම්පිටිය කොහිලවත්ත අල් - ඉබ්රාහිමියා ජුම්මා පල්ලියේ දායක සභාවෙන් කොවිඩ් වසංගත රෝගයෙන් පීඩාවට පත් වූ ජනතාවට වියළි සලාක පාර්සල් බෙදා දුන් අයුරු.

මේ අවස්ථාවට ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී පොල්ගහකුඹුරේ විපුලතිස්ස හිමි, වැල්ලම්පිටිය වෙන්නවත්ත ශ්‍රී කල්‍යාණිවංශිකාරාමය යටියන ඥාණවාස අනුනාහිමි ඇතුළු කොලොන්නාව ජුම්මා පල්ලියේ සභාපති ආචාර්ය අයි. වයි. එම්. හනීෆ් සහ කොහිලවත්ත ජුම්මා පල්ලියේ සභාපති එම්. ෆසීන් යන මහත්වරු සහභාගී වූහ.

ඡායාරූපය : රුසෙයික් ෆාරුක්



# හම්බන්තොට අන්තර්ජාතික වරාය සමූහයෙන්
# ලක්ෂ 146ක පීසීආර් මධ්‍යස්ථානයක්



**මහින්ද අලුත්ගෙදර**

හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ පීසීආර් පරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට රුපියල් ලක්ෂ 146ක් (අමෙරිකානු ඩොලර් 75000ක) ප්‍රදානය කිරීමට හම්බන්තොට අන්තර්ජාතික වරාය සමූහය තීරණය කරයි.

ඒ අනුව හම්බන්තොට අන්තර්ජාතික වරාය සමූහය (HIPG) හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ පීසීආර් පරීක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව සිටී. හම්බන්තොට අන්තර්ජාතික වරාය සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී ජොන්සන් ලියු මහතාගේ මූලිකත්වයෙන් හම්බන්තොට රෝහලේ පැවති චාම් උත්සවයකට සහභාගී වූ අතර, එහිදී මේ පහසුකම නිම කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දීමට සහතික කළේ තිබේ.

ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, රාජ්‍ය ඇමැති ඩී. වී. චානක, හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය උපුල් ගලප්පත්ති යන මහත්වරුන් ඇතුළු රෝහල් නිලධාරීහු සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරීහු මේ උත්සවයට සහභාගී වූහ.

මේ අවස්ථාවට එක් වෙමින් HIPG හි ප්‍රධාන විධායක නිලධාරී ජොන්සන් ලියු මහතා මෙසේ පැවැසුවේය.

'HIPG සමාගමේ ප්‍රධාන හවුල්කරුවා වන CMPort සමාගමේ ආයතනික සමාජ සත්කාරක අරමුදල වන චයිනා මර්චන්ට්ස් පදනමේ (China Merchants Fund - CMF) අරමුදල්වලින් කොටසක් දුන්නා. CMFහි මෙහෙවර වන්නේ තිරසර හා සමානාත්මතාව අරමුණු කර ගනිමින් සමාජ අභියෝගවලට නව්‍ය විසඳුම් සෙවීමයි.

අපගේ පරමාර්ථය සමාජීය හා පාරිසරික වශයෙන් ජනතාවට සැලකිය යුතු බලපෑමක් ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි. වසංගත කාලයකදී මෙවැනි ව්‍යාපෘතියකට සහාය වීම කාලීන අවශ්‍යතාවයක්. අංග සම්පූර්ණ පීසීආර් පරීක්ෂණාගාරයක් මේ ප්‍රදේශයට දැඩි අවශ්‍යතාවක්. ඉදිරියේදී වැඩිදුර සහයෝගීතාව සඳහා චීනයේ ප්‍රමුඛ රෝහලක් හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල සමග සම්බන්ධ කිරීමට ද යෝජනා කරනවා.'

# ග්‍රාම නිලධාරී කොට්ඨාස 02ක් නැවතත් හුදෙකලාභාවයට

**නුවන් කොඩිකාර**

කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන ඊයේ (22) උදෑසන 6.00 සිට බලපැවැත්වෙන පරිදි දිස්ත්‍රික්ක 02ක ග්‍රාම නිලධාරී කොට්ඨාස 02ක් හුදෙකලා කළ බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ යුද හමුදාපතිවරයා මෙසේ ද කීය.

'ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව පොලිස් බල ප්‍රදේශයේ සේරපුර ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී ආනන්දරාම පාර සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල පොලිස් බල ප්‍රදේශයේ කොටවල ග්‍රාම නිලධාරී වසම ඊයේ උදෑසන සිට හුදෙකලා කළා. මේ අතර ගම්පහ දිස්ත්‍රික්කයේ මහබාගේ පොලිස් බල ප්‍රදේශයේ කෙරගපොකුණ ජෝර්ජ් පාර ග්‍රාම නිලධාරි වසම ඊයේ උදෑසන 06 සිට හුදෙකලා භාවයෙන් ඉවත් කළා.

# උතුරු පළාතෙන් පෙරේදා කොරෝනා මරණ තුනක්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

කොරෝනා රෝගය ආසාදනය වීම හේතුවෙන් උතුරු පළාතේ තුන් දෙනකු පෙරේදා (21) මිය ගොස් ඇති අතර, තවත් පුද්ගලයන් 52ක් කොරෝනා ආසාදිත බවට හඳුනාගෙන තිබේ.

මෙයින් එක් මරණයක් යාපනයෙන් වන අතර, අනෙක් මරණ දෙක වවුනියාවෙන් වාර්තා විණි. රෝගීන් හමුවී ඇත්තේ කිළිනොච්චියෙන් 18ක්, වවුනියාවෙන් 26ක් සහ යාපනයෙන් 08ක් වශයෙනි.

**පෙරේදා (21) වන විට එන්නත්කරණයේ ප්‍රගතිය**

| කොවිෂීල්ඩ් Covishield | | සයිනොෆාම් Sinopharm | | ස්පුට්නික් - V Sputnik - V | |
|---|---|---|---|---|---|
| පළමු මාත්‍රාව | දෙවන මාත්‍රාව | පළමු මාත්‍රාව | දෙවන මාත්‍රාව | පළමු මාත්‍රාව | දෙවන මාත්‍රාව |
| 925,242 | 372,290 | 144,3470 | 455,592 | 113,454 | 14,301 |
| පෙරේදා එන්නත් කළ ප්‍රමාණය | | පෙරේදා එන්නත් කළ ප්‍රමාණය | | පෙරේදා එන්නත් කළ ප්‍රමාණය | |
| — | 132 | 6358 | 12935 | 6848 | 2610 |
| සමස්ත එන්නත්කරණය 3,324,349ක් වේ. | | | | | |



# සංවරණ සීමා ලිහිල් කළ දා රිය අනතුරු මරණ 11ක්

**රක්ෂණ ශ්‍රියන්ත**

සංචරණ සීමා ලිහිල් කළ පෙරේදා (21දා) උදෑසන 6.00න් අවසන්වූ ගතවූ පැය 24 තුළ රිය අනතුරු හේතුවෙන් පුද්ගලයන් 11දෙනකු ජීවිතක්ෂයට පත්ව ඇති බව පොලිසිය පවසයි.

සිදුව ඇති මරණවලින් පදිකයින් දෙදෙනකු, යතුරුපැදිවල ගමන් කළ පුද්ගලයන් 6ක්, පාපැදිවල ගමන් කළ පුද්ගලයන් 2ක් සහ ලොරි රථයක ගමන් කළ එක් අයකු සිටින බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

දිනකට මරණ 11ක් වාර්තා වීම සාමාන්‍ය තත්ත්වය ඉක්මවා යෑමක් ලෙස පෙන්වා දෙන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මෙම අනතුරු වළක්වා ගැනීමට තිබූ ඒවා බව කියා සිටියේය.

මාර්ගයේ ගමන්කරන පදිකයන් මෙන්ම කුඩා වාහනවල ගමන් කරන තැනැත්තන් වැඩි වශයෙන් රිය අනතුරුවලින් ජීවිතක්ෂයට පත්වන බවත් එබැවින් පදිකයන් මෙන්ම රියැදුරන්ද සෑම විටම මාර්ග නීතිවලට අනුගතව කටයුතු කරන ලෙසද ඉල්ලා සිටී. එම සිදුව ඇති අනතුරු අතර කොළඹ - පුත්තලම මාර්ගයේ පුබුදුගම හංදියේ දී මුන්දලම දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් එම දිසාවට ම ඉදිරියෙන් ගමන් කළ පා පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතළ තුවාල ලැබූ පා පැදිකරු හා ත්‍රීරෝද රථයේ රියදුරු මුන්දලම රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හලාවත රෝහලට මාරු කර යැවීමේ දී පාපැදිකරු ජීවිතක්ෂයට පත්ව තිබේ. එලෙස මිය ගොස් ඇත්තේ වයස අවුරුදු 59ක් වූ මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මේ අතර නොරොච්චෝලෙ පොලිස් වසමේ කල්පිටිය - පාලවිය මාර්ගයේ කොයියන්සේන හන්දියේ වෑන් රථයක් විරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකාරිය බරපතළ තුවාල ලබා ඇත. රෝහල් ගත කිරීමේ දී 31 හැවිරිදි කල්පිටිය ප්‍රදේශයේ පදිංචි කාන්තාව මිය ගොස් තිබේ.

ගිරාදුරුකෝට්ටේ රත්කිද බැරියල් හංදිය මාර්ගයේ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී සිදුවූ අනතුරෙන් යතුරුපැදිකරු හා පසු පැදිකරු බරපතළ තුවාල ලබා මහියංගනය රෝහලට ඇතුළත් කිරීමේ දී පැදිකරු මියගොස් තිබේ. එලෙස මිය ගොස් ඇත්තේ 27 හැවිරිදි තරුණයෙකි.

# පාඩු ලැබූ ලංකා ලුණු සමාගම මිලියන 44ක් ලාභ ලබයි

**දුමින්ද ගුරුගේ**

ඉකුත් පාලන සමයේදී පාඩු ලැබූ ලංකා ලුණු සමාගමට මේ වසරේදී රුපියල් මිලියන 44ක ලාභයක් උපයා ගැනීමට හැකි වූ බව ලංකා ලුණු සමාගමේ සභාපති නීතිඥ නිශාන්ත සඳබරණ මහතා පවසයි.

ඉකුත් පාලන සමයේදී සිදුවූ අයථා ගනුදෙනු නිසා සමාගමට රුපියල් කෝටි24ක පමණ දැවැන්ත ණයක් ගෙවීමට සිදුව ඇති බව ද එම ණය ගෙවන ගමන් මෙවැනි ලාභයක් උපයා ගැනීමට හැකි වීම විශාල ජයග්‍රහණයක් බව ද සභාපතිවරයා පවසයි.

මෙට්‍රික් ටොන් 1,25,000ක් පමණ වන මෙරට ලුණු අවශ්‍යතාවෙන් 50කේ පමණ ද කර්මාන්ත සඳහා භාවිතා කරන රික්තක ලුණු අවශ්‍යතාවෙන් 15%ක් පමණ ද සපුරාලන්නේ ලංකා ලුණු සංස්ථාවයි. කර්මාන්ත සඳහා යොදා ගන්නා වැලි රහිත රික්තක ලුණු (vaqum salt) සම්පූර්ණයෙන්ම මෙරට දී නිපදවීම තම ඉලක්කය බව සභාපතිවරයා පවසයි .

මේ සඳහා රුපියල් මිලියන 300ක් පමණ ආයෝජනය කරන ව්‍යාපෘතියක් යෝජනා කර ඇතැයි ද මෙමගින් අපේ අවශ්‍යතාව පමණක් නොව පිටරටට අපනයනයට රික්තක ලුණු නිපදවීමට හැකි වනු ඇතැයිද සභාපතිවරයා පවසයි. ආයෝජනය කරන මුදල වසර දෙකක් තුළ උපයාගත හැකි බව ද පැවසීය.

මීට අමතරව අපේ රටට පිටරටින් ගෙන එන අමුද්‍රව්‍ය රැසක් මුහුදු ජලයෙන් නිපදවීමට හැකියාව ඇති බැවින් ඒවා නිපදවීම කෙරෙහි තම අවදානය යොමු වී ඇතැයි ද සභාපතිවරයා පවසයි.

පසුගියදා ගිනිගත් පර්ල් එක්ස්ප්‍රස් නෞකාව නිසා මෙරට ලුණු නිෂ්පාදනවලට කිසිදු බලපෑමක් එල්ල නොවන බව පැවසූ සභාපතිවරයා ඒ පිළිබඳ කිසිදු බියක් ඇති කර ගත යුතු නැතැයි ද කීය.

ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



• බලපන් බං, තෙල් මිලට විරුද්ධව එදා බයිසිකලේ මෙදා තිරික්කලේ !

• මොකෝ ආවත්, අන්තිමට අපිට දාන්නෙ තක්කලේ තමයි සර් !

# ගෙවල් බිඳුම් රැසකට සම්බන්ධ සෙබළකු අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

හිගුරක්ගොඩ ප්‍රදේශයේ සිදුවූ ගෙවල් බිඳුම් රැසකට සම්බන්ධ ගුවන් හමුදා සෙබළකු පසුගියදා (20දා) අත්අඩංගුවට ගත් හිගුරක්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් සැකකරු විසින් සොරා ගන්නා ලද දේපළවලින් උපයා ගත් කැබ් රථයක් හා මිරිස් කුඩු ඇඹරුම් යන්ත්‍රයක්ද පොලිස් භාරයට ගෙන ඇත.

2019 වසරේ සිට හිගුරක්ගොඩ නගරය ආශ්‍රිත ප්‍රදේශවල විවිධ අවස්ථාවල රාත්‍රී කාලයේ නිවෙස්වලට ඇතුළු වී ගෙවල් බිඳීමේ සිද්ධි රැසකට මෙම සැකකරු සම්බන්ධ බවට පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

එම නිවෙස්වල තිබූ ස්වර්ණාභරණ වැනි වටිනා භාණ්ඩ මොහු සොරාගෙන ඇති අතර එවැනි අපරාධ 12කට මොහු සම්බන්ධ බවත් හිගුරක්ගොඩ පොලිසිය විසින් අනාවරණය කරගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු හිගුරක්ගොඩ ගුවන් හමුදා කඳවුරට අනුයුක්තව සේවය කරන ගුවන් හමුදා සෙබළකු බවට පොලිසිය පවසයි.

සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහු පදිංචි මොනරාගල නිවසේ තිබී ඔහු විසින් ගෙවල් බිඳීමෙන් උපයා ගත් මුදලින් මිලදී ගත් කැබ් රථයක් සහ මිරිස් කුඩු කරන යන්ත්‍රයක් පොලිසිය විසින් සොයා ගෙන තිබේ.

# ජාතික බලශක්ති දිනය ලෙස ජූනි 26දා නම් කරයි

**නුවන් කොඩිකාර**

සෑම වසරක ජූනි මස 26 වැනි දින 'ජාතික බලශක්ති දිනය' ලෙස නම් කිරීමට රජය තීරණය කර තිබේ.

විදුලි පහනකින් නිකුත් වූ ආලෝකය ප්‍රථම වතාවට ශ්‍රී ලාංකිකයන්ට දැක ගැනීමට හැකි වූ දිනය වන, කොළඹ වරායට ජර්මානු නෞකාව පැමිණි, 1882 ජූනි මස 26 වැනි දින මෙලෙස නම් කිරීමට පියවර ගෙන ඇති බව සම කැබිනට් ප්‍රකාශක, වැවිලි කර්මන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා පැවසීය.

විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහත්වරුන් ඒකාබද්ධව ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩලයේ අනුමැතිය හිමිවුණ බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (22) පැවැති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

විදුලිබල, බලශක්ති, අධ්‍යාපන අමාත්‍යාංශ සහ සූර්යබල, සුළං හා ජල විදුලිජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව තිරසර බලශක්ති පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම, ආකල්ප සහ නිර්මාණශීලිත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් ජාතික වැඩසටහනක් සැලසුම් කර ඇති බව පතිරණ මහතා කියා සිටියේය.

පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා යෝජිත වැඩසටහන සෑම වසරක ජූනි මස 26 වැනි දිනෙන් ආරම්භව ඊළඟ වර්ෂයේ ජූනි 26 වැනි දින දක්වා ක්‍රියාත්මක කර ජාතික ත්‍යාග ප්‍රදානෝත්සවයකින් අවසන් කිරීමටත් එම අමාත්‍යාංශය තීරණය කර ඇති බව සම කැබිනට් ප්‍රකාශකවරයා පැවසීය.

# ඇමැති අනුකමිටුවේ නිර්දේශය අනුව ගෑස් මිල ගැන සාධාරණ තීරණයක් ගන්නවා

## ලාෆ් සමාගමේ සභාපති ඩබ්ලිව්. එච්. කේ. වෑගපිටිය

**ශිරාන් රණසිංහ**

ගෑස් මිල සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ ඇමැති අනුකමිටුවේ නිර්දේශය ලද විගස ගෑස් මිල සම්බන්ධයෙන් සාධාරණ තීරණයක් ගන්නා බව ලාෆ් සමාගමේ සභාපති ඩබ්ලිව්. එච්. කේ. වෑගපිටිය මහතා 'දිනමිණ'ට පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'ගෑස් මිල ඉහළ නොදමන බවට හෝ ඒ සම්බන්ධයෙන් රජය ගන්නා පියවර නිල වශයෙන් මට තවම දැනුම්දී නෑ. කොරෝනා වසංගතය නිසා පීඩාවට පත්ව සිටින ජනතාවට සාධාරණ මිලකට ගෑස් දීම අපේ අරමුණයි. රජය මේ මොහොතේ යම් සහනයක් සලසන්නේ නම් ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.'

## ගිනිකෙළි

එළඹි සිහියෙන් සිටින අය කොහොමටත් රැකේ
නොබැලුවොත් දුර දිගක් නැවත නැවතත් දුකේ
හිතූ හිතූ දේ ගන්න අත මිටත් නැති එකේ
ඇහැකි හැම වෙලාවෙම ගෙදර ඉමු මේ ටිකේ

ගජමන් හෝනා

ඩෙල්ටා ප්‍රභේදය මෙරටට ඇවිත් ඇත
මේ ගැන සොයයි ලංකාවේ නොයෙක් අත
මින් සිදු වන විපත් හිරිහැර නිමක් නැත
බෝවෙයි ලෙඩේ සිටියත් රන් වැටක් මත

සීමා කොට ඇතත් රට තුළ සංචරණ
හැසිරෙති ඇතැම් අය සුපුරුදු ලෙස පරණ
මේ ලෙස ගියොත් වැඩි වෙයි කෝවිඩ් මරණ
තමන් හට තමන්මය ඇති රැකවරණ

රටේමුල්ලේ මුදන්නායක


සෙලින්කෝ ලයිෆ්

අරමුණු හඹා යන ඔබේ ශක්තිය අපි වෙන්නම්...



ඔබේ ජීවිතයේ අරමුණු සහ සිහින හඹා යෑමට කිසිම මොහොතක පැකිළෙන්න එපා. ඔබට ජීවිතය අභියෝගයක් වුණු හැම මොහොතකම ඔබේම සෙවණැල්ල මෙන් ඔබව තනි නොකර ඔබට ශක්තියක් වෙමින් අප ඔබ ළඟම හිටියා. 2020 වසරේ දී රුපියල් බිලියන 12ක ප්‍රතිලාභ ලබාදෙමින් රුපියල් බිලියන 100ක ජීවිත රක්ෂණ අරමුදල සමඟින් වසර 17ක් පුරා ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ අසමසම නායකත්වයක් දරමින් හෙටත් ඔබේ ජීවිතයේ අභියෝගවල දී ඔබව විශ්වාසයෙන් ජයග්‍රහණය කරා රැගෙන යන්නට ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම ලෙස ජනතා විශ්වාසය දිනූ අප සූදානම්.

ඉතිං, ඔබ අරමුණු හඹා යන්න. අවදානම අපි ගන්නම්!

World Finance 2020 Best Life Insurance Company in Sri Lanka for 7 consecutive years.
2020 Brand Finance Awards MOST VALUABLE LIFE INSURANCE BRAND IN SRI LANKA
2020 වසරේ ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවාදරයට පාත්‍ර වූ සමාගම්
අඛණ්ඩව වසර 15ක් ජනප්‍රියම රක්ෂණ සමාගම
2020 සඳහා Great Place to work සහතිකයෙන් පිදුම් ලැබීම

සෙලින්කෝ ලයිෆ් රක්ෂණ සමාගම වෙතින් නිකුත් කිරීමක්. (PB5183)

CEYLINCO LIFE®

ජීවිතය පුරාවට සබැඳියාවක්™

සෙලින්කෝ ලයිෆ් රක්ෂණ සමාගම, සෙලින්කෝ ලයිෆ් ටවර්, 106, හැව්ලොක් පාර, කොළඹ 05. සමාගම් ලියාපදිංචි අංකය PB5183 දුරකථනය: (011) 2461461 ඊමේල්: service@ceylife.lk වෙබ් අඩවිය: www.ceylincolife.com

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 ජූනි 23 බදාදා

# කොවිඩ් මර්දනයට තවත් ප්‍රතිපාදන

කොවිඩ් මර්දනය සඳහා තවත් රුපියල් කෝටි විසිදහසක් වෙන් කිරීමට රජය තීන්දු කර තිබේ. පරිපූරක ඇස්තමේන්තුවක් මගින් එම මුදල ලබා ගැනීමට නියමිතය. රජය මෙතෙක් කොවිඩ් මර්දනය සඳහා යොදවා ඇති මුදල අති විශාලය. වසංගතය මර්දනය කොට ජන ජීවිත යථාවත් කිරීම රජයේ ප්‍රමුඛ කාර්යය වී තිබේ. ශ්‍රී ලංකාව කොවිඩ් මර්දනය සඳහා ප්‍රමුඛතාව දී ඇත්තේ ඇතැම් දුප්පත් රටවල් එන්නත්කරණය ආරම්භ කර නැති අවස්ථාවකය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සංඛ්‍යා දත්තවලට අනුව දුප්පත් රටවල් හතළිහක තවම එන්නත්කරණය ආරම්භ වී නැත. කොවිඩ් වැළැක්වීමේ ප්‍රතිශක්තිකරණ එන්නත් වර්ග හතක් ඇති අතර ඒ සෑම එන්නත් වර්ගයක්ම මිලෙන් ඉහළය.

මේ වසර අවසන් වීමට පෙර ජනගහනයෙන් 60% කට එන්නත් ලබාදීම රජයේ ඉලක්කය වී ඇත. එන්නත් වර්ග තුනක් දැනට ශ්‍රී ලංකාවේ භාවිත වන අතර එන්නත් ලබා දීමේ වැඩසටහන වේගවත් ලෙස ක්‍රියාත්මක වෙයි. වරින්-වර එන්නත් තොග ගෙන්වනු ලැබේ. එන්නත් පිළිබඳ වෙළෙඳපොළ ඉතා තරගකාරී එකක් වී ඇති අතර ශ්‍රී ලංකාව සැලැසුම් සහගත ලෙස එන්නත් ගැනීම සිදු කරයි. මුලදී එන්නත් පිළිබඳ විශ්වාසයක් ජනතාව තුළ පැවැතියේ නැත. එහෙත් මේ වන විට ජනතාව එන්නත් ලබා ගැනීම සඳහා තරගයක යෙදී සිටිති. එය සාධනීය තත්ත්වයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන අන්දමට කොවිඩ් වැළැක්වීම සඳහා ඇත්තේ පියවර දෙකක් පමණි. පළමු පියවර එන්නත් ගැනීමය. දෙවන පියවර නිසි සෞඛ්‍ය උපදේශන පිළිපැදීමය.

විපක්ෂය කොවිඩ් වැළැක්වීමේ වැඩසටහන තදින් විවේචනය කළද, ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු ජගත් සංවිධාන ගණනාවක් එම වැඩසටහන් අගය කර තිබේ. කොවිඩ් පළමු රැල්ල සාර්ථකව මර්දනය කළ ආණ්ඩුව කොවිඩ් මර්දනය අතින් ලෝකයේ දෙවන ස්ථානයට පත්විය. කොවිඩ් දෙවන රැල්ල ද මර්දනය කරගත් ආණ්ඩුව කොවිඩ් මර්දනය අතින් ලොව දසවන ස්ථානය හිමි කර ගත්තේය. කොවිඩ් තෙවන රැල්ල රට පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට පටන්ගත් අතර, මේ වන විට එය සැලැකිය යුතු මට්ටමකින් පාලනය කර තිබේ. කොවිඩ් තෙවන රැල්ල මතුවූයේ ජනතාවගේ නොහික්මුණු හැසිරීම නිසාය. ආණ්ඩුව ජනතාවගේ හැසිරීම් පාලනය කිරීම සඳහා පියවර ගණනාවක් ගෙන තිබේ.

ජනතාව පීඩාවට පත් නොකොට කොවිඩ් මර්දනය සාර්ථක කර ගැනීම ජනාධිපතිවරයාගේ ඉලක්කය වී ඇත. රට මුළුමනින්ම වසා දමා කොවිඩ් වැළැක්විය යුතු යැයි යෝජනා ඉදිරිපත් වී තිබුණ ද ජනාධිපතිවරයා එය පිළිගත්තේ නැත. ජන ජීවිතය යථා පරිදි පවත්වා ගනිමින් කොවිඩ් වැළැක්වීම ඉදිරියට ගෙන යෑම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වී තිබේ. ඇතැම් රටවල කොවිඩ් වැළැක්වීම සඳහා දැඩි නීති රීති ක්‍රියාත්මක කළ ද ශ්‍රී ලංකාව එබඳු ස්ථාවරයකට ගියේ නැත. නීති කඩන සාමාන්‍ය ජනතාවට ඉන්දීය පොලිසිය දිගටහරහට පහර දුන්නේය. ඇතැම් රටවල නීති කඩන අය පොලිස් වෙඩි පහරට ලක්වූහ. ශ්‍රී ලංකාව තුළ එබඳු සිද්ධි වාර්තා වී නැත. කොවිඩ් වැළැක්වීම සඳහා මහත් කැපවීමකින් ක්‍රියා කරන නිලධාරීන්ට ජනතාව පහරදුන් අවස්ථා පමණක් අපේ රටෙන් වාර්තා වී ඇත.

ආණ්ඩුව කොවිඩ් මර්දනය සඳහා විශාල මුදලක් යොදවන්නේ සංවර්ධන ව්‍යාපෘති ද ඉදිරියට ගෙන යන අතරය. අය වැය යෝජනාවලට අනුව නව සංවර්ධන ව්‍යාපෘති දෙසිය ගණනක් ක්‍රියාත්මකය. ඒ සඳහා වෙන් කර ඇති මුදල රුපියල් කෝටි හැටනම දහසකට වැඩි බව කැබිනට් ප්‍රකාශක මැතකදී කියා තිබිණි. මේ ව්‍යාපෘති අමාත්‍යාංශ එකොළහක් යටතේ ක්‍රියාත්මක වන අතර මේ වන විට 33%ක ප්‍රගතියක් ලබා ඇති බව ද සඳහන්ය. වසර අවසන් වන විට ඒවා ඉලක්ක සපුරාගත් වැඩසටහන් බවට පත්වනු ඇත. සියල්ල යහපත් ලෙස සිදුවන්නේ රාජ්‍ය ආදායම් ශීඝ්‍රයෙන් පහළ යන තත්ත්වයක් තුළය. ඒ අතින් බලන විට රටේ මූල්‍ය කළමනාකරණය ගැන සතුටු විය හැකිය. ලෝකයේ බොහෝ රටවල ආර්ථිකයන් බංකොලොත් වී ඇත.

කොවිඩ් ලෝක වසංගතයත් සමඟ සෑම රටක්ම ප්‍රධාන අර්බුද දෙකකට මුහුණ දෙයි. පළමු අර්බුදය වන්නේ කොවිඩ් වැළැක්වීම සඳහා සෞඛ්‍ය පහසුකම් වැඩි කර ගැනීමය. දෙවන අර්බුදය වන්නේ බිඳ වැටෙන ආර්ථිකය යළි යථාවත් කිරීමය. ආර්ථිකය යනු දිගුකාලීන ගැටලුවකි. කොවිඩ් වසංගතය තවත් වසර දෙක තුනකින් තුරන් වී යා හැකි වුව ආර්ථික අර්බුදය දිගටම පවතිනු ඇත. අර්බුදයේ තත්ත්වය නිර්ණය කළ හැක්කේ එකිනෙක රටවල නායකයන් ඊට මුහුණ දෙන ආකාරයට අනුවය. ආර්ථික විශේෂඥයන්ගේ මතයට අනුව එකිනෙක රටවලට ගැළපෙන ප්‍රායෝගික උපාය මාර්ග ඔස්සේ අර්බුදය ජයගත යුතුය. ඒ සඳහා දැක්මක් ඇති නායකයන් සිටිය යුතුය.

රට වසා දැමීම අවශ්‍යම අවස්ථාවලදී පමණක් සිදුවන අතර කෘෂිකර්මය, ඇඟලුම් කර්මාන්තය, වෙළෙඳාම වැනි ආර්ථික කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට රජය සමත් වී ඇත. ඒ අතර සංචාරක කර්මාන්තය පවා වරින් වර සුදුසු පරිදි ක්‍රියාත්මක කරයි. රජය පසුවන්නේ ආදායම් අඩුවී වියදම් අධික වන ආර්ථික පසුබිමකය. මේ තත්ත්වයෙන් ගොඩයෑම සඳහා විවිධ උපායමාර්ග භාවිත කිරීමට සිදුවනු ඇත. ඇතැම් විට ජනප්‍රිය නොවන තීන්දු ගැනීමටත් සිදු වනු ඇත. තෙල් මිල ඉහළ දැමීම එබඳු තීරණයකි. කුමන දේශපාලන පක්ෂයක් බලයේ සිටිය ද ඊට විකල්ප විසැඳුමක් නැත. තෙල් සංස්ථාව පාඩු පිට දුවන ආයතනයක් වී ඇත්තේ ජනතාවට සහන ලබා දීම හා රාජ්‍ය ආයතනවලට ණයට තෙල් ලබා දීම නිසාය. කොවිඩ් වසංගතය හමුවේ ඒවා තවදුරටත් පවත්වා ගැනීම අසීරුය.

රටේ විපක්ෂ දේශපාලන කණ්ඩායම් හා පොදු ජනතාව ආණ්ඩුවට සහයෝගය දෙන්නේ නම්; මේ අර්බුදය පහසුවෙන් ජයගත හැකිය. එහෙත් එබඳු සාමූහික වගකීමකට විපක්ෂය හෝ පොදු ජනතාව හෝ එකතු වන බවක් පෙනෙන්නට නැත.

**කඩ පිලේ නගරයේ පොදි ගැසෙන සෙනග දැක**
**ඇයි මෙහෙම මෝඩ කම් මිනිසුනේ දැනෙයි දුක**
**නොහැකි නම් තමාටම තමාවම ගන්න රැක**
**වළක්වනු නොහැකි වෙයි කොරෝනා දිනන එක**

# මානුෂික මෙහෙයුම සහ GSP+ සහනය

අද ත අතීතයේ සිට කෘෂිකාර්මික ජීවන රටාවකට හුරුවූ ජනතාවක් වාසය කළ රටක් වශයෙන් අපේ රට ප්‍රසිද්ධියට පත්විය. පෙරදිග ධාන්‍යාගාරය වශයෙන් විරුදාවලිය ලත් මේ දිවයින සහලින් ස්වයංපෝෂිත වූයේ පෙර රජ දරුවන් ඇතුළු ජනී ජනයාගේ අපරිමිත උත්සාහයේ අගනා ප්‍රතිඵල හේතුවෙනි.

අනුරාධපුරයෙන් ඇරඹි ඒ සහල් සභ්‍යත්වය වෙහෙර විහාර පෙතිපිළිම සඳකඩපහණ පමණක් නොව වාපි ශිෂ්ටාචාරයේ දැහැමි දේශයක් බවට පත් කළේය. වැවයි දාගැබයි ගමයි පන්සලයි ඒ සංස්කෘතියේ හර පද්ධතිය විය. ගස්ගල්වලට වඳිමින් සිටි ජනී ජනයා මිහිඳු සංස්කෘතියේ සිතුම් පැතුම්වලින් පෝෂණය වූයේ බුද්ධියට මුල් තැන දෙන ජාතියක් වශයෙනි.

මහා ඝන වනාන්තරවල ගල්ගුහාවලින් ඇසුණු කොටි වග වලසුන්ගේ රුදුරු හඬ වෙනුවට කසාවතින් බබළන ශාන්ත සුන්දර දහමක හරය කියා දෙන දහම් නිකේතන බවට පත් කළේ ඒ මිහිඳු සංස්කෘතියයි. මිහිඳු සංස්කෘතියෙන් ඔද වැඩුනු ජාතියක් ගුණ ගරුකත්වයෙන් පිරිපුන් ජාතියක් බවට පත් කළේ ආර්ථික සමෘද්ධියත් සමඟය. කය වෙහෙසා වැඩ කළ ජාතියකගේ මනස නිරවුල් කළේ බුදුදහමෙනි. සරල සැහැල්ලු දිවිපෙවෙතක අරුත කියාදුන්නේ ඒ බුදුදහමයි.

අපේ රටේ නිර්මාණශීලී මිනිසුන් බිහිවූයේ එතැන් සිටය. මහා රළු ගල් කුළු ඉතා මටසිලිටි නිර්මාණ බවට පත් කළේ ඒ සුන්දර මිනිසුන් අතින් බව අපේ ඉතිහාසය අපට කියාදෙයි.

අනුරාධපුරය කේන්ද්‍ර කොටගෙන ගොඩනැගුණු මේ චින්තන විප්ලවය අද දක්වාම නොනැසී පවතින්නේ බුදුදහම යනු අතීතයටත් වර්තමානයටත් අනාගතයටත් බලපවත්වන සර්වකාලීන ජීවන ප්‍රතිපදාවක් වූ නිසාය. රටේ පාලකයා දැහැමි රාජ්‍ය පාලකයකු වූ අතර මහා සඟරුවනගේ අවවාද අනුශාසනා පරිදි රාජ්‍ය පාලනය ගෙන ගියහ.

බුදු දහම සහ රාජ්‍ය පාලනය ගසට පොත්තක් පොත්තට ගසක් මෙන් ඈත අතීතයේ සිටම විශාල බැඳීමක් තිබූ බව නොරහසකි. මහාවංශයේ සඳහන් පරිදි දුටුගැමුණු රජ තුමාගේ ප්‍රකාශයෙන් තවදුරටත් ඒ බැඳීම ඔප්පුකොට ඇත. ඒ අනුව “මගේ ව්‍යායාමය හුදෙක්ම රජ සැප පිණිස නොව සම්බුදු සසුනේ චිරස්ථිතිය පිණිස” යන ප්‍රකාශයෙන් තවදුරටත් පැහැදිලිය. ඒ තරමටම රාජ්‍ය පාලනය සහ බුදුදහම අතර අවියෝජනීය සබඳතාවයක් ගොඩනැගී තිබුණේය. එදා ථූපාරාමයෙන් ඇරඹි ස්තූප ගොඩනැගීම් රුවන්වැලි සෑරදුන්, මිරිසවැටිය වැනි විස්මිත නිර්මාණ ඔස්සේ අපේ උරුමයන් බවට පත් කළේය.

ධාතුසේන වැනි කුමරකු හදා වඩා පෝෂණයකොට රාජ්‍ය පාලනය දක්වා රැගෙන ආවේ එදා අපේ රටේ වැඩ විසූ මහා සඟරුවනයි. ධාතුසේන රජතුමා කලාවැව වැනි නිර්මාණයක් බිහිකළේ අපේ රටේ සහල් සභ්‍යත්වය රැකගැනීමටයි. ඒ අසල අවුකන බුදුපිළිම වහන්සේ නිමැවූයේ බුදුදහමේ හරය ලෝවැස්සන්ට පවා අවබෝධ කරගැනීමටය. සීගිරිය වැනි කලා නිකේතනයක් කාශ්‍යප රජතුමා ගොඩනැගුවේ ජාතියක උරුමය ලෝකය හමුවේ අදටත් දැක බලා ගැනීමටය. යුරෝපීයන් ප්‍රාථමික අවදියේ ජීවත්වෙද්දී හෙළයන් වූ අප ඔවුනට වඩා එදා ඉදිරියෙන් සිටි බව පැහැදිලිය.

චෝල පාණ්ඩ කේරළ වැනි ඉන්දියානු ආක්‍රමණිකයන් හමුවේ නොසැලී මුහුණදෙමින් රට එක්සේසත් කොට පාලනය කිරීමට පෙර රජ දරුවන් උත්සුක වූහ.

දුටුගැමුණු වළගම්බා වැනි රජවරු අනුරපුර යුගයේ දී එසේ රට එක්සේසත් කිරීමට උරදුන් රාජ නාමවලියේ ඉදිරියෙන් සිටින නරපතියන්ය. පොලොන්නරුව සිය රාජධානිය කොටගත් රජවරු අතර මහා පරාක්‍රමබාහු රජතුමා මුළුරටම සහලින් ස්වයංපෝෂිත කොට විදේශ රටවලට පවා සහල් අපනයනය කළ බව ඉතිහාසයේ පෙන්වා දෙයි.

විශේෂයෙන් මිහිඳු සංස්කෘතිය තුළ අනුරාධපුර මහාවිහාරයෙන් ධර්ම ශාස්ත්‍රීය දියුණුව වෙනුවෙන් සුවිශේෂ මෙහෙවරක් සිදුකළ විද්‍යාස්ථානයකි. විශේෂයෙන් හෙළ වෙදකමට ඉහළ වටිනාකමක් ලබා දුන් බුද්ධදාස වැනි ජීවකවරු ද සතා සිවුපාවුන්ට පවා වෙදකම් කළ බව අමතක නොකළ යුත්තකි.

අහසින් වැටෙන එක දිය බිඳක් වත් මුහුදට නොයවා රැකගත යුතු බව මහා පරාක්‍රමබාහු රජතුමා පැවසුවේ අද බටහිරින් අපට කියාදෙන තිරසර සංවර්ධනය බව පැහැදිලිය.



කිසිවක් අපතේ නොයවා රැක ගැනීම අනාගත පරපුරට ඉතිරි කිරීමක් බව තිරසර සංවර්ධනයෙන් පෙන්වාදෙන පොදු න්‍යාය ධර්මයකි. අපේ පෙර රජදරුවන් එය ගුණාංගයක් ලෙස වැඩිදියුණු කළ බව පොලොන්නරුවෙන් රටම පාලනය කළ පරාක්‍රමබාහු රජතුමාගේ ප්‍රකාශයෙන් තවදුරටත් පැහැදිලි වේ.

යුරෝපීය ජාතිකයින් දියුණු නාවිකයන් වූ කල නාවික මාර්ග හරහා අප වැනි රටවල ආර්ථිකය කොල්ලකාරී ලෙස ඔවුනගේ ආධිපත්‍යයට නතු කර ගැනීමට මාන බැලූහ. එහි ප්‍රතිඵලයක් වූයේ 1505දී පෘතුගීසීන් මෙරටට ගොඩ බැසීම එහි ආරම්භයයි. අපේ රටේ කුළුබඩුවල ඇති රසය මෙන්ම වටිනාකම තේරුම්ගත් යුරෝපීයන් වෙළෙඳාම හරහා රට අභ්‍යන්තරයට සේන්දු විය.

මේ වනවිට රටේ පැවැති දේශපාලන අවුල් වියවුල් සැලකිල්ලට ගත් මොවුන් කෝට්ටේ බුවනෙකබාහු වැනි දුර්වල පාලකයකු හරහා දේශපාලන ආධිපත්‍යය තහවුරු කර ගත් බව නොරහසකි. යුරෝපීයන් කෘෂිකර්මාන්තය හෙළ වෙදකම ධර්මශාස්ත්‍රීය දියුණුව ඇතුළු අපේ හර පද්ධතිය සුනුවිසුනු කළේ ඉතාම කුරිරු අයුරිනි.

අපේ රටේ තිබෙන භූගෝලීය පිහිටීම් මෙන්ම හෙළයන් ආහාරයට ගත් සියලු ආහාර වර්ග ජවසම්පන්න නිරෝගිමත් ජනතාවක් බිහි කළේය. භූගෝලීය පිහිටීම අනුව සතුරාට ගරිල්ලා ප්‍රහාර එල්ල කොට ඔවුන් විනාශ කිරීමට අපේ රටේ එදා ජීවත්වූ ජනයා පසුබට වූයේ නැත.

පලතුරු උයන්වලින් ඔසු උයන්වලින් පමණක් නොව නිල්ලපිරුණු සහල් නිෂ්පාදනයෙන් පෝෂිත රටක දේශීයත්වය විනාශකොට දැමීම බටහිර ජාතීන්ගේ එකම ඉලක්ක විය. එසේ කොට ඔවුන්ගේ ආර්ථික භෝග මේ මහ පොළොවට ළං කළේය.

ඌව වෙල්ලස්සෙන් ඇරඹි අපේ රටේ ගොවි ජනයා භුක්තිවිඳි ඉඩකඩම් ඉතාම මංකොල්ලකාරී ලෙස යුරෝපීය ජාතිකයන් අත්පත් කර ගත්තේ සිත් පිත් නැත්තන් සේය.

වතු වගාව ආරම්භ කොට අපේ පරිසරය විනාශ කිරීම ආරම්භ කළේය. මධ්‍ය කඳුකරයෙන් ගලා බසින මහා ගංගාවන්වලට එසේ එළිපෙහෙළි කළ කඳුකරයේ සාරවත් පස සෝදා යෑම ආරම්භ වූයේ එදා සිටය. යුරෝපීයන් එදා ඒ කළ මහා පරිසර හානියේ ප්‍රතිඵල කඳු නාය යෑමෙන් මිනිස් ජීවිතවලින් මෙන්ම දේපළවලින් පවා අද වන්දිගෙවන බව අමතක නොකළ යුත්තකි.

අපේ රටේ පෞරාණික වටිනාකම් තිබූ පොත්පත් පමණක් නොව කෞතුක භාණ්ඩ එංගලන්තය වැනි රටවල කෞතුකාගාරතුළ අදටත් විරාජමානව ඇත. බටහිර වෙදකම පරයා යන අපේ හෙළ වෙදකමේ රහස් පොත පත විනාශ කළේ ජාතියක කොඳුනාරටිය කඩා දමන්නා සේය. එහෙත් මේ සියලු බාධක කම්කටොලු මැද ස්වාධීන ජාතියක් වශයෙන් අපි නැගී සිටීමට මාන බැලූ බවද අමතක නොකළ යුත්තකි. බටහිර ජාතීන් අපේ රටින් නික්ම ගියේද ජාතීන් අතර අසමගිය ගොඩනගිමිනි. ජාති ආගම් කුල වශයෙන් සියලුදෙනා අතර එදා බටහිර ජාතීන් අසමගිය ඇති කළේය. එය අද දක්වාම ඔඩු දිවූ තුවාලයකි.

නිදහසින් පසුව නැවත ජාතියක් වශයෙන් අපි නැගී සිටීමට වෙර වෑයම් දැරුවද බටහිර ආධිපත්‍යයේ නව යටත්විජිතවාදය නම් යදම්වැලට අපවත් සංවර්ධනය වෙමින් පවතින රටවලුත් කොටු කළේය. විවිධ නම්වලින් පෙනී සිටින ජාත්‍යන්තර සංවිධාන රැසක් අපට දැත් දිගු කළේ සිප ගැනීමට දුන් අත වේදනාවෙන් තොරව සපා කන්නා සේය. විශේෂයෙන් යුරෝපයේ ජාත්‍යන්තර සංවිධාන මිතුරන් සේ එන සතුරන් බව අමතක නොකළ යුත්තකි.

දේශීය ආර්ථිකය ශක්තිමත් කරන වැඩපිළිවෙළක් 1977 දක්වා ඉතා දුෂ්කරතා මධ්‍යයේ රැගෙන ආවේ 1970 බලයට පත්වූ සමගි පෙරමුණු ආණ්ඩුවයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුතු වූ සමගි පෙරමුණු ආණ්ඩුව නොයෙක් අවලාද අපවාද මැද දේශීය ආර්ථිකය ශක්තිමත් කළේය.

1977 බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කැඳවාගෙන ආ විවෘත ආර්ථිකය අපේ රටේ පැවැති දේශීය ආරථිකය උඩු යටි කුරු කළේය. කටුනායක බියගම වෙළෙඳ කලාප ඇතිකොට ඇඟලුම් කම්හල් ආර්ථිකයක් ස්ථාපිත කළේය.

ඒ අතර උතුරු නැගෙනහිර ෆැසිස්ට්වාදී යුද්ධයක් නිර්මාණය කළේය. යුද්ධයේ මුවාවෙන් මිනිස් ජීවිත බිලිදෙමින් රට පාලනය කිරීම එක්සත් ජාතික පක්ෂයේ පිළිවෙත විය. යුරෝපීය ජාතීන් වූ කැනඩාව, නෝර්වේ වැනි රටවල් සාමදූතයන් සේ හැසිරෙමින් උතුරේ ත්‍රස්තවාදීන්ට උදව් කළ බව නොරහසකි. මිලිබ්‍රැන්ඩ්ලා සොල්හයිම්ලා අකාශිලා හමුවේ දණ නොනැමූ අපේ හිටපු ජනාධිපති මහින්ද රජපක්ෂ මහතාගේ රජය ඉතා සාර්ථක ලෙස මානුෂික මෙහෙයුමක් සිදුකොට යුද්ධය අවසන් කළේය. එදා ඈත අතීතයේ සිට අපේ රට මංකොල්ල කෑ බටහිර ජාතීන්ට එය අතුල් පහරක් විය.

යුරෝපා සංගමයෙන් GSP+ සහනය ලබා දුන්නේ අපේ රටේ සුනාමි ව්‍යසනය පසුවයි. එහෙත් මානුෂික මෙහෙයුම ජයගන්නා සමය වන විට GSP+ සහනය අපට ලබා නොදුන්නේ එදා අපේ රට මංකොල්ලකාරී ලෙස විනාශ කළ බටහිර ජාතීන් වීම එහි ඇති දෛවෝපගත සිදුවීමකි. එහෙත් රට ඉදිරියට රැගෙන යෑමට මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුතු ආණ්ඩුව පසුබට වූයේ නැත. එදා බටහිරට ගතු කියූ බටහිරට වන්දනාමාන කරන දේශපාලන නායකයන් නැවත GSP+ සහනය ලබා ගත්තේ අපේ රටේ රණවිරුවන් අති අමානුෂික අයුරින් දඩයම් කිරීම ආරම්භ කිරීමෙන් පසුවයි.

අද නැවතත් යුරෝපා සංගමය අපේ රටට අනතුරු හඟවන්නේ ඉතාම ද්වේෂ සහගත අයුරින් බව මධ්‍යස්ථ මතධාරී ඕනෑම අයෙකුට පෙනෙන පැහැදිලි සත්‍යයකි. වර්තමානයේ යුරෝපා සංගමය යුරෝපා පාර්ලිමේන්තුව අපේ රජයට ඉදිරිපත් කරන එක කොන්දේසියක් නම් ත්‍රස්තවාදී පනත අහෝසි කරන ලෙසය. ත්‍රස්තවාදී පනත අහෝසි කළ හොත් පාස්කු ප්‍රහාරයට සම්බන්ධ 700කට ආසන්න පිරිසක් සමඟ හිටපු කොටි ත්‍රස්තවාදින් නිදහස් වනු ඇත. එය පාස්කු ප්‍රහාරයේ ඉදිරි විමර්ශන කටයුතුවලට බලවත් පාඩුවකි. තවද කොටි ත්‍රස්තයන් නිදහස් කිරීම කොටි ඩයස් පෝරාවේ බලවත් ඉල්ලීමක් බව පැහැදිලි සත්‍යයකි. ඍජුකශේරුකාවක් ඇති නායකයකු වශයෙන් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා එය තරයේ ප්‍රතික්ෂේප කොට ඇත. සියලු අභියෝග මැද රටක් ඉදිරියට ගෙනයෑමට ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගන්නා උත්සාහය අගය කළ යුතුව ඇත.



**මහින්ද ආරියවංශ**



# නැඟෙනහිරින් පිබිදෙන කාබනික වගා අරුණැල්ල

පසුගිය යල කන්නයේ දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ගොවිමහතෙකු මා අමතා ප්‍රකාශ කර සිටියේ කුඹුරු යායක්ම කීඩෑ උවදුර නිසා විනාශ වී ඇති බැවින් ඒ වෙනුවෙන් වන්දි ලබාදීමට කටයුතු කරන ලෙසය. එවකටද, කොවිඩ් අර්බුදය හේතුවෙන් රට තුළ සංචරණ සීමා පනවා තිබූ බැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා වන්දි ලබා ගැනීම නොහැකි වූ බව, ඔහු පවසා සිටියේය. මාගේ ආරාධනාව පරිදි රසායනික විද්‍යාඥ ආචාර්ය කීර්ති වික්‍රමසිංහ මැතිතුමා කන්තලේට පැමිණියේ අඛණ්ඩව පැවැති මෙම කීඩෑ උවදුරට පිළියමක් ලබාදීමට ය.පසුගිය වසරේ යල කන්නයේ නියමු ව්‍යාපෘතියක් ලෙස පටන් ගැණුනු කාබනික වී ගොවිතැන ක්‍රම ක්‍රමයෙන් පුළුල්ව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය පුරාවට වර්ධනය කර ගැනීමට අවස්ථාව උදා වූයේ මේ ආකාරයෙනි.

ගොවිතැන කෘෂිකර්මාන්තයක් නොව කෘෂි සංස්කෘතියකි (agriculture). ගොවිතැන අපගේ රට තුළ නම් කෘෂි ශිෂ්ඨාචාරයකි. අපගේ ඉපැරණි, එනමුදු සජීවී ශිෂ්ඨාචාරය සම්පූර්ණයෙන්ම වාගේ රඳා පවතින්නේ මෙම කෘෂි සංස්කෘතිය මගිනි. පණ්ඩුකාභය රජ දවස සිට තවමත් ශක්තිමත්ව පවතින ඉතා සංකීර්ණ වාරි කර්මාන්තයක් අපට උරුම වූයේ ද මෙම හේතුවෙනි. ලංකාදීපය, පෙරදිග භාණ්ඩාගාරය ලෙස නම් කෙරුණේ ද එවකට තිබූ ශක්තිමත් කෘෂි ආර්ථිකය නිසාවෙනි. එසේම කෘෂි සංස්කෘතිය බෞද්ධ දහම ද සොබාදහම ද එක්ව කැටි වූ ජීවන රටාවක් මත පදනම් වූ දහමකි. දැනට ලොව ඇති විශාල අභියෝග මධ්‍යයේ අපගේ අනාගත පැවැත්ම සහ එහි සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ අප අපට ආවේණික වූ මෙම දහම රැක ගන්නවාද නැතහොත් හරිත විප්ලවය නමින් ලොවට හඳුන්වා දුන් කාර්මික කෘෂි කර්මාන්තයේ රැඳෙනවා ද යන්න මතයි.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදය සහ සෝවියට් දේශය අතර ඇති වූ සීතල යුද්ධය අවස්ථාවේදී එක්සත් ජනපදය ඔවුන්ගේ බලය සහ දේශපාලන මතවාදය ලොව ප්‍රචලිත කිරීමට බොහෝ ක්‍රමවේද තෝරා ගන්නා ලදී. හරිත විප්ලවය මින් එකකි. හරිත විප්ලවය හරහා තුන්වැනි ලෝකයේ පැවති ආහාර හිඟයට පිළියමක් ලබා දෙමින් එම රටවල් තම මතවාදයට යොමු කර ගැනීම ඔවුන්ගේ අභිමතාර්ථය විය.

1940 දශකයේ දී මෙක්සිකෝවෙන් පටන් ගත් හරිත විප්ලවය හරහා කාර්මීකරණය වූ කෘෂිකර්මාන්තයට එවකට තිබූ ආහාර නිෂ්පාදනයට වඩා වැඩි ප්‍රමාණය කින් දායක වීමට හැකි විය. ඉතා විශාල ඉඩම් ප්‍රමාණයක් වෙන් කරමින් බොහෝ යන්ත්‍රෝපකරණ යොදාගනිමින් අධික ප්‍රමාණයක රසායනික පොහොර යොදා ගනිමින් විශේෂයෙන්ම තිරිඟු, බඩ ඉරිඟු වැනි ධාන්‍ය වර්ග වල නිෂ්පාදනය වැඩි කිරීමට මෙම ක්‍රමය හරහා හැකිවී ඇත. මීට අමතරව පර්යේෂණාගාර හරහා නිෂ්පාදනය වැඩි කරන බීජ වර්ග හඳුන්වාදීම ද සිදුවිය. 1970 දී ඇමෙරිකානු ජාතික නෝමන් බෝලොග් නමැති විද්‍යාඥයාට නොබෙල් සාම ත්‍යාගය ලැබෙන්නේ ද ඔහු විසින් පර්යේෂණ කර හඳුන්වා දුන් තිරිඟු වර්ගයක් නිසාවෙනි. මෙලෙස ව්‍යාප්ත වූ හරිත විප්ලවයට අවශ්‍ය රසායනික පොහොර නිෂ්පාදනාගාර බවට පත් වන්නේ දෙවන ලෝක යුද්ධයට අවි ආයුධ නිපදවූ නිෂ්පාදනාගාරයයි. මොවුන් මහා පරිමාණයෙන් යුද්ධය නිසා නිෂ්පාදනය කරමින් සිටි රසායනික ද්‍රව්‍ය පොහොර ලෙස මහ පොළොවට එක් වන්නේ ද මෙලෙසිනි.

හරිත විප්ලවය වඩාත් ප්‍රචලිත වූ ලතින් ඇමරිකානු රටවල් අද වන විට බොහෝ අභාග්‍යවන්ත ලෙස මෙහි පලවිපාක විඳිමින් සිටියි. එකම වර්ගයේ බෝග(monocultures) සඳහා වෙන් කළ අක්කර දස දහස් ගණනක භූමි ප්‍රමාණයක් වගා කරනුයේ යන්ත්‍රෝපකරණ ආධාරයෙනි. පැරගුවේ ජනතාව අදටත් තමන්ට අහිමි වූ ඉඩම් ඉල්ලා උද්ඝෝෂණ කරති. ගොවි ඉඩම් අල්ලා ගත් සමාගම් පවසන්නේ ගොවියන්ට වන්දි ගෙවූ බව ය. නමුත්, මොවුන් තමන්ගේ ගොවිතැනට කුඩා භූමි භාගයක් වත් නැතිව වෙනත් ජීවන මාර්ගයක් ද නැතිව ජීවත් වීමට වෙර දරති. කාර්මීකරණය වූ ගොවිපලවල් නිසා ගොවියාට භූමියක් පමණක් නොව රැකියා අවස්ථා ද අහිමි වී ඇත. ඔවුන්ට කම්කරුවන් ලෙස නගරයට ගොස් පැල්පත්වල අභියෝග රාශියකට මුහුණ දෙමින් ජීවත් වීමට සිදුව ඇත්තේ ද මේ නිසා වෙනි. ජාන වෙනස් කරන ලද බෝග වලට යොදන අධික රසායනික පොහොර සහ පළිබෝධනාශක, වල්නාශක නිසා මෙම වගාබිම් අවට ජනතාවගේ සෞඛ්‍යය තත්වය ද ඉතා පහළය. ශාරීරික අබාධ සහිත දරු උපත් ද, ශ්වසන රෝග ද ඉතා සුලබය. වකුගඩු රෝගීන් ද, පිළිකා රෝගීන් ද එමටය. මේ සියලු කම්කටුලු මැද වුව ද ලෝක ආහාර අවශ්‍යතාවට මහා පරිමාණ ගොවිපලවල් වලින් ලැබෙන දායකත්වය 30%කි. එයින් 70%ක්ම සත්ව ආහාර සහ බලශක්ති නිෂ්පාදනයටයි. අදටත් ලෝක ආහාර අවශ්‍යතාවය මූලික ලෙස සපුරා ගන්නේ කුඩා ගොවිපලවල් හරහාය.

## ● විනාශයේ ස්වරූපය

මොන්සැන්ටෝ වැනි බහු ජාතික සමාගම් නිපදවන කෘෂි ආදේශ තවමත් ලොව පුරාම විකිණේ. කෙතරම්ද යත්, 2024 වන විට US ඩොලර් බිලියන 12 ක වටිනාකමින් යුතු ප්‍රමාණයක රවුන්ඩ්අප් නමැති වල්නාශකය පමණක් විකිණිය හැකි බව ට නිව්යෝක් ටයිම්ස් පුවත්පත අනාවැකි කියයි. මෙහි ඇති ප්‍රධාන රසායනිකය ග්ලයිෆොසේට් පිළිකාකාරක බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාත්‍යන්තර පර්යේෂණ ආයතන මගින් තහවුරු කර ඇතත් මෙය තවම මහා පරිමාණයෙන් විකිණෙමින් පවතී. ඖෂධ සමාගමක් වන බේයර් සමාගම 2018 දී ඇ. ඩො. බි. 63කට පිළිකාකාරක ග්ලයිපොසේට් නිෂ්පාදනය කරන මොන්සැන්ටෝ ආයතනය මිලදී ගන්නේ එම ආයතනයට නඩු 125,000ක් ද තිබිය දීය. දැන් එකම සමාගමකට පළමුව කෘෂිකාර්මික රසායනික ආදේශ විකුණා, පසුව සෞඛ්‍යය අංශයට ඖෂධ විකිණීමට හැක. මෙය මනුෂ්‍යත්වයට කෙරෙන ඉහළම උපහාසයයි.

ශ්‍රී ලංකාව ග්ලයිෆොසේට් තහනම් කළ රටවල් කිහිපය අතරින් එකකි. ලංකාවේ විශේෂයෙන්ම වියළි කලාපයේ ගොවීන් අතර පැතිර ඇති නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධව කළ පර්යේෂණ වල ප්‍රතිඵල වලින් පසුව රජය, ග්ලයිෆොසේට් තහනම් කිරීමට තීරණය කිරීම අප රට ලද ජයග්‍රහණයකි.

අද වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රසායනික පොහොර සම්පූර්ණයෙන්ම තහනම් කිරීමට ගත් තීරණය ඉතා කාලෝචිත සහ දූරදර්ශීය. මෙය ලොව පුරා ඇති කෘෂි ත්‍රස්තවාදයට එරෙහිව ගත් නිර්භීත තීරණයකි. එම තීරණය ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස අප සියලු දෙනා එක්ව අගය කළ යුතු කාර්යයකි. රටක, ජාතියක පැවැත්ම රඳා පවතින්නේ රාජ්‍ය නායකයන් විසින් ගන්නා මෙවන් බුද්ධිමත් තීරණ මතය. නමුත් මෙය සාර්ථකත්වය කරා ගෙන යෑමට නම්, මෙහි වගකීම සියලු දෙනාම කරට ගත යුතුයි.

බොහෝ විශේෂඥයින්ගේ දැනුමට අනුව, ලොව පැවැත්ම රඳා පවතින්නේ ජෛව විවිධත්වය මතයි. ගැඩවිලාගේ සිට මී මැස්සා දක්වාද ඇති ජෛව විවිධත්වය රැක ගත හැක්කේ කාබනික යෙදවුම් වලට පමණක් සීමා වූ පසෙහි ජීවය රැක ගත හැකි පරිසර හිතකාමී ගොවිතැනින්මය. පරිසර පද්ධතියම රැකගත හැකි වන්නේ කාබනික ගොවිතැනෙනි. කාබනික යෙදවුම් සහිත පසෙහි පෝෂ්‍යපදාර්ථ වෙනත් පසක පෝෂ්‍යපදාර්ථ වලට වඩා 60 % කින් වැඩි බව අධ්‍යයන වලින් අනාවරණය වී ඇත.

“ බොහෝ විශේෂඥයින්ගේ දැනුමට අනුව, ලොව පැවැත්ම රඳා පවතින්නේ ජෛව විවිධත්වය මතයි. ගැඩවිලාගේ සිට මී මැස්සා දක්වාද ඇති ජෛව විවිධත්වය රැක ගත හැක්කේ කාබනික යෙදවුම් වලට පමණක් සීමා වූ පසෙහි ජීවය රැක ගත හැකි පරිසර හිතකාමී ගොවිතැනින්මය. ”

ආචාර්ය වන්දනා ශිවා පරිසර හිතකාමී කාබනික වගාව ලොව ප්‍රචලිත කිරීමට බොහෝ වෙහෙසක් ගන්නීය. භෞතික විද්‍යා ආචාර්ය උපාධිධාරිනියක් වන ඇයගේම ගොවිබිම් හරහා කරන ලද පර්යේෂණ වලට අනුව කාබනික යෙදවුම් සහිත පසෙහි නයිට්‍රජන් ප්‍රමාණය 44% සිට 147% දක්වා වැඩිවී ඇති බව ද රසායනික යෙදවුම් වලදී නයිට්‍රජන් 22%කින් අඩු වී ඇති බවද සොයාගෙන ඇත. ඇය ප්‍රකාශ කරන්නේ රසායනික පොහොර හරහා නයිට්‍රජන් එකතු කරන විට පසෙහි හටගන්නා ස්වභාවික නයිට්‍රජන් ප්‍රමාණය අඩුවන බවය. කාබනික ගොවිතැනේ දී පොස්පරස් 63%කින්ද පොටෑසියම් 34% කින් ද සින්ක් 14%කින් වැඩි වී ඇති බව ඇය පර්යේෂණවලින් පෙන්වා දෙයි.

## ● අතීතයේ ආදර්ශ

පැළයක වර්ධනය රඳා පවතින්නේ පසෙහි සජීවීවත් බව මතයි. පස පොහොසත් කරන්නේ එහි සිටින ක්ෂුද්‍ර ජීවින්ය. රසායනික පොහොර ඉල්ලා අඩන ගොවියා මහපොළොවට යූරියා ඉසින විට පස සාරවත් කරන ක්ෂුද්‍ර ජීවීන් සියල්ල විනාශ වන බව ඔහු නොදන්නේ ද? පස මරා දමමින් නැවත නැවත ආදේශක යොදමින් කරන ගොවිතැනට පැවැත්මක් නැත. ආහාර සුරක්ෂිතභාවය යනු පසෙහි සුරක්ෂිතභාවයයි. අපේ මුතුන් මිත්තන් පමණක් නොව සියලුම පැරණි ශිෂ්ටාචාරයන් පස දේවත්වයෙන් සැලකුයේ මෙය තේරුම් ගෙනය.

එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයට (Food and Agriculture Organization-FAO) අනුව පසුගිය වසර වනවිට ලෝකයේ මුළු ජනගහනයෙන් 8.9%ක් මන්ද පෝෂණයෙන් පෙළෙන අයය. බිලියන දෙකකට අධික ප්‍රමාණයකට ආහාර සුරක්ෂිතභාවය නැත්තේය. කෘෂි කර්මාන්තයේ යෙදී සිටින අයගෙන් මිලියන 700ක් අධික දුප්පත්කමින් පෙළෙන අයය. එසේම කාලගුණික විපර්යාසයන්ට ප්‍රධාන හේතුව වන ගෝලීය හරිතාගාර වායු විමෝචනයෙන් 30%ක්ම සිදුවන්නේ කාර්මීකරණය වූ කෘෂිකර්මාන්තය නිසාවෙනි. මෙම දත්ත වලට අනුව මහා පරිමාණයේ ගොවිබිම් හරහා ලොවෙහි ආහාර සුරක්ෂිතභාවය හෝ පරිසරය රැක ගැනීමට නොහැකි වී ඇති බව සක් සුදක් සේ පැහැදිලිය.

## ● ගොවි ප්‍රබෝධය

FAO ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් කියු ඩොංග්යු මැතිතුමා පසුගිය මැයි 25 වන දින පැවැත්වූ ලෝක නායකයන්ගේ සම්මේලනයේ දී ප්‍රකාශ කර සිටියේ ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම, සොබාදහමත් සමග නොගැටී ජීවත් වීම, ස්වභාවධර්මය සහ මානවයා අතර සහජීවනය සියලු දෙනාගේම වගකීම බවත් ය. ඔවුන් මෙම ප්‍රතිපත්තීන් “අප විසඳුමේ කොටස්කරුවන්ය” යන තේමාව යටතේ ප්‍රචලිත කිරීමට කටයුතු කරයි. ජෛව විවිධත්වය හරහා සිදුවන පාරිසරික ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය මගින් කුසගින්න, ආහාර අහේනිය සහ මන්දපෝෂණයට ඇති විසඳුම් පමණක් නොව කාලගුණික විපර්යාසයන් අවම කිරීමටද, ජලය සහ පස සංරක්ෂණය කිරීමටද ඇති විසඳුම වේ. ජෛව විවිධත්වය පාරිසරික ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හෝ කාබනික යෙදවුම් සහිත කෘෂිකර්මාන්තය හරහා කුඩා ගොවිබිම්වල විවිධ බෝග වර්ග වරින් වර වගාකර ලබාගන්නා අස්වැන්න ඒක වර්ග බෝගයකින් ලබා ගන්නා අස්වැන්නට වඩා ප්‍රමාණයෙන් පමණක් නොව පෝෂණයෙන් ද වැඩිය. මෙමඟින් අඩු වියදමකින් වැඩි ආදායමක් ද ලබාගත හැක.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පසුගිය මහ කන්නයේ කරන ලද පරිසර හිතකාමී ගොවිතැන හරහා අක්කරයකට අස්වැන්න වී බුසල් 73ත් 108ත් අතර ප්‍රමාණයක් ලබාගැනීමට හැකිවූ අතර පොහොර සහ කෘෂි විකර්ශක ඇතුළුව වියදම් වූ මුළු මුදලම රු.9000කට සීමා විය. ගොවියකුට පොහොර සහනාධාරය ද ඇතුළුව රසායනික පොහොර හා අනෙකුත් ආදේශකයන් වලට යන මුදල රු.29000ක් පමණ වන අතර එම වී කිලෝවක් රජය මිලට ගත්තේ රු.50කට ය. කාබනික වී කිලෝවකට රු.100ක් වැනි අධික මුදලකට විකිණීමට හැකිවූ බවද ගොවියෝ පවසති. මෙම ක්‍රමවේදය යටතේ පාරම්පරික වී වඩාත් හොඳ ප්‍රතිඵල ලබා දුන් බවද අපි දනිමු. එසේම, මෙම ගොවිතැනින් පස, ජලය, ගොයම සහ අවට වාතය පමණක් නොව ක්ෂුද්‍ර ජීවීන්ද, ගොවිතැනට හිතකර කුඩා කෘමීන් වර්ගද ආරක්ෂා වන නිසා ස්වාභාවික ජීව චක්‍රය මගින් ගොයමට හානි කරන කීඩව ද මර්දනය විය.

වී ගොවිතැන සම්පූර්ණ පරිසර හිතකාමී රසායනික පොහොර සහ ආදේශකයන් වලින් තොර ගොවිතැනක් බවට පත්කිරීම අභියෝගාත්මක වුවද මෙය ජයගත හැකි අභියෝගයකි. වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මගින් ඉදිරිපත් කර ඇති දත්තවලට අනුව මහ කන්නයට හෙක්ටයාර් 560,000 සහ යල කන්නයට හෙක්ටයාර් 310,000ක කුඹුරු වගා කරයි. මෙමගින් අවුරුද්දකට කිලෝ මිලියන 2.7 ක හාල් ප්‍රමාණයක අස්වැන්න ලබා ගැනීමට හැකිවී ඇත. ඒකපුද්ගල හාල් පරිභෝජනය අවුරුද්දකට කිලෝ 100ක ප්‍රමාණයක් වන අතර මෙය කිසිම ආකාරයකින් අඩු නොකිරීමේ වගකීමද අප මුහුණ දෙන අභියෝග වලින් එකකි. අද වෙළඳපොළේ පාරම්පරික සහල් රු.250ත් රු.500ත් අතර මිලකට දැකිය හැක. නමුත් අපගේ අභිප්‍රාය වනුයේ කාබනික පොහොර යොදා පරිසර හිතාකාමී ලෙස පාරම්පරික සහල් රටේ සාමාන්‍ය ජනතාවටද මිළදී ගත හැකි වන පරිදි මෙහි අස්වැන්න වැඩි දියුණු කිරීමය. එමනිසා නැවත වතාවක් අපගේ බීජ ගොවිපළවල් ශක්තිමත් කරමින් ආනයනික බීජ සහ ජාන විකෘති කළ බීජ ක්‍රමයෙන් අපගේ ගොවිබිම් වලින් ඉවත් කිරීමටද ක්‍රියාමාර්ග ගත යුතුය. මේ හරහා විශාල විදේශ විනිමයක් ද ඉතිරි කර ගත හැකිය.

නිවැරදි ජල කළමනාකරණය, මෙම අභියෝග ජය ගැනීමට ඇති ප්‍රධානම අංගයක් බව පරිසර හිතකාමී කෘෂි විශේෂඥයෝ පවසා සිටිති. කන්න දෙක අතරට රනිල බෝග වගාව හරහා පස සාරවත් වනවා පමණක් නොව වඩා පෝෂ්‍යදායී ආහාර ආදේශකයන් අපගේ ආහාර පද්ධතියට එකතු කර ගැනීමටද හැකිවේ. ජෛව විවිධත්වය පරිසර පද්ධතිය ආරක්ෂා කරනවා සේම විවිධත්වයෙන් යුතු ආහාර ලබාගැනීමේ පෝෂ්‍ය ඵලදායිතාව, සෞඛ්‍ය සුරක්ෂිත භාවය වැඩිකරගත හැකි බවද විද්‍යාඥයෝ පවසති.

ලංකාවේ වී නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක වගා කරන නැගෙනහිර පළාතේ ගොවියා, රසායනික පොහොර තහනම ඔහු ලැබූ ජයග්‍රහණයක් ලෙස සිතන බව මම හොඳින් දනිමි. ඔවුන්ට අවශ්‍ය වන්නේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මූල්‍යමය ශක්තිය හා බිත්තර වී පහසුවෙන් ලබාගත හැකි ක්‍රමවේදයක්ය. ගව පට්ටි හිමි ගොවියාට පහසුවෙන්ම ඔවුන්ට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය කරගත හැක. එබැවින් ගව සම්පතද ආරක්ෂා කර ගනිමින් එයද ගොවිතැනෙහි කොටසක් බවට පත් කර ගැනීමට හැකිවේ. ගෙවතු වගාවද තවතවත් දිරිමත් කිරීමට මෙය අවස්ථාවක් කර ගත යුතුය. මෙමගින් රටේ ආහාර සුරක්ෂිත භාවය ශක්තිමත් වන අතර, ගෙවතු වගාව ආර්ථිකයට සහ පරිසරයට වන දායකත්වය අවතක්සේරු නොකර මෙයද අපේ රටේ තිරසාර සංවර්ධනයෙහි අංගයක් බවට පත් කළ යුතුය.

දුප්පත්කමින් පමණක් නොව වකුගඩු රෝගයෙන් ද පීඩා විඳින ගොවිජනතාවට පරිසර හිතකාමී ගොවිතැන අස්වැසිල්ලක් වනු බව නොඅනුමානය. රසායනික පොහොර ආනයනය නවතා ඇ.ඩො. මිලියන 400කට ආසන්න ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට රජයට හැකි වුවද කාබනික පොහොර ආනයනය කළ හොත් මෙම ඉතිරිවන මුදල රටේ නිෂ්පාදන ක්‍රියාවලියට එක් කිරීමට ලැබෙන ස්වර්ණමය අවස්ථාව මග හැරී යනු ඇත.එබැවින් හැකිතරම් කුඩා ගොවිබිම් වලට ඔවුන්ගේම කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබාදීමට ප්‍රමුඛතාවය දිය යුතුය.

## ● ජාත්‍යන්තර මැදිහත්වීම

අන්තර්ජාතික කාබනික කෘෂිකාර්මික සම්මේලනයට (International Federation of Organic Agriculture Movements - IFOAM) අනුව ලෝකයේ හෙක්ටයාර් මිලියන 37.2ක් කාබනික කෘෂි වගාවහි යෙදේ. මෙයින් වැඩිපුර කාබනික කෘෂි වගා භූමි ඇත්තේ ඕස්ට්‍රේලියාව, ආජන්ටිනාව සහ ඇමෙරිකාවටයි. ලෝකයේ සෑම රටක්ම ආහාර සුරක්ෂිතභාවය පවත්වා ගැනීමට වසවිසෙන් තොර ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට යොමුවෙමින් පවතී. ඔවුන් විශ්වාස කරනුයේ කුඩා ගොවිපළවල් හරහා විවිධ භෝග වර්ග වරින්වර පැළ කිරීම වඩාත් දියුණු කෘෂි තාක්ෂණයක් ලෙසයි.

අන් සියල්ලම මෙන් කෘෂිකර්මාන්තය ද පරිණාමය වෙමින් පවතී. ලෝකයේ සෑම රටක් ම පරිසර හිතකාමී කෘෂි කර්මාන්තයට ක්‍රමක්‍රමයෙන් යොමු වෙමින් සිටින අවස්ථාවක ශ්‍රී ලංකාව ම පරිසර හිතකාමී, තිරසාර ගොවිතැන හරහා ලොව වසවිසෙන් තොර පළමුවන රට වීමට ලැබී ඇති මෙම අනගි අවස්ථාව සියලු දෙනාම එක්වී යථාර්ථයක් බවට පත්කර ගැනීමට උත්සුක වෙමු. මෙය සියළු ශ්‍රී ලාංකිකයන්ගේම යුතුකම කි.

**අනුරාධා යහම්පත්**
**ආණ්ඩුකාරවර**
**නැගෙනහිර පළාත**




# ඔන්ලයින් කාර්යාල සහ ඔෆ්ලයින් ජීවිත සටන්

වසංගතය විසින් මිනිසුන්ට පෙර නොවී විරූ දේ නිහඬවම උගන්වමින් සිටියි. කාර්යාලීය වැඩ ඔන්ලයින් කිරීමට උගැනීම ඉන් ප්‍රධානය. ඔන්ලයින් ඉගෙනුම අනෙක් පසින් ඉදිරියෙන්ම සිටිනු දැකිය හැකිය. කාර්යාලීය වැඩ කටයුතු ඔන්ලයින් කිරීම යනු කලකට පෙර අපේ රටේ පොදු ජනතාවට බොහෝ ඈතින් තිබූ සංකල්පයකි. සියල්ල සේවා ස්ථානයේදී කිරීමට පුරුදු පුහුණුව සිටි බහුතරයක් ලාංකික ප්‍රජාව ඔන්ලයින් වැඩ කටයුතු කෙරෙහි දැක්වූයේ ඇල්මැරුණු ප්‍රතිචාරයකි. එසේත් නැත්නම් සැක සහිත ස්වභාවයකි. කාලාන්තරයක් මුළුල්ලේ සාම්ප්‍රදායික ක්‍රමවලට අනුගතව වැඩ කටයුතු කිරීමේ අධික ඇල්මත්, ඇබ්බැහියත් මේ ඔන්ලයින් වැඩ කටයුතු බැහැර කිරීමට තවත් හේතු සාධකයක් වූවා විය හැකිය.

මීට අමතරව තවත් අවශේෂ හේතු සාධක රාශියක් තිබිය හැකිය. ශ්‍රී ලංකාවේ දැනට භාවිත වන අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් දරන්නට සිදු වන අධික වියදම තවත් කරුණක් ලෙස මතු කර පෙන්විය හැකිය. උපයන අදායමට සාපේක්ෂව අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් මාසිකව දරන්නට සිදු වන මුදල පිළිබඳ දෙවරක් සිතා බැලීමට බොහෝ මධ්‍යම පාන්තිකයන්ට පවා සිදුව ඇත. මේ හේතු බොහොමයක් හේතුවෙන් ඔන්ලයින් රැකියා කටයුතු කිරීමට අපේ රටේ බොහෝ දෙනෙක් තුළ එතරම් මනාපයක් නොතිබුණි.

එහෙත් සියල්ල උඩු යටිකුරු කරමින් කොරෝනා වසංගතය මුළු ලෝකයම වෙළා ගති. අතොරක් රටවල් පොළොවටම සමතලා කර දමන්නට තරම් චණ්ඩ වූ මේ වසංගතයෙන් යන්තමින් හිස ඔසවා ගැනීමට සමත් වූයේ රටවල් කිහිපයක් පමණි. සංචරණ සීමා සහ ඇඳිරි නීතිය ආදිය පැනවීම හේතුවෙන් මහජනතාවට නිවෙසට වී සිටීමට ඉබේම සිදු විය. ඔන්ලයින් ආකාරයෙන් කාර්යාලීය වැඩ කටයුතු කිරීමට කෙසේ හෝ හුරු වීමට සිදු වූයේ ඊටත් පසුවය. බලාපොරොත්තු රහිත ලෙස අපේ රටේ වැඩි පිරිසක් ඔන්ලයින් වැඩ කිරීමට ඉතා ඉක්මනින් හුරු පුරුදු විය. බොහෝ විට ඊට බලපාන්නට ඇත්තේ වෙනත් විකල්පයක් නැති වීම සහ වසංගතය කෙරෙහි බල පැවැත්වූ අධික භීතියයි. අන්තර්ජාලගත නුහුරුභාවය ක්‍රම ක්‍රමයෙන් දුරු වන්නට පටන් ගත් මුත් ඊට සාපේක්ෂව තවත් ගැටලු රාශියක් ද පැන නඟින්නට පටන් ගති. දුර්වල අන්තර්ජාල සබඳතාව මේ අනපේක්ෂිත ගැටලු අතර මුල් තැනක් ගෙන තිබුණි. එමෙන්ම පෙර ගෙවුම් සබඳතා සහිතව අන්තර්ජාලය පරිහරණය කළ අයට තම ගිණුම්වලට අදාළ ඩේටා පහසුකම් සපයා ගැනීමේ අපහසුතා ද පැවතුණි.

යළිත් මේ වෙනුවෙන් පෙනී සිටියේ අන්තර්ජාල සේවා සපයන ඇප් සහ ඔන්ලයින් බැංකු කටයුතු කරන ඇප් ආදියයි. අන් කිසිඳු විකල්පයක් නොමැති විට කෙතරම් අපහසු වුවත් ආසන්නතම පිළිතුරට ළඟා වීමේ සහජ වුවමනාව මේ සඳහා බලපාන්නට ඇත. එහෙත් අපේ රටේ සියලු සේවා සපයන ආයතන, රාජ්‍ය ආයතන ආදිය තම සේවා සැපයුම් ඔන්ලයින් ක්‍රමයට සකස් කර නොමැති නිසා සියල්ල පෙර පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ පැවතියා යැයි කිව නොහැකිය. එහෙයින් අතොරක් සේවා සැපයුම් අකර්මණ්‍යව පැවතුණි.

ඉන් උගත යුතු පාඩම තවත් අනාගත ව්‍යසන සඳහා අප දැන්ම සිට සූදානම් විය යුතු බව නොවේද? දින දින දියුණු වෙමින් පවතින ලෝකය ඇතුළත අපට පමණක් සාම්ප්‍රදායික ලිපිගොනු සමඟ ගැටෙන ක්‍රමයෙන් අඩියක් උඩට තැබීමට උත්සාහ කළ යුතු බව නොවේද? බොහෝ දේ ඩිජිටල් වීමට පටන් ගෙන ඇති වටපිටාවක තොරතුරු ගොනු ඩිජිටල් කළ යුතු බව නොවේද? අදාළ කාර්ය ඉෂ්ට කරවා ගැනීමට නම් යම් ස්ථානයකටම යෑමට අවශ්‍ය නොවන ආකාරයෙන් සේවා සැපයීමේ ක්‍රියාවලිය සැකසීම නොවේද? ස්වයං සේවා ලබා ගත හැකි ආකාරයේ කුඩා මැෂින් නොයෙක් තැන්වල ස්ථාපනය කිරීමේ වටිනා වැඩපිළිවෙළක් පසුගිය කාලය පුරා ක්‍රියාත්මක වනු දැකිය හැකි විය. එමෙන්ම රැකියා ස්ථානවල සේවයකයන්ට ඔන්ලයින් වැඩ කටයුතු කිරීම කෙරෙහි උනන්දු කිරීම සේම ඔවුන්ට ඒ වැඩ කටයුතු පහසු කිරීම ද කළ හැකිය. සේවකයා අත ද යම් වැඩ කොටසක් ඉතිරිව ඇත. ඒ තමන් ස්වේච්ඡාවෙන්ම යම් යම් දේ උගැනීමය. ගැටලු සොයා ඒවාට විසඳුම් ලබා ගත හැකි මාර්ග සොයා බැලීමය.

ෆින්ලන්ත විශ්වවිද්‍යාලයේ ඩිජිටල් නාමිකයන් පිළිබඳ අධ්‍යයනය ආචාර්ය ඕල්ගා හැනොනන් පවසන ආකාරයට "මිනිසුන් ජීවත් වන්නේ තමන් වැඩ කරන තැන නොව ඔවුන් ජීවත් වන ස්ථානයේය." රාජකාරි ස්ථානය සුව පහසුම ස්ථානය නොවන හෙයින් සේවකයන් කැමැත්තෙන් රාජකාරි කටයුතු සිදු නොකරන බව මෙහි යටි අදහසයි. එහෙත් නිවෙසේ සිට රාජකාරි කටයුතු කිරීමේදී ඒ තත්ත්වය උඩු යටිකුරු වී ඇත. සුව පහසුව සහ වේලාව කළමනාකරණය කර ගැනීමේ නිෂේධ බලය තමන්ට හිමි වන නිසා නිවෙසේ සිට රාජකාරි කිරීමට බහුතරයක් රුචිය.

එහෙත් ශ්‍රී ලාංකිකයන් හට මේ සියලු දෑ හිමිව ඇතිද? යන්න ඊළඟට විමසා බැලිය යුතු කාරණයයි. අඩු පහසුකම් යටතේ වැඩ කටයුතු කරන සේවකයන් ආශ්‍රයෙන් මේ තත්ත්වය වෙනස්ය. එහෙත් පවතින වසංගතයෙන් ගැලවී සිටීමට නිවෙසේ සිට වැඩ කරන්නට හැකි වීම විශාල ආශිර්වාදයකි. වසංගතයෙන් ගැලවී සිටිනවාට අමතරව සුපුරුදු ලෙස කාර්යාලීය වැඩ කටයුතු කෙරෙනවාදැයි සිතා බැලීම අනෙක් කාර්යයි. ඔන්ලයින් වැඩ කිරීමේ සියලු ධනාත්මක දේ ඒ අයුරින්ම ඔබ විසින් උකහා ගන්නවාදැයි සිතා බැලීම ඊළඟ කාරණයයි.

වෙනත් රටවල මෙන් පහසුකම් බහුල නොවූවත්, අධිවේගී අන්තර්ජාල පහසුකම් නොමැති වුවත් කළ හැකි සියල්ල ඔබ කරනවාදැයි විමසා බැලිය යුතුය. එමෙන්ම අපට බලපාන ගැටලු මොනවාද ඒ වෙනුවෙන් පෙනෙන්නට තිබෙන විකල්ප මොනවාදැයි ඉන් පසුව විමසා බැලිය යුතුය. මන්දයත් පෙර පුරුදු කාර්යාලීය ජීවිතයට අපට ඒ ආකාරයෙන්ම නැවත ළඟා විය නොහැකි බැවිනි. ලෝකයේ බොහෝ රටවල් මේ වන විට කතාබහ කරමින් සිටින්නේ දැවැන්ත ඔන්ලයින් වැඩ සංස්කෘතියක් පිළිබඳය. ඒ වෙනුවෙන් නොයෙකුත් ස්ථාන පවා දැන් තැනෙමින් පවතී.

කොස්ටරිකාවේ වසන්නකු සුව පහසු හැමොකයක ගිලී එක් අතකින් බීම වීදුරුවක් ගෙන උකුල මත ලැප්ටොප් පරිගණකයක් තබාගෙන තම ඉන්ස්ටග්‍රෑම් ගිණුමට ඒ පින්තූරය උඩුගත කරන්නේ 'අද දවසේ මගේ කාර්යාලය' නම් මාතෘකාව යොදමිනි. මේ අපට බොහෝ ඈතින් ඇති යථාර්ථයකි. ලෝකය එතරම් ලක ලැහැස්තියකින් ඔන්ලයින් කාර්යාල තනාගෙන වැඩ කරන විට ඒ සම්බන්ධයෙන් අපට ඇති වැඩසටහන හෝ ඉලක්කය කුමක්දැයි මදක් සිතා බැලිය යුතුය. ඔන්ලයින් අවකාශයක සියලු වැඩ කටයුතු කෙරෙන නව සාමාන්‍යයේ දවසක් අපට ද උදා කර ගත හැකිය. එහෙත් ඒ වෙනුවෙන් අද පටන් වැඩ කටයුතු කළ යුතුය. සේවා සැපයුම් සියල්ල අන්තර්ජාලගත කිරීමට උත්සාහ කිරීම ඊට කදිම පෙර සූදානමකි. ඒ වෙනුවෙන් උපකාර දීමට, අවශ්‍ය දැනුම දීමට සැදී පැහැදී සිටින තරුණ තාක්ෂණවේදීන් අපේ රටේ බහුලය. නව නිපැයුම්කරුවන් අපේ රටේ බහුලය. ඔවුන් තනන්නට බලාපොරොත්තු වන අලුත් දෑ කෙරෙහි විශ්වාසය තැබීමෙන් අපට නව අනාගතයකට දොරටුවක් විවර වනවා හැරෙන්නට සිදු විය හැකි අවැඩක් නැත.

අතොරක් සමාගම් මේ නව සාමාන්‍යයේ කාර්යාල වැඩ කිරීමටම තැනූ අවකාශ ගැනද මදක් සොයා බැලීම වටී. ඒ අතර Airbnb යනු එවන් ඔන්ලයින් අවකාශ කුලියට දෙන ආයතනයකි. මේවා වෙරළ ආසන්නයේ කොටේජ් වශයෙන් හෝ සුවපහසු කාර්යාල ලෙස සකසා ඇත. මාසිකව කුලියක් ගෙවා මෙකී අවකාශ වෙන් කරවා ගත හැකිය. පුද්ගල දුරස්ථභාවය සියයට සියයක්ම ආරක්ෂා කරන මේ ස්ථාන වඩා ජනප්‍රිය වන බව එම සමාගමේ අදහසයි. විශේෂයෙන්ම වනාන්තර ආශ්‍රයේ තැනෙන කුඩා කැබින් ආදියට වැඩි ඉල්ලුමක් පැවතිය හැකි බවට එම සමාගම පවසා ඇත. එහෙත් වසංගතයෙන් පසුව මේ සියල්ල කෙසේ ක්‍රියාත්මක වනු ඇතිද? වසංගතය සැබැවින්ම නිම වේද? නිවෙසේ හිරවී සිටීමට අකමැති පුද්ගලයන්ට අධික මුදලක් ගෙවා මෙවන් සැප කොටේජ වෙත ප්‍රවිෂ්ඨ වීමට හැකි වුවත් සෙස්සන්ගේ තත්ත්වය කුමක් වනු ඇතිද? ගැටලු සහසකි.

**කාංචනා අම්ලානි**

# ඉන්ධන මිල ඉහළ දැමීමට දෙජාස විරෝධය

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

රජය විසින් ඉන්ධන මිල ඉහළ දැමීම නිසා ගොවීන් ධීවරයන් හා ගම්බද ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව සිටින නිසා රජය ඉන්ධන මිල ඉහළ දැමීම සම්බන්ධයෙන් දෙමළ ජාතික සන්ධානය විරෝධය පළ කොට සිටින බව එහි නායක ආර්.සම්පන්ධන් මන්ත්‍රීවරයා 21 දා පැවසීය.

ඉන්ධන මිල වැඩි කිරීම නිසා ඇති වී තිබෙන ගැටලු පිළිබඳ මාධ්‍යවේදීන් දෙමළ ජාතික සන්ධානයේ අදහස් විමසූ අවස්ථාවේදී සම්පන්ධන් මන්ත්‍රීවරයා මේ බව කියා සිටියේය.

මන්ත්‍රීවරයා මෙසේද පැවසීය.

"ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව සිටින අවස්ථාවක රජය ඉන්ධන මිල ඉහළ දැමීම පිළිබඳ අපි ඉතාම කනගාටු වෙනවා. ඒ වගේම අපි අපේ පක්ෂයේ විරුද්ධත්වයත් පළකොට සිටිනවා.

ඉන්ධන මිල ඉහළ යාම නිසා පීඩාවට පත්ව සිටින්නේ ගම්බද ජනතාව ගොවීන් හා ධීවරයිනුයි. මේ ගැන අපි රජයට කරුණු ඉදිරිපත් කොට ඒ පිරිසට යම් සහනයක් ලබා දීමට කටයුතු කරන මෙන් දැනටමත් ඉල්ලීමක් සිදු කොට තිබෙනවා.

ඉන්ධන මිල ඉහළ දැමීම සම්බන්ධයෙන් උදය ගම්මන්පිල අමාත්‍යවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමට විපක්ෂයේ පිරිසක් උත්සහ කරනවා. මේ සඳහා දෙමළ ජාතික සන්ධානයේ සහයෝගය ඉල්ලා තිබෙනවා. නමුත් දෙමළ ජාතික සන්ධානය මේ සම්බන්ධයෙන් තවම තීරණයක් ගෙන නැහැ.

පාර්ලිමේන්තුවේදී අපි මේ ගැන සාකච්ඡා කිරීමට තීරණය කළා. අපේ මන්ත්‍රීවරු සියලු දෙනා සමග සාකච්ඡා කිරීමෙන් පසුව දෙමළ ජාතික සන්ධානය උදය ගම්මන්පිල ඇමැතිවරයාට එරෙහිව ඉදිරිපත් වන විශ්වාසභංග යෝජනාවට සහය දෙනවද නැද්ද කියන කාරණය පිළිබඳ අපි තීන්දුවකට එනවා ."

# රියැදුරු බලපත්‍ර මුද්‍රණය හමුදාවට පැවරීමෙන් මසකට කෝටි 10ක් ඉතිරියි

**ශිරාන් රණසිංහ**

රියැදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කටයුතු යුද හමුදාවට පවරා දීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගත් තීරණය නිසා මෙතෙක් කලක් පෞද්ගලික සමාගමකට නිරපරාදේ මාසිකව ගෙවූ රුපියල් කෝටි 14කට අධික මුදල නතර කර එම කටයුත්ත රුපියල් කෝටි හතරකින් ඉටුකරගැනීමට හැකිවී ඇතැයි රජයේ විගණන නිලධාරීහු 'දිනමිණ'ට හෙළි කර සිටිති.

චිපය සහිත රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කොන්ත්‍රාත්තුව 2009 වසරේ දී පුද්ගලික සමාගමට පවරා දී තිබූ අතර එම ගිවිසුම් කාල සීමාව 2016 වසරේදී නිම කර එම කටයුත්ත මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවට පවරා දීමට නියමිතව තිබිණි.

ජීපීඑස් සහිත රියැදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ දී එකී සමාගම එක් රියැදුරු බල පත්‍රයක් මුද්‍රණය කිරීම සඳහා රුපියල් 1571ක මුදලක් අය කළ අතර මේ වන විට යුද හමුදාව ඒ සඳහා අය කරන්නේ රුපියල් හාරසිය පනහක් වැනි මුදලක් බව ද රජයේ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීහු කියා සිටිති.

# ලේක්හවුස් ප්‍රවාහන අංශයේ ඩබ්. ඩබ්. පියදාස අභාවප්‍රාප්ත විය



වසර පනහකට ආසන්න කාලයක් ලේක්හවුස් ආයතනයේ ප්‍රවාහන අංශයේ සේවය කළ ඩබ්ලිව්. ඩබ්ලිව්. පියදාස මහතා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ අවසන් කටයුතු පසුව දැනුම් දෙනු ලැබේ. දුරකතන අංකය 071-7865763. ලිපිනය උතුර ගල්වත්ත, ඒකල.

# අකුරැස්ස හිටපු සභාපතිගේ ප්‍රතිශෝධන පෙත්සමට කරුණු දක්වන්න නීතිපතිට නොතීසි

**නෙල්කා මැදගෙදර**

බාලවයස්කාර දැරියක් දූෂණය කරන ලදැයි චෝදනාවට කොළඹ මහාධිකරණයෙන් බරපතළ වැඩසහිත වසර 15ක සිරදඬුවම් ලැබ සිටින අකුරැස්ස ප්‍රදේශීය සභාවේ හිටපු සභාපති සාරුව ලියනගේ සුනිල් නමැත්තා ඇපමත මුදා හරින ලෙස ඉල්ලා ගොනු කළ ප්‍රතිශෝධන පෙත්සම සම්බන්ධයෙන් කරුණු දැක්වීමට ජූලි 20 වැනිදා අධිකරණයේ පෙනී සිටින ලෙස නීතිපතිවරයාට දන්වා අභියාචනාධිකරණය විසින් ඊයේ (22) නොතීසි නිකුත් කර තිබේ.

මෙම පෙත්සම සලකා බැලූ මේනකා විජේසුන්දර සහ නීල් ඉද්දවෙළ යන මහත්ම මහත්මීන් ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ලක් විසින් මෙලෙස නොතීසි නිකුත් කර ඇත.

පෙත්සම සලකා බැලූ අවස්ථාවේ දී අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති වරයා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් කියා සිටියේ පෙත්සම්කාර චූදිත අතින් තමා දූෂණය නොවූ බවට අදාළ දැරිය විසින් මහාධිකරණ නඩු විභාගයේ දී ප්‍රකාශ කර ඇති බවය.

තම සේවාදායකයාට එරෙහිව නීතිපතිවරයා චෝදනා ඔප්පු කිරීම සඳහා වීඩියෝ සාක්ෂි ඉදිරිපත් කළත් එම වීඩියෝ සාක්ෂි තහවුරු කෙරෙන ස්වාධීන සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇතැයිද ජනාධිපති නීතිඥ ජයමාන්න මහතා අභියාචනාධිකරණය ට දන්වා තිබේ.

ඒ අනුව විත්තිකරු වරදකරු කිරීමට මහධිකරණය ගනු ලැබූ තීරණය නීතියට පටහැනි බවත් , මේ හේතුවෙන් අදාළ සිර දඬුවමට ඒරෙහිව තම සේවාදායකයා ගොනු කළ අභියාචනා පෙත්සම් විභාගය අවසන් වන තුරු ඔහුව ඇප මත මුදා හරින ලෙසත් ජනාධිපති නීතිඥ ජයමාන්න මහතා අධිකරණයෙන් ඉල්ලා ඇත.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල මෙම පෙත්සම විභාග කිරීමට අවසර දෙමින් ඒ වග උත්තරකරු ලෙස නම් කර සිටි නීතිපතිවරයා වෙත නොතීසි නිකුත් කිරීමට තීරණය කර තිබේ.

බාලවයස්කාර දැරියක් දූෂණය කිරීමේ චෝදනාවට වරදකරු කෙරුණු අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති සාරුව ලියනගේ සුනිල් මහතාට කොළඹ මහාධිකරණය විසින් බරපතල වැඩ සහිත වසර 15ක සිර දඬුවම් හා දඩ මුදල් නියම කරනු ලැබ ඇත..

එම දඬුවමට එරෙහිව ඔහු විසින් අභියාචනාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර ඇති බැවින් එම අභියාචන විභාග අවසන් තීන්දුව ප්‍රකාශයට පත් කරන තුරු තමාව ඇපමත මුදාහරින ලෙස ඉල්ලමින් අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් මෙම ප්‍රතිශෝධන පෙත්සම ගොනු කර ඇත.මෙහි වගඋත්තරකරු ලෙස නීතිපති නම් කර ඇත.

පෙත්සම්කාර හිටපු ප්‍රාදේශීය සභාපතිවරයා වෙනුවෙන් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න සහ නීතිඥ දර්ශන කුරුප්පු පෙනී සිටියේය.

# සහන දෙන්න බැරි නම් ඉල්ලා අස් වෙන්න

## සජිත් ප්‍රේමදාස

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස් සහ රුවන්ත නිතුල්ගස්පිටිය**

ඉන්ධන මිල අඩු කිරීම ඇතුළු ජනතා සහන වහාම ලබාදීමට නොහැකි නම් වත්මන් ආණ්ඩුව ඉල්ලා අස්විය යුතු බව සමඟි ජන බලවේගයේ නායක, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවැසීය.

ඉන්ධන මිල වැඩි කිරීමට එරෙහිව ඊයේ (22දා) සමඟි ජන බලවේගයේ මන්ත්‍රී කණ්ඩායම කොළඹදී පැවැත්වූ විරෝධතාවකට එක්වෙමින් විපක්ෂ නායකවරයා මේ බව සඳහන් කළේය.

රට සංවර්ධනය කර ජනතාවට සහන දීමට මූලිකත්වය දිය යුතු වුවද රජය ඒ කිසිවක් ගණනට නොගෙන ජනතාව පීඩාවට පත්කරමින් සිටීම කිසිසේත්ම අනුමත කළ නොහැකි බවද හෙතෙම කීය.

කොවිඩ් වසංගතය, පොහොර අර්බුදය, රැකියා ගැටලු සහ දරුවන්ගේ අධ්‍යාපනය අවහිර වීම ඔස්සේ සමස්ත ජනතාව පීඩාවට පත්ව සිටින පසුබිමක තෙල් මිලද වැඩි කිරීමෙන් ජනතාව අන්ත අසරණභාවයකට පත්ව ඇති බවද විපක්ෂ නායකවරයා පැවැසීය.

එන්නත්කරණ වැඩසටහනද ආණ්ඩුවේ බලවතුන් අතර පමණක් ක්‍රියාත්මක වන බැවින් සාමාන්‍ය ජනතාවට එන්නත්කරණය කිරීම නිසි ලෙස සිදුනොවන බවත් මව්වරුන්ට සහ දරුවන්ට ත්‍රිපෝෂ ලබාදීමේ වැඩපිළිවෙළ ද අසාර්ථක තත්ත්වයකට පත්ව ඇති බවත් ඒ මහතා කීවේය.

රට ඉදිරියට කරගෙන යෑමේ වගකීම භාරගැනීමට සමගි බලවේගය සූදානම් බව වැඩිදුරටත් සඳහන් කළ විපක්ෂ නායකවරයා වැඩි කළ ඉන්ධන මිල වහාම නැවත අඩු කිරීමට පියවර ගන්නා ලෙස රජයෙන් ඉල්ලීමක්ද කළේය.

දේශද්‍රෝහීන් සහ දේශප්‍රේමී නිසි ලෙස තෝරාගැනීමේ අවස්ථාවක් නැවතවරක් උදා වී ඇති බවත් පැවැසූ විපක්ෂ නායකවරයා ඉන්ධන මිල වැඩිකළ විෂයභාර අමාත්‍යවරයාට එරෙහිව සමගි බලවේගය ගෙන ආ විශ්වාසභංග යෝජනාව සම්බන්ධයෙන් රජයේ පාර්ශ්ව ගන්නා තීන්දුව මත එය තීරණය වන බවත් හෙතෙම වැඩිදුරටත් පැවැසීය.

# රනිල්ට විපක්ෂයේ ඉදිරි පෙළ අසුනක්

**ස්වර්ණා විජේකෝන් සහ පහන් විජේසේකර**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස දිවුරුම් දීමට නියමිත රනිල් වික්‍රමසිංහ මහතාට පාර්ලිමේන්තු සභා ගර්භයේ විපක්ෂයේ ඉදිරි පෙළ 13 වැනි ආසනය වෙන් කර ඇති බව වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කළේය.

රනිල් වික්‍රමසිංහ මහතා අද (23) පෙරවරුවේ කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ දිවුරුම් දීමට නියමිත වේ.

# කල් පැන්න ඖෂධවල දින වෙනස් කරන ස්ථානයක් වටලයි

**රුවන්ත නිතුල්ගස්පිටිය**

වසර හතකට අධික කාලයක් පුරා කල්ඉකුත් වීමේ දින සහ ඇසුරුම් වෙනස් කරමින් නීති විරෝධීව ඖෂධ වෙළඳපොළට නිකුත් කළ ස්ථානයක් වැටලීමට ඊයේ (22දා) ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් විසින් පියවර ගෙන තිබේ.

දෙහිවල, නැදිමාල, රබර්වත්ත පාරේ පිහිටි අදාළ ස්ථානයේ දීර්ඝ කාලයක සිට නීතිවිරෝධීව මෙම ජාවාරම සිදුවන බවට ඖෂධ නියාමන අධිකාරියට දින කිහිපයකට පෙර ලැබුණු තොරතුරක් මත මෙම වැටලීම සිදු කර ඇත.

වැටලීම සිදුකරන අවස්ථාව වන විට වකුගඩු රෝගය සඳහා ලබාදෙන ඖෂධ වර්ග විශාල ප්‍රමාණයක් මෙම ස්ථානයේ තිබී සොයාගෙන ඇති අතර එම ඖෂධ බහුතරයක් පසුගිය වසරේ සහ මේ වසරේ පළමු මාස කිහිපයේ කල් ඉකුත් වූ මෙරට තුළ ලියාපදිංචි නොකළ ඖෂධ බව අනාවරණය වී තිබේ.

වැටලීම සිදුකරන අවස්ථාවේ ඖෂධ නියාමන රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතාද එම ස්ථානයට ගොස් ඇති අතර එහිදී මෙම නීතිවිරෝධි ගබඩාව අමාත්‍යවරයාගේ නිරීක්ෂණයට ලක් විය.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කළේ මේ වනවිටත් මෙලෙස දින සහ ඇසුරුම් වෙනස් කර නීතිවිරෝධිව වෙළඳපොළට නිකුත් කළ ඖෂධ සියල්ල වෙළඳපොලෙන් ඉවත් කිරීමට අදාළ අංශ වෙත දැනුම් දුන් බවත් මෙම සිදුවීමට සම්බන්ධ අයට නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බවයි.

## 01 වැනි පිටුවෙන්

### අද රෑ 10 සිට ...

කොවිඩ් ව්‍යාප්තියේ යම් පාලනයක් සිදුව ඇති බවට සෞඛ්‍ය විශේෂඥයින් ලබාදුන් වාර්තාවන් මත පදනම්ව පෙරේදා (21දා) සිට සංචරණ සීමා ලිහිල් කිරීම සිදුකළද එළඹෙන පොසොන් පෝය ඉලක්ක කර දිවයින පුරා බහුලව සංචරණයන් සහ ජනතා ඒකරාශි වීම් සිදු වීම වැළැක්වීමට මෙම තීරණය ගන්නා බවද යුද හමුදාපතිවරයා කීවේය.

ඉකුත් මැයි මස (21දා) සිට පසුගිය ජූනි (21දා) දක්වා මාසයක කාලයක් සංචරණ සීමා පැනවීමට මින් පෙර පියවර ගත් අතර එය (21දා) අලුයම 4.00ට ඉවත් කිරීම සිදු කළේය. කෙසේ වෙතත් දැනට සංචරණ සීමා ලිහිල් කිරීමක් සිදුකළ ද පළාත් අතර සංචරණ සීමා තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

### හොඳ වී සත්ත්ව ...

මිනිස් පරිභෝජනය සඳහා සුදුසු වී මෙට්‍රික් ටොන් 88615ක් සත්ත්ව ආහාර ලෙස අඩු මිලට විකිණීම හේතුවෙන් විශාල අලාභයක් සිදුව ඇති බවත් මෙය යහපාලන රජය සමයේ සිදුවූ විශාල වංචාවක් බවත් අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය. සත්ත්ව ආහාර සඳහා වී කිලෝවක් රුපියල් 24ක් වැනි අඩු මුදලකට එවකට අමාත්‍යවරයා ඇතුළු අදාළ බලධාරින් විකුණා ඇත්තේ වී අලෙවි මණ්ඩලයේ කිසිදු අනුමැතියකින් තොරව බවද ඇමැතිවරයා පැවසීය. වී කිලෝවක් රුපියල් 38, 40 වැනි මිල ගණන් යටතේ මිලදී ගත් වී තොග මෙලෙස රුපියල් 24ක් වැනි අඩු මිලකට සත්ත්ව ආහාර වෙනුවෙන් අලෙවි කර ඇති අතර එවකට අමාත්‍යවරයා ඇතුළු රජය මේ සඳහා වගකිවයුතු බවද මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

මෙම වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් ද පරීක්ෂණ සිදුකෙරෙන බවද ඇමැතිවරයා වැඩිදුරටත් පැවසීය.

### ගම්මන්පිලට එරෙහි ...

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඇතුළු පිරිසක් විසින් අදාළ යෝජනාව කතානායකවරයා වෙත භාර දී ඇත. බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල මහතාට එරෙහිව සමඟි ජන බලවේගය විසින් ඉදිරිපත් කරනු ලබන විශ්වාසභංග යෝජනාවට අත්සන් තැබීම පසුගිය 16වැනිදා ආරම්භ විය.

ඒ සඳහා සමගි ජන බලවේගයේ නායක සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස, මහලේකම් රංජිත් මද්දුම බණ්ඩාර, සෙසු නායකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් ෆොන්සේකා, තිස්ස අත්තනායක යන මහත්වරුන් සහ පක්ෂ නායකයන් ඇතුළු මන්ත්‍රීවරු 43දෙනෙක් ඒ සඳහා අත්සන් කර ඇත.

### කොවිඩ් කෙටුම්පත ...

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1)ව්‍යවස්ථාව ප්‍රකාරව අදාළ පෙත්සම ඉදිරිපත් කර ඇති බව කතානායකවරයා සභාවට දැනුම් දුන් අතර සභාවේ කටයුතු ආරම්භක අවස්ථාවේදී කතානායකවරයා මේ බව සඳහන් කළේය.

### ලන්ච් ශීට් තහනම් ...

වාර්තා වන තොරතුරු අනුව මෙරට ප්‍රධාන සමාගම් 04ක් විසින් මාසයකට ලන්ච් ශීට් ටොන් 07-08 දක්වා ප්‍රමාණයක් නිපදවනු ලබයි. ඒ අනුව වාර්ෂිකව ලන්ච් ශීට් ටොන් 106ක් පමණ මෙරට තුළ භාවිත කෙරේ. ඒ අනුව දිනකට අප රටේ පරිසරයට බැහැර කෙරෙන ලන්ච් ශීට් ප්‍රමාණය අවම වශයෙන් මිලියන 10 ඉක්මවනු ඇතැයි දළ වශයෙන් ගණන් බලා තිබේ. මෙම ලන්ච් ශීට් පසෙහි දිරාපත් වී නොපෙනී යාම වසර දෙක තුනකින් සිදු වේ. එසේ වුවද, ලන්ච් ශීට් නිසා පසට එකතුවන ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු වසර 200කට වැඩි කාලයක් පවතින බව විද්‍යාත්මකව සනාථ වී තිබේ.

දැනට ලෝකයේ කිසිදු රටක ලන්ච් ශීට් භාවිත නොකරන අතර ශ්‍රී ලංකාව ඒවා භාවිත කරන එකම රටයි. ලන්ච් ශීට් වෙනුවට විකල්ප හඳුන්වා දීම සඳහා පියවර ගන්නැයි මෙරට අදාළ සමාගම්වලට උපදෙස් දී ඇතත් ඔවුන් ඒ සඳහා මෙතෙක් පියවර ගෙන නැත. එමෙන්ම ඇතැම් සමාගම් විසින් ලන්ච් ශීට් නිපදවන යන්ත්‍ර ගෘහස්ථ කර්මාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම නිසා මේ රටේ නිපදවන ලන්ච් ශීට් පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවක් ද පවතී.

වසර 2016 දී එවකට පරිසර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ලන්ච් ශීට් තහනම් කිරීම සඳහා පියවර ගෙන තිබුණත් ඉක්මණින්ම දිරාපත්වන ලන්ච් ශීට් (Biodegradable lunch sheet) හඳුන්වා දෙන බවට ඇතැම් සමාගම් විසින් පියවර ගන්නා බව ප්‍රකාශ කර තිබුණ ද එම තීරණය නිසි පරිදි ක්‍රියාත්මක නොවූ බව අමරවීර මහතා කියයි.

මින් පෙර ලන්ච් ශීට් තහනම් කිරීම සම්බන්ධව පරිසර අමාත්‍යාංශය විසින් කටයුතු යොදා තිබූ බැවින් නව ගැසට් පත්‍රයක් පළ කිරීමෙන් තොරව නියෝගයක් නිකුත් කිරීමේ හැකියාවක් ද ඇතැයි කී අමාත්‍යවරයා ලන්ච් ශීට් භාවිතය තහනම් කිරීමට අදාළ පියවර ගන්නැයි පෙරේදා (21)අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවකදී අදාළ අංශවලට උපදෙස් ලබා දුන්නේය. මෙම සාකච්ඡාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සහ මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු ආයතනවල නිලධාරින්ද සහභාගි වූහ.

### තැපෑල ආදායම් ...

හැඳින්විය හැකි බවත් ඒ අනුව පවත්නා වසංගත තත්ත්වය තුළ දී වුව ද, මේ වන විට පවුල් ලක්ෂ 17කට බෙහෙත් නිවසටම ලබා දීමට තැපැල් දෙපාර්තමේන්තුව කටයුතු කර තිබෙන බවත් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (22) පැවති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේ දී ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

ඒ අනුව, මෙම කොරෝනා වසංගතයත් සමග පවුල් ලක්ෂ 17 කට නිවෙස් වලට බෙහෙත් ලබා දීමේ පළමු වටයේ වැඩපිළිවෙළ මෙන්ම ඊට පසුවත්, මෙම අපහසු කාල පරිච්ඡේදය තුළත් ඔවුන්ගේ සේවාවන් අඛණ්ඩව ගෙනයාම පිළිබඳව තැපැල් දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යය මණ්ඩලය වෙත බෙහෙවින් ස්තුතිවන්ත වන බව ද ඒ මහතා කියා සිටියේය. එමෙන්ම, මරණ සංඛ්‍යාව ගෙන විශ්ලේෂණය කර බලන කළ සංකූලතාවයන් වැඩිවන පිරිස් බොහෝ විට මිය යන බව දක්නට ලැබී ඇති බවත්, ඊට එක හේතුවක් වන්නේ නිසි පරිදි නිසි වෙලාවට බෙහෙත් නොලැබීමට තිබූ නොහැකියාව බවත් හෙතෙම කීවේය.

තැපැල් දෙපාර්තමේන්තුව සිදු කරන නිහඬ සේවය තුළ නොපෙනෙන මරණ සංඛ්‍යාව අවම කිරීමට දායක වී ඇති බව ද ඇමැතිවරයා පැවසීය.

### රේගු දඩ ...

ඉකුත් වසර පහකට අධික කාලයක් තිස්සේ පනවන ලද දඩ මුදල් එම පිරිස් නොගෙවා දඩ මුදල් නියම කරන ලද පිරිස් විසින් වසර පහකට පමණ පෙර ගොනු කරන ලද නඩු හේතුවෙන් මෙම මුදල අහිමි වී තිබේ.

භාණ්ඩ නීති විරෝධී ලෙස ආනයන සහ අපනයනකරුවන් විසින් රේගු දඩ මුදල් ගෙවීම මග හැරීමට අධිකරණය යොදාගැනීම පුරුද්දක් කරගෙන ඇති බවත් රේගු විභාගය අවසානයේ දඩ නියම කිරීමෙන් පසුව ඔවුන් අභියාචනාධිකරණයේ නඩු පැවරීම සිදු කරන බවත් පවසන රේගුව එම නඩු දිගින් දිගටම කල්යෑමෙන් රජයට ආදායම් ලැබීම ප්‍රමාද වන බවත් රේගුවේ උසස් නිලධාරියෙක් 'දිනමිණ'ට කියා සිටියේය.

නීති විරෝධීව කසළ තේ අපනයනය කිරීම්, බීඩි කොළ ආනයනය ඇතුළු භාණ්ඩ ගණනාවක් සම්බන්ධයෙන් මෙම දඩ මුදල් ගෙවීම් පැහැර හැර ඇති බවත් ඒ සඳහා රජය මැදිහත් විය යුතු බවත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ රේගුවේ උසස් නිලධාරියෙක් පැවසීය.

කසළ තේ නීති විරෝධී ලෙස අපනයන කිරීමට උත්සාහ කිරීමේ සිද්ධි කීපයකට ලක්ෂ ගණනක දඩ මුදල් නියමවූ අභියාචනාධිකරණයට රිට් පෙත්සම් ගොනුකර ඇති පුද්ගලයෙක් පසුගියදා නැවත කසළ තේ අපනයන කිරීමට කළ උත්සාහයකදී අත්අඩංගුවට පත්වූ බවය.

වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමට සහ රජයට ආදායම් ලබාගැනීමට කටයුතු කිරීම සඳහා රජය වැඩි මැදිහත් වීමක් සිදු කළ යුතු බව එම නිලධාරියා පැවැසීය.

### ගෘහස්ථ ගෑස් ...

එහිදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දැනට නියම කර ඇති පරිදි කිලෝග්‍රෑම් 12.5ක ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් රු 1,493ක මිලට ලිට්‍රෝ සහ ලාෆ් ගෑස් සමාගම් විසින් තවදුරටත් වෙළෙඳපොළේ අලෙවි කළ යුතු බවත් එමෙන්ම ගෑස් මිල දී ගැනීම, ප්‍රවාහනය සහ ගබඩා කිරීම සමාගම් දෙක විසින්ම ඒකාබද්ධව සිදුකිරීම සහ ඒ සඳහා හම්බන්තොට ගෑස් පර්යන්තය යොදා ගත හැකි බව එම නිර්දේශයන්ට ඇතුළත් බවත් රඹුක්වැල්ල මහතා කියා සිටියේය.

රටට අවශ්‍ය LP ගෑස් මිල දී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු, විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ලිට්‍රෝ ගෑස් සමාගමේ සහ ලාෆ් සමාගමේ නියෝජිතයෙන් ද ඇතුළත් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම සහිත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීමට ද එහිදී නිර්දේශය හිමිව තිබෙන බව ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

අනුකාරක සභාව විසින් නිර්දේශිත ක්‍රමවේදය ඉදිරි මාස 6 තුළ ක්‍රියාත්මක කර එහි ප්‍රගතිය මත ඉදිරි පියවර ගැනීමට ද නියමිත බවද හෙතෙම පැවසීය.

ඇමැතිවරයා වැඩිදුරටත් මෙසේද කියා සිටියේය.

ගෑස් මිල සම්බන්ධ පසුගිය කාලය පුරා විශාල සාකච්ඡාවක් තිබුණා. ප්‍රධාන සැපයුම්කරුවන් දෙපළම දිගින් දිගටම කියා සිටියා රුපියල් 700 කින් 600 කින් මිල වැඩි කරන්න අවශ්‍යයි කියලා. එහෙත් පාරිභෝගික අධිකාරිය අවසානයේ කියා සිටියේ රුපියල් 375 ක් 400 කින් පමණ වැඩි කළ යුතුයි කියලා. එහෙත් ජනාධිපතිවරයාත් කැබිනට් මණ්ඩලයත් ඒකමතිකය තීරණය කළ දෙයක් තමයි මොන හේතුවම නිසාවත් මේ රටේ තියෙන තත්ත්වයත් එක්ක එහි බර ජනතාවට දෙන්නේ නැහැ කියන එක. ඒ බර රජය පැත්තෙන් බාරගෙන අවශ්‍ය කටයුතු සිදුකරන්න එහිදී තීරණය කළා.මේ සමාගම් දෙක ගෑස් ආනයනය කරද්දි එක ප්‍රසම්පාදන ක්‍රමවේදය එකට කරන්න පුළුවන්ද කියන එක ගැන අවධානය යොමු කරලා තිබෙනවා. මොනම හේතුවක් නිසාවත් මේ වෙලාවේ තියෙන තත්ත්වය තුළ ජනතාවට පීඩනයකට ලක්වීමට ඉඩදෙන්න බෑ. වර්තමානයේ සහතියක් දෙන එක තමයි අපි කරන්නේ. රජයක් ලෙස අපි කුමන පාඩුවක් ලැබුවත් එය රජය යම් ක්‍රමවේදයක් තුළ හසුරුවා ගන්නා ගමන් මිල වැඩිකිරීමක් කිරීමට බලාපොරොත්තුවක් නැතැයි ද කෙහෙළිය රඹුක්වැල්ල මහතා කියා සිටියේය.

සම කැබිනට් ප්‍රකාශක, වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතාද මේ අවස්ථාවට එක්ව සිටියේය.

# පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවට

**ස්වර්ණා විජේකෝන්, පහන් විජේසේකර**

රුපියල් බිලියන 200ක වටිනාකමින් යුත් 2021 අංක 01 දරන පරිපූරක ඇස්තමේන්තුව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පාර්ලිමේන්තුවට ඊයේ (22) ඉදිරිපත් කළේය.

එය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලෙසද ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරමින් ඉල්ලා සිටියේය.

කොරෝනා වසංගත තත්ත්වය පාලනය සහ රජයේ අනෙකුත් වියදම් සඳහා අමතර රුපියල් කෝටි විසිදාහක මුදලක් අනුමත කර ගැනීම සඳහා අදාළ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත. එමෙන්ම 2020 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ද අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර එය මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කිරීමට යෝජනා විය.

## 01 වැනි පිටුවෙන්

### 21දා කොවිඩ් ...

කෙසේ වෙතත් මේ දක්වා මෙරටින් වාර්තා වී ඇති සමස්ත කොවිඩ්-19 ආසාදිතයින් දෙලක්ෂ හතලිස් එක්දහස් අටසිය විස්සෙන් (241, 820) දෙලක්ෂ නවදහස් දෙසිය අනූහය (209,296) දෙනකු පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ඇති බවද එම දත්ත වාර්තාවල දැක්වේ.

### පාසල් 10,000කට ...

වසර දෙකක් ඇතුළත රට පුරා සන්නිවේදන කුලුනු ලබාදීම යාවත්කාලීන කොට සියලුම සන්නිවේදන සැපයුම්කරුවන් සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එකට එක්ව ඒකාබද්ධ ප්‍රවේශයකින් එක් ප්‍රතිඵලයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව හෙතෙම පසුගියදා මාධ්‍ය හමුවක් පවත්වමින් කියා සිටියේය.

2021 ජුනි මාසයේ සිට වීඩියෝ කොන්පරන්ස් පහසුකම e-තක්සලාව හරහා නොමිලේ ලබා දෙන බව අනාවරණය කළ නාමල් රාජපක්ෂ මහතා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය නැතිනම් ලර්නින් මැනේජ්මන්ට් සිස්ටම් (LMS) ජුනි 25 වැනිදා සිට පාසල් 20කින් ආරම්භ කරන බව පැවසීය.

සන්නිවේදන පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රදේශ හඳුනාගෙන ඒ ප්‍රදේශවල සන්නිවේදන පහසුකම් ලැබෙන මධ්‍යස්ථාන පිහිටුවන බවත් සති දෙකක් ඇතුළත ඒ තැන්වලට අවශ්‍ය පරිගණක හෝ ටැබ් උපරිම වශයෙන් 10ක් ලබා දෙමින් උදෑසන සිට සවස්වරුව දක්වා e-තක්සලාව හරහා අධ්‍යාපනය හදාරන්න අවකාශය ලබා දෙන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

### ලේක්හවුස්-මිහින්තලා ...

මිහිඳු මහා රහතන් වහන්සේ මෙරටට වැඩම කළ 2329වන පොසොන් පොහෝදා (24) ආලෝක පූජා පුන්‍ය උත්සවය තෛනිකායික මාහිමිපාණන් වහන්සේලාගේ ආශිර්වාද මධ්‍යයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතින් විවෘත කිරිමට කටයුතු යොදා තිබේ.

## ග්‍රාමීය හා ප්‍රාදේශීය ජල සම්පාදන ව්‍යාපෘති රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ප්‍රසම්පාදන ලියකියවිලි භාර ගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

2021.05.10 දින දිනමිණ, Daily news හා තිනකරන් පුවත්පත් වල පළ වූ ප්‍රසම්පාදන දැන්වීමෙහි ප්‍රසම්පාදන ලංසු භාර ගන්නා අවසාන දිනය 2021.07.02 පෙ. ව. 10.00 දක්වා දීර්ඝ කරන ලදී.

2021.07.01 දින ප. ව. 2.00 දක්වා ලංසු ලේඛන නිකුත් කරනු ලැබේ.

අනෙකුත් කොන්දේසි හා නියමයන් නොවෙනස්ව පවතී.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,**
**නො. 1114, පන්නිපිටිය පාර,**
**තලවතුගොඩ.**

## රාජ්‍ය දැව සංස්ථාව

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

### ලංසු ආරාධනය සඳහා වන සංශෝධනය (IFB)

**ප්‍රසම්පාදන අංකය : එස්.ටී.සී. / පී.එස්.එම්. / 2020 / ප්‍රා. අංක 13**

### ක්‍රියෝසෝට් තෙල් ලීටර් 160,000 ක් මිල දී ගැනීම සඳහා ලංසු කැඳවීම

ඉහත ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 වන දින දිනමිණ හි පළ කරන ලද පුවත්පත් දැන්වීම හා සම්බන්ධවයි. ඒ අනුව ඉහත සඳහන් ලංසු ආරාධනයෙහි පහත සඳහන් සංශෝධන සිදු කරනු ලැබේ.

- ලංසු විවෘත කිරීමේ / ලංසු භාරගැනීමේ අවසාන දිනය 2021.07.08 දින පැය 1030 දක්වා දීර්ඝ කර ඇත.
- ලංසු 2021 ඔක්තෝබර් 07 දක්වා වලංගු වේ.
- ලංසු සුරක්ෂණය 2021 ඔක්තෝබර් 21 දක්වා වලංගු වේ.

අනෙකුත් සියලු නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.

**සභාපති,**
**රාජ්‍ය දැව සංස්ථාව.**

## ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

### පිරිපහදු කාර්යාංශය

### 2021 / 2022 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම

තරගකාරි ඉල්ලුම් කිරීමේ පදනම මත පහත සඳහන් කාර්යයන් / සේවාවන් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය අවස්තාවන්හිදී භාරගැනීමට කැමති කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමට ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කාර්යාංශය අදහස් කරනු ලැබේ.

අ. සිවිල්, යාන්ත්‍රික සහ විදුලි කාර්යයන් වන ඉන්ධන ටැංකි ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම, ටැංකි පිරිසිදු කිරීම, තාප හුවමාරු ටියුබ් බන්ඩල පිරිසිදු කිරීම, අධිපීඩන වැලි විදිනයෙන් යකඩ මල ඉවත් කිරීම සහ උපකරණවල තීන්ත ආලේප කිරීම, යකඩ සහ යකඩ නොවන ලෝහවල ලියවනපට්ටල වැඩ සහ වාත්තු කිරීමේ වැඩ, මුහුනත් දැඩි කිරීම් ඇතුළුව ගෙවී ගිය යන්ත්‍ර කොටස් වල පිලිසකර කිරීම්, ලෝහ ආලේපනය කිරීම් සහ බෙයාරින් පිරවීම වැනි කාර්යයන්, රබර් ප්ලාස්ටික් සහ පයිබර් ග්ලාස්වලින් නිමවුන උපාංග සෑදීමේ කර්යයන්, පිරිපහදු උපකරණ සඳහා වානේ ව්‍යුහයන් සෑදීම, අමතර කොටස් නිෂ්පාදනය කිරීම, සිවිල් ඉංජිනේරුමය වැඩ සහ ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුමය කටයුතු කිරීම, මෝටර් රථ සහ ගෘහ භාණ්ඩ කුෂන් වැඩ, ටයර් නැවත පිරවීම, වාහන ටින්කරින් වැඩ, රේඩියේටර් අලුත්වැඩියා කිරීම, සිලින්ඩර් බෝර කිරීම, ස්ලිව් ගැසීම සහ ක්‍රැන්ක් ශාෆ්ට් ග්‍රයින්ඩින් කිරීම, සයිලන්සර් සෑදීම, රෝදක පළු ඇලවීම, වාහන අලුත්වැඩියාව, ඒසී සහ ඩීසී මෝටර් එතීම, ශීතකරණ හා වායුසමීකරණ අලුත්වැඩියාව සහ RT,UT,MT,PT යනාදී නිර්විනාෂක පරීක්ෂණ කාර්යයන් සිදු කිරීම.

ආ. පැස්සුම් යන්ත්‍ර, වායු සම්පීඩන යන්ත්‍ර, ජංගම දෙඹකර, ක්‍රෝලර් දෙඹකර, ජංගම පොම්ප, සැන්ඩ් බ්ලාස්ටින් උපකරණ, වානේ පලංචි උපකරණ, ද්‍රව ජැලැන්තු (හයිඩ්‍රොලික්) එසවීමේ උපකරණ, ෆෝක්ලිෆ්ට් ට්‍රක්, ජලයේ බහාලිය හැකි පොම්ප, විදුලි උත්පාදක යන්ත්‍ර, පස් කපා ඉවත් කරන උපකරණ, ට්‍රැක්ටර්, ගල්රෝල, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර සහ බදාම විදීමේ යන්ත්‍ර, බූම් ට්‍රක්, බැකෝලෝඩර් යන්ත්‍ර, පෝකර් වයිබ්‍රේටර් යන්ත්‍ර යනාදිය කුලියට සැපයීම.

ඇ. පිරිපහදුවේ යාන්ත්‍රික, විදුලි, උපකරණ සහ සිවිල් ඉදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා පුහුණු හා අර්ධ පුහුණු කම්කරුවන් සහ සනීපාරක්ෂක කම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත සැපයීම.

ඈ. හදිසි අවශ්‍යතාවන්හිදී ගිලන් රථයක් අදාළ කාර්ය මණ්ඩලය සහ අවශ්‍ය උපකරණ සහිතව සැපයීම.

පිරිපහදුව තුළ දැනටමත් ලියාපදිංචි වී ඇති සහ අලුතින් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන සියලුම කොන්ත්‍රාත්කරුවන් ලිඛිත ඉල්ලීමක් සමග පිරිපහදු මුදල් අංශයට ආපසු ගෙවනු නොලබන රු. 100/- ක මුදලක් ගෙවීමෙන් අයදුම්පත් ලබාගත හැක.

එසේම අන්තර්ජාලයේ www.ceypetco.gov.lk වෙබ් අඩවිය මගින් අයදුම්පත් නොමිලේ බාගත කර ගත හැක.

අයදුම්පත් නිකුත් කරනු ලබන අවසාන දිනය 2021 ජූලි මස 14 වැනි දින 15.00 පැය දක්වා වන අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 ජූලි මස 27 වැනි දින 14.30 පැයට හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලබා දිය යුතුය.

**නියෝජ්‍ය පිරිපහදු කළමනාකාර (නඩත්තු හා යෝජනා ක්‍රම)**
**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව,**
**පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද, කැලණිය.**

## කැලණිය ප්‍රාදේශීය සභාව

### ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම

2021.05.31 දින පළ කරන ලද උක්ත කරුණට අදාළ පුවත්පත් දැන්වීම හා බැඳේ.

ඒ අනුව 2021.08.01 දින සිට වර්ෂ 02 ක් සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

01. අයදුම්පත් ලබාදීම 2021.07.06 දින පෙ.ව. 3.00 ට පෙර රු. 1,000.00 ක මුදලක් ගෙවා කැලණිය ප්‍රාදේශීය සභාව ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකිය.
02. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර "**ආරක්ෂක සේවාව සැපයීම**" යනුවෙන් සඳහන් කළ යුතු අතර, මිල ගණන් 2021.07.07 දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය හැකි අතර, අතින් ගෙනවිත් ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය. එදින එම වේලාව තුළ මිල ගණන් විවෘත කරනු ලැබේ.
03. 2021.05.31 දින පුවත්පත් දැන්වීමෙහි සඳහන් කරන ලද කොන්දේසි හා යටත් විය යුතුය.

**2021.06.23**

**සභාපති,**
**කැලණිය ප්‍රාදේශීය සභාව.**
**කැලණිය.**

## ප්‍රසම්පාදන දැන්වීම

### අපේක්ෂා රෝහල - මහරගම - ශ්‍රී ලංකාව

### රෝහලේ ජාන විශ්ලේෂණ රසායනාගාරයක් ඉදිකිරීම සඳහා ලංසු ආරාධනා කිරීම

මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති පරිද්දෙන් ශ්‍රී ලංකා ඉදිකිරීම් හා පුහුණු කිරීමේ ආයතනයේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් වෙතින් 2021.07.14 වන දින පෙ.ව. 10.00 දක්වා ලංසු භාරගනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් කළ වහාම මහරගම අපේක්ෂා රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලයේදී ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

ඉහත ලිපිනයෙහි ආයතන අංශයෙන් 2021.07.13 දින තෙක් වැඩ කරන දිනයන්හි පෙ.ව. 09.00 හා ප.ව. 3.00 අතර කාලය තුළදී ලංසු ලේඛන ලබා ගැනීමට ලංසුකරුවන් තමාගේ ඉල්ලීම් කිරීමේ ලිපිය, සුදුසුකම් සනාථ කරන සාක්ෂි සහ ටෙන්ඩර් ගාස්තුව ගෙවීම වෙනුවෙන් අපේක්ෂා රෝහලේ ගණකාධිකාරී විසින් නිකුත් කරන ලද රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | අයිතමය | යෝග්‍යතාව | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | ලංසු සුරක්ෂිතයේ වටිනාකම | දළ ඇස්තමේන්තු මුදල රු. මිලියන |
|---|---|---|---|---|---|
| 01 | මහරගම අපේක්ෂා රෝහලේ රසායි වෛද්‍ය සංකීර්ණයේ 07 වන මහලෙහි ජාන විශ්ලේෂණ රසායනාගාරයක් සැකසීම. | C 06 හෝ ඊට ඉහළ | රු. 6,000.00 | 300,000.00 | 19.5 |

වැඩි විස්තර සඳහා අධ්‍යක්ෂ, අපේක්ෂා රෝහල, මහරගම යන ලිපිනයෙන් විමසිය හැකිය. දුරකථන අංක : 011-2840233 කිසිදු අයකිරීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැක. ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

**සභාපති,**
**ප්‍රසම්පාදන "ජී" කමිටුව,**
**සෞඛ්‍ය අමාත්‍යාංශය.**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

### පූර්ව ලංසු රැස්වීමේ හා ලංසු ඉදිරිපත් කළ යුතු දිනයන්හි නැවත නියම කරන ලද දින පිළිබඳ දැනුම් දීමයි

**දිනය :** 2021 ජූනි 23

IFB **අංක :** LGESP(AF)-MPCLG-17

**ණය අංකය හා ශීර්ෂය :** L 3431 SRI, පළාත් පාලන වැඩිදියුණු කිරීම් ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය)

**කොන්ත්‍රාත් අංකය හා ශීර්ෂය :** පැකේජ අංක : NCP-AF-WS-CKD-13 ජල සම්පාදන බෙදාහැරීම් ජාලය - මින්නේරිය (ගල්ඔය ග්‍රාම නිලධාරී කොට්ඨාසය)

**පළකරන ලද මුල් දිනය :** 2021 මැයි 13

2021 මැයි මස 13 වන දින පළකරන ලද ලංසු ආරාධනා දැන්වීම සහ ඒ අනුගාමීව, 2021 මැයි මස 28 වන දින දිනපතා ජාතික පුවත්පත්වල පළවූ පූර්ව ලංසු හමුව හා ලංසු ඉදිරිපත් කළ යුත අවසාන දිනයන් කල් දැමීමේ නිවේදනය සහ ව්‍යාපෘතියේ වෙබ් අඩවිය වන (www.puraneguma.lk) හි පළකරන ලද එම නිවේදනයද ප්‍රකාරව, ඉහත ලංසුව සඳහා ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය හා පූර්ව ලංසු හමුවේ දිනයද පහත සඳහන් පරිදි නැවත නියම කර සංශෝධනය කරනු ලැබූ බව සියල්ලන් වෙත මෙයින් දැනුම් දෙමු.

**පූර්ව ලංසු හමුවේ නැවත නියම කළ දිනය :** Virtul අතථ්‍ය පූර්ව ලංසු රැස්වීම Zoom **තාක්ෂණය හරහා 2021 ජූනි මස 29 වන දින පෙ.ව. 10.30 ට පැවැත්වීමට** නියම කරනු ලැබ ඇත. මේ සඳහා සහභාගි වීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් (i) ආසන්නයේ / සමාගමේ නම, (ii) සහභාගි වන පුද්ගලයන්ගේ තනතුරු නාම (iii) pdlgesp@gmail.com හෝ vajira@puraneguma.lk වෙත email IDs link සබඳියන් සඳහන් කරමින් ඊමේල් ලිපින හරහා ඉල්ලීමක් 2021 ජූනි මස 28 වන දින මධ්‍යහ්නයට පෙර ඉදිරිපත් කිරීම කළ යුතුවන අතර, Link සබැඳිය රැස්වීමට / හමුවට පෙරාතුව නිකුත් කරනු ලැබේ.

**සැ.යු : ව්‍යාපෘතිය විසින්** Zoom පූර්ව ලංසු හමුව එක් වරක් පමණක්, ඉහත සඳහන් නියම කර ඇති වේලාවට පවත්වනු ලබන අතර, ඒ සඳහා සහභාගි වීමට නොහැකි වීම පිළිබඳ කවර හෝ හේතු දැක්වීමකට වගකීමක් නොදරනු ඇත. කෙසේ වෙතත් Link සබඳිය සඳහා ඉල්ලුම් කර ඇති සියලුම ලංසුකරුවන් වෙත පූර්ව ලංසු රැස්වීමේ වාර්තා බෙදා හරිනි ලැබේ.

**ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය හා වේලාව 2021 ජූලි මස 13 වන දින, ප.ව. 2.00 ට (දේශීය වේලාවන්)**

ඒ අනුව, ලංසු ලිපිලේඛන, රාජකාරි දිනවලදී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර, 2021 ජූලි මස 09 වන දින දක්වා** ලබාගත හැකිය.

**ලේකම්,**
**සභාපති,**
**ආමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,**
**330, යුනියන් පෙදෙස, කොළඹ 02.**

## ප්‍රසම්පාදන දැන්වීම

### ලංසු ආරාධනය

### ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය පොළොන්නරුව

### පොළොන්නරුව සේවාගම ගොවිජන සේවා මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා වූ ලංසුව

**ලංසු අංකය - 02/NCB/DAD/2021**

***(ඇස්තමේන්තු පිරිවැය රු.මි 2.06)***

සේවාගම ගොවිජන සේවා මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා "**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ** (CIDA)", "C8" හෝ ඊට ඉහළ ශ්‍රේණිගත කිරීමේ සහතිකය සහිත ලංසුකරුවන්ගෙන්, මුද්‍රා තබන ලංසුපත් පොලොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලීය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් භාරගනු ලැබේ.

02. මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීම මගින් සිදු කරනු ඇත.
03. මෙම ලංසුවට අදළ ලංසු ලේඛන ආපසු නොගෙවනු ලබන රුපියල් දෙදහස් පන්සීයක (2,500.00 ) මුදලක් පොලොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට මුදලින් ගෙවීමෙන් 2021 ජූනි මස 23 වන දින පෙ.ව 9.00 සිට 2021 ජූලි මස 07 දින ප.ව 3.00 දක්වා සතියේ වැඩ කරන දිනයන්හීදි ලබා ගත හැකිය.
04. ලංසු පත්‍රිකාව පිටපත් දෙකකින් යුතුව, "මුල් පිටපත (Original)" හා "අනු පිටපත (Copy)"යනුවෙන් මුල් පිටුවේ සඳහන් කර, පිටපත් දෙකම වෙන් වෙන්ව කවර තුල බහා නැවත එක් කවරයක බහා මුද්‍රා තබා "**ලංසු අංක** : 02/NCB/DAD/2021" යනුවෙන් ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් 2021 ජූලි මස 08 වන දින ප.ව 2.30 ට පෙර ලැබෙන සේ, පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. නැතහොත් පහත ලිපිනයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය යුතුය.
05. 2021 ජූලි මස 08 වන දින ප.ව 2.30 ට මෙම ලංසුව වැසූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සිය අනන්‍යතාවය ඉදිරිපත් කර සහභාගි විය හැකිය. නියමිත දින නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී සිදුවන ප්‍රමාදයන් හෝ අස්ථානගත වීම් සඳහා ප්‍රසම්පාදන කමිටුව වග කියනු නොලැබේ. ඉදිරිපත් කරන ලංසුපත් සමඟ ආපසු ගෙවනු ලබන රුපියල් විසි එක් දහසක් (රු. 21,000.00) වටිනා ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.
06. මේ පිළිබඳ වැඩිදුර විස්තර අවශ්‍ය වේ නම් දුරකථන අංක 027 - 2222183 මගින් ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ ප්‍රසම්පාදන අංශය වෙතින් ලබා ගත හැකිය.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව**
**ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය.**
**පොළොන්නරුව**

## ඡන්දය ඔබේ අයිතියයි

### 2021 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

### ඡන්දය දීමට හැකිවන්නේ ලියාපදිංචි ඡන්ද හිමියන්ට පමණි

**පවතින COVID – 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘති ගෙයින් ගෙට බෙදාදීම සිදු කරනු නොලැබේ.**

**2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා පහත පියවරයන් අනුගමනය කරන්න.**

- 2020 ඡන්දහිමි නාමලේඛනයේ ඔබගේ නම ලියාපදිංචි වී ඇත්ද යන්න www.elections.gov.lk වෙබ් අඩවියෙන් හෝ ඔබ පදිංචි වසමේ ග්‍රාම නිලධාරී වෙතින් පරික්ෂා කර බලන්න.
- ඔබ 2020 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇත්නම් 2021 වර්ෂය සඳහාද එම ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ඇත. ඒ සඳහා ඔබ විසින් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව සලකන්න.
- ඔබගේ පදිංචියේ වෙනසක් සිදුව ඇත්නම් හෝ 2020 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව නොමැතිනම් හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම ඇතුළත් කර ගැනීම සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීමේ (2021/ER) ආකෘතියක් සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී වෙත 2021 ජූලි මස 15 දිනට පෙර භාරදීමට කටයුතු කරන්න. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගැනීමෙන් හෝ ග්‍රාම නිලධාරී වරයා වෙතින් ලබාගත හැකිය.

**ඡන්දහිමියකු ලෙස ලියාපදිංචිවීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම පුරවැසි අයිතියකි. එමෙන්ම පුරවැසියන්ගේ වගකීමකි.**

**සභාපති**
**මැතිවරණ කොමිෂන් සභාව**
**දුරකථන : 011-2868441/42/43**
**ෆැක්ස් : 011-2868368**
**e-mail : info@elections.gov.lk**
**මැතිවරණ මහලේකම් කාර්යාලය,**
**සරණ මාවත, රාජගිරිය.**
**2021 ජූනි මස 23 වන දින.**



# ප්‍රසිද්ධ දැන්වීමයි

**සමාගමක තත්ත්වය, වගකීමෙන් සීමිත පොදු සමාගමක් බවට (PLC) වෙනස් කිරීම හේතුවෙන්, එහි නාමය වෙනස් කිරීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ (පනත) හි, 11(5) වගන්තිය ප්‍රකාර, මෙයින් දැනුම් දෙන වග නම්, කොළඹ 08, D.S. සේනානායක මාවතේ අංක 75 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහිත (සමාගම් අංක PB 00234680 දරන) ප්‍රයිම් ලැන්ඩ්ස් රෙසිඩන්සීස් ලිමිටඩ්, එහි කොටස් 2021 ජූනි මස 08 වන දින කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති අතර, ඒ අනුව එකී පනතේ 11(3) දරන වගන්තිය ප්‍රකාරව එම සමාගම වගකීමෙන් සීමිත පොදු සමාගමක් බවට පරිවර්තනය කරලීමේ හේතුව මත, එහි නාමය එකී දින සිට ප්‍රයිම් ලැන්ඩ්ස් රෙසිඩන්සීස් PLC යනුවෙන් වෙනස් කර ඇති සේ සලකනු ලබන බවයි.

**අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,**
**පෙලේ කන්සල්ටින් (ප්‍රයිවට්) ලිමිටඩ්,**
**සමාගම් ලේකම්වරු.**

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

## 7 වන වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : පා/ඉ/2/අත්/18

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/8/2017/PC/298

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 2215/38 දරන 2021.02.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ III වැනි කොටස බලන්න.

### උපලේඛනය

| | | |
|---|---|---|
| පළාත | : | බස්නාහිර |
| දිස්ත්‍රික්කය | : | කොළඹ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | පාදුක්ක |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | අංක : 461 පාදුක්ක |
| ගම | : | පාදුක්ක |
| මූලික පිඹුරු අංකය | : | මූ.පි.කො. 9894 පිඹුරේ කැබලි අංක 1, ප්‍රමාණය හෙක්. 0.1114 |

**සුගත් සිසිර කුමාර,**
**ප්‍රාදේශීය ලේකම්,**
**පාදුක්ක.**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**පාදුක්ක.**

2021.04.29

---


**ලේක්හවුස් ඡායාරූප ශිල්පීන් විසින් ඡායාරූප ගත කරන ලද කළු සුදු හා වර්ණ සේයා පත් කර්තෘ මණ්ඩල පුස්තකාලයෙන් මිලදී ලබාගැනීමට පහසුකම් සලසා ඇත.**

**දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට 1950 සිට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**


**පුස්තකාලයාධිපති**
**දුරකථන අංක 2429491**

---

ලුහුඬු දැන්වීම්



**රථවාහන**



122


**යතුරු පැදි හා ත්‍රීරෝද රථ**

විකිණීම

**EPBIM** - 5709 Hero Destini ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216 සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 038704



**රැකී රක්ෂා**




325

**ඇබෑර්තු**

විවිධ

**සීමාසහිත** සමාගමක් සඳහා ග්‍රාමීය අලෙවි නියෝජිතවරුන් / වරියන් දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම දේශිය රූපලාවන්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනයට බඳවා ගැනේ. මාසිකව රු. 35000/- ඉහල ආදායමක් පහසුවෙන් ලබාගත හැක. වැඩි විස්තර සඳහා ඔබගේ නම හා ලිපිනය SMS කරන්න. 0704394006 038912

---



**21 වැනි සියවසට එළඹෙන යෞවනයට**

නිරවුල් ගමන් මග

බුදුසරණ

---

# ප්‍රධාන ලේකම් කාර්යාලය

# උතුරු මැද පළාත

## ලංසු කැඳවීමේ ආරාධනයයි

උතුරු මැද පළාත්, පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපෘතීන් සඳහා පහත CIDA ආයතනයේ ලියාපදිංචිය සහිත ලංසුකරුවන්ගෙන් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති / ප්‍රධාන ලේකම් වන මා විසින් ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

### උපලේඛනය

| අනු අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම (වැට් රහිත රු. මි.) | ආපසු නොගෙවන ලියකියවිළි සඳහා වන ගාස්තුව (රු.) | ලංසු ඇපකරය | | ICTAD (CIDA) ආයතනයේ ලියාපදිංචිය (මාර්ග හා පාලම් ඉදිකිරීම්) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වටිනාකම (රු.) | ලංසු විවෘත කරන දින සිට වලංගු විය යුතු දිනය | |
| 01 | 2021/PR DA/C & D/03 | සුසානය භූමිය - විජයපුර - පුබුදුපුර මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීම (1+780-3+350) සහ විජයපුර ජනහිත හන්දිය මාර්ගය (0+00) මල්වතුඔය අසල පාලම පළල් කිරීම | නැ.නු.ප. | 19.9 | 4,500.00 | 299,000.00 | 2021.10.29 | C6 සහ C5 |
| 02 | 2021/PR DA/C & D/04 | පුබුදුගම - නිධන්වල මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම (0+000-1+000) | දිඹුලාගල | 17.7 | 4,500.00 | 266,000.00 | 2021.10.29 | C6 සහ C5 |
| 03 | 2021/PR DA/C & D/08 | කොක්කිච්චිය - දිගනේගම මාර්ගය මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම. (1+000-2+000) | ම.නු.ප. | 15.3 | 4,000.00 | 230,000.00 | 2021.10.29 | C6 සහ C5 |
| 04 | 2021/PR DA/C & D/10 | දම්මින්න - අරුණපුර මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම. (2+430-4+000) | දිඹුලාගල | 14.4 | 4,000.00 | 217,000.00 | 2021.10.29 | C6 සහ C5 |
| 05 | 2021/PR DA/C & D/05 | පින්පාර මාර්ගය (1+117) ස්ථානයේ පවතින පාලම පුළුල් කර සංවර්ධනය කිරීම | හිඟුරක්ගොඩ | 13.4 | 4,000.00 | 202,000.00 | 2021.10.29 | C6 සහ C5 |

02. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021.06.23 දින සිට 2021.07.15** දින දක්වා සතියේ වැඩ කරනු ලබන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අනුරාධපුර, එච්.බී. සේමසිංහ මාවතේ පිහිටි උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ගණකාධිකාරී** වෙත උපලේඛනයේ සඳහන් ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් ගෙවා ලංසු ලියවිලි ලබාගත හැකිය.

03. ලංසු ඉදිරිපත් කිරීමේදී ඉහත උපලේඛනයේ සඳහන් වටිනාකමට සහ වලංගු කාල සීමාවට සරිලන පරිදි නියමිත ආකෘති පත්‍රයට අනුව නිසියාකාරව සම්පූර්ණ කරන ලද කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණයක්, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ලේකම්, පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය නමින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

04. මෙම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 50 ට වඩා අඩු වන විට, ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය පිළිබඳ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016(ii) හා 04/2016(iii) අනුව කටයුතු කරනු ලබන අතර, ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් 10% ට වඩා අඩුවන විටදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2020(i) අනුව කටයුතු කරනු ලැබේ.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු අසාධු ලේඛන ගත නොවූ අයෙකු විය යුතු අතර, ලංසු විවෘත කරන දිනට තම CIDA ලියාපදිංචිය සක්‍රියව තිබිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් පූර්ව ප්‍රසම්පාදන රැස්වීමක් 2021.07.09 දින පහත ලිපිනය සහිත පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේදී පෙ.ව. 10.00 ට පැවැත්වේ.

07. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා, එම කවර දෙක නැවත එක් කවරයක ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති අංකය පැහැදිලිව එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර මුද්‍රා තබා 2021.07.16 **දින පෙ. ව.** 11.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **"සභාපති, ප්‍රධාන ලේකම්, ගරු ආණ්ඩුකාරවර විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය. උතුරු මැද පළාත"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැකිය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට මෙම අවස්ථාවට සහභාගී විය හැකිය. මෙම ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උතුරු මැද පළාත, දුරකථන අංක 025-2222505 වෙතින් ලබාගත හැකිය.

**සභාපති / ප්‍රධාන ලේකම්,**
**ගරු ආණ්ඩුකාරවර විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු මැද පළාත.**
**025-2222736**

---

**ප්‍රසම්පාදන දැන්වීම සංශෝධනය කිරීම**

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**

**පළාත් හා කලාපීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සවිබල ගැන්වීම**

2021.05.13 වන දින පළ කරන ලද උක්ත කරුණට අදාළ පුවත්පත් දැන්වීමේ, 04 වන ඡේදයේ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැකි දිනය 2021.06.29 දින දක්වා ද, 06 වන ඡේදයේ ලංසු ලේඛන මිලදී ගත හැකි දිනය 2021.06.29 දින ප.ව. 03.00 දක්වා ද, 09 වන ඡේදයේ ලංසු පත් භාර ගන්නා දිනය 2021.06.30 දින ප.ව. 02.00 දක්වාද, ලෙස සංශෝධනය කරමි.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත, අනුරාධපුර.**
**2021.06.23**

---

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ලංසු සඳහා ආරාධනය

**ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

## ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

### ප්‍රධාන කාර්යාලයට සහ දිස්ත්‍රික් කාර්යාලවලට කැබ්රථ 20 ක් / ජීප් රථ 01 ක් කුලියට ලබා ගැනීම

පහත විස්තර කොට ඇති කාර්යය සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් සුදුසුකම් ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳ වනු ලැබේ.

| කොන්ත්‍රාත්තුවේ නම | වාහන සංඛ්‍යාව | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | ලංසු සුරක්ෂණ අවශ්‍යතාවය (රු.) (බැංකු ඇපකරය) බැංකු ඇපකරය | යෝග්‍යතා සුදුසුකම් | ලිපිලේඛන නිකුත් කරන ස්ථානය හා විමසිය යුතු අය. | ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව. |
|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලයට සහ දිස්ත්‍රික් කාර්යාලවලට කැම් රථ කුලියට ලබා ගැනීම **කොන්ත්‍රාත් අංක** : DNCWS/PRO/2021/ Vehicle Hiring/01 | කැබ්රථ 20 | 5,000.00 | එක් වාහනයකට 30,000.00 බැගින් | වාහන අයිතිකරු හෝ වාහන කුලියට සපයන සමාගම් | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, නො. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ. | 2021 ජූලි 14 දින පෙ.ව. 10.00. දුරකථන : 0112774927 |
| ප්‍රධාන කාර්යාල සඳහා (ප්‍රාඩෝ SUV) ජීප් රථයක් කුලියට ලබා ගැනීම **කොන්ත්‍රාත් අංකය** : DNCWS/PRO/2021/ Vehicle Hiring/02 | ජීප් රථ 01 | 3,000.00 | එක් වාහනයකට 30,000.00 බැගින් | වාහන අයිතිකරු හෝ වාහන කුලියට සපයන සමාගම් | | |

01. අයදුම්කරුගේ ලිපි ශීර්ෂයක ලිඛිත අයදුම්පතක් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ විට ලංසුකරණ ලිපිලේඛන නිකුත් කරනු ඇත.

02. ලංසුකරණ ලිපිලේඛන 2021 දින තෙක් සාමාන්‍ය වැඩකරන දිනයන්හි 0900 පැයත්, 1500 පැයත් අතර ලබාගත හැකිය. (ඒ සඳහා දුරකථනය මගින් කලින් වේලාවක් වෙන්කරවා ගන්න.)

03. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ ලංසු ලිපිලේඛන නිකුත් කරන ස්ථානයේදී ලිපිලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

04. යථා පරිදි සම්පූර්ණ කළ ලංසු 2021 ජූලි 14 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර පහත දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාවක් මගින් ලැබෙන්නට සැළැස්විය හැකිය. නැතහොත් දෙපාර්තමේන්තුවේ 2 වන මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

05. සියලුම ලංසු 2021 ජූලි 14 දින පෙ.ව. 10.15 ට, එම අවස්ථාවට සහභාගිවීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී එම ලිපිනයේදීම විවෘත කෙරේ. ප්‍රමාදවී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු එවනු ලැබේ.

06. ලංසු වලංගු කාලය දින 77 කි.

07. ලංසු සුරක්ෂණය 2021.10.27 දින දක්වා වලංගු විය යුතු අතර, තලවතුගොඩ පන්නිපිටිය පාරේ, නො. 1114, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමට යොමු කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,**
**නො. 1114, පන්නිපිටිය පාර, තලවතුගොඩ, බත්තරමුල්ල.**
**2021.06.21**

---

# ලංසු සඳහා ආරාධනයයි

## ලුනුගල ප්‍රාදේශීය සභාව

01. ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ඉදිකිරීම් නම | අවශ්‍ය ICTAD ශ්‍රේණිය | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ලංසු සුරක්ෂණය | | ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුව |
|---|---|---|---|---|---|
| | | | සුරක්ෂණ මුදල (රු.) | වලංගු කාලය | |
| ලුනුගල විවිධ සේවා ගොඩනැගිල්ල ඉදිකිරීම BD/LGPS/2021/W01 | C-6 හා C-7 ගොඩනැගිලි | මාස 04 | 90,000/- | 2021 ඔක්තෝබර් 28 | 2,500/- |

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණය මගින් මෙහෙයවනු ලැබේ. කෙසේ වෙතත් ඌව පළාත් පරිපාලන සීමාව ඇතුළත ලියාපදිංචි වී ඇති ලංසුකරුවන්ට පමණක් සීමාවේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවූවකු විය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකරියේ, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉහත සඳහන් ශ්‍රේණිය සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. මෙම ලංසුව 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන මගින් පාලනය වේ. එම නිසා, ලංසුකරු **පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා** විසින් නිකුත් කළ වලංගු ලියාපදිංචි සහතිකය ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම, ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත.

05. සුදුසුකම් අවශ්‍යතාවයන් ලංසුකරණ ලිපිලේඛනෙහි 4 වන කොටසේ පෙන්වා දී ඇත. අමතර විස්තර 5 වන කොටසේ සඳහන්ව ඇත.

06. අභිලාෂී ලංසුකරුවන්ට වැඩමනත් විස්තර ලුනුගල ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙතින් (දු.ක. 0552263978 ෆැක්ස් : 0552263875, ඊමේල් lunugala.ps2011@gmail.com) වැඩිමනත් විස්තර ලබාගත හැකි අතර, කාර්යාල දිනයන් හි 9.00 පැය සිට 15.00 පැය දක්වා ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

07. **ලුනුගල ප්‍රාදේශීය සභාවේ ලේකම්** වෙත, ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ඉහත වගුවේ සඳහන් ආපසු නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව **2021 ජූනි 23 දින සිට 2021 ජූලි** 14 දින තෙක් 9.00 පැය සිට 15.00 පැය දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

08. ලංසු **ලුනුගල ප්‍රාදේශීය සභාවේ ලේකම්** වෙත **2021 ජූලි 15 දින** පැය **14.00** ට හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

09. ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 77 ක් දක්වා ලංසු වලංගු විය යුතුය.

10. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කළ වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් ඇපකර අරමුදලින් වගුවේ දී ඇති තොරතුරු ප්‍රකාර ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රාදේශීය සභාව, බණ්ඩාරවෙල.**

**055 2263978 / 0552263875** **2021 ජූනි 23**



# සම්බා මෙට්‍රික් ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට පියවර

## ඇමැති ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල

**නුවන් කොඩිකාර**

පාරිභෝගික ජනතාවට සහන සැලසීමත්, අතිරික්ත තොග පවත්වාගෙන යෑමත් මූලික කර ගනිමින් සම්බා මෙට්‍රික් ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට රජය තීරණය කළ බව ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පැවැසීය.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (22) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ වන විට වෙළෙඳපොළේ සහල් මිලෙහි යම් ඉහළ යෑමක් තිබෙනවා. වෙළෙඳපොළේ තරගකාරීත්වයක් ඇති කිරීමෙන් යම් මිල පාලනයක් ඇති කළ හැකියි. වර්තමානයේ වෙළෙඳපොළේ සහල් මිල සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරමින් මේ තීරණය ගත්තත් එය කැමැත්තෙන්ම කරන දෙයක් නොවේ.

නමුත් ජනතාවට තිබෙන පීඩනය අඩු කිරීමට එක ක්‍රමවේදයක් විදියට හාල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට තීරණය කළා. එය ආනයනය කිරීමේදී ක්‍රම කිහිපයක් සැලකිල්ලට ලක් කරනවා.

මේ කන්නයට කිසිදු පොහොර හිඟයක් නෑ. එය අමූලික බොරුවක්. අනෙක මේ කන්නයට කිසිම පොහොර හිඟයක් තිබෙන්න බෑ. මොකද 2018- 2019 වසරවල විශාල වශයෙන් පොහොර ආනයනය කර තිබෙනවා. සමහර විට එහි පරිපාලනයේ සහ බෙදා හැරීමේ ප්‍රශ්නයක් ඇති. නමුත් අප සතු දත්ත බැලූ විට කිසිදු පොහොර හිඟයක් නෑ. සමහරක් විට සමහර කණ්ඩායම් තමන්ගේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් මේ සඳහා ක්‍රියාත්මකවී තිබෙනවා කියන එක මේ දවස්වල ඔවුන්ගේ හැසිරීම්වලින් පෙන්නුම් කරනවා.



### තත්ත්වයෙන් ඉහළ කාබනික පොහොර ආනයනයට කැබිනට් මණ්ඩල අනුමැතිය

**ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ**

අනෙක් කාරණය තමයි අප සහල් ගෙන්න තීරණය කළේ අතිරේක තොග පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවත් සැලකිල්ලට අරගෙනයි. වර්තමානයේ උද්ගත වෙලා තිබෙන තත්ත්වයන් උඩ පාරිභෝගිකයන්ට වෙළෙඳපොළේ සහල් මිලේ ඉහළ යෑමක් තිබෙනවා. ඒ නිසා එය පාලනය කරන එක ක්‍රමයක් තමයි තරගකාරිත්වයක් ඇති කිරීම. හැබැයි පාරිභෝගිකයන් ගැන සිතා මිසක් පොහොර ප්‍රශ්නයක් නිසා නොවෙයි සහල් ගෙන්වීම කරන්නේ. පොහොර ප්‍රශ්නයක් එනවා නම් එන්නේ මේ කන්නයේදී නොවෙයි ඊළඟ කන්නයේදී.'

වැවිලි කර්මාන්ත ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා

'ගුණාත්මකභාවයෙන් ඉහළ කාබනික පොහොර දීමට දේශීයව පොහොර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නත්, ඉහළ කාබනික පොහොර ආනයනය කරන්නත් කැබිනට් මණ්ඩල අනුමැතියදී තිබෙනවා. ගොවීන්ට අවශ්‍ය පොහොර දීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබෙනවා. ඉතා කඩිනමින් එය ක්‍රියාත්මක කරනවා. කිසිදු බියක් ඇති කරගන්න එපා. ඔබට අවශ්‍ය කාබනික පොහොර දෙන්න රජයක් ලෙස අප කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, යම් පමණකට හෝ අස්වනු හානියක් සිදුවුණහොත් ඒ සඳහා වන්දි ගෙවීමටත් සූදානම් බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා මේ කාලයේ යම් කැප කිරීමක් සිදු කර අනාගතය වෙනුවෙන් වස විසෙන් තොර වගාවක් ඇති කරගන්න කටයුතු කරමු කියලා මා ගොවි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ රටට අවශය සහල් තොග තිබෙන බවට දත්තවලින් පෙන්වාදී තිබෙනවා. එහෙත් පුද්ගලයන් තිදෙනෙක් විසින් එම සහල් වෙළෙඳපොළට නිකුත් නොකරමින් මාෆියාවක් පවත්වාගෙන යන නිසා යම් අතිරික්ත තොග තබාගැනීමේ අරමුණින් මේ සහල් ගෙන්වීම සිදු කරනවා.'

# රතන හිමි දුන් පොරොන්දුව ඉටු කරන තෙක් මා බලා සිටිනවා

## ගලගොඩඅත්තේ ඥානසාර හිමි

**ශිරාන් රණසිංහ**

මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවේ දිවුරුම්දී මාස හයකට පසුව එම මන්ත්‍රී ධුරය තමාට දෙන බවට අතුරලියේ රතන හිමි දුන් පොරොන්දුව ඉටු කරන තෙක් තාමත් බලාපොරොත්තු තබා සිටින බව ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ පැවැසූහ.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ උන් වහන්සේ මෙසේ ද කීහ.

'ඉකුත් මහ මැතිවරණයේදී අපේ ජනබල පක්ෂයට ලැබුණු එකම ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය සම්බන්ධයෙන් මාස ගණනාවක් පක්ෂ අභ්‍යන්තරයේ මත ගැටුම් ඇති වුණා. ඒ අනුව එම මන්ත්‍රී ධුරයට අයකු පත්කිරීම මාස කිහිපයක් යනතුරු අර්බුදයකට ලක්ව තිබුණා.

වසංගතයත් එක්ක රටේ සමාජ, ආර්ථික ප්‍රශ්න වැඩි වෙලා. මේ මෙහොතේදී අප පාර්ලිමේන්තුවේ වැඩක් කළ යුතුයි. විශේෂයෙන්ම මුස්ලිම් අන්තවාදයට එරෙහිව යම් යම් පියවර ගත යුතුයි. මේ ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් ලැබුණේ ඒවා ඉටු කරන්න.



අන්තවාදයට එරෙහිව අප එළියේ කතා කරද්දී අන්තවාදය පතුරනවා කියලා අපට චෝදනා කරනවා.

අප මාධ්‍ය සාකච්ඡා, උද්ඝෝෂණ, රැස්වීම් තියන කොට දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති අල්ලාගෙන අප උසාවි දානවා. අපට පාර්ලිමේන්තුවේ අනෙක් මන්ත්‍රීවරුන් දෙසීය විසිහතර දෙනා අතරේ වාඩි වෙලා ඉන්න ආසාවක් නෑ. අපට මේ රට වෙනුවෙන් කරන්න යුතුකම් තිබෙනවා. අන්තවාදයට එරෙහිව අණපනත් අවශ්‍යයි. ඒකට හඬ නගන්න තමයි මා පාර්ලිමේන්තු මන්ත්‍රීකම ඉල්ලන්නේ. රතන හාමුදුරුවෝ එක්ක රණ්ඩු අල්ලන්න යන්නේ නෑ. ඒත් පොරොන්දු වූ පරිදි මට මන්ත්‍රීකම දෙනතුරු බලා ඉන්නවා.'

# සුළු භූ කම්පන තත්ත්වයන්ට හේතු සොයා බලනවා

## භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපති ඉංජිනේරු අනුර වල්පොල

**උපාලි කරුණාරත්න**

ත්‍රිකුණාමලය සිට කන්දඋඩරට හරහා මාතර දක්වා තිබෙන ඛනිජ ද්‍රව්‍ය අඩංගු තීරුවේ පවතින වාත කුහර මෙරට ඇති වන සුළු භූ කම්පන තත්ත්වයන්ට හේතු වනවා දැයි සොයා බලමින් තිබෙන බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපති ඉංජිනේරු අනුර වල්පොල මහතා පැවැසීය.

සභාපතිවරයා එසේ ප්‍රකාශ කළේ මෙරට සිදු වන සුළු භූ කම්පන පිළිබඳව 'දිනමිණ'ට අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ සභාපතිවරයා මෙසේ ද කීය.

'පසුගිය කාලය පුරා විවිධ අවස්ථාවල මෙරට ස්ථාන ගණනාවක සුළු භූ කම්පන පිළිබඳව වාර්තා වුණා. ඒවා ඇති වූ ස්ථාන පිළිබඳව තවදුරටත් සූක්ෂමව සොයා බැලීමට සුළු භූ කම්පන වැඩි වශයෙන් වාර්තා වූ වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ ප්‍රදේශ ආශ්‍රිතව තවත් කුඩා භූකම්පන මාන දහයක් සවි කරනවා.

මේ වන විට ලොව කුමන ස්ථානයක භූ කම්පන ඇතිවුවත් මහකනදරාව, පල්ලෙකැලේ, හක්මන, බුද්ධංගල පිහිටි මෙරට ප්‍රධාන භූ කම්පන මනින ස්ථානවල සටහන් වෙනවා. එවැනි ප්‍රධාන තවත් භූ කම්පන මනින ස්ථානයක් ඉදිරියේදී ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවා.

වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ ප්‍රදේශ ආශ්‍රිතව ජර්මනියෙන් ගත් සුළු භූ කම්පන පිළිබඳව සොයා බැලීමේ උපකරණ සවි කරන්නේ අදාළ සිදුවීම සිදු වූ ස්ථානය පිළිබඳව ඉතා සූක්ෂමව සොයා බැලීමේ අරමුණින්.'

# අමෙරිකාවෙන් එන්නත් මිලියන 25ක් නැව් ගත කිරීමට පියවර

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව ඇතුළුව ආසියානු රටවල් සඳහා අමෙරිකාව දෙන පළමු එන්නත් මිලියන හත ඇතුළත් එන්නත් මිලියන 25ක තොගය නැව් ගත කිරීමට අමෙරිකා එක්සත් ජනපදය පියවර ගෙන තිබේ.

දෙවන අදියර යටතේ තවත් එන්නත් මාත්‍රා මිලියන 16ක් ලංකාව ඇතුළුව ආසියානු රටවලට දෙන බවට අමෙරිකානු ජනාධිපති ජෝ බයිඩන් මහතා ප්‍රකාශ කරයි.

මේ අතර මෙරට සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව 241,820ක් දක්වා ඉහළ ගොස් ඇත. නව ආසාදිතයන්ගෙන් 2,098ක් අලුත් අවුරුදු කොවිඩ් පොකුරේ ආශ්‍රිතයන් වන අතර, විදේශයන්හි සිට පැමිණි 33 දෙනකුද ආසාදිතයන් ලෙස හඳුනාගෙන තිබෙනවා.

ඒ අනුව තවදුරටත් ආසාදිතයන් 31,952ක් රෝහල්ගතව ප්‍රතිකාර ලබන අතර, සුවය ලැබූ සංඛ්‍යාව 272,087කි. මේ අතර ගත වූ මාස දෙකේ කොරෝනා ආසාදිත මරණ 2000 ඉක්මවා වාර්තවී තිබෙනවා. ඒ අනුව දළ වශයෙන් මාසිකව කොරෝනා හේතුවෙන් පුද්ගල මරණ දහසක් පමණ සිදුව ඇති බව වාර්තා වේ. කොරෝනා ආසාදිත මරණ 52ක් ඊයේ (22) දිනයේ වාර්තා වූ අතර, එම මරණ සිදුව ඇත්තේ පෙරේදා දිනයට අදාළවයි. ඒ අනුව මෙරට සමස්ත මරණ සංඛ්‍යාව 2,633ක් දක්වා ඉහළ ගොස් තිබේ. එයින් මරණ 2024ක් සිදුව ඇත්තේ කොරෝනා තුන්වන රැල්ලට අදාළවයි.

ඉතාලියේ මේ මස 28 වැනිදා සිට මුව ආවරණ පැළඳීම අනවශ්‍ය බව එරට සෞඛ්‍ය ඇමැතිවරයා ප්‍රකාශ කර තිබේ. දැනට ආසාදිතයන් නොමැති සුදු පැහැය යටතේ දක්වා ඇති එරට කලාපවලට එය බලපැවැත්වෙන බව ඔහු පවසා ඇත. එරට විශේෂඥයන් සඳහන් කර ඇත්තේ 28 වැනි සඳුදා වන විට මුළු ඉතාලියම සුදු කලාපයක් බවට පත් කළ හැකි වනු ඇති බවයි.

# නීති විරෝධී ජාවාරම් මැඬලීමට අඛණ්ඩ මෙහෙයුම්

**දිලංක ගුණතිලක**

නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ පරිසර හානි සිදු කරමින් සිදු කරන නීති විරෝධී ජාවාරම් මැඬපැවැත්වීමට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වාගේ උපදෙස් මත දිවයින පුරා විසිරී ඇති ආරක්ෂක සේනා මූලස්ථානවලින් මෙහෙයුම් අඛණ්ඩව සිදු කරනු ලැබේ.

ඒ අනුව 2021 වසරේ ජනවාරි මස සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් ආරම්භ කළ මෙහෙයුම්වලදී ගංජා කිලෝ 284 ග්‍රෑම් 76ක්, කේරළ ගංජා කිලෝ 745ක් අත් අඩංගුවට ගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා භට පිරිස් සමත් වූහ. ඊට අමතරව අයිස්, හෙරොයින් ඇතුළු නීති විරෝධී මත්ද්‍රව්‍ය ද අත්අඩංගුවට ගැනීමට යුද්ධ හමුදා භට පිරිස් කටයුතු කළහ. මෙලෙස අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් 68 දෙනකු ද යුද්ධ හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා පොලිසියට භාරදී ඇත.

එසේම නීති විරෝධී වැලි ජාවාරමේ නිරත වූ පුද්ගලයන් 171 දෙනකු අත්අඩංගුවට ගෙන ඉදිරි පරීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට යුද්ධ හමුදාව කටයුතු කර ඇත. එලෙස අත්ඩංගුවට ගත් පුද්ගලයන් නීති විරෝධී වැලි ජාවාරම සඳහා භාවිත කළ ට්‍රැක්ටර් රථ 57ක්, ටිපර් රථ 07ක්, ඩම්ප් ට්‍රක් රථ 08ක් සහ කරත්ත 2ක් ද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අත්අඩංගුවට ගෙන ඉදිරි නීතිමය කටයුතු සඳහා පොලිසිය සහ අදාළ ආයතන වෙත භාර දීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කරන ලදී.



බස්නාහිර පළාතේ උප්පැන්න සහ මරණ සහතික ප්‍රථම වරට පරිගණක ගත කර පිටපත් නිකුත් කිරීමේ ක්‍රමවේදය ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේදී පසුගියදා සිදු වූ අයුරු. මේ අවස්ථාවට සහභාගි වූ ගම්පහ සහකාර ප්‍රාදේශීය ලේකම් සුරංගි ලක්ශ්‍රිණි ගුණතිලක, ගම්පහ සහකාර රෙජිස්ට්‍රාර් දිලූක විතානආරච්චි, ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් චමින්ද හේරත්, අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් ලසිකා ඒකනායක, ගම්පහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් සංගමයේ ලේකම් තාලති රණතුංග මහත්ම මහත්මීහු එක් වූහ.

# ආණ්ඩුවේ හවුල්කාර පක්ෂවලට දේශපාලන ප්‍රශ්නයක් ඇති වෙමින් තිබෙනවා

## රාජ්‍ය ඇමැති ජයන්ත සමරවීර

**සුභාෂිණී සේනානායක**

ආණ්ඩුවේ හවුල්කාර පක්ෂවලට කෙනෙහිලිකම්වලට එහා ගිය දේශපාලන ප්‍රශ්නයක් ඇති වෙමින් තිබෙන බව රාජ්‍ය ඇමැති ජයන්ත සමරවීර මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය. '1956දී පැමිණි දේශප්‍රේමී ගමන නවතා දැමුවේ බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමෙන්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 1970 බලයට පැමිණි සමගි පෙරමුණු ආණ්ඩුව විසින් මුල පුරා තිබුණු ජාතික ආර්ථික ගමන වැළැක්වූයේ ආචාර්ය එන්. එම්. පෙරේරා ඇතුළු වමේ පක්ෂ ආණ්ඩුවෙන් එළවා දැමීමෙන්. නැවත වරක් වත්මන් ආණ්ඩුවේ සිදු වෙමින් තිබෙන්නේ එවැනි තත්ත්වයක්.

ගෝඨාභය රාජපක්ෂ මහතාට ජනාධිපති අපේක්ෂකත්වය නොදී සිටි මේ කුමන්ත්‍රණකාරී බලවේග ක්‍රියාත්මකව තිබියදී මේ මොහොතේ රට හමුවේ පවතින අභියෝග ජයගැනීමට ගෝඨාභය රාජපක්ෂ මහතා හැර වෙනත් සුදුසු පුද්ගලයෙක් නොමැති බවට සමාජයේ දැ හිතකාමී බලවේගවලට අවධාරණය කළ නායකයින් දෙදෙනකු වන විමල් වීරවංශ සහ උදය ගම්මන්පිල වැනි අයට ප්‍රහාර එල්ල කිරීමේ තත්ත්වය බරපතළ කාරණයක්.

මේ වන විට ආණ්ඩුවේ හවුල්කාර පක්ෂවලට බරපතළ පීඩාවක් ඇති වෙමින් තිබෙනවා. පවතින තත්ත්වය ගැන ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ මෙන්ම ජනතාව ද අවධානයෙන් පසු වෙනවා.'

# දිස්ත්‍රික් මට්ටමින් සංචාරක සංවර්ධන සැලැස්මක්

**මහින්ද අලුත්ගෙදර**

සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට දිස්ත්‍රික් මට්ටමින් සංචාරක සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට රජය තීරණය කරයි.

ඒ සඳහා අදාළ යෝජනා දෙන්නැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගෙන් ඉල්ලීමක් කරයි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඇමැතිවරයා මෙසේ ද කීය.

'මේ යටතේ ඒ ඒ දිස්ත්‍රික්කවල දැනටමත් ඇති සංචාරක කලාප සංවර්ධනය කිරීමටත්, නව සංචාරක ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන ඒවා ප්‍රවර්ධනය කිරීමටත් ප්‍රමුඛතාව දෙන්න. ආර්ථික පුනර්ජීවන සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකාය දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලද සාකච්ඡා සහ ජනාධිපතිවරයාගේ ගම සමඟ පිළිසඳරක් වැඩසටහන්වලදී මතු වූ යෝජනා සඳහා ද ප්‍රමුඛතාව හිමි වෙනවා. හඳුනාගනු ලබන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට අදාළ යෝජනා ප්‍රමුඛතාව පරිදි පෙළගස්වා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ද අනුමැතිය ඇතිව අමාත්‍යාංශයට යොමු කරන්න.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි දිවයිනේ සියලුම සංචාරක කලාප සහ නගරවල යටිතල පහසුකම් නංවාලීම මේ ව්‍යාපෘතියේ අරමුණයි. මෙරටට පැමිණෙන වාර්ෂික සංචාරකයන් ප්‍රමාණය මිලියන 07 දක්වා ඉහළ දැමීමත් එමගින් වාර්ෂිකව රුපියල් බිලියන 10ක් ජාතික ආර්ථිකයට එක් කිරීමත් රජයේ අරමුණයි.

කොවිඩ් වසංගතය හේතුවෙන් බිඳවැටුණු සංචාරක කර්මාන්තය පැවති තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයට ගෙන ඒමට රජය සංචාරක ප්‍රවර්ධන වැඩ සැලැස්මක් ද සකස් කර තිබෙනවා. කොවිඩ් එන්නත්කරණය ලොව පුරා සිදු කිරීමත් සමඟ ලෝකයේ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වනු ඇතැයි විශ්වාස කරනවා. ඒ අනුව මෙරට සංචාරක ව්‍යාපාරය ද යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරනවා.'

# වැසි තත්ත්වයේ අඩුවීමක්

**උපාලි කරුණාරත්න**

දැනට පවතින වැසි තත්ත්වය ලබන 27 වැනි දින පමණ දක්වා අඩු වැඩි වෙමින් පවතිනු ඇති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකිකරණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙරිල් මෙන්ඩිස් මහතා පැවැසීය.

අද (23) දිනයේ බස්නාහිර, මධ්‍යම, සබරගමුව, දකුණු පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

## පොලාගේ ලියවිල්ල

# 'තව මොනවද අඩු මෙන්න බොලේ බඩු යූ. ඇන්. පි. ය කුඩු යමුද මචෝ මඩු'

එදා මැතිනිගේ ආණ්ඩු කාලයේ තෙල් හොයාගත්තා කියලා සතුට දෝර ගලපු අපේ ඇයෝ එහෙමයි කෑ ගැහුවේ. හැම පැත්තෙන්ම දේශීය කර්මාන්ත ගොඩදාන කාලයක් හින්දා. මිනිස්සු එදා ඒක ඇඟටම ගත්තා. ලංකාව ගොඩේ ගොඩ කියලයි එදා ගොඩක් අය කීවේ. හැබැයි ඊට ඉස්සර 67 ඩඩ්ලිගේ ආණ්ඩුව කාලයේ තෙල් කතාව කරළියට ඇවිත් තිබුණා.

එදා මැතිනිගේ කාලයේ කතාවට ගුවන් විදුලියයි පත්තරයයි දෙන්න පුළුවන් හැම ඉඩක්ම දුන්නා. එක පැත්තකින් මැතිනි කියන්නේ දේශීය සම්පත් ගොඩනගන්න උත්සාහ කළ ආසියාවේ දිරිය ගැහැනියයි. ඒත් ඇයටත් වැරදුණු තැන් නැතුවාම නොවේ.

ඒ කාලයේ ලෝක තෙල් මිල ගැන ලොකුවට කතා නොකළද මැතිනිගේ ආණ්ඩුව තෙල් මිල වැඩි කරන විට ජේ. ආර්. ඇතුළු විපක්ෂයේ උදවිය එදා පාර්ලිමේන්තුවට ආවේ කරත්තවලිනි. අවුරුදු පනහකට විතර පස්සෙත් අපේ ඒ දේශපාලන සංස්කෘතියේ වෙනසක් අදත් පෙනෙන්නේ නැහැ.

මැතිනිගෙන් පස්සේ බලයට ආපු හැම ආණ්ඩුවක්ම දේශපාලන වේදිකාවේ මන්නාරමේ තෙලුයි, ඛනිජ සම්පතයි ගැන කතා කළා. ලංකාවෙන් තෙල් පිටරටට යවනවා කීවා. මේ අය ඒක වේදිකාවේ කතා කළේ මහ උජාරුවෙන්.

ඒත් අවුරුදු පනහක් ගෙවුණත් අද වෙනකම් අපට ලැබුණු තෙලක් නැහැ. ලෝක වෙළෙඳපොළේ තෙල් මිල අඩු වැඩි වන විට ඒ පදයට නටන එකයි හැම ආණ්ඩුවක්ම කළේ. සමහර කාලවල මිල සූත්‍ර ගෙනත් ජනතාව ගොනාට ඇන්දුවා. එහෙම කාලවල මාසයෙන් මාසයට තෙල් මිල වැඩි කරන්නයි ඒ අය සූත්‍රර හැදුවේ.

කාලයකට පස්සේ අද ආයෙත් තෙල් ගැන, ගෑස් ගැන කතා කරන්න පටන් අරන්. තෙල් මිල වැඩි කරලා සතියක් යන්න ඉස්සර වෙලා ගෑස් මිල වැඩි කරන්න සමාගම් ඉල්ලද්දී ගෑස් මිල වැඩි කරන්නේ නෑ කියලා පෙරේදා රජය තීරණයකට ආපු එක එක පැත්තකින් ජනතාවට පොඩි හරි සහනයක්.

තෙල් සම්පත කියන්නේ ආසියාව පැත්තට ආගන්තුක වුවත් අරාබි ලෝකයට ඒක තමයි ආශිර්වාදය. ලෝක තෙල් සම්පතින් 65%ක් භුක්ති විඳින්නේ සවුදිය, ඉරානය, ඉරාකය, කුවේට්, ඕමාන් ඇතුළු රටවල්ය. ප්‍රවාහන පද්ධතියේ 90%කට වඩා සාධකය ඛනිජ තෙල්ය. තෙල් නිසාම සමහර රටවල් යුද්ධවල පැටලුණා. අද වන විට ලෝක ආර්ථිකයේ ප්‍රධාන සාධකයක් විදිහට ඛනිජ තෙල් පත් වෙලා. ලෝකයේ බොහෝ රටවල ආණ්ඩු පෙරලුණේ ද ගොඩ ආවේ ද තෙල් නිසාය.

මේ වන විට ඛනිජ වර්ග විස්සක් විතර ශ්‍රී ලංකා භූමිය සතුව පවතී. තිරුවානා, මිනිරන්, පොස්පේට්, මැණික්, ඩොලමයිට්, හුණුගල්, සිලිකා වැලි, යපස් ඒ අතර වේ. එනිසා එක් පැත්තකින් තෙල් ගැනයි, ගෑස් ගැනයි තියෙන අදහස අපට අමතක කරන්න බැහැ. ඒත් ඒ බලාපොරොත්තුව තියාගෙන ලෝක වෙළෙඳපොළේ තෙල්, ගෑස් අඩු වැඩි වන විට ඒවා අඩු වැඩි කරන සූත්තර විතරක් තියාගෙන අපට ගොඩ එන්න බෑ.

මන්නාරම් උතුරු මුහුදේ තෙල් සම්පත ගැන කතාව තවමත් බැහැර වෙලා නෑ. ඒත් තාම ඒක හරියට හොයා ගෙනත් නෑ. ඇත්තටම තෙල් තිබුණොත් අප රටක් විදිහට ගොඩේ ගොඩ. මේ ඇවිත් තියෙන්නේ ඒකට උනන්දු වෙන්න ඕනැම කාලයක්. එක පැත්තකින් මේ වෙලාවේ ගෑස් මිල වැඩි කරපු නැති එක ජනතාවට කප්පරක්. ඒත් මේක කොයිතරම් කාලයක් අල්ලගෙන ඉන්න පුළුවන් වෙයිද. අද අප ගෙවන්නේ ලෝකයටම අමාරු කාලයක්. මෙහෙම අමාරු කාලවල මිනිස්සුන්ට මේ වගේ වැඩිකිරීම් ඉවසුම් නැහැ.

එදා ඉඳලා හිටපු හැම විපක්ෂයක් ආණ්ඩුව තෙල් මිල වැඩි කරන කොට කළේ සංදර්ශන විතරයි. අද කෙරෙන්නෙත් ඒකමයි. මේකෙන් වෙන්නේ ජනතාව තවත් කබලෙන් ළිපට වැටෙන එකයි. එදා වගේම අදත් යතුරුපැදියෙන්, ත්‍රීරෝද රථයෙන්, බට්ටා ලොරියෙන් පාර්ලිමේන්තු ආපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආපහු යන්න ගියේ තම තමන්ට තියෙන සැප වාහනවලමය. මේක දැන්වත් නවතින්න ඕනෑ කාලයක්. කරනවා නම් ආණ්ඩුවට දැනෙන නෙවේ මිනිසුන්ට ලැබෙන දෙයක් කරන්න ඕනෑ.

ශ්‍රී.ලංකා, යූ.එන්.පී. හවුල් ආණ්ඩු වගේම හැම ආණ්ඩු කාලයකම තෙල් මිල අඩු වැඩි වුණා. ඒ වෙලාවට විපක්ෂය කළේ ගොන් කරත්තවල, පාපැදිවල, යතුරුපැදිවල යන එකයි, පාරට බැහැලා බෝඩ් එල්ලාගෙන පත්තරවලට ටී.වී. වලට පෙනෙන්න සංදර්ශන දාන එකයි විතරයි. ඒකෙන් ජනතාවට ලැබුණු සහනයක් නෑ. මේකට දැන්වත් තිත තියන්න ඕනෑ කාලයක්. එහෙම නැත්තන් ඒකේ පව් ගෙවන්න වෙන්නේ අදට නුපන් පරපුරටය.

✍ ඉන්දික පොල්කොටුව



# කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ඉඩම් ලබා දීමට පියවර

## ඇමැති එස්. එම්. චන්ද්‍රසේන

## පාර්ලිමේන්තුව

**ස්වර්ණා විජේකෝන් සහ පහන් විජේසේකර**

මෙරටේ කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය දීමට බලාපොරොත්තු වන බව ඉඩම් ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහතා ඊයේ (22) පාර්ලිමේන්තුවේදී පැවැසීය.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථා පනත (සංශෝධන) පිළිබඳ පැවති විවාදයේදී අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඇමැතිවරයා මෙසේ ද සඳහන් කළේය.

'ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල් ගෙවීමේදී විශාල ව්‍යාපෘති 6කට රෙගුලාසි සංශෝධනය කරනවා. කොළඹ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වටිනා ඉඩම් අත්පත් කර ගන්නවා. ඒ ඉඩම්වලට සුදුසු වටිනාකම් නොලැබෙනවා කියන දුක් ගැනවිල්ල සලකා බලා මා මේ සංශෝධනය ඉදිරිපත් කරනවා. ඉඩම් අයිතිකරුට අවාසියක් නොවන ආකාරයට මුදල ගෙවන්න තමයි වැඩපිළිවෙළ සකස් කර තිබෙන්නේ. සමහර විට එහි වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියේ නම් එහි කොපමණ ලාභ ලබනවාද කියලත් සොයා බලනවා. තවම අවුරුදු 10ක 15ක වන්දි ගෙවාගන්න බැරි වූ ඒවා තිබෙනවා. මේ අසාධාරණකම් වන නිසා තමයි ජනාධිපතිවරයා මට දැන්වූයේ මෙයට කැබිනට් පත්‍රිකාවක් දමා කරන්න කියලා. ජනතා විරෝධතා එල්ල වන නිසා සංවර්ධනය ආ පස්සට ගිහින් තිබෙනවා. ඒ නිසා රටේ දැවැන්ත සංවර්ධනයට කරන දේ වෙනුවෙන් සහයෝගය අපට දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

තරුණයන් ලක්ෂයකට ඉඩම් දෙන්න කියලා ජනාධිපතිවරයා උපදෙස් දී තිබෙනවා. මේ කොරෝනා වසංගත මධ්‍යයේ වුවත් ඒ සඳහාත් අප කටයුතු කරගෙන යනවා. ඒ වගේම රසායනික පොහොර නිසා රජරට ජනතාව විශාල ලෙස වකුගඩු රෝගවලින් බැට කනවා. ඒ නිසයි, මේ වැදගත් තීන්දුව ජනාධිපතිවරයා ගත්තේ. ඒ නිසා එන මාස් කන්නයේ සියලුම ගොවීන්ට නොමිලේ කාබනික පොහොර දෙන්න බලාපොරොත්තු වෙනවා. කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය අප අමාත්‍යාංශය විදියට දෙනවා.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා**

'දඹුල්ල හරහා හබරණ සිට යාපනය දක්වා දිවෙන දුම්රිය මාර්ග ව්‍යාපෘතියට අත්පත් කර ගන්නා ඉඩම් ගත්තොත් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය දුප්පත් ජනතාවගේ ඉඩම්. ඒ වගේම බලපත්‍ර ඉඩම්, විහාර ගම් දේවාල ඉඩම්. මේ රෙගුලාසිවලින් ඔවුන්ට අත් වන යහපත ගැන හිතලා මේ රෙගුලාසිවලට විරුද්ධ වෙන්නේ නෑ. නමුත් උපාය මාර්ගික ව්‍යාපෘතිවලට කියලා කොළඹ සහ අනෙකුත් වටිනා ඉඩම් අයථා ලෙස යොදා ගන්නවා නම් අප විරුද්ධයි. අපේ රටේ ඉඩම් විකුණගෙන කන ප්‍රතිපත්තියට අප විරුද්ධයි. අත්පත් කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තිය නිසා ජනතාව විශාල ලෙස අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා ඊට අදාළ සංශෝධන ගේන්න අවශ්‍යයි. අප දන්නවා, විෂය භාර ඇමැති වෙනස් වුණාම ව්‍යාපෘතිය වෙනස් වෙනවා. පනත් වෙනස් වෙනවා. ඒ වගේම සමහර අහිංසක මිනිසුන්ට තමන්ගේ කියලා ඔප්පු කර ගත නොහැකි ඉඩම් තිබෙනවා. ඒ ජනතාවට සහනයක් සැලසිය යුතුයි. ඒ වගේම රක්ෂිත නීති විරෝධීව අල්ලාගෙන ඉන්න අයත් ඉන්නවා. ඒ සඳහාත් වගකීමෙන් කටයුතු කළ යුතුයි.

ඡන්දය කාලේ නොමිලේ පොහොර දෙනවා කිවුවාට ඇත්තටම අපට ඩොලර් නැති නිසයි පොහොර ගේන්නේ නැත්තේ කියලා ජනතාවට කියන්න ඕනේ. තෙල් ඇමැතිවරයා කෙළින් කිවුවා වගේ. අපේ රටේ ප්‍රථම ඉඩම් ඇමැති ඩී. එස්. සේනානායක මහතා ලියූ පොත කියවලා ඇති. කොටින්ම අපේ රටේ පස හුරු කර තිබෙන්නේ රසායනික පොහොර භාවිතයට කියලා. මේක ක්‍රමානුකූලව පරිවර්තනීය ලෙස කරන්න ඕන දෙයක්. එක පාරට කරන්න ගියොත් විශාල අර්බුදයකට මුහුණ දෙන්න වෙනවා. මුල් අයිතිකරුවන්ට දුන් නැති ඉඩම් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ තිබෙනවා. නිසි උරුමක්කාරයන්ට එම ඉඩම් දීමට මා ඉඩම් ඇමැති කාලේ ඉලක්කයක් දී තිබුණා. නමුත් අවාසනාවකට ඒ ආණ්ඩුව 2019 වසරේ පරාජයට පත් වුණා.'

**වරාය හා නාවික කටයුතු ඇමැති රෝහිත අබේගුණවර්ධන මහතා**

'අප ජාතික සහ අන්තර්ජාතික වශයෙන් කොවිඩ්වලට මුහුණ දෙන ගමන් රටේ සංවර්ධනයත් කරගෙන යනවා. කොළඹ අගනගරය ආශ්‍රිත ව්‍යාපෘති ගැන අපේ ඇමැතිවරයා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. අපේ මාතෘ භූමියට තවත් භූමි කොටසක් ලැබුණේ පෝට් සිටි ව්‍යාපෘතිය නිසයි. ලෝකයේ දියුණු රටවල මනා මාර්ග පද්ධතියක් සහ සන්නිවේදන පද්ධතියක් තිබෙනවා. ඒ නිසා තමයි, අප මේ සඳහා කටයුතු කරගෙන යන්නේ. අප ආණ්ඩුවේ සිටියත්, විපක්ෂයේ සිටියත් වැඩ කරන්න කැමතියි. අපව ජනතාව පත් කරන්නේ කාල රාමුවකට. අපේ අවුරුදු පහක කාලය ඇතුළත සංවර්ධන ව්‍යාපෘති අවසන් කරන්න බලාපෙරොත්තු වෙනවා. ලෝකය දිහා බැලුවාම ආර්ථික වශයෙන් වෙනස් තැනකට යන්න වෙලා තිබෙනවා. අද සංචාරක ව්‍යාපාරයෙන් කිසිම රුපියලක් ලැබෙන්නේ නෑ. අපේ ආදායම් මාර්ග වැහිලා නම් නව දොරක් විවෘත කරන්න වෙනවා. ඒ නිසා තමයි, මේ රෙගුලාසි වෙනස් කර නව දොර විවෘත කරන්න යන්නේ. මේ ව්‍යාපෘති වෙනුවෙන් මෙරට මුදල් රුපියලක්වත් වැය කර නෑ.

එක්ස්ප්‍රස් පර්ල් නැව හසීරා වරායට ගිහින් බහාලුම් මෙහෙයුම් දියත් කර මැයි මාසයේ 20 වැනිදා වන විට ලංකාවට එනවා. මේ නැව පිටත හාබර් එකේ තිබෙන විට තමයි අපට දැනුම්වත් කරන්නේ නැවේ තිබෙන යම් දෙයක් පිටට එනවා කියලා. දුමක් නගිනවා කියලා. ඒ අනුව තමයි, අපේ වගකිව යුතු ආයතන නිරීක්ෂණයට ගියේ. මේක ඉතාම අහඹු සිද්ධියක්. මේකේ කපිතාන්වරයාට වගකීමක් තිබුණා, හසීරා වරායෙන් පිටත් වන විට මේ නැවේ අහිතකර දෙයක් තිබුණා නම් ඒ ගැන කියලා අප දැනුම්වත් කරන්න. එහෙම නම් අප ඒක පිටින් තියලා අවශ්‍ය කරන වැඩපිළිවෙළ ආරම්භ කරන්න තිබුණා. වරායවල් තුනකින් මේ නැව ප්‍රතික්ෂේප කළා කීම අමූලික බොරුවක්. වරායවල් තුනටම ගිහින් බහාලුම් මෙහෙයුම් කරලා තමයි මේ නැව එන්නේ. මේක ලංකාවට තුන් වතාවක් ආපු නැවක්. මේක අහඹු සිදුවීමක් නිසා දේශපාලන කෝණයෙන් බැලීම සුදුසු නෑ. විපක්ෂය කියන විදියට අප තමයි, කොරෝනා ආනයනය කර තිබෙන්නේ. හැමදේම දේශපාලන කෝණයකින් බලන්න හදනවා. දැන් තෙල් මිල ගැන කතා හදනවා. බුලත් විටක් කාලා හපයක් කර දුන් රටක් තමයි අප භාර ගත්තේ. එහෙම ගොඩනගාගෙන ඉද්දී තමයි කොවිඩ් වසංගතය ආවේ. මෛත්‍රීපාල සිරිසේන සහ රනිල් වික්‍රමසිංහ දෙපළ තමයි මේ රට අන්ධකාරයේ තිබ්බේ. එදා ඉවර කරන්න බෑ කිවුව යුද්ධය ඉවර කර මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සංවර්ධනය කළ රට තමයි පසුගිය ආණ්ඩුව විනාශ කළේ. අද එක රතිඤ්ඤා කරලක් පත්තු වෙන්නෙ නැති තැනට රට ගෙනාවා. යහපාලන ආණ්ඩුව ආපු ගමන් මහ බැංකුව කොල්ල කෑවා. වැඩ බිමක්ව තිබූ රට මුඩු බිමක් බවට පත් කළා. මේ අවුරුද්ද අවසන් කරන්න කලින් ලංකාවේ සියලුම අයට කොවිඩ් එන්නත දෙනවා. රජයට එන අභියෝග සියල්ල අප භාර ගන්නවා. යුද්ධය අවසන් කර රට එක්සේසත් කළා වගේම කොවිඩ් මර්දනය කර මේ රට ආසියාවේ ඓතිහාසික රටක් බවට පත් කිරීමට කටයුතු කරන බවට ප්‍රකාශ කරන්න කැමතියි.'

**නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පිරිසුදුකම පිළිබඳ රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා මහතා**

'ජනතාවගෙන් බහුතරයකට අද ගංවතුර පීඩාවක් බවට පත් වෙලා. ජනගහනය වැඩි වෙද්දී සොබා දහම සමඟ තිබූ බැඳීම නතර වෙලා ගියා. ඉඩකඩ මදි වන විට පහත් බිම්වලත් ජනතාව පදිංචි වෙන්න පටන් ගත්තා. රජයන් ඊට අදාළ පාලන කටයුතු කළත් අනවසර පදිංචි වීම් වැඩි වුණා. ඒ නිසා ඒ සඳහා නීතිරීති සම්පාදනය අවශ්‍ය වුණා. මුතුරාජවෙල ගත්තොත් පසුගිය දශක තුන පුරාවටම ජනතාව එහි අනවසරයෙන් පදිංචි වීම නිසා තුනෙන් දෙකක ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. ඉතුරු වෙලා තිබෙන තෙත් බිම රජයට පවරා ගෙන රම්‍යා තෙත් බිමක් විදියට සංවර්ධනය කිරීමට අප අපේක්ෂා කරනවා. එය ජාතික රක්ෂිතයක් බවට නම් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙතෙක් බලාත්මක වූ පනතට අනුව ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අනවසර ඉදි කිරීමක් කරන අයට විරුද්ධව තවදුරටත් තහනම් නියෝගයක් ගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. තවදුරටත් ඉදිකිරීම් නොකරන ලෙස තහනමක් ගත්තත් කරපු ඉදිකිරීම් ඉවත් කිරීමට හැකියාවක් තිබුණේ නෑ. ඒක බරපතළ තත්ත්වයක්. අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් ක්‍රම තුනක් ගැන සඳහන් වෙනවා.

මාදිවෙල කෘෂි ආයතනය, ගාලු මෝදර නාගරික වන උද්‍යාන ව්‍යාපෘතිය මෙන්ම දැනට අවසන් වීමට නියමිත බත්තරමුල්ල සඳුන් උද්‍යානය අලංකෘත ව්‍යාපෘති කිහිපයක්. ඊට අමතරව මෙරට සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ඇවිදින මංතීරු ව්‍යාපෘතිවලට මූලිකත්වය ගන්නේ මේ සංස්ථාව. මීට අමතරව ජලය බැස යෑමට ව්‍යාපෘති ගණනාවක් අප ක්‍රියාත්මක කරනවා. මේ ආණ්ඩුව ඉතා විශාල වැඩ කොටසක් කරනවා. ඒවා ජනතාව දන්නේ නෑ. ඉතා කැපවීමෙන් ක්‍රියා කරන නිලධාරීන් පිරිසක් අපට ඉන්නවා.'

**ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරිනි අමරසූරිය මහත්මිය**

'කොළඹින් පිට ගියොත් ඉඩම් ගොඩ කරලා බෝඩ් ගහලා තියෙනවා, සංවර්ධනය කර විකිණීමට ඇත කියලා. රජය දැන් කියන්නේ රටේ සංවර්ධනයට තමයි මේ සංශෝධනය ගේන්නේ කියලා. මේ රජය කොහොමද සංවර්ධනය කියන එක දකින්නේ. රජය සතු ඉඩම් රැසක් විකිණෙමින් යනවා. සෙලෙන්දිවා සංස්ථාව යටතේ කොළඹ ප්‍රදේශයේ ඉඩම් විශාල ප්‍රමාණයක් සංවර්ධනය කරන්න යනවා. ඇත්තටම මේ සංවර්ධනය වෙන්නේ කා වෙනුවෙන් ද කියලා අපට කතිකාවක් අවශ්‍යයි. අපේ රටේ සංවර්ධනයට පරිසරයත් සමඟ ගැට ගැසුණු සම්බන්ධතාවක් තිබුණා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න ඕනේ. දැන් කොටුව ප්‍රදේශය කියන්නේ පෞරාණික වටිනාකමක් ඇති ප්‍රදේශම නෙමෙයි. ජනතාව විශාල ප්‍රමාණයක් රැකියා සඳහා එනවා. විශාල ප්‍රමාණයක ආයතන පිහිටා තිබෙනවා. ඒ වගේම පාසල් පද්ධති තිබෙනවා. ඒ නිසා විශාල දෛනික බැඳීමක් තිබෙනවා. මේ පරිසරය සංවර්ධනය කරන මුවාවෙන් විශාල හානියක් සිදු වෙන්නත් පුළුවන්. පවුලක දියණියකට වුණත් ඉඩමක් ගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. මේ සංවර්ධනය කරන්නේ ඉතාම සුළු පිරිසකට, සමීපතමයන් පිරිසකට විතරක් නම් මේවායින් වැඩක් වෙන්නේ නෑ.'

**පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය ඇමැති රොෂාන් රණසිංහ මහතා**

'ඉඩම් අත්පත් කර ගැනීමේදී ජනතාවට සාධාරණ මුදලක් දීම වෙනුවෙන් තමයි අද අප මේ කටයුතු කරන්න හදන්නේ. ඉඩමක් පවරා ගන්න කොට තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කරන්නේ ඒ ඉඩමේ වටිනාකම පමණයි. නමුත් ව්‍යාපාරයක් කරන ව්‍යාපාරිකයාට ඒ ව්‍යාපාරය අතහැර යන්න වෙනවා. ඒ වගේම සංවර්ධන කටයුත්තකදී ඉඩමක් අත්පත් කරගන්නේ එම කටයුත්තට බාධාවක් කියලා තමයි. මේ නිසා ඇතැම් ව්‍යාපාර කළ අයට තමන්ගේ ව්‍යාපාර නාමය ඔස්සේ ගොඩනැගුණු පාරිභෝගික විශ්වාසය බිඳ වැටෙනවා. තව තැනකට ගිහිල්ලා ව්‍යාපාරයක් පටන් ගත්තත් පෙර තිබූ ස්ථානය දක්වා ව්‍යාපාරය ගොඩනගන්න යම් කිසි කාලයක් සහ ශ්‍රමයක් වැය කරන්න සිද්ධ වෙනවා. ඉතින් මෙන්න මේ කාරණාව සැලකිල්ලට ගෙන තමයි, ඒ පවුලේ දරුවන්ගේ පාසල් යන ආකාරය, ඒ පිරිස රැකී රක්ෂා කරනවා නම් එහිදී අත් වන තත්ත්වය ආදී සියල්ල සලකා බලා සාධාරණයක් කරන්න කටයුතු කරනවා.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක් අබේසිංහ මහතා**

'සංවර්ධනය මුවාවෙන් ඉඩම් අත්පත් කර ගැනීම, ඉඩම් ගොඩකිරීම මේ දවස්වල ඉතා ජයටම සිද්ධ වෙනවා. කුරුණෑගල නගර සංවර්ධනයට නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘති දෙකක් සකස් කළා. එහි ව්‍යාපෘති 38ක් නම් කර තිබුණා. පරිසරයට අවම හානි වන විදිහට කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉඩම අත්පත් කරගන්න එහිදී කටයුතු කර තිබුණා. ඒ සඳහා ආයෝජන තිබුණා. නමුත් පසුගිය දිනවල නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නගර සීමාවේ පිහිටි කුඹුරු අක්කර 130ක වපසරියක් ගොඩ කිරීම සම්බන්ධව අවසර අරන් තිබෙනවා. නමුත් පරිසරයට ගැටලු අවම වන ආකාරයටයි මේවා සංවිධානය කර තිබුණේ. 2021 මේ කුඹුරු ඉඩම් යට කරන්න වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. මේ නිසා මීට විරුද්ධව ස්වාමීන් වහන්සේලා කිහිප නමක් ඇතුළු පිරිසක් එකතු වෙලා ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. කුඹුරු ගොඩ කළොත් කුරුණෑගල නගරය අනිවාර්යයෙන්ම යට වෙනවා. කවුද මේ තීන්දුව ගත්තේ. ඒ පිළිබඳව සොයා බලන්න. මේ ස්වාමීන් වහන්සේලා තිස් දෙනම අත්සන් කළ ලිපිය මා අද හැන්සාඩ් ගත කරනවා.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. සී. අලවතුවල මහතා**

'කොරෝනා වගේම ඉඩම් ගැන කතා කරද්දී ගොවියා ගැන කතා කරන්නම වෙනවා. දැන් පොහොර හිඟය නිසා ගොවි ජනතාව විශාල අපහසුතාවට පත් වෙලා. තේ වගාව ගත්තත් දැන් නිෂ්පාදනය අඩු මට්ටමට ඇවිත් තිබෙන්නේ. සිලෝන් ටී කියලා හොඳ නාමයක් තිබුණත් දැන් අප ලෝක මට්ටමෙන් පහළ යමින් සිටිනවා. කාබනික පොහොර භාවිතයට අප කැමතියි. නමුත් එය ක්‍රමානුකූලව සිදු කළ යුතුයි. මේ ප්‍රශ්න ජනතාවට තිබුණත් අද කොළඹ තිබෙන වටිනා ඉඩම් විකිණීමට ආණ්ඩුව කටයුතු කරගෙන යනවා.'

**පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා**

'මේක ඉතාමත් වැදගත් පනතක්. නිරත ජනතාව ඉල්ලූ කරුණක් සම්බන්ධයෙන් තමයි, ඉඩම් ඇමැතිවරයා මේ පනත ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන්ම අහිංසක මිනිසුන්ට උසාවියට යන්න, හඬක් නගන්න හැකියාවක් නොතිබූ අයට ලොකු ප්‍රශ්නයකට විසඳුමක් තමයි මේ ලැබෙන්න යන්නෙ. ඒ නිසා අපේ ඇමැතිවරයාගේ ඉල්ලනවා, මේ කටයුත්ත කොහොම හරි සාර්ථක කර ගන්න කියලා. ජනතාවට සහන දෙන්න කටයුතු කරන්න.

අද සෑම ක්ෂේත්‍රයකම අර්බුද මතු වෙලා. ඒ නිසා අප එකතු වෙලා වැඩ කරන්න ඕනෙ. ආණ්ඩුවයි, විපක්ෂයයි කියලා බෙදෙන්නේ නැතිව වැඩ කළ යුතුයි. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තිබෙන නිලධාරී හිඟය නිසා ජනතාවගේ අවශ්‍යතා ඉටු කර ගන්න බැරිවී තිබෙනවා. අප ඒ සඳහා අවධානය යොමු කරන්න ඕනෙ. විරෝධතා මතු වුණාට රටේ සංවර්ධනය වෙනුවෙන් ඒ කටයුතු ක්‍රමානුකූලව සිදු කළ යුතුයි. අද රටේ තිබෙන සුසාන භූමි ටික මැනගන්න මිනින්දෝරුවෙක් නෑ. ඒ නිසා විශාල ප්‍රශ්න ප්‍රමාණයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. රජයේ ව්‍යාපෘති බහුතරයක් පරක්කු වෙනවා. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා මේ පිළිබඳ අලුත් ක්‍රමවේදයක් සකස් කරන්න. මිනින්දෝරුවන් බඳවා ගැනීමේ හැකියාව වැඩි කරන්න.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනී රෝහිණී කවිරත්න මහත්මිය**

'වී ගොවියා, අල ගොවියා, තේ ගොවියා යන සෑම ගොවියෙක්ම අද විශාල අපහසුතාවට පත් වෙලා. පුරන් කුඹුරු අස්වද්දන්න මහා උජාරුවෙන් පොරොන්දු දීපු ආණ්ඩුවට කුඹුරු ටික කර ගන්න පොහොර දෙන්න බැරි වෙලා. අද කන්න තිබුණු කුඹුරු පවා මුඩු ඉඩම් බවට පත් වෙලා. පිටරටින් සහල් ගෙන්වන්නේ නෑ කියූ ආණ්ඩුව දැන් සහල් මෙට්‍රික් ටොන් ගණනින් ආනයනය කරන්න සූදානම් වෙලා.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

'අද අපේ රට වෙන්දේසිකරුවන්ගේ පාරාදිසයක් බවට පත් වෙලා. අද ජේනවා ඉන්දියාව, චීනය වගේ රටවල් ඉඩම් වෙන්දේසියට ඇවිත් ඉන්නවා. ඉන්දියාවේ ඩ්‍රෝන යාත්‍රා රට පුරා කැරකෙනවා කියලා ආරංචියක් තිබෙන්නේ. ජාතික ආරක්ෂාවට කෝ අපේ රට රකින විරුවා ඉන්නවා කිවුවා. මේ රටේ ජාතික ආරක්ෂාව ගැන හොයනවාද නැත්නම් මේ රටේ තිබන ඉඩම් ගැන නිරීක්ෂණය කරනවාද කියලා අප දන්නේ නෑ. නැත්නම් චීනයට කලින් අපේ ඉඩම් ටික අරගන්න ඉන්දියාව සැලසුම් කරනවාද කියලා අප දන්නේ නෑ.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් මහතා**

'මේ රටේ වටිනා ඉඩම් සංවර්ධනය කරනවාද? නැත්නම් තමන්ට හිතවත් විදේශීය සමාගම්වලට දෙන්න යනවාද කියලා අනතුරක් මතු වෙලා තිබෙනවා. සෙලෙන්දිවා ආයතන යටතේ අනු ආයතන කිහිපයක් ස්ථාපිත කර තිබෙනවා. මේ ඉඩම් අරගෙන බැලුවාම කොටුවේ පෞරාණික ප්‍රදේශයේ ගෆූර්, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් ආයතනය, ග්‍රෑන්ඩ් හයට්, හිල්ටන් යන අධි වටිනාකමින් යුතු ස්ථාන විදේශීය ආයෝජකයන්ට දීමට පවරාගෙන තිබෙනවා. කොළඹට ආවම අපේ කියන හැඟීම එන ස්ථාන සියල්ල මේ විදේශයන්ට දෙන්න සූදානම් වෙනවා. මේ ආණ්ඩුව ණය අරගෙන ගෙවා ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ජී.එස්.පී. සහනය අහිමි වෙන්න යනවා. අපේ ණය ගෙවන්න ඩොලර් සංචිත අඩු වෙලා තිබෙනවා. ඒ වගේම පිටරටින් තෙල් ගන්න විදෙස් සංචිත නැති නිසා තමයි තෙල් මිල වැඩි කළේ කියලා ඇමැතිවරයා කිවුවා. බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා කියනවා, ණයක් ගෙවන්න බැරි නම් ගෙදර තිබෙන බඩු ටික හරි විකුණන්න වෙනවා කියලා. අපට කමක් නෑ, එතුමාගේ ගෙදර තිබෙන බඩු විකුණා ගත්තාට. නමුත් මේ ආණ්ඩුව කරගෙන යන දේශද්‍රෝහී ඉඩම් විකිණීමේ ව්‍යාපෘතියට අප දැඩි ලෙස විරුද්ධ වෙනවා.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී වේලුකුමාර් මහතා**

'ඉඩම් සංවර්ධන පනතේදී අද වන විට ජනතාවට විශාල ප්‍රශ්නයක් තිබෙනවා, රටේ නායකයා කවුද කියලා. සමහරු කියනවා නායකයා ගෝඨාභය රාජපක්ෂ මහතා කියලා. තවත් අය කියනවා, මහින්ද රාජපක්ෂ මහතා කියලා. තවත් අය කියනවා, බැසිල් රාජපක්ෂ මහතා කියලා. ජනතාව දන්නේ නෑ නායකයා කවුද කියලා. අද මේ රට මාෆියාවක් අල්ලාගෙන තිබෙනවා. චීන රජය තමයි මේ රට අල්ලාගෙන තිබෙන්නේ. මේ රටේ කුමන්ත්‍රණය කර තිබෙන්නේ චීන රජය තමයි. චීන රජය කියනවා, අද අප පොහොර ගෙනත් දෙන්නම් කියලා.'

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

'දැවැන්ත සංවර්ධන කටයුතු කරන කොට මුහුණ දෙන ගැටලුවක් තමයි වන්දි ක්‍රමය. ඉඩම් හිමියාට තම ඉඩමට ලැබෙන මුදල කුමක්ද කියන එක තමයි ඔවුන් සිතන්නේ. මේ ඉඩම් පවරා ගැනීමෙ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. අපට තිබෙනවා, කොළඹ නුවර පාර සංවර්ධනය කරන්න. මේ ඉඩම්වලට ගෙවන මුදල අපට ගැටලුවක් වෙලා තිබෙනවා. සමහර එක ළඟ තිබෙන ඉඩම්වල ගැටලු තිබෙනවා. එක ඉඩමකට එක ගානක් අනෙක් ඉඩමට තවත් ගානක් ගෙවීමේදී මේවායේ ගැටලු පැන නගිනවා. ජනතාව මේ ප්‍රශ්නයේදී පසු බසිනවා. මා මේවාට මැදිහත් වෙලා තමයි මේ ප්‍රශ්න නිරාකරණය කළේ. ජනතාව මේවාට විරෝධය දක්වනවා. රජය මේවාට ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. මේ ජනතාවට සාධාරණයක් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. වගුරු බිම් පවත්වාගෙන යනවාට වඩා සියලු ආයතන එකඟ වෙලා මේවා ගොඩ කර වටිනාකමක් දෙන්න. මේවායේ නීති රීති ඉවත් කර වටිනාකමක් දෙන්න ඕන. සමහර තැන්වල පර්චස් දෙක තුන ඉතුරු කරන්නේ නැතිව සියල්ල පවරා ගන්න ඕන. නැත්නම් ජනතාව අසීරුතාවට පත් වෙනවා. මේවා කිරීමේදී ක්‍රමවේදයකට අනුව කළ යුතුයි.'

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හෙක්ටර් අප්පුහාමි මහතා**

'ඉඩම් අමාත්‍යාංශය තවම පරණ ලැයිස්තු ගොනු කරමින් ඉන්නවා. ඉඩම්වල අයිතිය දැක්කාම එදා අතීතයේ ඉඳලා ආ ක්‍රමවේදය ඉවත් කර මේක අලුත් ක්‍රමවේදයකට සකස් කරන්න. දැන් පොහොර ජාවාරමක් පටන් ගෙන තිබෙනවා. වහාම පොහොර සම්බන්ධව අලුතෙන් ඇතිවී තිබෙන ජාවාරමට විසඳුමක් දෙන්න කියා අප ඉල්ලා සිටිනවා. ගොවියාට සම්පූර්ණයෙන් ඔවුන්ගේ රාජකාරිය, ව්‍යාපාරය කරන්න ඉඩ දෙන්න කියා ඉල්ලා සිටිනවා.'

**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මහතා**

'ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව හදන්නේ විශාල වැඩපිළිවෙලක් ආරම්භ කරන්න. නමුත් නෛතිකව ඇති වූ ගැටලු තුළ එම ආයතනයත්, නිලධාරීනුත් ගැටලු රාශියකට මුහුණ දෙනවා. උදාහරණයක් ලෙස ඉඩම් පිළිබඳව ගත්තාම ස්වර්ණ භූමි ඉඩම්වල නීති හදලා තිබෙන්නේ විශාල කාලයකට පෙර. එම ඉඩම්වල අයිතිකරු මිය ගියාම එම ඉඩමේ අයිතිය වැඩිමහල් පිරිමි දරුවාට යන්නේ. ඒ කාලයේ එම ආඥා පනතට අනුව එම පවුලේ බර කරට ගන්නේ පවුලේ වැඩිමහල් දරුවා. නමුත් දැන් ජය භූමි ඉඩම්වල එසේ නොවෙයි. මේ වන විට එම ජය භූමි ඉඩම්වල විවිධ ප්‍රශ්න පැන නැඟී තිබෙනවා. ඔවුන් අපට විවිධ ප්‍රශ්න ගැන ප්‍රකාශ කරනවා. ඒ නිසා මේකට සංශෝධන ගෙන එන්න කියා අප ඉල්ලා සිටිනවා. ඒ වගේම ආයෝජකයන්ට රජයේ ඉඩමක් අරගෙන නීත්‍යනුකූලව යම් සාර්ථකත්වයට පත් වෙන්න රටේ තිබෙන නීති අනුව දීර්ඝ කාලයක් යනවා. අපට තිබෙන්නේ ආඥා පනතක්. මේක යාවත් කාලීන කිරීම අවශ්‍ය වෙනවා. නැත්නම් යල් පැන ගිය නීතිත් එක්ක අපට ඉදිරියට යන්න ලැබෙන්නේ නෑ. මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ මොන පනත ගෙනාවත් මැක්කාගේ කතාව වගේ ආණ්ඩුවට දෝෂාරෝපණය කිරීම පමණයි.'

*පාර්ලිමේන්තුව*
*අද (23) පෙරවරු 10.00 යළි රැස්වේ.*

රටේ ඉඩම් විකුණාගෙන කන ප්‍රතිපත්තියට අප විරුද්ධයි



මන්ත්‍රී ගයන්ත කරුණාතිලක

පෝට් සිටි ව්‍යාපෘතියෙන් අපේ මාතෘ භූමියට තවත් කොටසක් ලැබුණා



ඇමැති රෝහිත අබේගුණවර්ධන

අද සංවර්ධනය සිදු වන්නේ ඉතා සුළු පිරිසක් වෙනුවෙන් නම් ඉන් පලක් නෑ.



මන්ත්‍රිනී හරිනි අමරසූරිය

අද අපේ රට වෙන්දේසිකරුවන්ගේ පාරාදීසයක් වෙලා



මන්ත්‍රී තුෂාර ඉඳුනිල් අමරසේන


# ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීයෝ


අලි මානාවා


ගැට කිඹුලා


අලියා


දාර කැස්බෑවා


දිවියා




වලහා

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014දී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීහු සත් දෙනා නම් කරනු ලැබීය. මේ නම් කිරීමේදී ඔවුන්ගේ විශේෂ ශරීර ලක්ෂණ, අනුවර්තන මෙන්ම හැසිරීම් රටා ද වෙනත් සත්ත්ව විශේෂ අතර ඔවුන්ට ලැබී ඇති ආකර්ෂණය ද සැලකිල්ලට ගැනිණි.

මෙලෙස ප්‍රමුඛ වනජීවීන් නම් කිරීම ඒ සත්ත්ව විශේෂවල ආරක්ෂාව සහ සංරක්ෂණය උදෙසා වැදගත් වන අතරම සංචාරක ව්‍යාපාරයට ද යහපත් බලපෑමක් ගෙන දෙයි.

මෙකී වනජීවීන් සත්දෙනාට ගොඩබිම සහ සාගරවාසීන් ඇතුළත් වන අතර ලොව පුරා වෙසෙන විශාලතම ක්ෂීරපායි සත්ත්ව විශේෂය මෙන්ම සාගරයෙහි වෙසෙන විශාලතම සත්ත්ව විශේෂය ද වන නිල් තල්මසා සහ ගොඩබිම වෙසෙන විශාලතම සත්ත්ව විශේෂය වන අලියා ද ඇතුළත් වෙයි. තව ද මේ වනජීවී විශේෂ හත රුහුණු ජාතික වනෝද්‍යානය සහ කුමන ජාතික වනෝද්‍යානය (යාල නැගෙනහිර) ගොඩබිම සහ සාගරයෙහි වාසය කිරීම ද විශේෂත්වයකි.

ශ්‍රී ලංකා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත මඟින් මේ වනජීවී විශේෂ හත ආරක්ෂිත හෝ දැඩි ආරක්ෂිත ලෙස නම් කර ඇති අතර, ලෝක සංරක්ෂණ සංගමය (IUCN) රතු දත්ත නාමාවලියෙහි වඳ වී යෑමේ තර්ජනයට ආසන්න (Critically Endangered) සත්ත්ව විශේෂ හෝ අන්තරායට ලක් වූ (Endangered) සත්ත්ව විශේෂ ලෙස ද, වඳ වී යෑමට ආසන්න (Near Threatened) හෝ අන්තරායට භාජනය විය හැකි (Vulnerable) ලැයිස්තුවලට ඇතුළත් වී ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීහු සත්දෙන (Top Seven Wild Species of Sri Lanka) මෙසේ වෙති:

01. **ආසියානු අලියා** - Asian Elephant - *Elephas maximus maximus*
02. **දිවියා** - Leopard - *panthera pardus kotiya*
03. **වලහා** - Sloth bear - *Melursus ursinus*
04. **අලි මානාවා** - Black neeked stork - *Ephippiorhynchus asiaticus*
05. **ගැට කිඹුලා** - Saltwater Crocodile - *Crocodylus prosus*
06. **දාර කැස්බෑවා** - Leatherback sea Turtle - *Dermochelys coriacea*
07. **නිල් තල්මසා** - Blue Whale - *Balaenoptera musculus*

වර්ෂ 2016 ජනවාරි මස 26 වන දින ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය මඟින් නිකුත් කරන ලද Top Seven Wild Sri Lanka මුද්දර පෙළ මඟින් මෙම වනජීවී විශේෂ හත නිරූපණය කර ඇත.

### ආසියානු අලියා

දිවයිනෙහි බොහෝ ප්‍රදේශවල වන අලින්ගේ ජීවිතවලට හානි සිදු වීම පිළිබඳ වාර්තා වේ. ස්වාභාවික වනාන්තර, ලඳු කැලෑ ප්‍රදේශ විනාශ කිරීම, අලිමංකඩවල් විනාශ කිරීම, වගා භූමි ඇතුළු මිනිස් ක්‍රියාකාරකම් නිසා වන අලීන්ගේ ජීවිතවලට එල්ල වන තර්ජන මෑත කාලයේ සිට ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.

### දිවියා

වඳ වී යෑමේ තර්ජනයට ලක්ව ඇති දිවියන් ශ්‍රී ලංකාවේ වෙසෙන බළල් පවුලේ විශාලතම සාමාජිකයායි.

කඳුකර ප්‍රදේශවල වෙසෙන දිවියන් මරණයට පත් වීම මෑතක සිට ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත.

### වලහා

බොහෝ විට වියළි කලාපීය වනාන්තරවල වෙසෙන වලසා සර්ව භක්ෂකයෙකි. වන ගහනය අඩු වීම නිසා මොවුන්ගේ වාසස්ථාන අඩු වෙමින් පවතී.

### අලි මානාවා

මෙරට වෙසෙන උසම පක්ෂියා වන අලි මානාවා අඩි 5ක් පමණ උස ඉතා ස්වල්ප ගහනයක් ඇති ජලජ පක්ෂියෙකි.

### ගැට කිඹුලා

දිවයිනෙන් හමු වන කිඹුල් විශේෂ දෙකෙන් විශාලම කිඹුල් විශේෂයයි. පිරිමි සතකු මීටර 4.3 – 5.2ක් දිගු වන අතර, ගැහැනු සතකු මීටර 2.3 – 3.5ක් පමණ දිගුය.

### දාර කැස්බෑවා

ලොව වෙසෙන විශාලම කැස්බෑ විශේෂයයි.

මීටර් 2ක් පමණ දිගුය. වැඩුණු සතකුගේ බර කි.ග්‍රෑ. 500ක් පමණ වෙයි.

### නිල් තල්මසා

මිහිතලය මත වෙසෙන විශාලම ක්ෂීරපායි සත්ත්වයායි. මීටර් 30ක් පමණ දිගුය.


නිල් තල්මසා





කල්‍යාන් කාරියවසම්



# කාබනික පොහොර තරගයට හදන අපේම ගොවි ජනතාව


එස්.කේ.රේනිස් මහතා
කාබනික පොහොරින් සරු වුණ වගාවක්

කාබනික පොහොර භාවිතයට මෙරට ජනතාව හුරු කර වීම සඳහා රජය විසින් ගෙන ඇති රසායනික පොහොර තහනම ප්‍රඥාගෝචර වේ. අතීතයේ පෙරදිග ධාන්‍යාගාරය ලෙසින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාද්වීපයේ කෙත් වතු එකල සරුසාර වූයේ රසායනික පොහොරින් නොවේ. ගොවියන් විසින්ම කොළ අතු එකතු කොට සාදන ලද කොම්පෝස්ට් පොහොර සහ ගොම සහ කුකුල් පොහොර ඇතුළු ස්වාභාවික සත්ත්ව පොහොරවලිනි. එකල වී වගාව මෙන්ම එළවළු වගාව ද සශ්‍රීක විණි. මිනිසුන් හඳුනා නොගත් ලෙඩ රෝගවලින් මිය ගියේ නැත. ඔවුහු බොහෝ ආයුෂ දැරූහ.

මේ වන විට හඳුනා නොගත් වකුගඩු රෝග ඇතුළු රෝග ගණනාවකින් ජනතාව මිය යති. මෙයට හේතුව ලෙස විද්වතුන් හඳුන්වා දෙනු ලබන්නේ රසායනික පොහොර තුළ පවතින විෂ රසයනිකයන් ආහාර දාම දිගේ මිනිසාගේ ශරීරය තුළට නැවත පැමිණෙන බවය. ඉදිරි පරම්පරාව හෝ මෙවැනි රෝගවලින් ආරක්ෂා කර ගැනීම සඳහා මේ මොහොතේ සිට හෝ රසායනික පොහොරවලට නැවතීමේ තිත තබා ස්වාභාවික පොහොරින් රට ස්වයංපෝෂිත කිරීම ආරම්භ කළ යුතු වේ.

රසායනික පොහොර ගෙන්වීම රජය විසින් නතර කරනු ලැබූ විට රට පුරාම සිටින ගොවියන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කළ යුතුය. වසර එකොළහකට වැඩි කාලයක් පුරා කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන අනුරාධපුර නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිදෝගම සුහදගම එස්.කේ.රේනිස් මහතා පොල් වගාවට, එළවළු වගාවට, පලතුරු වගාවට, කෙසෙල් වගාවට මෙන්ම බුලත් වගාවට ද කාබනික පොහොර යොදමින් සාර්ථක අස්වැන්නක් ලබා ගෙන ඇති බව සඳහන් කරයි.

මෙ වන විට එම ගොවි මහතා කාබනික පොහොර කිලෝ 10,000 ක් පමණ නිෂ්පාදනය කරමින් නාච්චාදූව ගොවි ජනතාවට ද අලෙවි කරනු ලබයි. රජය හෝ යම් අයෙක් රේනිස් මහතාට උදව් කරනවා නම් ගුණාත්මක බවින් වැඩි කාබනික පොහොර කිලෝ 25000 ක් පමණ ලබා දීමට හැකි බව ද ඔහු පවසයි.

ඒ වාගේම ගුණාත්මක බවින් වැඩි ඉස්තරම් කාබනික පොහොර හදන ආකාරය පිළිබඳව ද යම් ආයතනයක් හෝ යම් අයෙක් ඉල්ලීමක් කළ හොත් ඒ සඳහා කටයුතු කර දීමට ද ඔහු සූදානම්ය.

වගාවන් සඳහා කාබනික පොහොර එක් කිරීම සම්බන්ධව එස්.කේ. රේනිස් මහතා දැක්වූයේ මෙවන් අදහසක්.

"මෙතෙක් කලක් රාජ්‍ය නායකයෙක් මේ වාගේ රටට වැදගත් තීන්දුවක් ගත්තේ නැහැ. හැමෝම රසායනික පොහොර නතර කිරීමට බය වුණා. රසායනික පොහොර නිෂ්පාදනය කරන මහා පරිමාණයේ බහු ජාතික සමාගම්වලින් ලැබෙන මුදල ගැන හිතා රාජ්‍ය නායකයින් මේ වාගේ තීරණ ගත්තේ නැහැ. කාබනික පොහොර හදන්න බැහැ, විකුණන්න බැහැ, අස්වැන්න නැහැ, වී වගාව කරන්න බැහැ, පොල් වගාවට දාන්න බැහැ, යන බොරු බිල්ලෝ පෙන්වා ජනතාව බය කරලා තිබෙන්නේ.

නමුත් අපේ රටට සහ දුප්පත් ජනතාවට ආදරය කරන ජනාධිපතිතුමා රසායනික පොහොර නතර කිරීමට තද දැඩි තීරණයක් ගෙන තිබීම අප අගය කරන්න ඕනෑ. දැන් ගොවි ජනතාව කාබනික වගාවට යන්න සූදානම් වෙලා ඉන්නේ.

කාබනික පොහොර යොදන්න කිසිම අයුරකින්වත් බිය විය යුතු නැහැ. පොල් ගසකට කාබනික පොහොර කිලෝ 30 ක් දමන්න ඕනෑ. දැනට තිබෙන පොල් අස්වැන්න දෙගුණ වෙනවා. මම අත්දැකීමෙන් කියන්නේ. මම කාබනික පොහොර යොදලා තිබ්බටු පැළ දෙකක් සිටවා තිබෙනවා. අක්කර කාලක් පමණ ඒ ගස් විහිදිලා තිබෙනවා. ඒ තිබ්බටුවලට මම කාබනික පොහොර දාලා තිබෙන්නේ. සති දෙකකට මම රුපියල් 3000ක් උපයා ගන්නවා.


පොල් වගාවට මම කාබනික පොහොර දාලා අස්වැන්න වැඩි කර පෙන්වා දුන්නාට පොල් සංවර්ධන මණ්ඩලයෙන් මට දිරි දීමනාවකුත් දුන්නා. මගේ අක්කර දෙකක පොල් වගාවට මම කාබනික පොහොර යොදා තිබෙනවා. මම හොඳ අස්වැන්නක් ගන්නවා.

රසායනික පොහොර නතර කරන එකට විරුද්ධව කටයුතු කරන්නේ ඖෂධ නිෂ්පාදකයින් වගේම රසායනික පොහොර නිෂ්පාදකයින්. ඒ වාගේම බේත් මාපියාකාරයින්.

අපේ ප්‍රදේශවලට අවශ්‍ය පොහොර ටික අපි හදා දෙන්නම්. ගොවි ජනතාව ඒ සදහා සූදානම් වී සිටීම නිසා අනුරාධපුරයේ මේ වන විට කාබනික පොහොර හදන එක තරගයක් වෙලා.

චිත්‍රාරත්න කළුආරච්චි


කාබනික පොහොරින් සරු වූ පොල් වගාවක්



(හිටපු අගමැති එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු ලෙස අද පාර්ලිමේන්තුවේ දිවුරුම් දෙයි. මෙම ලිපිය ඒ නිමිත්තෙනි)

# යළි මැති සබයට එන රනිල්

එක්සත් ජාතික පක්ෂයේ පස් වන නායකයා වන ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මහතාගේ 98 වන උපන් දිනය අදට යෙදී ඇත. මෙදින එක්සත් ජාතික පක්ෂයේ 7 වන නායකයා වන රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් දිවුරුම් දීමද සිදු වීම ඓතිහාසික සිද්ධියක් ලෙස සැලකිය හැක.

රණසිංහ ප්‍රේමදාස මහතා ජනාධිපති වශයෙන් සිටි විටදී එක්සත් ජාතික පක්ෂයේම පිරිසක් විපක්ෂයේ සහයෝගය ඇතිව එතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන ආවේ රණසිංහ ප්‍රේමදාස මහතා ජනාධිපති පුටුවෙන් ඉවත් කර ඔවුන්ගේ බලාපොරොත්තු ඉටු කර ගැනීම සඳහාය. මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ සභා නායකවරයා වශයෙන් සිටි රනිල් වික්‍රමසිංහ මහතා එම පිරිසට එකතු නොවී ප්‍රේමදාස මහතා බේරා ගැනීමේ මහා කර්තව්‍යයට නායකත්වය දුන්නේ ඔහු සතුව තිබූ ප්‍රඥාව හා සිහි බුද්ධියත්, ඉවසීමේ ගුණයත් මුල් කරගෙනය. එම නිසා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රේමදාස මහතා සතුව තිබූ නායකත්වයත්, ජනාධිපති පදවියත් ප්‍රේමදාස මහතාට රැක ගැනීමට මනා උපස්ථම්භකත්වයක් රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ලැබිණ. එවන් අයකු එතුමාගේ 98 වන උපන් දිනය යෙදෙන දා එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයා වශයෙන් දිවුරුම් දීම නිසා එය ඓතිහාසික දිනයක් බව තව තවත් මනාව පැහැදිලි වේ.

1977 ජූලි මස පැවැත් වූ ශ්‍රී ලංකාවේ 8 වන පාර්ලිමේන්තු මැතිවරණයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම අභිනව මැතිවරණ කොට්ඨාශය වැඩි ඡන්ද 6769 කින් දිනා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන් පත් වූ රනිල් වික්‍රමසිංහ මහතා ජේ.ආර්. ජයවර්ධන මහතා පිහිටු වූ රජයේ විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් 1977 ජූලි 23 වෙනිදා එවකට ජනාධිපති විලියම් ගොපල්ලව මහතා ඉදිරියේ දිවුරුම් දුන්නේ 28 හැවිරිදි තරුණයකු ලෙසිනි. එයින් වසර 2 ½ කට පසුව එනම් 1980 පෙබරාවාරි 14 වන දින ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතා සිදු කළ තම රජයේ කැබිනට් ඇමැති සංශෝධනයේදී රනිල් වික්‍රමසිංහ මහතා කැබිනට් ඇමතිවරයකු බවට පත් කර තරුණ කටයුතු හා රැකී රක්ෂා ඇමැති පදවිය සමග අධ්‍යාපන ඇමැති පදවිය ද පවරනු ලබන්නේ මෙරට ප්‍රථම තරුණ කටයුතු ඇමැතිවරයා සහ ළාබාලම අධ්‍යාපන ඇමැතිවරයා වශයෙනි. එතැන් සිට 1994 දක්වා වසර 14 කට ආසන්න කාලයක් එක දිගට කැබිනට් ඇමැතිවරයකු ලෙස ක්‍රියා කළ රනිල් වික්‍රමසිංහ මහතා 1993 මැයි මස සිදු වූ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ අභාවයත් සමග ලංකාවේ අගමැති පදවිය බාර ගනු ලබන්නේ එක්සත් ජාතික පක්ෂය ඉතා බැරෑරුම් අවස්ථාවකට මුහුණ දෙමින් සිටියදීය.

දේශපාලන ලෝකයේ යස, අයස, නින්දා, ප්‍රශංසා විඳ ගනිමින් නොනවතින දේශපාලන ගමනක යෙදෙන රනිල් වික්‍රමසිංහ මහතා 1994 වසරේ සිට මේ දක්වා එක්සත් ජාතික පක්ෂයේ නායකයා වශයෙන් ක්‍රියා කරනුයේ පක්ෂයේ 7 වන නායකයා ලෙසය. එතුමා 1977 අගෝස්තු 4 වන දින සිට පසුගිය මහ මැතිවරණය දක්වා වසර 42 ක් අඛණ්ඩව පාර්ලිමේන්තුව නියෝජනය කළේය

1956 වසරේ පැවති මහ මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය අන්ත පරාජයකට පත් වී විපක්ෂ නායක පදවියවත් නොලැබ පාර්ලිමේන්තුවේ මුල්ලකට තල්ලු වී ගියේ ජයග්‍රාහකයින් යූ.එන්.පීයේ මිනී පෙට්ටියට අන්තිම ඇණයක් ගැසුවා යැයි වාසි බස් දොඩමින් ජය පැන් බොන විටය. නමුත් සිදු වූයේ එම රජය නිදහස් ලංකාවේ ප්‍රථම අදක්ෂම, අර්බුධකාරිම රජය බවට ඉතිහාසයට එක් වීමයි. එම වසරේ මැතිවරණයේදී ජේ.ආර්. ජයවර්ධන මහතා කැලණිය ආසනය පරාජය වූයේ වැඩි ඡන්ද 20,000 කටත් වැඩි ප්‍රමාණයකිනි. එක්සත් ජාතික පක්ෂයේ නරක් වූ දත ගලවන්න ගොස් එජාපය නමැති වෙදා මිය ගියා යැයි ජේ.ආර්. පැරද වූ ආර්.ජී. සේනානායක රටට පැවසුයේ මැතිවරණ කොට්ඨාස දෙකක්ම ජයගත් ලංකවේ එදා මෙදා බිහි වූ වාර්ථාගත මන්ත්‍රීවරයෙකු වශයෙන් ඉතිහාසයට එක්වීමෙනි. නමුත් එයින් වසර 4 කට පසු ජේ.ආර්. මැතිසබයට පිවිසියේ ඩඩ්ලිගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීමට තරම් ජනතාව එක්සත් ජාතික පක්ෂය වැලඳ ගන්නා පක්ෂයක් බවට පත් කරමිනි. එදා ආසනයෙනුත් පැරදුණු ජේ.ආර්. වසර 22 කට පසු ලංකාවේ 6 න් 5 ක බලයක් ලබා ගෙන මෙතෙක් නොබිඳුනු දේශපාලන ජයග්‍රහණයක් වාර්ථා කර ඇත්තේ ප්‍රඥාවේ ආලෝකය තුළිනි.

රනිල් වික්‍රමසිංහ මහතා අයත් වන්නේ එවන් දේශපාලන නායක පරපුරකටය. මඳ විරාමයකට පසුව රනිල් වික්‍රමසිංහ මහතා අද මැති සබයට පැමිණ මන්ත්‍රීවරයෙකු වශයෙන් දිවුරුම් දෙන්නේ රටත්, දැයත්, සමයත් යන හෙළ තෙරුවණ මාර මුඛයකට වැටෙමින් තිබෙන විටෙකය. එයින් හෙළ තෙරුවණ ගලවා ගත් නායකයා ලෙස රනිල් වික්‍රමසිංහ මතු දින ඉතිහාසගතවනු නොඅනුමානය.

1956 දී එක්සත් ජාතික පක්ෂයේ අන්ත පරාජය සමග එක්සත් ජාතික පක්ෂයට නායකත්වය දීමට සිටි සර් ජෝන් කොතලාවල හිටපු අගමැතිවරයා ද පක්ෂයේ වගකීම් වලින් ඉවත්ව ඔහුගේ කටයුතු පමණක් බලාගෙන සිටින්නට විය. එම අවස්ථාවේදී ජේ.ආර්. ජයවර්ධන මහතා කොල්ලුපිටියේ සිරිකොත මන්දිරයට ගොස් පක්ෂ කාර්යාලයේ දොරවල් ඇර යළි පක්ෂය ජයග්‍රහණය කරවීමේ මහා ක්‍රියාමාර්ගයට අත ගැසූ බව ඉතිහාසයේ දිස් වෙයි. එක්සත් ජාතික පක්ෂයට පරාජයන් හොඳට හුරු පුරුදුය. 1956 මැතිවරණය, 1960 මැතිවරණය, 1970 මහ මැතිවරණය, 1994 මහ මැතිවරණය හා ජනාධිපතිවරණය ඒවාට නිදසුන්ය. වැටුනු විට නැගිටින්නට ද එක්සත් ජාතික පක්ෂයට මනා හැකියාවක් තිබුණු බව එම කාලවලින් පසු පැවති මැතිවරණ දෙස බලන විට හොඳින් අවබෝධ වේ. පක්ෂයේ නායකයන් ද නොයෙක් විට පරාජයට පත් වූයේ ඔවුන්ගේ දුර්වලකම් නිසා නොව මහජනයාගේ නොමග යැම් නිසාය. උදාහරණයක් වශයෙන් ගත හොත් නිදහස් අධ්‍යාපනය නිර්මාණය කළ ආචාර්ය සී.ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා 1948 මහ මැතිවරණයෙන් පරාජයට පත් වී කළුතර කච්චේරියෙන් එළියට ආවේ දෑසේ පිරුණු කඳුළු සහිතවය.

1965 ජාතික රජයේ සභා නායක වශයෙන් ක්‍රියා කළ සී.පී. ද සිල්වා මහතා මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භකොට මහවැලි ගඟේ ගමන් මග වෙනස් කර එය උතුරට හැරවීමට මූලික විය. එසේ ක්‍රියා කළ ඔහු රජරට මින්නේරියේ මැතිවරණ කොට්ඨාසය පරාජයට පත් වී 1970 දී පොළොන්නරුවේ කච්චේරියෙන් එළියට ආවේ දැඩි සිත් වේදනාවෙන් යුතුවය. තම ගමට විදුලි ආලෝකය නොමැති නිසා තම නිවසට ද විදුලිය ආලෝකය ලබා නොගත් මතුරට මන්ත්‍රී වූ කෘෂිකර්ම ඇමැති එම්.ඩී. බණ්ඩා මහතා පරාජයට පත් වී එළියට බැස්සේ පාර්ලිමේන්තුවට යළිත් නොයන්නට අධිෂ්ඨාන කරගෙනය. බුද්ධ ශ්‍රාවක ධර්මද්වීපය වැනි විශ්වවිද්‍යාලයක් ආරම්භ කළ කුලියාපිටි මන්ත්‍රීවරයා හා අධ්‍යාපන ඇමතිවරයා වූ අයි. එම්. ආර්. ඒ.ඊරියගොල්ල මහතා 1970 මහ මැතිවරණයෙන් පරාජයට පත් වී කොපමණ වේදනාවට පත්වී තිබුණේද යත් ඔහු ඉතා ටික කලකින් මරණයට ද පත් විය.

1965 ජාතික රජයේ ප්‍රබල ඇමැතිකමක් දැරූ අපරාජිත දේශපාලඥයෙකු වූ අවිස්සාවේල්ල මන්ත්‍රී පිලිප් ගුණවර්ධන මහතා ද 1970 මහ මැතිවරණය පරාජයට පත් විය. ජනතාව සිව් වරක්ම අගමැති ධූරයට පත් කළ නොමිලේ හාල් සේරුවක් ජනතාවට ලබා දීම නිසා බත් දුන් පියා යන විරුදාවලිය ලත් ඩඩ්ලි දැඩිගම ආසනය දිනුවේ යන්තම් ඡන්ද එක්දහස් ගණනකිනි. ඔවුන් පරාජය කර වෙනත් රජයක් පිහිටවුවද ජනතාවට එම නායකයන්ගේ වටිනාකම තේරුනේ 1972 වසර ගෙවෙනවාත් සමගය. අද එක්සත් ජාතික පක්ෂයේත් එහි නායකයන්ගේ වටිනාකමත් ජනතාවට අවබෝධවෙමින් පවතින්නේ රජය පෙරළී ගොස් මාස ගණනක් ගත වන්නට පටන් ගත් දවසේ සිටය. එම නායකයන්ට අත් වූ ඉරණම එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන නායකයන්ට ද අත් වී ඇතත් ඔවුන් ජීවතුන් අතර සිටිමින් පක්ෂයට යළි ජීව වායුව පිඹින්නට උත්සාහ ගනිමින් සිටින යුගයකි මේ. එම ජීව වායුව පිඹීමේ උච්චතම අවස්ථාවක ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් යළි දිවරුම් දීම හැඳින්වීමට හැක. ඔහු ලංකාවට පමණක් නොව ආසියාවටම කතා කළ හැකි නායකයෙකි. ජාත්‍යන්තර සම්බන්ධතා ඕනෑවටත් වඩා වැඩියෙන් ඇත. ඔහු 2015 රජය පිහිටුවීමෙන් පසු ලබා ගත් GSP+ සහනය නොමැති නම් මේ වන විට ඩොලරයේ වටිනාකම රුපියල් 300 ඉක්මවා යන්නට බොහෝ සෙයින් ඉඩ කඩ ඇත. අද වර්තමාන රජයට තිබෙන ලොකුම ආර්ථික ශක්තිය වන්නේද GSP+ සහනයයි. ඒ සහනය ද නැතිවෙමින් අනතුරට පත්වෙමින් ඇති අවස්ථාවක් ලෙස මෙම යුගය හැඳින්වීම නිවැරදිය. රනිල් වික්‍රමසිංහ මහත්මා උත්සාහ ගන්නේ තම පරපුරකට හෝ පවුලකට ඔටුනු පැළඳවීමට නොව මේ රටේ දුගී දුප්පත් ජනතාවට ඒ වරම හිමිකර දීමටය. එයට හොඳම නිදසුනකි ඔහු තමාට ඇති තමා ජීවත් වන පෞද්ගලික නිවස පවා කොළඹ රාජකීය විද්‍යාලයට පිරිනැමීමට ගත් තීරණය. එජාප නායකයෝ රාශියක් තම දේපළ අනාගත පරපුරෙහි ප්‍රයෝජනය සඳහා ජාතියට පිරිනමා ඇත. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ නායකයන් ධනපතියන් බව පමණක් නොව දානපතියන් බව ද අමතක නොකළ යුතුව ඇත.

ඇමරිකාවේ මැතිරවණ වලින් වැඩියෙන්ම පැරදුණු දේශපාලකයා වනුයේ හිටපු ජනාධිපතිවරයෙකු වන ඒබ්‍රහම් ලින්කන්ය. අවසානයේදී ඔහු ඇමරිකාවම ජයගෙන ලෝකයේම ශ්‍රේෂ්ඨ දේශපාලකයෙකු, දාර්ශනිකයෙකු, චින්තකයෙකු ලෙස සිය නාමය ඉතිරි කරන්නේ ඔහු ලෝක දේශපාලනයෙත්, ඇමරිකානු දේශපාලනයෙත් සුවිශේෂී පෙරළියක් සිදු කළ නායකයෙකු ලෙසය. ඒ අනුව රනිල් යනු ලංකාවේ “ලින්කන්“ය. රනිල්ගේ දැක්ම ඉතිහාසයෙන් පාඩම් උගෙන වර්තමානයේ සිටිමින් අනාගතය දැකීමය. එය “තුන් කල් දක්නා ඉසිවර නුවණ“කි. 1996 වසරේදී එක්සත් ජාතික පක්ෂයට වසර 50 ක් සපිරුණි. එය සැමරීමේ ස්වර්ණ ජයන්තිය පැවතුනේ කොළඹ නගර සභා පිටියේදීය. එහිදී ජනකාය ඇමතූ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා මෙසේ පැවසූහ.

“තමන්ගේ අයිතියට බැංකු ගිණුමක්, තමන්ගේ අයිතියට භූමි භාගයක්, තමන්ගේ අයිතියට කුඩා ව්‍යාපාරයක්, තමාගේ අයිතියට සමාගම්වල කොටස් අප බලාපොරොත්තු වෙන්නේ ප්‍රතිපත්ති රාමුවක් හදන්න පමණක් නොවේ ඒ මාර්ගයෙන් මේ රටේ දියුණු ආර්ථිකයක් ඇති කරලා මේ රටේ දුප්පත්කම නැතිකරන්න. ඒ වගේම එක එක මාර්ගයෙන් දියුණු වෙන්න. තමන්ගේ දක්ෂකමෙන් ඉදිරියට යන්න. ඉදිරියට යන්න තිබෙන බාධක ඉවත් කරන්න. සියලුදෙනාට මේ අවස්ථාව ඇති කරගන්න පුළුවන් මේ රටේ දියුණු ආර්ථිකයක් ඇති කිරීමෙන් පමණයි. ඒ අයුරින් තමයි ජනතාවට ඉසුරුමත් සමාජයක් ඇති කරන්න ශක්තියක් තියෙන්නේ. ඒ ශක්තිය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට පමණයි කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා“

රනිල් දැන් මැතිසබයට පැමිණ ඇත. ඔහු මැතිසබයට පැමිණෙන්නේ ශ්‍රී ලංකාද්වීපය ධර්මද්වීපයක්, ධාන්‍යාගාරයක් කිරීමට මුල පිරූ මහින්දාගමනය සිදු වූ පොසොන් පුර පසළොස්වක දිනයට පෙරදාය. පොසොන් සඳ මෝරන්නාක් මෙන් රනිල් වික්‍රමසිංහ මැතිසබයට පිවිසෙනු ඇත. තව පොසොන් පොහොයවල් 4 ක් ගෙවන විට ඔහු මේ රටේ පූර්ණ චන්ද්‍රයා මෙන් ජනාධිපතිවරයා ලෙස රට බබළවන බවට කිසිම සැකයක් නැත. රනිල්ගේ පැමිණීම ජනතා ජයග්‍රහණයකි. අනාගතයට සුබ නිමිත්තකි. රටට බලාපොරෝත්තුවකි. ඔහුගේ පැමිණීම සැබැවින්ම රිදුණු පයට තණ පලසක් වනු නොඅනුමානය.

**වජිර අබේවර්ධන**
**සභාපති - එක්සත් ජාතික පක්ෂය**
**අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හිටපු අමාත්‍ය**

# හඬක් නැති ජනතාවට හඬක් දුන් නායකයා



අතීතය පාඩමක් කොටගෙන වර්තමානය සකස් කොට අනාගතය ගොඩනැඟීමට කටයුතු කරන නායකත්වයක් යනු තුන් කල් දකින නායකයකු ලෙස හැඳින්වීමට පුළුවන.

දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ චරිතාපදානය ගැඹුරින් විමසන විට අප දකින්නේ තුන් කල් දුටු නායකත්වයක ලක්ෂණයි.

පාසල් අවධියේ සිටම පොදු ජන සුබසෙත සඳහා කැප වුණු එතුමා ආරම්භ කළ සුචරිත වාග් වර්ධන ළමා සමාජයේ ක්‍රියාකාරකම්වල සිට නාගරික මන්ත්‍රීවරයකු ලෙස, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු, අමාත්‍යවරයකු, අගමැති, ජනාධිපති ලෙස කළ කටයුතු විමසා බලන විට එය මැනවින් පැහැදිලි වේ.

රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සැම විටම කටයුතු කළේ ප්‍රායෝගික තලයයේ සිටය. අධිෂ්ඨානය, කැපවීම සහ නොපටුබස්නා උත්සාහය එතුමාගේ චරිතය තුළ දක්නට ලැබූ සුවිශේෂී ගුණාංගය.

එතුමාට රට පිළිබඳ පැහැදිලි දැක්මක් සහ නිරවුල් අවබෝධයක් තිබුණි. ශ්‍රී ලංකාවේ ජන සමාජය නිවරදිව නිර්වචනය කිරීමට එතුමාට හැකි විය. අපගේ මාතෘ භූමිය බහු වාර්ගික, බහු ආගමික, බහු භාෂාමය සමාජයක් බවත් රටේ සියලුම ප්‍රතිපත්ති සම්පාදනයේදී එය පදනමක් විය යුතු බව එතුමා තරයේ විශ්වාස කළේය. එය මනාව පැහැදිලි වූ අවස්ථාවක් ලෙස ජනාධිපති ධූරයේ දිවුරුම් දීමෙන් පසුව සිරිකොත මන්දිරයේ පැවැති පක්ෂයේ විධායක සභාව අමතා කළ කතාවෙන් පැහැදිලි වේ. එතුමා එම අවස්ථාවේ කියා සිටියේ තමා ජනාධිපති ධූරයට පත් කළ සියයට පනහකට වැඩි පිරිසට පමණක් නායකත්වය ලබා දුන හොත් සියයට හතළිස් නවයකට ආසන්න පිරිසක් අසරණ වන බවයි. එමෙන්ම සියයට හැත්තෑ හතරකට ආසන්න සිංහල බෞද්ධ ජනතාවට පමණක් නායකත්වය දුන හොත් සියයට විසි හයකට අසාධාරණයක් වන බවයි. එම නිසා තමා ජනාධිපතිවරයා ලෙස කටයුතු කරනුයේ සියයට සියයක් වූ රටේ ජනතාවට බවයි.

මෙම ප්‍රකාශය තුළ එතුමාගේ තුන් කල් දැක්ම මැනවින් ඉස්මතු වේ. ජනවාර්ගික අසමගිය, ආගමික බෙදීම් වැනි පටු හැඟීම් තුළ බලය තහවුරු කිරීම නොකළ යුත්තක් බවයි එමගින් විග්‍රහ කරනු ලැබුවේ.

අද අප රටේ වර්තමානයේ ක්‍රියාත්මක දේශපාලනය තුළ සිදු වී ඇති ව්‍යසන විමසා බලන විට රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ දැක්ම කෙතරම් ප්‍රායෝගික ද යන්න වැටහේ. අද අපට අවශ්‍ය කරනුයේ එම දර්ශනය වර්තමානයට ගළපා ගත හැකි වැඩපිළිවෙළකි. එතුමාගේ පුත් සජිත් ප්‍රේමදාස මැතිතුමා ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත සද් ජාතිකත්ව වැඩපිළිවෙළ තුළ මෙම දැක්මේ අන්තර්ගතය දක්නට ලැබීම රටේ අනාගතය ගොඩනැඟීමට සුබවාදී ප්‍රවේශයක් ලෙස හැඳින්වීමට පුළුවන.

දිවංගත ජනාධිපතිතුමා රටේ නායකත්වය බාර ගනු ලැබුවේ උතුරේ සහ දකුණේ කැරලි දෙකක් රජයට එරෙහිව දියත් කර තිබෙන අවස්ථාවකදීය. එතුමාගේ වචනවලින්ම සඳහන් කරන්නේ නම් දෙකොන ඇවිළෙන විලක්කුවක් බදු රටකි.

දකුණේ ක්‍රියාත්මක වූ ජනතා විමුක්ති පෙරමුණේ අරගලය සංසිඳවීමට ජනාධිපති වූ වහාම හදිසි නීතිය ඉවත් කරමින් අත් අඩංගුවේ සිටි පහළොස් දහසක් පමණ තරුණ තරුණියන් නිදහස් කරමින් සාකච්ඡා මාර්ගයට අවතීර්ණ වීමට එතුමා උත්සාහ දැරීය. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයට ආණ්ඩුවට සම්බන්ධ වී තරුණ කටයුතු ඇතුළුව අමාත්‍ය ධූර තුනක් ලබා ගැනීමට ද ආරාධනා කරන ලදී. එවකට විපක්ෂය පවා එතුමාගේ මෙම තීරණය විවේචනය කළේ ජනාධිපතිතුමා සාකච්ඡා කරන්න හදන විට උණ්ඩයෙන් පිළිතුරු දෙන අයට සාම කතා නොව බලය යොදා පිළිතුරු දිය යුතුය යන ස්ථාවරය ගනිමිනුයි.

අවසානයේ එම කැරල්ල මර්දනය කළ පසු එතුමා සිදු කළේ කුමක්ද? කැරැල්ල මර්දනය කළ පසු අදහස් දක්වමින් එතුමා කියා සිටියේ කැරැල්ල යනු ඵලය මිස හේතුව නොවන බවයි. හේතුව නැති නොකොට ඵලය විනාශ කිරීම පිළිතුරක් නොවන බවයි. එම නිසා යළිත් කැරැල්ලක් ඇති නොවීමට හේතුව ඉවත් කළ යුතු බවයි. තරුණ අසහනය පිළිබඳව වූ ජනාධිපති කොමිසම එතුමා පත් කරනු ලැබුවේ එබැවිනි. කොමිසම පත් කළා පමණක් නොව එහි නිර්දේශ ක්‍රියාත්මක කරලීමට ද එතුමා උත්සුක විණි. සුදුසුකම් මත රැකියා ලබා දීම, ඒ සඳහා තරග විභාගයක් පැවැත්වීම, දේශපාලනය තුළ තරුණ පරපුරට අවස්ථාව වැඩි කිරීම, කුඩා දේශපාලන පක්ෂවලට පාර්ලිමේන්තු නියෝජනය සඳහා ලබා ගත යුතු ඡන්ද ප්‍රතිශතය අඩු කිරීමට පියවර ගැනීම වැනි තීන්දු, තීරණවලට එතුමා එළැඹුණේ ඵලය නොව හේතුව ඉවත් කිරීමටයි. මෙම සමහරක් තීරණ ජනප්‍රිය දේශපාලනය තුළ අභියෝගයට ද ලක් වූ අතර බලය ලබා ගැනීමට දේශපාලනිකව භාවිත කිරීම තුළ සිදු වූ බේදවාචකයන්ද වටහා ගැනීම වැදගත්ය. මෙහි වැදගත් කරුණ වන්නේ දකුණේ කැරැල්ලට පසුව එතුමා උත්සාහ කළේ යළිත් එවැන්නක් ඇති නොවීමට පියවර ගැනීමටයි. කැරැල්ල මර්දනය කොට දේශපාලනය තුළ වාසි ලබා ගැනීම නොව රටේම තරුණ පිරිසක් නොමගට ගියේ මන්ද යන්න හෙළිදරව් කර ගැනීමටයි. රටක අනාගතය ගොඩනගන නායකත්වයක වගකීම සහ වගවීම කුමක්දැයි එතුමා පෙන්වා දී ඇත්තේ පරමාදර්ශී අන්දමටයි. වර්තමානයේ අදටත් මෙම මග පෙන්වීම් වලංගු වන්නේ උතුරේ කැරැල්ල මර්දනයට පසුව තවමත් අප අභියෝග රැසකට මුහුණ දී ඇති නිසාවෙනි.

ශ්‍රී ලංකාවේ අප මුහුණ දී ඇති බරපතළ අනතුරක් ලෙස එතුමා දුටු තවත් අංශයක් වූයේ දිළිඳුකමයි. දුප්පත්කම කරුමයක් ලෙස සලකා කටයුතු කරන ජනතාවට එතුමා කීවේ දුප්පත්කම කරුමයක් නොව ඒ තුළින් උරුමයක් පාදා ගන්නා ලෙසයි. ජනසවිය වැඩපිළිවෙළ දියත් කළේ දුප්පතුන් ස්ව ශක්තියෙන් නගා සිටුවීමටත්, ආණ්ඩුව සදාකාලිකව සුබ සාධනය තුළ ක්‍රියා කිරීම අවසන් කිරීමටත්ය.

ජනසවිය සංකල්පය තුළ සැඟවුණ විශිෂ්ඨත්වය හඳුනා නොගැනීම අවාසනාවකි. වසර දෙකක් ආණ්ඩුව මැදිහත් වන සුබ සාධක වැඩපිළිවෙළක් තුළ ජනතාව සවිබල ගන්වමින් ඔවුන් නගාලීමට කටයුතු කිරීම එහි මූලික අරමුණ විය. වසර දෙකකට පසුව ජනතාව දැනුවත්ව ආණ්ඩුව සුබ සාධනය තුළින් ඉවත් වේ. ක්‍රමානුකූල වැඩපිළිවෙළක් තුළ සැම පුරවැසියක්ම ආණ්ඩුවෙන් යැපෙන්නන් නොවන ආකාරයට ගොඩනගමින් සුබ සාධනය නොව නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීමට දැරූ උත්සාහය බලය සඳහා වූ පදනමක් ලෙස දුප්පත්කම පෝෂණය කිරීමේ ඛේදවාචකය අප අත් දකිමු.

ආණ්ඩුවක සුබ සාධන වැඩසටහන් අනුමත නොකරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා ජනසවිය භාර අරමුදලක් පිහිටුවීමට දායක වූයේ ඇයි? ඒ ආණ්ඩුවක් ප්‍රයෝගිකව දිළිඳුකමට එරෙහිව වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීමට සමත් වූ බැවිනි. නොමිලේ හාල්, ධාන්‍ය රාත්තල් අටක් වැනි දේශපාලන සටන් පාඨ තුළ දුප්පතුන්ගේ ඡන්දය ලබා ගැනීමේ වැඩපිළිවෙළ මැනවින් දුටු ප්‍රේමදාස මැතිතුමා උත්සාහ දැරුවේ එවැනි අතීතයේ පාඩම් වෙනස් කරමින් ආත්ම ගරුත්වය ඇතිව ජනතාවට ජීවත් වීමේ මගක් සෑදීමටය.

රටක ජනතාවගේ නිරෝගී ජීවිතය සංවර්ධන ක්‍රියාදාමය තුළ අත්‍යවශ්‍ය වූවකි. රෝග වැළැඳීමට පසු ප්‍රතිකාර නොව වළක්වා ගැනීමේ උපාය මාර්ග සැකසීම කළ යුතු බව එතුමාගේ දැක්ම විය. ඒ අරමුණ සාධනය කර ගැනීමට ආරම්භ කළ ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන වැඩසටහනට එදාටත් වඩා වටිනාකමක් ලැබෙනුයේ අදටය. එම මධ්‍යස්ථානයේ ස්ථානගත කරනු ලැබුවේ පවුල් සෞඛ්‍ය නිලධාරිනියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ඇතුළු ප්‍රාථමික සෞඛ්‍ය අංශයේ පිරිසයි. සැම ගමකම එවනි මධ්‍යස්ථාන බිහි කිරීමට සැලසුම් කරන ලදී. එය ඉදිරියට ගෙන ආවා නම් මෙම කොවිඩ් වසංගතය තුළ ඉටු කළ යුතු එන්නත්කරණය ඇතුළු කටයුතු සඳහා ව්‍යුහයක් දීප ව්‍යප්තවම සකස් වී තිබෙනු ඇත. මෙවනි දුර දක්නා දර්ශනයක් එතුමාට ලැබුණේ ජනතාව අතර ජීවත් වූ, ජනහද ගැස්ම මැනවින් හඳුනාගත් මානවවාදී නායයකයකු වූ නිසාය.

විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ ගමට කැඳවූ ඇඟලුම් කම්හල් දෙසීයේ වැඩසටහන, ගම් උදාව, නොමිලේ ලබා දුන් පාසල් නිල ඇඳුම්, දිවා ආහාර වේල, සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය, ගම්මාන පහළොස් දහසක ව්‍යපෘතිය, උදාගම් ජංගම සේවය, ජනාධිපති ජංගම සේවය ආදි එතුමා දියත් කළ සැම වැඩපිළිවෙළක් තුළම දක්නට ලැබෙන්නේ කුමක්ද? ජනතාව වෙනුවෙන් එතුමා ගත් ස්ථාවරයයි, සිදු කළ ප්‍රකාශයයි. එතුමා කීවේ "හඬක් නගන්න බැරි ජනතාවගේ හඬ මම වෙමි. වැඩවර්ජන මගින් අයිතීන් දිනා ගැනීමට නොහැකි ජනතාවගේ අයිතීන් දිනා දිමට පෙනී සිටිමි..." යනුවෙනි.

වර්තමානයේ රටට අවශ්‍ය වන්නේ ද එවනි දැක්මක් ඇති නායකත්වයකි. අප හමුවේ අද ඇති අභියෝග දිනන්නට රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ දේශපාලන කියවීම ඉතා වැදගත් වන්නේ එබැවිනි. පටු දේශපාලන දැක්මෙන් මිදී එය සිදු කරන්නේ නම් වර්තමාන අංකුර දේශපාලකයන්ට පූර්වාදර්ශ නොව පරමාදර්ශ රැසක් හමු වනු ඇත. මන්ද කොළඹ සාන්ත බස්තියමේ, සුචරිතයේ සිට කොළඹ කොටුවේ ජනාධිපති මන්දිරයට එතුමා ආ ගමන පහසු හෝ මල් අතුල මාවතක් නොවන නිසාය.

"මා රුව අමතක කරන්න සුචරිත පිළිවෙත රකින්න." දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ලියු එම වැකියම අපට බොහෝ දේ පසක් කර දෙනු ඇත.

**ඒරානන්ද හෙට්ටිආරච්චි**
**ගුවන්විදුලි සංස්ථාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්**

# දිනමිණ The Dinamina
# ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි (2021 / 05)
## උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
### ආරක්ෂක හා පවිත්‍රතා සේවා ප්‍රසම්පාදනය - 2021 / 2022

උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සඳහා ආරක්ෂක සේවා සහ පවිත්‍රතා සේවා සැපයීමේ ප්‍රසම්පාදනය අරභයා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

***අවශ්‍යතා විස්තර පහත දක්වා ඇත.***

| විස්තර | ආරක්ෂක සේවා | පවිත්‍රතා සේවා |
|---|---|---|
| යොමු අංකය : | NP/21/05/Pro/Scty/2021 | NP/21/05/Pro/Clean/2021 |
| අවශ්‍ය ව්‍යාපාර ලියාපදිංචිය | ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ආරක්ෂක සේවා සඳහා | පවිත්‍රතා සේවා සඳහා |
| ලංසු සුරක්ෂණය | රු. 300,000/- | රු. 200,000/- |
| ආපසු ගෙවනු නොලබන තැන්පතුව | රුපියල් 12,500/- | රුපියල් 12,500/- |

01. ලංසුකරණය, වෙන වෙනම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.
02. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා යෝග්‍ය වීමට සාර්ථක ලංසුකරු අසාධුලේඛනගත නොවී සිටිය යුතුවන අතර, සිය ලියාපදිංචි කාර්යාලය හෝ ශාඛාව උතුරු පළාතේ පිහිටා තිබිය යුතුය.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවන් විසින් ලංසුකරන දත්ත වල දෙවන කොටසේ / වගන්තියේ දක්වා ඇති අවම සුදුසුකම් උපමාන සපුරාලිය යුතුය.
04. අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු යාපනය, උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතින් ලබාගත හැකි වන අතර, ලංසු ලිපි ලේඛන එම ලිපිනයේදීම රාජකාරී දිනවලදී පැය 09.00 සිට පැය 15.00 දක්වා අතරතුර පරීක්ෂා කර බැලිය හැකිය.
05. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසුකරණ ලිපිලේඛන කට්ටලයක් ඉහත වගුවේ සඳහන් වටිනාකමට වන ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021 ජූනි මස 23 වන දින සිට 2021 ජූලි මස 12 වන දින දක්වා පැය 09.00 සිට පැය 15.00 දක්වා අතරතුර මිලදී ගත හැකිය.
06. ලංසු, 2021 ජූලි මස 14 වන දින පැය 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ යාපනය, පණ්ණයි හි, සෞඛ්‍ය ගම්මානයේ උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු, එම ලංසු භාර ගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

**වෛද්‍ය A. කේතීශ්වරන්**
**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,**
**සෞඛ්‍ය ගම්මානය, පන්නයි, යාපනය. 40000**

**දුරකථන : 021-2220811**
**021-2220812**
**ෆැක්ස් : 021-2217905**
**021-2220818**
**ඊමේල් : capdhsnp@gmail.com**

## ලැප්ටොප් පරිගණක සපයා ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය
## ජාතික පිළිකා මර්දන වැඩසටහන
### සෞඛ්‍ය අමාත්‍යාංශය

ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් Microsoft Office මෘදුකාංගය අඩංගු ලැප්ටොප් පරිගනක 36 ක් සපයා ගැනීම පිණිස සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙහි, මැලේරියා මර්දන ව්‍යාපාරයෙහි, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සුදුසු ලංසුකරුවන් හට මුද්‍රා තබන ලද ලංසු ඉදිරිපත් කරන ලෙසට ආරාධනා කරනු ලබයි.

| කොන්ත්‍රාත් අංකය | විස්තරය | ප්‍රමාණය | ආපසු ගෙවන ලංසු ඇපකර මුදල (රු.) | ආපසු නොගෙවන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| NCCP/ORAL/ WB02/2021 | Microsoft Office මෘදුකාංගය අඩංගු ලැප්ටොප් පරිගණක සපයා ගැනීම | 36 | 91,500.00 | 3,000.00 |

01. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු ක්‍රියාපටිපාටිය අනුව සිදුකරනු ලැබේ.
02. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට වැඩිදුර විස්තර 23/06/2021 දින සිට 14/07/2021 දින දක්වා කාර්යාල වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා වූ කාලය තුළදී, පහත සඳහන් ලිපිනයේදී ජාතික පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ වෙතින් ලබාගෙන ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම සිදුකළ හැකිය.
03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලියකියවිලි කට්ටලයක් පහත සඳහන් කර ඇති ලිපිනයේදී ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් සහ ආපසු නොගෙවන රුපියල් තුන් දහසක මුදලක් (3,000.00) ගෙවීමෙන් ජාතික පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ වෙතින් 23/06/2021 දින සිට 14/07/2021 දක්වා වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා වූ කාලය තුළදී ලබාගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් විය යුතු අතර, එය ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත ගෙවිය යුතුය. මේ ගෙවීමට අදාළ ලදුපත එම අවස්ථාවේදී ඔබට ලබාදෙනු ඇත.
04. ලංසු 15/07/2021 දින පෙ.ව. 10.00 ට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනය වෙත භාරදිය යුතුය. ලංසු භාර ගැනීම 15/07/2021 දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර, ඉතික්බිති වහාම ලංසු විවෘත කිරීම සිදුකරනු ඇත. සෑම ලංසුවක් සමගම මෙම ලංසු අයදුම්පත්‍රයෙහි වගුවෙහි සඳහන් පරිදි වූ ලංසු ඇපකරයක් එවා තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ලියකියවිලි මිලදී ගත් සියලු ලංසුකරුවන්හට ලංසු විවෘත කරන අවස්ථාවට පහත සඳහන් කර ඇති ලිපිනයට පැමිණෙන ලෙස ආරාධනා කරනු ලැබේ.
05. මෙම ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරන ලද කිසියම් පිරිවැයකට හෝ වියදමක් සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.

(ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන්)

**අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන,**
**555/5, මහජන සෞඛ්‍ය සංකීර්ණය,**
**ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**දුරකථනය - 011-2368627**
**ෆැක්ස් - 011-2368627**
**ඊමේල් - nccpsl@yahoo.com**

## ප්‍රසම්පාදන දැන්වීම
## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- මාතලේ

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් පහත සඳහන් ව්‍යාපෘතිය සඳහා 2021.07.19 වැනි දින පස්වරු 2.30 දක්වා මධ්‍යම පළාත තුළ ස්ථිර ලිපිනයක ස්ථාපිත CIDA ආයතනයේ ලියාපදිංචි සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| ලංසු අංකය | ව්‍යාපෘතිය | CIDA ලියාපදිංචිය | සෘජු ඉදිකිරීම් පිරිවැය ආසන්න (රු.මි.) (වැට් රහිත) | ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලියවිලි ගාස්තු (රු.) | ආපසු ගෙවන ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|---|---|
| DSO.MT/2021/ 11/PRO/04 | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිරිස්ගෝනියා ඔය අවහිරතාවයන් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය | වාරිමාර්ග හා භූමි අපවහනය ක්ෂේත්‍රයේ (Irrigation & Land Drainage) C5 සහ C6 | 14.40 | 3,500.00 | 144,000.00 |

01. උක්ත කර්මාන්තය සඳහා ඉල්ලුම් කරනු ලබන ඉල්ලුම්කරු ඉහත සඳහන් ශ්‍රේණියේ යාවත්කාලීන වී (CIDA) තිබිය යුතු අතර, අසාධු ලේඛනයට ඇතුළත් නොවී තිබිය යුතුය.
02. ව්‍යාපෘති අවසන් කිරීම සඳහා වෙන්වන කාල සීමාව **මාස 04 කි.**
03. ලංසුපත් **2021.06.25 දින සිට 2021.07.16** වැනි දින **පස්වරු 2.30 දක්වා** සතියේ වැඩකරන දිනයන්හි ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු මෙම කාර්යාලයේ සරප් වෙත ගෙවා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඉංජිනේරු අංශයෙන් ලබාගත හැකිය.
04. CIDA ලියාපදිංචිය තහවුරු කරගැනීමෙන් පසුව ලංසුපත් නිකුත් කරනු ලැබේ.
05. ප්‍රසම්පාදන ලියකියවිලි ඉදිරිපත් කිරීමේ දී ප්‍රසම්පාදනකරුගේ වැට් බදු ලියාපදිංචියක් ඇත්නම් එහි අංකය සඳහන් කිරීම අනිවාර්ය වන අතර, අදාළ සහතිකයේ පිටපතක් ද ලංසු පත්‍රයට අමුණා එවිය යුතුය.
06. ඉහත ආපසු ගෙවන ලංසු සුරක්ෂණ ගාස්තු (Bid Security) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් වාණිජ බැංකුවක්, ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (Construction Guarantee Fund) මගින් ලබාගත් **2021.12.31** වන දින දක්වා වලංගු ඇපකරයක් මගින් ඉදිරිපත් කළ හැකිය.
07. සම්පූර්ණ කරන ලද ලංසු මුල් පිටපත හා අතිරේක පිටපතක් වශයෙන් **2021.07.19 වන දින පස්වරු 2.30** ට ප්‍රථම **"සභාපති, දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ"** නමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු නිල කාමරයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලමින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ හැකි අතර, තැපෑලේ දී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව වග කියනු නොලැබේ. ප්‍රසම්පාදනපත් බහාලන කවරයේ උඩ වම් කෙළවරේ ඉහළ කර්මාන්තයේ නම අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.
08. ලංසු, ඉහත ලිපිනයේ දී එම අවස්ථාවට සහභාගිවීමට කැමති ලංසුකරුවන් හෝ ඔවුන් වෙනුවෙන් ලිඛිතව බලය පවරනු ලබන නියෝජිතයින් ඉදිරිපිටදී අවසාන වේලාව ඉකුත් වූ වහාම විවෘත කෙරේ.
09. ඉහත ව්‍යාපෘතිය පිළිබඳ වැඩි විස්තර මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු අංශයෙන් ලබාගත හැකිය. **(දුරකථන අංකය 066-2222319)**
10. ලංසුකරුවන් විසින් ලංසු පිළියෙල කිරීම හෝ භාරදීම සම්බන්ධයෙන් වන පිරිවැය හා වැඩබිම් වෙත යාම ඇතුළුව දරන වියදම් පිළිබඳව සේව්‍යයා වගකියනු නොලැබේ.
11. පසුගිය වසර තුන (3) ඇතුළත මෙම ව්‍යාපෘතියට සමාන ස්වභාවයේ ව්‍යාපෘති සාර්ථකව නිමකර පළපුරුද්දක් ඇත්නම් එය විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.
12. නියමිත තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සපුරා නොමැති ලංසුකරුවන්ගේ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
13. ලංසු සඳහා වන අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වේ.

**සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**මාතලේ.**

## ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
### ලංසු සඳහා ආරාධනයයි

01. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (04 වන කලාපය) සභාපති විසින් පහත විස්තර කොට ඇති කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| | කර්මාන්තයේ විස්තර | VAT බදු ඇතුළුව ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | ඉදිකිරීම් කාල සීමාව (දින) | CIDA ශ්‍රේණිය | ලංසු ඇපකරය (රු.) | ආපසු ගෙවනු නොලබන ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01 | මඩකලපුව, තිරයිමඩු, කලාප IV ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම - අදියර - I (BD/Z4/2021/04) | 17.7 | දින 126 යි | සී 6 හෝ සී 5 | 265,000.00 | 5,000.00 |
| 02 | මඩකලපුව කල්ලඩියේ පොලිස් පුහුණු පාසලේ මායිම් බිත්තිය ඉදිකිරීම - අදියර I (BD/Z4/2021/05) | 15.8 | දින 140 යි | සී 6 හෝ සී 5 | 237,000.00 | 5,000.00 |
| 03 | අරලගන්විල පොලිස් පුහුණු පාසලේ ගොඩනැගිලි අංක 13 සඳහා වන නවීකරණ කටයුතු (BD/Z4/2021/06) | 13.6 | දින 154 යි | සී 6 හෝ සී 5 | 205,000.00 | 5,000.00 |
| 04 | අරලගන්විල පොලිස් පුහුණු පාසලේ ගොඩනැගිලි අංක 16 සඳහා වන නවීකරණ කටයුතු (BD/Z4/2021/07) | 13.6 | දින 154 යි | සී 6 හෝ සී 5 | 205,000.00 | 5,000.00 |

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටු කිරීමට ඇති කර්මාන්තවල ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 50 ට අඩු බැවින් අංක 04/2016(iii) සහ අංක 03/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛවල සඳහන් කර ඇති පරිදි ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ප්‍රමුඛතාවය අදාළ වනු ඇත.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු භාරගැනීමේ අවසාන දිනය දක්වා වලංගු වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සී 6 හෝ සී 5 ශ්‍රේණිය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය. තවද, ලංසු ප්‍රදානය කරනු ලබන දිනය දක්වා ලියාපදිංචිය වලංගු විය යුතුය.
04. ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ඔවුන්ව ලියාපදිංචි කරගත යුතුය. ලියාපදිංචි සහතිකයේ (PCA 03) මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. PCA 03 සහතිකය ඉදිරිපත් කර නොමැති ඕනෑම ලංසුකරුවෙකුට මෙම ප්‍රසම්පාදනය ප්‍රදානය කරනු නොලැබේ.
05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු මඩකලපුව, මන්මුනයි උතුර පරිශ්‍රයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු (04 වන කලාපය) වෙතින් ලබාගත හැකි අතර, එම ලිපිනයේදී ඕනෑම රාජකාරී දිනයකදී 09.00 පැය හා 16.00 පැය අතර, ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

**සම්බන්ධ කරගත හැකි අංක : දුරකථනය : 065-2229808**
**ෆැක්ස් : 065-2229807**

06. ඉහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2021.06.23 වෙනි දින සිට 2021.07.06 වෙනි දින දක්වා මඩකලපුව, මන්මුනයි උතුර පරිශ්‍රයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු (04 වන කලාපය) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
07. ලංසු, 2021.07.07 වෙනි දින 10.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, (04 වන කලාපය), ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මන්මුනයි උතුර පරිශ්‍රය, මඩකලපුව"** යන ලිපිනය වෙත ගෙනැවිත් භාර දීමට හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමට හැකිය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම ලිපිනයේදී එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
08. ලංසු භාරගැනීම සඳහා නියමිත අවසාන දිනයේ සිට දින 77 ක් හෝ ඕනෑම දීර්ඝ කරනු ලබන කාල සීමාවක් සඳහා ලංසු වලංගු විය යුතුය.
09. සියලුම ලංසු සමග පහත සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.
- ලංසු ලිපිලේඛනයේ 09 වන කොටසේ ඇතුළත් කොට ඇති ආකෘතියේ
- ගොඩනැගිලි අධ්‍යක්ෂ නමින්
- වගුවේ සඳහන් වටිනාකමින් යුතු
- 2021.10.20 වෙනි දින දක්වා වලංගු
- උපලේඛනයේ 16.0 වන වගන්තියේ සඳහන් නියෝජිතායතනයක් විසින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක්

**ඉංජිනේරු ඩබ්ලිව්. ඒ. ඩබ්ලිව්. අභයවර්ධන**
**අධ්‍යක්ෂ ඉදිකිරීම් (ප්‍රාදේශීය),**
**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,**
**2 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**

# ප්‍රසම්පාදන දැන්වීම

## පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## වයඹ පළාත

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ජාතික තරගකාරී ක්‍රමය යටතේ ලංසු මිල ගණන් කැඳවනු ලැබේ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට 2021.06.22 දින පෙ.ව. 9.00 සිට 2021.07.12 දින ප.ව. 3.30 දක්වා කාලය තුළ පහතින් සඳහන් කර ඇති ආයතන වෙත පැමිණ ලංසු ලියවිලි පරීක්ෂා කිරීමෙන් පසු ඊට අදාළ ලංසු ගාස්තු එම ආයතනයේ මුදල් අයකැමි වෙත මුදලින් ගෙවා ලංසු ලියවිලි ලබාගත හැකිය.

| අනු අංකය | ඉදිකිරීම් හා අලුත්වැඩියා ව්‍යාපෘතියේ විස්තර | අවශ්‍ය ලියාපදිංචිය හා ශ්‍රේණිය | ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් (රු.මි.) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රුපියල්) | ලංසු ඇපකරයේ වටිනාකම (රුපියල්) | ලංසු ලියවිලි ලබාගත හැකි ආයතනය |
|---|---|---|---|---|---|---|
| 1 | Repair of Expansion & Upgrading of Laboratory at D.H Wariyapola | C9/C8 | 1.3 | 1,000.00 | 13,000.00 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල "සෞඛ්‍ය සංකීර්ණය" පුවක්ගස් හන්දිය, මීගමු පාර, කුරුණෑගල. |
| 2 | Upgrading wash room facilities at PMCI Kumbukwewa | C9/C8 | 1.5 | 1,000.00 | 15,000.00 | |
| 3 | Renovation of OPD Building Roof - DH Alawwa | C9/C8 | 1.6 | 1,000.00 | 16,000.00 | |
| 4 | Upgrading wash room facilities at PMCI DH Mahamookalanyaya | C9/C8 | 1.6 | 1,000.00 | 16,000.00 | |
| 5 | Renovation and refurbishments at D.H Hiripitiya | C9/C8 | 2 | 1,000.00 | 20,000.00 | |
| 6 | Renovation and refurbishments at D.H Pahalagiribawa. | C9/C8 | 2.1 | 1,000.00 | 21,000.00 | |
| 7 | Repair of Essential Renovations of PMCU at Munamaldeniya-Ward,OPD | C8/C7 | 2.2 | 1,500.0 | 22,000.00 | |
| 8 | Refurbishment of MOH offices, Narammala | C8/C7 | 2.2 | 1,500.0 | 22,000.00 | |
| 9 | Upgrading store facilities at MOH Offices (Pannala) | C8/C7 | 2.2 | 1,500.0 | 22,000.00 | |
| 10 | Upgrading store facilities at MOH Offices (Udubaddawa) | C8/C7 | 2.2 | 1,500.0 | 22,000.00 | |
| 11 | Essential repairs at BH Galgamuwa. | C8/C7 | 2.4 | 1,500.0 | 24,000.00 | |
| 12 | Renovation of wash room and drainage system at DH Polgahawela | C8/C7 | 2.5 | 1,500.0 | 25,000.00 | |
| 13 | Renovation and Refurbishments of DH Mawathagama | C8/C7 | 2.5 | 1,500.0 | 25,000.00 | |
| 14 | Renovation of Aragoda Clinic Building at Aragoda,Polgahawela | C8/C7 | 2.5 | 1,500.0 | 25,000.00 | |
| 15 | Construction of Thriposha Stores at MOH Polpithigama | C8/C7 | 2.6 | 1,500.0 | 26,000.00 | |
| 16 | Renovation of No-1 & No-2 MO Quarters Roof and Others at D.H Rajanganaya | C8/C7 | 2.8 | 1,500.0 | 28,000.00 | |
| 17 | Renovation and refurbishments at D.H Wariyapola | C8/C7 | 2.9 | 1,500.0 | 29,000.00 | |
| 18 | Essential Renovation of Ward No 1,2,7,10 and Nurses Quarters at BH Dambadeniya. | C8/C7 | 3 | 2,000.0 | 30,000.00 | |
| 19 | Refurbishment Existing PMCLs at PMCU Kudagalgamuwa | C8/C7 | 3.1 | 2,000.0 | 31,000.00 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල "සෞඛ්‍ය සංකීර්ණය" පුවක්ගස් හන්දිය, මීගමු පාර, කුරුණෑගල. |
| 20 | Essential Renovation of MO Quarters at BH Galgamuwa. | C8/C7 | 3.3 | 2,000.0 | 33,000.00 | |
| 21 | Expansion of PMCU Maspotha (Including Patient,Staff Wash Room & MCH Clinics) At Maspotha 2021 | C8/C7 | 3.4 | 2,000.0 | 34,000.00 | |
| 22 | Refurbishment of MCH clinic at Kathnoruwa | C8/C7 | 3.4 | 2,000.0 | 34,000.00 | |
| 23 | Renovation and refurbishment of MO quarters at PMCU Makulpotha | C8/C7 | 3.5 | 2,000.0 | 35,000.00 | |
| 24 | Refurbishment existing PMCIs DH Mawathagama | C8/C7 | 3.9 | 2,000.0 | 39,000.00 | |
| 25 | Essential Renovation of ward,wash room,fence & gate at D.H Karabe | C8/C7 | 4.7 | 2,000.0 | 47,000.00 | |
| 26 | Refurbishment existing PMCIs at D.H Delvita | C7/C6 | 6 | 2,500.00 | 60,000.00 | |
| 27 | Refurbishment existing PMCI at Nikawewa Hospital | C7/C6 | 6.1 | 2,500.00 | 61,000.00 | |
| 28 | Refurbishment existing PMCLs at D.H Gonigoda | C7/C6 | 6.4 | 2,500.00 | 64,000.00 | |
| 29 | Refurbishment of MOH office at Madampe | C9/C8 | 1.3 | 1,000.00 | 13,000.00 | |
| 30 | Improvements of facilities at Mundel Hospital | C9/C8 | 1.5 | 1,000.00 | 15,000.00 | |
| 31 | Renovation and Refurbishment of MOH Office Kalpitiya | C8/C7 | 2.7 | 1,500.00 | 27,000.00 | |
| 32 | Upgrading Store Facilities at MOH Office - Chilaw | C8/C7 | 3.2 | 2,000.00 | 32,000.00 | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - පුත්තලම, රෝහල් ගොඩනැගිල්ල, මාදම්පේ. |
| 33 | Renovation of Maternity Ward Complex at BH Marawila | C7/C6 | 5.6 | 2,000.00 | 56,000.00 | |
| 34 | Refurbishment of MOH Office at Anamaduwa | C7/C6 | 5.8 | 2,000.00 | 58,000.00 | |
| 35 | Refurbishment of existing PMCLs Quarters at D.H Thabbowa | C7/C6 | 6.5 | 2,500.00 | 65,000.00 | |
| 36 | Improvement of facilities at PMCU Koththanthive | C7/C6 | 7.1 | 2,500.00 | 71,000.00 | |
| 37 | Improvement of Facilities at PMCU Mahakubukkadawala | C7/C6 | 7.6 | 2,500.00 | 76,000.00 | |
| 38 | Refurbishement of MOH Office at Karuwalagaswewa | C7/C6 | 8.5 | 3,000.00 | 85,000.00 | |
| 39 | Infrastructure Development PDHS Office And Provincial Training NWP. | C8/C7 | 2.9 | 1,500.00 | 29,000.00 | |
| 40 | Expansion of existing Operating Theatre including Eye theatre and Central Air Conditioning System, BH Nikaweratiya | EM1/EM2 | 14 | 4,500.00 | 140,000.00 | |
| 41 | Balance work of first floor at Drugs Stores of Base Hospital Anamaduwa(Stage II) | C6/C5 | 14.9 | 4,500.00 | 149,000.00 | |
| 42 | Refurbishment of Professional Accommodation facilities, BH Nikaweratiya | C6/C5 | 15 | 4,500.00 | 150,000.00 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - කුරුණෑගල, "සෞඛ්‍ය සංකීර්ණය" පුවක්ගස් හන්දිය, මීගමු පාර, කුරුණෑගල. |
| 43 | Construction of Nursing Quarters at BH Galgamuwa (First Floor) | C6/C5 | 15.8 | 4,500.00 | 58,000.00 | |
| 44 | Construction of MO Quarters 1st & 2nd floor at BH Galgamuwa | C6/C5 | 16 | 4,500.00 | 160,000.00 | |
| 45 | Construction of Second Floor Dialysis unit Building at BH Polphithigama. | C6/C5 | 17.6 | 4,500.00 | 176,000.00 | |
| 46 | Construction of ETU complex with laboratory, Dental clinic at DH Wanathawilluwa | C6/C5 | 18.2 | 5,000.00 | 182,000.00 | |
| 47 | Construction of Surgical & ICU Complex at BH Marawila-Stage II | C5/C4 | 37 | 10,000.00 | 370,000.00 | |
| 48 | Construction of Five storied public health building (Phase 2) at RDHS Kurunegala. | C5/C4 | 50.8 | 12,500.00 | 508,000.00 | |
| 49 | Construction of Primary Care Building for D.H Gokarella (phase 2 ) | C4 පමණි | 98.6 | 12,500.00 | 986,000.00 | |

02. ලංසු ඇපකරය මුදලින් ගෙවන්නේ නම් ඉහත සඳහන් ලංසු ඇපකරයේ වටිනාකමින් 50% ක අගය ලංසු ලියවිලි ලබාගන්නා ආයතනයේ මුදල් අයකැමි වෙත ගෙවා මුදල් අයකැමි විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියේ සහතික කරන ලද ඡායාපිටපතක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතු අතර, ලංසු ඇපකරය මුදලින් ගෙවන්නේනම් ඉහත සඳහන් ලංසු ඇපකරයේ වටිනාකමට සමාන අගය ලංසු ලියවිලි සමග නිකුත් කරනු ලබන ආකෘතියට අනුකූලව ලංසු ලියවිලි ලබාගන්නා පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවක් මගින් ලබාගෙන ලංසු ලියවිලි සමග එහි මුල්පිටපත ඒ ඒ ව්‍යාපෘතියට අදාළව වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

03. නිසි පරිදි සම්පූර්ණ කල ලංසු ලියවිලි ලංසු මුල්පිටපත හා දෙවන පිටපත වෙන් වෙන්ව කවරවල බහා සියල්ල යලි එක් කවරයක බහා ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ නම ලිපි කවරයේ වම්පස ඉහළ තීරුවේ පැහැදිලිව ලියා ඊට අදාළ ලංසු ලියවිල්ලේ සඳහන් ආයතනය වෙත 2021.07.13 පෙ.ව. 10.00 ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් හෝ එම ආයතනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම සිදුකළ යුතුය.

04. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ඒ ඒ ලංසු ලියකියවිලි වල සඳහන් නියමිත ස්ථානය හා එහි සඳහන් නියමිත දින ලංසු විවෘත කරන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ඒ සඳහා සහභාගි විය හැකි අතර, භාණ්ඩාගාර ලේකම්ගේ 04/2016(ii) චක්‍රලේඛයට අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සිදු කෙරේ.

05. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ 0372223479 ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කුරුණෑගල 0372222278 හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ පුත්තලම 0322247261 යන දුරකථන අංක අමතා ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,**
**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය.**

# ලංසු සඳහා ආරාධනයයි

## මානව ශාස්ත්‍ර පීඨයේ, සුහුරු පංති කාමර හතරක් සහ මධ්‍යස්ථාන දෙකක් සංවර්ධනය කිරීම

## UK/GA/GA3/AHEAD/42

01. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙනුවෙන් කැලණිය විශ්වවිද්‍යාලයයේ උප කුලපති විසින් පහත විස්තර කර ඇති පරිදි සහ ඇස්තමේන්තු ගත පිරිවැය **වැට් බදු හැර රුපියල් මිලියන 24** ක් වන හා කොන්ත්‍රාත්තු කාල සීමාව මාස 04 ක් වන **මානව ශාස්ත්‍ර පීඨයේ සුහුරු පංති කාමර සතරක් සහ මධ්‍යස්ථාන දෙකක් සංවර්ධනය කිරීම** අරහයා යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

02. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු, අසාධු ලේඛනගත නොවී සිටිය යුතු වන අතර, ICTAD ලියාපදිංචියේ (5 වන වගන්තියේ) පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර සිටිය යුතුය.

ICTAD වලංගු ලියාපදිංචිය – SP 3 **හෝ ඉහළ**

04. අභිලාෂී ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ ඉංජිනේරු කාර්යාලය වෙතින් (දුරකථන අංකය : 0112–903164) ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන (www.kln.ac.lk) තුළින් හෝ 2021 ජූනි මස 23 වන දින සිට **2021 ජූලි මස 15 වන දින දක්වා, රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.30 දක්වා සහ ප.ව. 1.30 සිට ප.ව. 2.30 දක්වා** අතරතුර කැලණිය විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පරිපාලන වෙතින් පරීක්ෂා කර බැලීම සඳහා ලබාගත හැකිය.

05. අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් විශ්වවිද්‍යාලයේ සරප් වෙත ආපසු ගෙවනු නොලබන **රුපියල් 5,000.00 ක** ගාස්තුවක් ගෙවීමෙන් හා කැලණිය දළුගම, කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ, සහකාර ලේඛකාධිකාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්ද අනතුරුව **2021 ජූනි මස 23 වන දින සිට 2021 ජූලි මස 15 වන දින දක්වා රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 පෙ. ව. 11.30 සහ – ප.ව. 1.30 – ප.ව. 2.30** අතරතුර මිලදී ගත හැකිය.

***එසේ නැතහොත්,***

2021 ජූනි මස 23 වන දින සිට 2021 ජූලි මස 15 වන දින දක්වා මහජන බැංකුවේ දළුගම ශාඛාවේ කැලණිය විශ්වවිද්‍යාලයයේ **ගිණුම් අංක** 055 1001 1 066 7549 දරන ගිණුමට ආපසු ගෙවනු නොලබන **රුපියල් 5,000/– ක** ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ඊමේල් මගින් ඊමේල් ලිපින argenadmin@kln.ac.lk හරහා කැලණිය, දළුගම, කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ, සහකාර ලේඛකාධිකාරී වෙත ගෙවීම් ලදුපතේ පරිලෝකනගත (Scanned) කළ පිටපතක් සමග ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්ද මිලදී ගත හැකිය.

06. ලංසු, **2021 ජූලි මස 16 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර** ලැබෙනසේ, කැලණිය, දළුගම, කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී කාර්යාලය අසල තබා ඇති සාමාන්‍ය පරිපාලන අංශයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

07. ලංසු, එම ලංසු විවෘත කරනු ලබන වේලාවට පැමිණ සිටීමට කැමැති ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී **2021 ජූලි මස 16 වන දින ප.ව. 2.30 ට** විවෘත කරනු ලබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. රට තුල පවතින COVID - 19 තත්ත්වය හේතු කොටගෙන ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනයේ යම් වෙනස් කිරීමක් සිදු වුවහොත්, ඒ බව කැලණිය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන (www.kln.ac.lk) මගින් දැනුම් දෙනු ලැබේ.

08. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක්, මහජන බැංකුවේ, දළුගම ශාඛාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 055 1001 8 066 9229 දරන ගිණුමට මුදල් තැන්පතුවක් මගින් හෝ මුදලින් විශ්වවිද්‍යාලයයේ සරප් වෙත ගෙවීම හෝ සම්මත ආකෘති පත්‍ර වල 09 වන වගන්තියේ / කොටසේ අන්තර්ගත ලංසු සුරක්ෂණ ආකෘතිය භාවිතා කරමින් ඉදිකිරීම් ඇපකර අරමුදල හෝ රක්ෂණ නියෝජිතායතනයක් හෝ (ශ්‍රී ලංකා මහ බැංකුව හි ලියාපදිංචි) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකව පවතින බැංකුවකින් නිකුත් කරන ලද ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැළණිය.**
**2021.06.23**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## වෛද්‍ය සැපයුම් ගබඩාවක් සඳහා තාවකාලික පදනම මත ගබඩා ගොඩනැගිල්ලක් (ගොඩනැගිලි) බද්දට ලබාගැනීම

1. පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් (මින් මතුවට "සේවා යෝජක" ලෙස හැඳින්වේ) වෙනුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින්, අදාළ විෂය පථය කෙටියෙන් පහතින් විස්තර කොට ඇති පරිදි, ඉහත සඳහන් බද්දට ලබා ගැනීම සඳහා, තනි අදියර ද්විත්ව කවර ලංසු ක්‍රියාපටිපාටිය තුළින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

   අදාළ වෛද්‍ය සැපයුම් ගබඩා කිරීම පිණිස බද්දට ගැනීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිල්ල/ගොඩනැගිලිවල මුළු ගෙබිම ප්‍රමාණය ව. අඩි 32,500 කට [(වෛද්‍ය සැපයුම් ගබඩාව සඳහා ව. අඩි 32,000 (වායු සමීකරණය නොකළ) සහ කාර්යාල ප්‍රදේශය සඳහා ව. අඩි 500 (වායු සමීකරණ කරන ලද වශයෙන්)] නොඅඩු විය යුතු අතර, පරිමාව ඝන අඩි 585,000 කට නොඅඩු විය යුතුය. එහි පිහිටීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිට කි.මී. 15 දුරකින් හෝ ලංසු ලේඛනයේ සටහනේ දක්වා ඇති පරිදි මීගමුව දිශාවට පවතින වෙනත් ප්‍රදේශයක වුවද විය හැකිය. තවද එය, ප්‍රවේශ පහසුකම් හා රථ ගාලකින් යුක්ත විය යුතුය. අදාළ බදු කාලය, වසර දෙකක් වන අතර, වසර තුනක් දක්වා දීර්ඝ කිරීමේ හැකියාව පැවතිය යුතුය.

2. තවද අවශ්‍ය ගොඩනැගිලිවල තාක්ෂණ විස්තර හා ප්‍රධාන ලක්ෂණ, ප්‍රවේශ මාර්ගවල විස්තර හා බදු ගැනීමේ මූල්‍ය කොන්දේසි පිළිබඳව ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත. ලංසු ලේඛනය අධ්‍යයනය කිරීම සඳහා පමණක් පහත සඳහන් සම්බන්ධකය භාවිතා කළ හැකිය. **https://drive.google.com/drive/folders/1TGn_MbztIdbQipIu01KpfKZMBhFFHvV6?usp = sharing**

3. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ලංසු ලේඛනය මිලදී ගැනීමට පෙර අදාළ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි අතර, අවශ්‍ය වැඩිදුර විස්තර, රාජකාරී දිනවල, ලංසු භාරගැනීමේ අවසන් දිනය දක්වා **09.00 පැය හා 16.00** පැය අතර, කාලය තුළ, කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 86, මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩසටහන – Tranche 3 හි ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක. දුරකථනය 94(11) 2665331 සහ ෆැක්ස් (94)(11) 2665330 හෝ ඊමේල් pdgcwmp@sltnet.lk

4. ආපසු නොගෙවන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් පන්දහසක් (රුපියල් 5,000) ගෙවීමෙන් හා ඉහත 3 ඡේදයේ සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් රාජකාරී දිනවල **09.00 හා 16.00** පැය අතර, කාලය තුළ, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, අදාළ ලංසු ලේඛන මිලදී ගත හැක. අදාළ ගෙවීම් කළ පසුව ලංසු ලේඛන ලබාගත හැකි අතර, ගෙවීම් මුදලින්ම කළ යුතු වේ.

5. අදාළ ලංසු ඇපකරය, **රුපියල් 100,000.00** වටිනාකමින් යුක්තව, ලංසුකරුවන් සඳහා උපදෙස් හි 1.13 උපවගන්තිය ප්‍රකාරව තාක්ෂණ ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

6. විකල්ප මිල ගණන් කිහිපයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ලංසුකරුවන් විසින් ඒ සඳහා **වෙන් වශයෙන් ලංසු ලේඛන මිලදී ගත යුතු අතර, ඉහත සඳහන් පරිදි වෙන් වෙන්ව ලංසු ඉදිරිපත් කළ යුතුය.** කෙසේ වෙතත්, එවන් අවස්ථාවලදී එක් ලංසු ඇපකරයක් ප්‍රමාණවත් වේ.

7. ලංසු, දින 90 ක කාලයක් සඳහා වලංගු විය යුතුය.

8. ලංසු ලේඛනයන්හි ලබාදී ඇති විස්තර ඇතුළත් කොට අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කළ ලංසු, තාක්ෂණ ලංසුව හා මිල ලංසුව ලෙස වෙන් වශයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ "ටෙන්ඩර් පෙට්ටියේ" බහාලීමෙන් සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයාගේ අවධානයට යොමු කොට), පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ලිපිනයට **2021 ජූලි 20 වන දින 14.00** පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

9. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ, නියෝජිතයන්ගේ ඉදිරියේ තාක්ෂණ ලංසු විවෘත කරනු ලැබේ.

10. ලංසු පිළියෙල කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී ලංසුකරුවන්හට සිදුවිය හැකි යම් පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය කිසිදු වගකීමක් නොදරයි.

**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.**

# පුවත්පත් දැන්වීමේ දින සංශෝධනය කිරීම

## නඩත්තු / අලුත්වැඩියා හා හදිසි ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2021/2022 වර්ෂ

## ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත

මධ්‍යම පළාත් සභාවට අයත් අමාත්‍යාංශ ගොඩනැගිලි / දෙපාර්තමේන්තු ගොඩනැගිලි / ආයතන / වෙනත් ගොඩනැගිලි මහාමාර්ග සහ වාරිමාර්ග සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 03 දක්වා වූ නඩත්තු / අලුත්වැඩියා හා හදිසි ඉදිකිරීම් කටයුතු කිරීමට අදාළව 2021/2022 වර්ෂ සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් 2021 මැයි මස 17 වන දින පළ කරන ලද පුවත්පත් දැන්වීම හා බැඳේ.

එමගින් දැනුම් දී තිබූ ලංසු පෝරම නිකුත් කිරීමේ අවසන් දිනය හා වේලාව 2021 ජූලි මස 08 වනදා 15.00 වන පැය ලෙස සංශෝධනය කෙරේ.

එමෙන්ම සම්පූර්ණ කළ අයදුම්පත් භාරදීමේ අවසන් දිනය 2021 ජූලි මස 09 වන දින 10.00 පැය ලෙස සංශෝධනය කරන අතර, ලංසු 2021 ජූලි මස 09 වන දින 10.30 පැයට විවෘත කෙරේ.

2021 මැයි මස 17 වන දින පුවත්පත් දැන්වීමේ සඳහන් අනෙකුත් උපදෙස් ඒ අයුරින්ම වලංගු වන අතර, රට තුළ පවතින COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිරියේදී මෙම දිනයන්හි සංශෝධනයක් සිදු කිරීමට සිදු වුවහොත්, ඒ සඳහා සංශෝධිත පුවත්පත් දැන්වීම් පළ කිරීම ප්‍රායෝගික නොවන බැවින් එම තොරතුරු www.cs.cp.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.

මේ සම්බන්ධ වැඩි විස්තර සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දුරකථන අංක 081-2233725 මගින් විමසිය හැකි අතර, ලංසු ලියවිලි ලබා ගැනීම සම්බන්ධ ගැටළු ඇත්නම් දුරකථන අංක 0714474271, 0717300373, 0772424762 අමතා වැඩිදුර තොරතුරු ලබාගත හැක.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය,**
**මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ.**
2021.06.23

# ලංසු විවෘත කිරීමේ දිනය දීර්ඝ කිරීම

## පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය

## උතුරු මැද පළාත

උතුරු මැද පළාත් සභාවේ පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් 2021.05.17 දින පළ කරන ලද පුවත්පත් දැන්වීමට අනුව, පහත දින සංශෝධන කර ඇත.

| යොමුව | සංශෝධනය |
|---|---|
| ඡේද අංක 6 | ලංසු නිකුත් කිරීම අවසන් කිරීම 2021.07.07 වන දින දක්වා දීර්ඝ කිරීම |
| ඡේද අංක 7 | ලංසු විවෘත කිරීමේ දිනය 2021.07.08 වන දින පෙ.ව. 11.00 |
| ඡේද අංක 9 | ලංසු සුරක්ෂණය 2021.10.21 වන දින දක්වා වලංගු විය යුතුය. |

ඉහත සංශෝධන හා අනුරූපී කරුණු හැර අනෙකුත් සියලු කරුණු නොවෙනස්ව පවතී.

**සභාපති / අමාත්‍යාංශ ලේකම්,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන,**
**ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය,**
**උතුරු මැද පළාත,**
**පළාත් සභා සංකීර්ණය,**
**1 වන මහල, අනුරාධපුරය.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## වනජීවී රැකවරණ, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## ලංසු ආරාධනයයි

## Herbivore Pellets මිලදී ගැනීම

### WL/2/21/Herbivore Pellets/2021

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රැකවරණය ලබන අලි පැටවුන් සඳහා අවශ්‍ය Herbivore Pellets මිලදී ගැනීම සඳහා සුදුසුකම් ඇති හා ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

01. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ සිදු කරනු ලැබේ.

02. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි 2021.07.14 දින දක්වා රජයේ වැඩ කරන කාර්යාල දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප. ව. 2.30 දක්වා බත්තරමුල්ල, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේදී නොමිලේ පරීක්ෂා කළ හැක.

03. ලංසු ලියවිලි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළියෙල කර ඇති අතර, පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා 2021.07.14 දින වන තෙක් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නමින් කරන ලද ලිඛිත ඉල්ලීම සහිතව මුදලින් රු. 2,000.00 ක ආපසු නොගෙවන තැන්පත් මුදල දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් පසු ලබාගත හැක.

04. ලංසු ලියවිලි සමග ලංසුව විවෘත කළ දින සිට දින 120 ක් දක්වා වලංගු වන පරිදි ලබා ගත් රු. 81,000.00 ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු අතර, එය ලංසු ලියවිලි වල ඇතුළත් ආකෘතිය ප්‍රකාරව රජයේ පිළිගත් වාණිජ බැංකුවක් මගින් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත 2021.07.15 දින ප.ව. 2.30 ට පෙර මුදල් ගෙවීමෙන් ලබාගත හැක. ලංසු ලියවිලි සමග ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසුව ලංසු විවෘත කළ දින සිට අවම වශයෙන් දින 90 ක කාලයකට වලංගු විය යුතුය.

06. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි මුල්පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් ලියුම් කවරවල බහා මුද්‍රා තබා නැවත එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය සඳහන් කර 2021.07.15 දින ප. ව. 2.30 ට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තබා ඇති ලංසු බහාලුම් පෙට්ටියට බහාලිය හැකි අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම එදිනම ප.ව. 2.30 ට සිදු කරනු ලබන අතර, ඒ සඳහා ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

07. ලංසුපත් පිළිබඳ වැඩිමනත් විස්තර 0112-871537 දුරකථනය මගින් දෙපාර්තමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) ඇමතීමෙන් ලබාගත හැක. ලංසුපත් පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතු වන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන්හි සඳහන් වන හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයන්ට අදාළ කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබාදීමේ බලය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

08. ලංසුපත් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වැය වන කිසිදු පිරිවැයක් සඳහා සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.

09. ඕනෑම ලංසුවක් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, කොටසක් පිළිගැනීම හෝ කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,**
**අංක 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.**

# ලංසු සඳහා ආරාධනයයි 2021/02

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව - උතුරු පළාත

01. උතුරු පළාතේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු හා **ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපතින් විසින්** පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. **ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය** මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත වගුවේ සඳහන් ශ්‍රේණි සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපිලේඛනයේ 4 වන කොටසේ සඳහන් කොට ඇත. අතිරේක විස්තර ලංසු දත්ත හා කොන්ත්‍රාත් දත්ත (5 වන කොටසේ) ලබා දී ඇත.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පහත 6 යටතේ ලබාදී ඇති ලිපිනයන් වෙතින් ලබාගත හැකි අතර, එම ස්ථානයන්හි ඕනෑම රාජකාරී දිනක පෙ.ව. 9.00 සහ ප.ව. 4.00 අතර, ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

06. පහත වගුවෙහි සඳහන් කාලසීමාව තුළ පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයන් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා වගුවෙහි සඳහන් ආපසු නොගෙවන ගාස්තු ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

   අ) ලංසු අංක : NP/B/JA/21(2021)(R) සඳහා ප්‍රාදේශීය අධ්‍යක්ෂ කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වෙරළ පාර, යාපනය.
   (දු. අංක. 021-2228091/021-2212900 ෆැක්ස් : 021-2212700)

   ආ) ලංසු අංක : NP/B/JA/25(2021) සඳහා ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වෙරළ පාර, යාපනය.
   **(දු. අංක 021-2222632 ෆැක්ස් : 021-2222632)**

07. ලංසු (මුල්පිටපත, අනුපිටපත) පහත වගුවේ සඳහන් දිනයේ පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ගෙනැවිත් භාර දිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලංසු අංකය කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

   අ) ලංසු අංක : NP/B/JA/21(2021)(R) සඳහා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය අධ්‍යක්ෂ කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වෙරළ පාර, යාපනය.

   ආ) ලංසු අංක : NP/B/JA/25(2021) සඳහා සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, උතුරු පළාත, වෙරළ පාර, යාපනය.

08. පූර්ව-ලංසු සම්මන්ත්‍රණය ඉහත 6 හි සඳහන් අදාළ ලිපිනයන්හිදී පහත වගුවේ සඳහන් දිනයේ පෙ.ව. 10.30 ට පැවැත්වේ.

09. ලංසු සමග පහත වගුවේ දී ඇති තොරතුරු ප්‍රකාරව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළ යුතුය.

| | | |
|---|---|---|
| **ප්‍රභේදය - 1** | ලිපිලේඛන නිකුත් කරන / මිලදී ගන්නා කාලසීමාව | 2021.06.23 දින සිට 2021.07.06 දින දක්වා |
| | පූර්ව - ලංසු සම්මන්ත්‍රණය | 2021.07.06 දින පෙ.ව. 10.30 ට |
| | ලංසු භාරගැනීමේ අවසාන දිනය හා විවෘත කරන දිනය | 2021.07.14 දින පෙ.ව. 10.30 ට |

| ලංසු අංකය | වැඩ විස්තරය | අරමුදල් සැපයීම | ඇස්තමේන්තු ගත පිරිවැය / රු. මිලියන වලින් | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| NP/B/JA/ 21(2021)(R) | යාපනය, උතුරු පළාත, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සඳහා තෙමහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර III) | CBG | 57.41 | දින 245 යි | සී 4 හෝ සී 3 (ගොඩනැගිලි) | 15,000.00 | 575,000.00 | 2021.11.09 දින දක්වා |

| | | |
|---|---|---|
| **ප්‍රභේදය - 2** | ලිපිලේඛන නිකුත් කරන / මිලදී ගන්නා කාලසීමාව | 2021.06.23 දින සිට 2021.07.06 දින දක්වා |
| | පූර්ව - ලංසු සම්මන්ත්‍රණය | 2021.06.30 දින පෙ.ව. 10.30 ට |
| | ලංසු භාරගැනීමේ අවසාන දිනය හා විවෘත කරන දිනය | 2021.07.07 දින පෙ.ව. 10.30 ට |

| ලංසු අංකය | වැඩ විස්තරය | අරමුදල් සැපයීම | ඇස්තමේන්තු ගත පිරිවැය / රු. මිලියන වලින් | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| NP/B/JA/ 25(2021)(R) | යාපනය, පරණ උද්‍යානයේ ගරු ආණ්ඩුකාර තුමියගේ කාර්යාලයේ සෝපාන කාමරය ඉදිකිරීම | CBG | 16.30 | දින 168 යි | සී 6 හෝ සී 5 (ගොඩනැගිලි) | 5,000.00 | 163,000.00 | 2021.10.19 |

**ප්‍රභේද අංක 2 සඳහා පමණි**

මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකළ යුතු වැඩවල ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රු. මිලියන 50 ට අඩු බැවින් ප්‍රාදේශීය ප්‍රමුඛතාවය හා CIDA ශ්‍රේණි ප්‍රමුඛතාව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016(iii) හි නියම කර ඇති පරිදි අදාළ වනු ඇත.

ප්‍රසම්පාදන දෙක සඳහා පිළිවෙලින් 09.10.2020 හා 11.01.2021 දතම හා අංක 03/2020 සහ 03/2020(i) යොදා ගනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,**
**උතුරු පළාත.**

# ලංසු පිළිබඳ නිවේදනයයි

## වැවිලි අමාත්‍යාංශය

### පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

## පොල් පර්යේෂණ ආයතනය - ලුණුවිල

### 01 no Inductively Coupled Plasma - Optical Emission Spectrometer with compatible Auto sampler and 01 No Microwave Digestion System සැපයීම, ස්ථාපනය, ක්‍රියාත්මක කිරීම, පුහුණුව සඳහා මිල ගණන් කැඳවීම.

පොල් පර්යේෂණ ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් උපකරණය සපයා ඇති පිරිවිතර හා ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුව සැපයීම සහ ප්‍රවාහනය, ස්ථාපනය කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා සුදුසුකම් සපුරා ඇති සැපයුම්කරුවන්ගෙන් ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසු අංකය | අයිතමය | ප්‍රමාණය | ලංසු සුරක්ෂණය |
|---|---|---|---|
| CRI/2021/NCB/69 | Inductively Coupled Plasma - Optical Emission Spectrometer with compatible Auto Sampler | 01 | 250,000.00 |
| CRI/2021/NCB/70 | Microwave Digestion System | 01 | 75,000.00 |

(1) 2021.06.25 දින සිට 2021.07.13 දින දක්වා (රජයේ වැඩ කරන දිනයන්හි) පැය 09.00 සිට පැය 14.00 දක්වා අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල වෙත, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර එක් ලංසු පත්‍රිකා කට්ටලයක් සඳහා ආපසු නොගෙවන **රු. 3,500.00 ක්** බැගින්, පොල් පර්යේෂණ ආයතනයේ ලුණුවිල ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවීමෙන් පසු ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රණය කරන ලද ලංසු ලියවිලි ලබාගත හැකිය.

(2) පොල් පර්යේෂණ ආයතනයෙන් මිලදීගත් ලංසු ලියවිලිවලින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

(3) මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පොල් පර්යේෂණ ආයතනය, බන්ඩිරිප්පුව, ලුණුවිල. 61150 ලිපිනය ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පොල් පර්යේෂණ ආයතනය, බණ්ඩිරිප්පුව, ලුණුවිල, ප්‍රධාන කාර්යාලයේ සංස්ථාපන ඒකකයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීම **2021.07.14 දින පැය 13.00** දක්වා සිදුකළ හැක. ප්‍රමාදව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීමේ වේලාව අවසන්වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

(4) අධ්‍යක්ෂ, පොල් පර්යේෂණ ආයතනය, දුරකථන අංක 031-2255300 වෙතින් කාර්යාල දිනයන්හි පැය 09.00 සිට පැය 15.00 අතරතුර වැඩි විස්තර ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පොල් පර්යේෂණ ආයතනය, බන්ඩිරිප්පුව,**
**ලුණුවිල.**

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
දිනමිණ මඟුල
මංගල යෝජනා තීරයයි...
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
classified@lakehouse.lk
රු. 560/-
පියුමි - 011 2 429 383 , රමනි - 011 2 429 347 , ගයනි - 011 2 429 342 / 343

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - අනුරාධපුර

## උපකරණ මිලට ගැනීම - 2021

අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කොට්ඨාසයට අයත් රෝහල් හා අනෙකුත් ආයතනවල භාවිතය සඳහා අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ සැපයීම වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් 2021.07.20 වන දින පෙ.ව. 11.00 දක්වා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

| අනු අංකය | ලංසු කැඳවීමේ අංකය | අයිතමය | ප්‍රමාණය | ආපසු නොගෙවන ටෙන්ඩර්පත් ගාස්තුව (රු.) | ලංසුව සමග ඉදිරිපත් කළ යුතු මහ බැංකුව පිළිගත් දින 91 ක් වලංගු ලංසු ඇපකර වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 01 | RDHS/F8/2021/ 23-PSDG | Polythene Sealer machine | 12 | 1,000.00 | 2,000.00 |
| | | Grass cutter machine | 08 | | |
| 02 | RDHS/F8/2021/ 24-PSDG | Cushion Arm chair | 90 | 1,000.00 | 17,000.00 |
| | | Mid back chairs | 25 | | |
| | | Executive Chairs | 25 | | |
| | | Plastic chairs | 350 | | |
| | | Table Office | 25 | | |
| | | Table Executive | 10 | | |
| 03 | RDHS/F8/2021/ 25-PSDG | Steel Glass cupboard | 30 | 1,000.00 | 11,000.00 |
| | | steel cupboard | 30 | | |
| 04 | RDHS/F8/2021/ 26-PSDG | Refrigerator | 06 | 1,000.00 | 5,000,00 |
| 05 | RDHS/F8/2021/ 27-PSDG | Incubator | 01 | 1,000.00 | 16,000.00 |
| 06 | RDHS/F8/2021/ 28-PSDG | Ice line refrigerator | 01 | 1,000.00 | 6,000.00 |
| 07 | RDHS/F8/2021/ 29-PSDG | Defibrillator | 01 | 1,000.00 | 10,000.00 |
| 08 | RDHS/F8/2021/ 30-PSDG | syringe pump | 03 | 1,000.00 | 13,000.00 |
| | | Infusion pump | 06 | | |
| 09 | RDHS/F8/2021/ 31-PSDG | Portable sucker machine | 01 | 1,000.00 | 2,000.00 |
| 10 | RDHS/F8/2021/ 32-PSDG | Double Phototherapy unit | 04 | 1,000.00 | 18,000.00 |
| 11 | RDHS/F8/2021/ 33-PSDG | Infrared Lamp | 01 | 1,000.00 | 3,000.00 |
| | | Spot lamp | 04 | | |
| 12 | RDHS/F8/2021/ 34-PSDG | spinal board | 02 | 1,500.00 | 10,00000 |
| | | Examination Bed | 10 | | |
| | | bed side locker | 08 | | |
| | | Bed side screen | 02 | | |
| | | X-ray Illuminator | 20 | | |
| 13 | RDHS/F8/2021/ 35-PSDG | Doppler | 30 | 1,000.00 | 18,000.00 |
| 14 | RDHS/F8/2021/ 36-PSSP | Online UPS 3KVA | 17 | 1,000.00 | 18,000.00 |
| | | Online UPS 2KVA | 17 | | |
| | | UPS 650v | 20 | | |
| 15 | RDHS/F8/2021/ 37-PSSP | White Board 6x4 | 06 | 1,000.00 | 5,000.00 |
| | | Peddle Dust Bin (301) | 20 | | |
| | | Peddle Dust Bin (501) | 20 | | |
| | | Ladders | 08 | | |
| 16 | RDHS/F8/2021/ 38-PSSP | computer Tables | 10 | 1,000.00 | 4,000.00 |
| | | computer chairs | 10 | | |
| | | wooden beds 4x6 | 08 | | |
| | | Mattress 4'x6' | 08 | | |
| | | Towel Rack | 08 | | |
| 17 | RDHS/F8/2021/ 39-PSSP | Printers | 15 | 1,000.00 | 10,000.00 |
| | | Bar code printers | 02 | | |
| | | Bar code readers | 02 | | |
| | | Portable sound system | 03 | | |
| | | Television 40" | 05 | | |
| | | Fax machine | 05 | | |
| | | Scanner machine | 03 | | |
| 18 | RDHS/F8/2021/ 40-PSSP | Multimedia projector & screen | 10 | 1,000.00 | 18,000.00 |
| | | Photo Copy Machine | 11 | | |
| 19 | RDHS/F8/2021/ 41-PSSP | Mouse | 20 | 1,000.00 | 16,000.00 |
| | | Key board | 20 | | |
| | | Lap top computer | 10 | | |
| | | Pen drive | 30 | | |
| | | Desk Top computer | 05 | | |
| 20 | RDHS/F8/2021/ 42-PSSP | AC Machine | 34 | 2,000.00 | 30,000.00 |
| 21 | RDHS/F8/2021/ 43-PSSP | Patient Trolley | 18 | 2,000.00 | 23,000.00 |
| | | Drugs trolley | 18 | | |
| | | ECG trolley | 10 | | |
| | | Electronic chemical balance | 03 | | |
| | | Lab stool | 06 | | |
| | | Wheel chairs | 05 | | |
| | | Mattress 2 1/2 * 6 with Rexine cover | 30 | | |
| | | Emergency trolley | 06 | | |
| 22 | RDHS/F8/2021/ 44-PSSP | Auto Clave | 01 | 2,000.00 | 25,000.00 |
| | | Table Top Auto Clave | 03 | | |
| 23 | RDHS/F8/2021/ 45-PSSP | Diathermy machine | 01 | 1,000.00 | 22,000.00 |
| | | ECG Machine | 10 | | |
| 24 | RDHS/F8/2021/ 46-PSSP | BP apparatus( Digital) | 30 | 1,000.00 | 4,000.00 |
| | | BP apparatus( Aneroid) | 10 | | |
| 25 | RDHS/F8/2021/ 47-PSSP | Doppler | 60 | 1,000.00 | 15,000.00 |
| 26 | RDHS/F8/2021/ 48-PSSP | Semi Automated Coagulation Analyzer | 03 | 1,000.00 | 15,000.00 |
| 27 | RDHS/F8/2021/ 49-PSSP | TENS machine | 01 | 1,000.00 | 3,500.00 |
| | | Gym ball | 01 | | |
| 28 | RDHS/F8/2021/ 50-PSSP | Fully Automated Biochemistry Analyzer | 02 | 1,000.00 | 14,000.00 |
| 29 | RDHS/F8/2021/ 51-PSSP | Water distiller | 04 | 1,000.00 | 6,000.00 |
| | | Centrifuge | 02 | | |
| 30 | RDHS/F8/2021/ 52-PSSP | 3 part Hematology analyzer | 02 | 1,000.00 | 14,000.00 |
| 31 | RDHS/F8/2021/ 53-PSSP | Binocular Microscope | 02 | 1,000.00 | 5,000.00 |
| 32 | RDHS/F8/2021/ 54-PSSP | Dental chairs | 05 | 2,000.00 | 25,000.00 |
| 33 | RDHS/F8/2021/ 55-PSSP | Dental ultrasonic scalar | 05 | 1,000.00 | 10,000.00 |
| | | Dental light cure machine | 05 | | |
| | | Hand piece- air rotor | 05 | | |
| | | Hand piẹce -contra angle | 05 | | |

02. පිළිගත් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් හිමි දේශීය නියෝජිත ආයතන මෙම ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි. මිලදී ගැනීමට බලාපොරොත්තු වන උපකරණ සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර හා පිරිවිතරයන් අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක. (දුරකථන අංක - 025-2222579)

03. ආපසු නොගෙවන ටෙන්ඩර්පත් ගාස්තුව ගෙවීමෙන් හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රසම්පාදන පත් අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් 2021.06.25 දින සිට 2021.07.19 දින දක්වා කාර්යාල වේලාවන් (පෙ.ව. 9.00 සිට ප.ව. 3.00) තුලදී ලබාගත හැකි අතර, එහිදී ගාස්තු ගෙවීමකින් තොරව අදාළ ප්‍රසම්පාදන පත් පරීක්ෂා කර බැලිය හැක.

04. ලංසු කොන්දේසි වලට අනුකූලව විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන පත් 2021.07.20 දින පෙ.ව. 11.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවීම හෝ අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීම හෝ සිදු කළ යුතුයි.

05. ලංසු පිටපත් දෙකකින් සම්පූර්ණ කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් වෙන වෙනම ලිපි කවර වල බහා එම ලිපි කවර දෙක නැවත එක් කවරයක බහාලීම කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "**ලංසු කැඳවීමේ අංකය**" වෙන් වෙන්ව සටහන් කර ඉදිරිපත් කළ යුතුය.

06. 2021.07.20 දින පෙ.ව. 11.00 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ වහාම ඒවා විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්පත්කරුවන්ට හෝ ලිඛිත අවසරයක් ලත් ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ සහභාගි විය හැක.

07. ලංසු ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බැංකුවක් මගින් පමණක් ලබාගත් බැංකු ඇපකරයක් හෝ අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අදාළ මුදල තැන්පත් කර ලබාගත් රිසිට්පතක් මගින් ඉදිරිපත් කළ යුතුයි.

08. මෙම ටෙන්ඩරය පිළිබඳව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**වෛද්‍ය එන්.සී.ඩී. ආරියරත්න**
**සභාපති / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,**
**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර.**
**දු. ක. 025-2222579**
**2021.06.21**

# ලංසු සඳහා ආරාධනය

## පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### උතුරු මැද පළාත

01. උතුරු මැද පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් මිලදී ගැනීම් සඳහා සුදුසුකම්ලත් හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමයට මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ප්‍රධාන ගණකාධිකාරී, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය. (025-2050718 / 071-2126088) වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර, ලංසු ලියවිලි පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත පැමිණ පරීක්ෂා කළ හැකිය.

03. ආපසු නොගෙවන ගාස්තු ගෙවීමෙන් අනතුරුව 2021.07.19 වන දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ලබාගත හැකිය.

| අනු අංකය | වැඩ පිළිබඳ විස්තරය හා අංකය | මූල්‍ය ප්‍රභවය | ප්‍රමාණය | ඇස්තමේන්තු ගත වැඩ පිරිවැය (රු. මි.) | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | ලංසු ලිපිලේඛන ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|---|
| 01. | Auto Clave (Vertical) 16L | PSSP | 20 | 3.2 | 32,000.00 | 1,500.00 |
| 02. | Patient Monitor | PSDG | 27 | 9.2 | 92,000.00 | 3,500.00 |
| 03. | Generator 25KVA | PSDG | 03 | 5.0 | 50,000.00 | 2,500.00 |
| 04. | Defibrillator | PSDG | 05 | 4.5 | 45,000.00 | 2,000.00 |
| 05. | Pulse Oxymeter | PSDG | 22 | 2.4 | 24,000.00 | 1,500.00 |
| 06. | ECG Machine | PSDG | 25 | 2.5 | 25,000.00 | 1,500.00 |

04. ලංසු අනුපිපටතක්ද සහිතව 2021.07.20 වන දින පෙරවරු 10.00 ට පෙර සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ආයතනයේ පවතින ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාර ගැනීම අවසන් වූ විගස මෙම අවස්ථාවට සහභාගීවී සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

05. සෑම ලංසුවක් සමග ඉහත වගුවේ සඳහන් වටිනාකමට සමාන ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද 2021.07.20 දින සිට 2021.10.19 දින තෙක් වලංගු ලංසු ඇපකරයක් "පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - උතුරු මැද පළාත" නමින් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති / පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,**
**උතුරු මැද පළාත.**

2021.06.21

# ලංසු සඳහා ආරාධනය

## ප්‍රධාන ලේකම් කාර්යාලය

### උතුරු මැද පළාත

01. උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් පහත වගුවෙහි සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීම මගින් සිදු කරනු ලැබේ. මෙම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 50 ට වඩා අඩු වන විට, ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2016/13(ii) හා 2016/13(iii) අදාළ කරගනු ලබන අතර, ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් 10% කට වඩා අඩුවන විටදී පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2020/10(i) අනුව කටයුතු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රා.ලේ.කො. | ක්‍රියාකාරකම / ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත වටිනාකම (රුපියල්) | කොන්ත්‍රාත් කාලසීමාව | CIDA ශ්‍රේණිය | ලංසු ඇපකරය (රුපියල්) | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|---|
| 01 | මැදවච්චිය | 63 පුල්එළිය තුලාන පුල්එළිය මහ වැව ප්‍රතිසංස්කරණය කිරීම | මිලියන 32.34 | මාස 06 | C-5 සහ C-4 (වාරිමාර්ග) | 485,000.00 | 8,000.00 |
| 02. | මිහින්තලේ | 580 වෙල්ලාරගම තුලාන කටුකැලියාව වැව ප්‍රතිසංස්කරණය කිරීම | මිලියන 15.24 | මාස 04 | C-6 සහ C-5 (වාරිමාර්ග) | 230,000.00 | 6,000.00 |
| 03. | ගලෙන්බිඳුනුවැව | 189 හුරළු ජය පුර තුලාන මුවපිටිගම වැව ප්‍රතිසංස්කරණය කිරීම | මිලියන 15.24 | මාස 04 | C-6 සහ C-5 (වාරිමාර්ග) | 230,000.00 | 6,000.00 |
| 04. | මැදිරිගිරිය | 120-වඩිගේ වැව තුලාන එලබටු වැව ප්‍රතිසංස්කරණය කිරීම | මිලියන 20.47 | මාස 04 | C-6 සහ C-5 (වාරිමාර්ග) | 305,000.00 | 6,000.00 |

03. කොන්ත්‍රාත් සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු අසාධු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, CIDA ලියාපදිංචිය ලංසු විවෘත කරන දින වන විට සක්‍රීය විය යුතුය.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීම සඳහා ලංසු පතෙහි 4 පරිච්ඡේදය සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අනුරාධපුරය (දු.ක. 025-2237586) වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකි අතර, කාර්යාලයේදීම ලංසු ලේඛන පරීක්ෂා කළ හැක.

06. වගුවේ සඳහන් ආපසු නොගෙවන මුදල ලංකා බැංකුවේ, පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, උතුරු මැද පළාත නමින් ඇති ගිණුම් අංක 1472633 දරන ගිණුමට බැර කළ යුතුය (මෙය COVID 19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගයකි) බැංකුව වෙත මුදල් ගෙවීම් කර ලබාගත් ප්‍රේෂණ පත්‍රය උතුරු මැද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2021.06.23 දින සිට 2021.07.14 දින දක්වා වැඩ කරන දිනවල දී පෙ.ව. 9.00 ත් ප.ව. 3.30 ත් අතර, පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත හෝ පළාත් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබාගත හැකිය.

07. සෑම ලංසුවක්ම අනු පිටපතක්ද සහිතව 2021.07.15 වන දින පෙරවරු 11.00 ට පෙර ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාර දිය හැක. ප්‍රමාද වන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ විගසම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

08. සෑම ලංසුවක්ම දින 77 ක් වලංගු විය යුතුය.

09. සෑම ලංසුවක් සමගම එක් එක් ව්‍යාපෘතියට අදාළව ඉහත වගුවේ සඳහන් වටිනාකමට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු සුරක්ෂණයක් හෝ ලංකා බැංකුවේ, පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, උතුරු මැද පළාත නමින් ඇති ගිණුම් අංක 1472633 දරන ගිණුමට මුදල් ගෙවීම් කර ලබාගත් ප්‍රේෂණ පත්‍රය 2021.07.05 දින පෙ.ව. 10.00 ට ප්‍රථම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත භාරදී ලබාගත් NC 100 කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය 2021.10.27 වන දින දක්වා වලංගු විය යුතුය.

10. මෙම ප්‍රසම්පාදන පිළිබඳව අවසාන තීරණය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති / ප්‍රධාන ලේකම්,**
**ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**4 වන මහල, උතුරු මැද පළාත් සභා සංකීර්ණය,**
**හරිශ්චන්ද්‍ර මාවත,**
**අනුරාධපුරය.**

## නම වෙනස් කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියඹලාපේ, දික්වෙල පාර, අංක 304/1 දරන ස්ථානයේ පදිංචි **හේවා කණ්ඩම්බිගේ දුලාජ් මදුසංක** වන මම 2019.12.01 දින පටන් **දොන් දුලාජ් හෙයියන්තුඩුවගේ** ලෙස මාගේ නම භාවිතා කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

දොන් දුලාජ් හෙයියන්තුඩුවගේ
2019.12.01

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම, 2021 ජූනි මස 09 වන දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම :
**සුපර් මයින්ඩ්ස් ග්ලෝබල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය :
PV **00240435**

ලියාපදිංචි කාර්යාල ලිපිනය :
**අංක 41/2, ජය කොන්ත පටුමග, කිරුළ පාර, කොළඹ 05.**

**අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්,**
**සමාගම් ලේකම්,**
**ග්‍රෙගරිස් පාර්ට්නර්ස්,**
**53/3, ග්‍රෙගරි පාර, කොළඹ 07.**



බුද්ධියට පණිවිඩයක්
ජීවිතයට නැවුම් බවක්
බුදුසරණ

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 11, හෙට්ටි වීදිය, අංක 247 දරන ස්ථානයේ පදිංචිව සිටි සහ දැනට කේ.එම්.එන්.එන්. නිවස, වෙට්ටියාර් මාවත, සෙම්බනූර්, සිවගංගා දිස්ත්‍රික්කය, තමිල්නාඩු, ඉන්දියා හි පදිංචි සාවන්නා නාච්අප්පා කුමාරප්පන් වෙට්ටියාර් (ගමන් බලපත්‍ර අංක L4149011) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අඹගහ හේවගේ දෙන් මංජුලා දමයන්ති මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 272 සහ වර්ෂ 2009 ක් වූ දෙසැම්බර් මස 21 වන දින ලියා සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව 8956 දරන දිනපොතේ 25 කාණ්ඩයේ 48 දරන පත් ඉරුවේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස, පුත්තලම, මදුරංකුලිය, පන්සල පාර, අංක 176 දරන ස්ථානයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 603393791V සිරිමැදුරලාගේ චන්ද්‍රසිරි යන අයව පත් කළෙමි. මෙකී අංක 272 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව මෙයින් දැනුම් දෙනු ලබන අතර, තවදුරටත් මෙකී විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු වලංගුභාවයක් හෝ නීතිමය ශක්‍යතාවයක් නොමැති බවටත් සියල්ලෝම මින් දැනගත යුතුය.

**රත්නායක මුදියන්සේලාගේ කුලසේන**
**සාවන්නා නාච්අප්පා කුමාරප්පන් වෙට්ටියාර් යන අයගේ ඇටෝර්නි බලකාර.**

## වාසගම වෙනස් කිරීම

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 236 බහිරවකන්ද ග්‍රාම නිලධාරි වසමේ දිසාපති නිල නිවස, බහිරවකන්ද, මහනුවර ලිපිනයේ පදිංචි **තෙන්නකෝන් මුදියන්සේලාගේ පුස්සේගෙදර ඉෂානි මධුභාෂිණී තෙන්නකෝන්** වන මම මින් ඉදිරියට **ඉෂානි මධුභාෂිණී තෙන්නකෝන්** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

**ඉෂානි මධුභාෂිණී**
**තෙන්නකෝන්**

සත වෙත සිරිසෙත සලසන සතිපත
දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි
සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත

# ප්‍රසම්පාදන දැන්වීමයි

## මහ රෝහල - කළුතර - 2021

කළුතර මහ රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් පහත සඳහන් කාර්යන් සඳහා විවෘත ලංසු කැඳවනු ලැබේ.

➢ කළුතර මහ රෝහලේ ප්‍රධාන ආපනශාලා කොන්ත්‍රාත්තුව 2021 / 2022 වර්ෂය
➢ බේරුවල, අළුත්ගම හා දර්ගා නගරය යන රෝහල් සඳහා පිසූ ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව 2021 / 2022 වර්ෂය
➢ අධිකරණ වෛද්‍ය අංශය සඳහා අවශ්‍ය Digital Imaging System උපකරණය මිලදී ගැනීම

- ලංසු ලේඛන කළුතර මහ රෝහලේ මූල්‍ය අංශයේ ප්‍රසම්පාදන ශාඛාවෙන් ලබා ගත හැකිය.
- ලංසු ලේඛන ලබා ගැනීම සඳහා පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය.

  I. ඉල්ලීම් ලිපිය
  II. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / විදේශ ගමන් බලපත්‍රය
  III. ප්‍රධාන ආපනශාලාව සඳහා ඉදිරි මාස 12 කට වලංගු රු. 4,000,000.00 (ලක්ෂ හතලිහ) ක ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන වත්කම් සහතිකයේ පිටපත

- එක් අයිතමයක් සඳහා ආපසු නොගෙවන රු. 2,500/- ක ගාස්තුවක් අය කරනු ලැබේ.
- එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතු වේ.
- අදාළ ලංසු ලේඛන 2021.06.25 සිට 2021.07.12 දින දක්වා කාර්යාල දිනයන් හි පෙ.ව. 9.00 සිට ප.ව. 02.00 දක්වා ලබාගත හැකිය.
- 2021.07.13 දින පෙ.ව. 10.30 දක්වා ලංසු භාර ගනු ලැබේ. මෙම ටෙන්ඩරය 2021.07.13 දින පෙ.ව. 10.30 ට අවසන් කරනු ලබන අතර, ඒ විගසින් ම විවෘත කරනු ලැබේ. වැඩි විස්තර සඳහා දුරකථන අංක 034-2222261/62 අමතන්න.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**මහ රෝහල - කළුතර.**

GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

# MINISTRY OF JUSTICE

## INVITATION FOR BIDS (IFB)

## Construction of Magistrate Court Complex, Walapane

1. The Chairman, MPC on behalf of the Ministry of Justice now invites sealed bids from eligible and qualified bidders for **Construction of Magistrate Court Complex at Walapane** as described below and estimated to cost **Two Hundred Eighty Eight Million (Rs. 288.00 Million) plus VAT.**

| | | Approximate Total Floor Areas (m²) | Remarks |
|---|---|---|---|
| 1 | Construction of Court Building | 2100 | Three storied court building with lift. |
| 2 | Service Building | 350 | Two storied building. |
| 3 | Vehicle Park | | For Judges & Staff |
| 4 | Internal Roads & Landscaping | | Interlocking Paving, Planting Trees etc. |
| 5 | Improvement works of existing court building | | Air conditioning/ Roof, Wall & Floor repair works/ Painting/ Installation of Windows & Doors etc. |

*The building shall be of reinforced concrete framed structure with reinforced concrete pad/strip foundation, columns, beams and staircases. The walls shall be of clay bricks. The roof shall consist of Zinc-Aluminium Tile profile sheet and roof slab. The building shall consist of glazed ceramic wall and floor tiling, plastering, painting, floor rendering, landscaping and aluminium framed/timber framed glazed windows and doors. The main services provided in the building shall be air-conditioning, water supply, passenger lift, sewerage and drainage, electrical and fire protection & detection. Site is located at existing Court Complex, Walapane. Construction Period is 730 days.*

2. Bidding will be conducted through National Competitive Bidding Procedure.
3. To be eligible for contract award, successful bidder shall not have been blacklisted and shall meet the following requirements.
   ➢ The Bidders shall be registered with the Construction Industry Development Authority (CIDA) for Grade **C2** or **C3** for Building works.
4. Qualification requirements to qualify for contract award include:
   ➢ Average annual volume of construction work performed in last five years shall be at least **Rs. 216.00 million.**
   ➢ Successful completion of a multi storey building or 70% completed ongoing projects and minimum construction cost of **Rs.200.00 Million** during last five years, as the main contractor.
   ➢ The **minimum** amount of liquid assets and/or credit facilities, after setting apart for the other contractual commitments and exclusive of any advance payments which may be made under the Contract, shall be not less than **Rs. 36.00 Million.**
5. Interested bidders may obtain further information from **Director-Engineering, No. 19, Sangaraja Mawatha, Colombo 10** and inspect the bidding documents at the address given below from **June 14th, 2021** until **July 2nd, 2021** from **09:00 hrs to 15:00 hrs.**
6. A complete set of Bidding Documents in English language may be purchased by interested bidders on submission of a written request to the **Accountant (Procurement), 3rd Floor, Ministry of Justice, Superior Courts Complex, Colombo 12** from **June 14th, 2021** until **July 2nd, 2021** from **09:00 hrs to 15:00 hrs** upon payment of a non-refundable fee of **Rs. 40,000.00.** Or complete set of Bidding Documents in English language may be downloaded from the ministry website **(www.moj.gov.lk)** upon payment of a non-refundable fee of **Rs. 40,000.00** to the Account Number **176100109026395 (People's Bank -Mid City C branch).** Pay-in slip should be attached to the original bid at the bid submission. Further, all potential bidders who download Bidding Document from the website are requested to register by filling the online registration form published in the Ministry of Justice Website.
7. Bids shall be submitted in duplicates by hand, courier or registered post to **Accountant (procurement), 3rd Floor, Account Branch, Ministry of Justice, Superior Courts Complex, Colombo 12,** at or before **11:00 hrs on July 5th, 2021.** Late bids will be rejected. **"Walapane Project - Tender Document"** should be indicated on the top left-hand corner of the envelope. Bids will be opened soon after closing in the presence of the bidders' representatives who choose to attend.
8. Bids shall be valid up to **November 1st, 2021.**
9. All bids shall be accompanied by a Bid Security of **Rupees Two Million Eight Hundred Eighty Thousand only (Rs. 2,880,000.00).** Any bid not accompanied by a valid Bid Security will be rejected. Bid Security shall be valid up to **November 29th, 2021.**
   Bid security shall be obtained in favour of Secretary, Ministry of Justice.
10. **Pre-Bid meeting** is scheduled to be held at the Conference Hall, 2nd Floor, Ministry of Justice, Superior Courts Complex, Colombo 12 at **11:00 hrs. on June 28th, 2021**
11. Potential Bidders should have fulfilled the requirement of registration under the terms of Public Contract Act No. 3 of 1987 before collecting the Bid Documents and also should register the contract after the tender is awarded.
12. Ministry of Justice will not be responsible for any cost or any expense incurred by the bidder in connection with the preparation or delivery of the bid.
13. Please note that due to current Covid 19 situation any amendment to this notice will be published in Ministry of Justice Website.
14. All decisions are reserved to the procurement committee.
15. This same advertisement has been published in e-paper (Dinamina, Daily News & Thinakaran) on 14/06/21 in three languages.

*The address referred to above is;*

**Name :** **The Chairman, Ministry Procurement Committee,**
**Procurement Division,**
**3rd Floor,**
**Ministry of Justice,**
**Superior Courts Complex,**
**Colombo 12.**

**Address: Superior Courts Complex, Colombo 12.**

**Tel : 011-2438178**

# කොළඹ මහා නගර සභාව

## ලංසු සඳහා ආරාධනයයි

කොළඹ මහානගර සභාවේ නාගරික කොමසාරිස් විසින් පහත සඳහන් කාර්යයන් සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| | ලංසු අයිතමය | ලංසු අංකය | ලංසුකරුගේ යෝග්‍යතාව | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු. ශත) |
|---|---|---|---|---|
| 01. | කොළඹ - 07, කොළඹ මහා නගර සභාවේ නීති දෙපාර්තමේන්තුව සඳහා අලුත්වැඩියාවන් හා අභ්‍යන්තර සැළසුම් | ME/LG/ BR/113/2021 | CIDA C-05 හා C-06 ශ්‍රේණි වලට අයත් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් | රු. 342,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය |
| 02. | පුංචි බොරැල්ලේ පවත්නා ගොඩනැගිල්ල යෝජිත ශිෂ්‍ය සම්පත් මධ්‍යස්ථානයක් සහ අකුපන්චර් සායනයක් බවට හැරවීම | ME/AV/ BN/104/2021 | CIDA C-05 හා C-06 ශ්‍රේණිවලට අයත් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් | රු. 240,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය. |
| 03. | කොළඹ - 08, බොරැල්ල කනත්තේ හින්දු කොටසේ යෝජිත අලුත්වැඩියාවන් හා වැඩිදියුණු කිරීම් | ME/PH/BR/16/2021 | CIDA C-05 හා C-04 ශ්‍රේණිවලට අයත් ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් | රු. 540,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය. |
| 04. | නන්දදස කෝදගොඩ මාවතේ සහ නොරිස් ඇවනියු ගුණසේකර පටුමග හා ෆ්‍රැන්සිස් පාර දක්වා වැසි ජලය කානු පුනරුත්ථාපනය | ME/ME/ DR/176/2019 | CIDA C-05 හෝ ඉහළ ශ්‍රේණිවලට අයත් වැසිජල පවාහන කොන්ත්‍රාත්කරුවන් | රු. 948,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය |
| 05. | දෙමටගොඩ ආරාමය පෙදෙස ජී. අංක 92/93 හි වැසි ජල කාණුව ප්‍රතිසංස්කරණය කිරීම | ME/ME/ DR/43/2021 | CIDA C-06 හෝ ඉහළ ශ්‍රේණිවලට අයත් වැසිජල පවාහන කොන්ත්‍රාත්කරුවන් | රු. 301,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය |
| 06. | කොළඹ - 09 සිරිධම්ම මාවත, මරික්කාර් පෙදෙසේ කාණුව අලුත්වැඩියා කිරීම | ME/USS/ DR/02/2021 | CIDA C-07 හෝ ඉහළ ශ්‍රේණිවලට අයත් වැසිජල පවාහන කොන්ත්‍රාත්කරුවන් | රු. 100,000.00 කොන්දේසි විරහිත ඒක්ෂණ ඇපකරය |

ලංසුකරන ලිපිලේඛන (මුල් පිටපත හා අනු පිටපත) දෙවිදිහකින් ලබාගත හැකිය.

**01. www.colombo.mc.gov.lk කොළඹ මහානගර සභාවේ වෙබ් අඩවියෙන් බාගත කර ගැනීම.**

i. පහත සඳහන් ක්‍රමයට ආපසු නොගෙවන රු. 5400/- ක ලංසුකරණ ලිපිලේඛන ගාස්තුව ගෙවිය හැකිය.

අ) ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මහජන බැංකුවේ නගරශාලා ශාඛාවේ අංක 167-1-001-6-3169425 දරන ගිණුමට තැන්පත් කිරීම මගින්.

ආ) කොළඹ නගර සීමාවේ පහත සඳහන් නාගරික පරිශ්‍රයන් වෙත ගෙවීම මගින්.

➢ දිස්ත්‍රික් කාර්යාලය - 04,
නො. 147, හයිලෙවල් පාර, කිරුළපොන, කොළඹ - 06.

➢ ජලාපවහන හා ජලසම්පාදන අංශය,
මාළිගාකන්ද, කොළඹ - 10.

ii. ලංසුකරණ ලිපිලේඛන සමග බැංකු තුණ්ඩුව (Slip) / ලදුපත අමුණා එවීම අනිවාර්ය වේ.

**02. නගර ශාලා පරිශ්‍රයෙන් ලබාගැනීම.**

i. ව්‍යාපාර ලිපි ශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා එක් එක් ලංසුව වෙනුවෙන් රු. 5,400/- ක් බැගින් වන ආපසු නොගෙවන ලංසුකරණ ලිපිලේඛන ගාස්තුවක් නගර ශාලා පරිශ්‍රයේ සරප් කවුන්ටරය වෙත ගෙවීමෙන් අනතුරුව 2021.07.15 දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ, ව්‍යාපෘති කළමනාකරණ අංශයේ කාර්යාලයෙන් ලංසුකරණ ලිපිලේඛන ලබාගත හැකිය.

2021.07.15 දින ප.ව. 3.00 න් පසුව ලංසුකරණ ලිපිලේඛන වෙබ් අඩවියෙන් ලබා ගැනීමට අවකාශය නොලැබෙන අතර, නිකුත් කිරීමට සිදු නොකෙරනු ඇත. සියලුම ලංසුකරුවන් ටෙන්ඩර් ලිපිලේඛන ලබාගන්නා අවස්ථාවේදී (අදාළ වේනම්) CIDA ශ්‍රේණිය සනාථ කිරීම සඳහා වලංගු ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාව සඳහා ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාර ලිපි ශීර්ෂයක ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කොට ගාස්තු ගෙවූ විට පමණක් ලංසුකරණ ලිපිලේඛන නිකුත් කෙරේ. ලංසුකරණ ලිපිලේඛන නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ අංශයේදී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

★ අතථ්‍ය (Virtual) පූර්ව-ලංසු රැස්වීම් ලංසු අංක ME/LG/BR/113/2021 සඳහා 2021.07.01 දින පෙ.ව. 10.00 ට පැවැත්වෙනු ඇත.

කොන්දේසි විරහිත ඒක්ෂණ ලංසු සුරක්ෂණය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට **දින 210 ක්** දක්වා වලංගු විය යුතුය. **ලංසු සුරක්ෂණය 2022.02.11 දින දක්වා වලංගු විය යුතුය. මිළ ගණන් 2022.01.12 දින තෙක් වලංගු විය යුතුය.**

යථා පරිදි සම්පූර්ණ කළ ලංසුකරන ලිපිලේඛන මුල්පිටපත අනුපිටපත සමග **2021.07.16 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර, කොළඹ 07, නගර ශාලාව, නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ** තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ (ලංසු පෙට්ටියේ) තැන්පත් කළ යුතුය.

ලංසු භාරගැනීම 2021.07.16 දින පෙ.ව. 10.00 ට අවසන් කෙරෙන අතර, එම අවසන් වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. ලංසු භාරගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කෙරේ. මෙම දිනය ප්‍රසිද්ධ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්වුවහොත්, ඊට පසු එන කාර්යාල දිනයේ 10.00 පැයට ලංසු භාරගැනීම අවසන් කෙරේ. ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් හට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට අවසරය ඇත.

යම් පැහැදිලිකිරීමක් (වේනම්), ලංසු අංක ME/LG/BR/113/2021, ME/AV/BN/104/2021, ME/PH/BR/16/2021 සඳහා දුරකථන අංක 011-2692403 මගින් Dir. Engineering (Projects) සහ ලංසු අංක ME/ME/DR/176/2019, ME/ME/DR/43/2021, ME/USS/DR/02/2021 සඳහා දුරකථන අංක 011-2674809 මගින් Dir. Engineering (Drainage) විමසන්න. ලංසු සඳහා විස්තරාත්මක ආරාධනය ලංසුකරණ ලිපිලේඛන සමග නිකුත් කෙරෙනු ඇත. ලංසුකරණ ලිපිලේඛනවලට අමුණා ඇති සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PCA/13278 ට යොමුවන්න.

**රෝෂනී දිසානායක - නීතිඥ,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**

# ගංවතුරට තෙල් මිශ්‍ර වීමෙන් පීඩාවට පත් 45කට වන්දි දීමට පියවර



**ක්‍රිසන්ති විතාරණ**

ගංවතුරට තෙල් මිශ්‍ර වීමෙන් පීඩාවට පත් පුද්ගලයන් 45 දෙනකුට රුපියල් 1, 933,000ක් වන්දි වශයෙන් දීමට බලශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල මහතා විසින් පත් කළ කමිටුව නිර්දේශ කර තිබේ.

පසුගියදා ඇද හැළුණු අධික වර්ෂාපතනය හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ බිම් මට්ටමේ පිහිටි ජලය මිශ්‍රිත තෙල් පවිත්‍රාගාරයකින් ගංවතුරට තෙල් මිශ්‍ර වීමෙන් පීඩාවට පත් ජනතාවට කඩිනමින් වන්දි දීමට ඇමැතිවරයා විසින් පත් කළ කමිටුවේ වාර්තාව එහි සභාපති බී. ටී. ටී. පෙරේරා මහත්මිය සහ කමිටු සාමාජික තාරක වේරගොඩ මහතා විසින් ඇමැතිවරයාට පෙරේදා (21) භාර දෙනු ලැබීය.

එම කමිටුව මාබිම, වලහේන, පට්ටිවිල ප්‍රදේශවල ගංවතුරට තෙල් මිශ්‍ර වීමෙන් නිවාස හා දේපළ, ගෙවතු වගාවන්, ජල මූලාශ්‍රවලට සිදු වූ හානිය පිළිබඳව නිරීක්ෂණය කළ අතර, මේ සිද්ධියෙන් පීඩාවට පත් පුද්ගලයන් ඔවුන්ට සිදු වූ හානි පිළිබඳ විස්තර කමිටුව වෙත ලිඛිතව යොමු කරන ලදී. එම විස්තර සවිස්තරාත්මකව සමාලෝචනය කිරීමෙන් අනතුරුව පුද්ගලයන් 45 දෙනකුට රු. 1,933,000ක් වන්දි වශයෙන් දීමට වන්දි කමිටුව නිර්දේශ කර ඇත.

# SLT-MOBITEL ආයතනයෙන් පීඩාවට පත් ජනතාවට වියළි ආහාර-පානීය ජල බෝතල්



ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාවට අත්‍යවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය සහ වතුර බෝතල් බෙදා දීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගය මත ශ්‍රී ලංකාවේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ හා ජංගම දුරකථන ජාලය වන SLT-MOBITEL ආයතනය විසින් පසුගියදා සිදු කෙරිණි.

ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුදුනෙළුම්පුර නිවාස සංකීර්ණයේ ජීවත් වන ජනතාවට මෙන්ම ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් තවත් ප්‍රදේශ කිහිපයක ජනතාවට මෙලෙස වියළි ආහාර ද්‍රව්‍ය සහ වතුර බෝතල් බෙදා දීමටකටයුතු කළේය.

මීට අමතරව කොවිඩ් හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමට 'දාන පාරමිතා' නමින් විශේෂ වැඩසටහනක් ආරම්භ කිරීමට ද කටයුතු කර ඇති අතර, 'YES' ලෙස ටයිප් කර 255 අංකයට SMS යොමු කිරීමෙන් SLT-MOBITEL පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන්ට මේ සඳහා මුදල් පරිත්‍යාග කළ හැකිය. මේ සෑම SMS පණිවිඩයකටම රුපියල් 50ක් අය කෙරෙන අතර, එලෙස එක්රැස් වන මුදලට සමාන මුදලක් පරිත්‍යාග කරමින් අරමුදල දෙගුණ කිරීමට SLT-MOBITEL කටයුතු කරයි. මේ මුදල් මෙරට විපතට පත් ජනතාවට වියළි සලාක, සෞඛ්‍ය උපාංග සහ සහන මලු බෙදා දීමට භාවිත කෙරේ.

# 'අභ්‍යන්තර ක්‍රියාවලිය සඳහා හොඳම නවෝත්පාදන' සම්මානය 'Sysco LABS' ආයතනයට

SLASSCOM 2020 ජාතික දක්ෂතා සම්මාන උළෙලේ 'අභ්‍යන්තර ක්‍රියාවලිය සඳහා හොඳම නවෝත්පාදන' අංශයේ සම්මානය දිනාගැනීමට නව තාක්ෂණය ඔස්සේ ආහාර බෙදාහැරීමේ දැවැන්තයා වන 'Sysco LABS' ආයතනයේ sysco test automation platform (SUTAP) කණ්ඩායම සමත් විය.

කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී පසුගියදා පැවති සම්මාන උළෙලේදී මේ ජයග්‍රහණයට අදාළ සම්මානය ගැනීම 'SUTAP' කණ්ඩායම වෙනුවෙන් තත්ත්ව ඉංජිනේරු ප්‍රධානී රිෆාඩ් මොහොමඩ් මහතා විසින් සිදු කළේය.

ජයග්‍රහණය හිමි කර ගත් Sysco LABS ආයතනය ලෝකයේ විශාලතම ආහාර ආයතනය වන SYSCO සංස්ථාවේ නවෝත්පාදන අංශය වන අතර, විකිණීම, අලෙවි කිරීම, අවන්හල් සඳහා ආහාර සැපයීම, සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම්, නිවාස ස්ථාපනය, නිවෙසින් පිටත ආහාර සකසන අනෙකුත් පාරිභෝගිකයන්ට නිෂ්පාදන සැපයීමේ ගෝලීය ප්‍රමුඛයා වෙයි.

ලොව පුරා බෙදාහැරීම් මධ්‍යස්ථාන 326ක් පවතින මේ ආයතනයේ 57,000කට වැඩි සේවක පිරිසක් විසින් පාරිභෝගික ස්ථාන 625,000කට අධික පිරිසකට සේවා සපයනු ලබන Sysco LABS ආයතනය ලෝකයේ දැවැන්ත කර්මාන්ත අතරට පැමිණෙමින් සිටී.

මේ ආයතනයේ ඉංජිනේරු කණ්ඩායම නවීන ක්‍රමවේද ඔස්සේ කොළඹින් පිටත ප්‍රදේශවල මෙන්ම අමෙරිකාවේ ඔස්ටින්, හූස්ටන් සහ ටෙක්සාස් ප්‍රාන්තවල ආහාර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.



සෙලින්කෝ ලයිෆ් සමූහයේ පරිත්‍යාගයක් ලෙස සිදු කළ 'High Flow Nasal Cannula' උපකරණ මඩකළපුව ශික්ෂණ රෝහලට පිරිනැමූ අයුරු.

මේ සඳහා (වමේ සිට) සෙලින්කෝ ලයිෆ් ජ්‍යෙෂ්ඨ ව්‍යාපාර සංවර්ධන කළමනාකරු කේ. සුමන්දිරන්, සහකාර කලාපීය අලෙවි කළමනාකරු එස්. පුෂ්පහරන් සහ මඩකළපුව රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය ගනේෂලිංගම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය එම්. බාර්තිලොට් මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සංචරණ සීමා ඉවත් කිරීමත් සමඟ නිරෝධායන රීති අමතක කිරීමෙන් අවදානම් තත්ත්වයක්

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

සංචරණ සීමා ඉවත් කළ පෙරේදා (21) දිනයේදී මාතලේ දිස්ත්‍රික්කයේ සෑම නගරයකම පාහේ වෙනදා මෙන් ජනතාව සිය අවශ්‍යතාව සඳහා එක්රොක්ව සිටි අයුරු පැහැදිලිව දක්නට ලැබුණි. ඇතැමුන් සෞඛ්‍ය නීතිරීති පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා කටයුතු කිරීම ද අවදානම් තත්ත්වයක් බව සෞඛ්‍ය නිලධාරීහු මෙහිදී පැවැසුහ.

එවගේම මෙදින අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිලද ශීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබූ අතර, මේ නිසා පාරිභෝගික ජනතාවට මහත් අපහසුතාවකට මුහුණපෑමට සිදු විය. ස.තො.ස. වෙළෙඳසල්වල අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රමාණවත් ලෙස නොතිබූ බැවින් පෞද්ගලික වෙළෙඳුන් සිය අභිමතය පරිදි වැඩි මිලට භාණ්ඩ අලෙවි කිරීමට පෙලඹී තිබීම මෙවැනි තත්ත්වයක් නිර්මාණය වීමට හේතුවී ඇති බව මේ අතර සිටි පාරිභෝගිකයෝ පැවැසූහ.



සංචරණ සීමා ඉවත් කළ පසු ගලේවෙල නගරයේ පැවති තත්ත්වය

මේ තත්ත්වය යටතේ නාඩු සහල් කිලෝවක් රුපියල් 115ත් රුපියල් 120ත් අතර ද, සම්බා සහල් කිලෝවක් රුපියල් 130 ඉක්මවා ඇති බව ද පවසන පාරිභෝගිකයන් එයට සමගාමීව අනෙකුත් භාණ්ඩ මිල ද ඉහළ ගොස් ඇති බව සඳහන් කරයි.

ඇතැම් උඩරට එළවළු වර්ග කිලෝවක සිල්ලර මිල රුපියල් 250ත් රුපියල් 300ත් අතර පැවති බැවින් බොහෝ පාරිභෝගිකයන් අල පරිප්පු වැනි වෙනත් විකල්ප ආහාර වර්ග භාවිත කිරීමට යොමුවී තිබීම මෙහි විශේෂත්වයක් විය.

තවද ඉන්ධන මිල ඉහළ යෑම මෙසේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යෑමට බලපා ඇති බව ද වෙළෙඳුන් පවසයි. මේ තත්ත්වය යටතේ ත්‍රීවීලර්කරුවන් ද සිය කුලී ගාස්තු සියයට විස්සකින් වැඩි කිරීමට පියවර ගෙන තිබේ.

ඡායාරූපය - මාතලේ දිස්ත්‍රික් සමූහ

# කලාපීය පොදු කරුණුවලදී සහයෝගයෙන් කටයුතු කිරීමට දෙරට එකඟතාවක

**මහින්ද අලුත්ගෙදර**

කලාපීය පොදු කාරණාවලදී සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව එකඟතාව පළ කරයි.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්වි-පාර්ශ්වික සබඳතා ඉහළ නංවා ගැනීමට මේ දක්වා දෙරට අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග ඵලදායිවී ඇති බව ශ්‍රී ලංකා විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා ඉන්දීය විදේශ ඇමැති එස්. ජයශංකර් මහතා සමඟ පැවති දුරකථන සංවාදයකදී සඳහන් කළේය.

ඉන්දියාව මෙරටට දී ඇති මූල්‍ය ආධාර සහ කොවිඩ් මර්දන සහනාධාර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කෘතඥතාව පිරිනමන බව ද ඇමැතිවරයා ඉන්දීය විදේශ ඇමැතිවරයාට දන්වා සිටියේය.

බිම්ටෙක්ස්, අයෝරා වැනි කලාපීය සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ද මේ සාකච්ඡාවේදී දෙරටේ ඇමැතිවරුන් එකඟතාව පළ කර තිබෙන අතර, විශේෂයෙන් කොළඹ ක්‍රමය වැනි පොදු කාරණාවලදී දෙපාර්ශ්වයම සහයෝගයෙන් කටයුතු කළ යුතු බව ද මෙහිදී අදහස් හුවමාරු කරගෙන ඇත.

දෙරට මුහුණදී සිටින කොවිඩ් අවදානම පිළිබඳව ඇමැතිවරුන් දෙපළ දීර්ඝව සාකච්ඡා කළ අතර, මේ වන විට ඉන්දියාව මුහුණදී ඇති තත්ත්වය කඩිනමින් යථා තත්ත්වයට පත් කර ගැනීමට සියලු ශක්තීන් ලැබේවායි ද ශ්‍රී ලංකා විදේශ ඇමැතිවරයා ඉන්දීය විදේශ ඇමැතිවරයා සමඟ සඳහන් කළේය.

පැය භාගයකට ආසන්න කාලයක් පැවති මේ සාකච්ඡාවේදී දෙරටට වැදගත් වන කරුණු කිහිපයක් ද සාකච්ඡා කළේය.

# ඉරාන නව ජනපතිට ඊශ්‍රායලයෙන් අනතුරු ඇඟවීමක්






ඉරානයේ දැඩි මතධාරී අගවිනිසුරුවරයකු වන ඉබ්‍රාහිම් රයිසිට එරට ජනාධිපතිවරණයෙන් දැවැන්ත ජයක් ලැබීමෙන් පසු ඊශ්‍රායලය ඔහුගේ පත්වීම පිළිබඳ ලොවට රතු එළියක් නිකුත් කර ඇත. ඉරානයේ දේශපාලන සිරකරුවන් සිය ගණනාවක් 1988 වසරේදී සමූහ වශයෙන් එල්ලා මරා දැමීමේ සිදුවීමට සම්බන්ධව සිටි බැවින් රයිසිට මෙවර ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීම අන්තර්ජාතික වශයෙන් දැඩි මතවාදයට තුඩු දුන්නේය. ඉරානයේ මෙතෙක් ජනාධිපති තනතුරට පත් වූ වඩාත්ම අන්තවාදී පුද්ගලයා රයිසි බවට ඊශ්‍රායලයේ විදේශ ඇමැති ලියෝර් හයියට් ප්‍රකාශ කර තිබේ. ඔහු ඉරානයේ න්‍යෂ්ටික අවි නිෂ්පාදනය වැඩි කරනු ඇතැයි කී ඊශ්‍රායල විදේශ ඇමැති ඔහුගේ පත්වීම බරපතළ ලෙස අවධානය යොමු කළ යුතු කරුණක් බවත් කියා සිටී.

එමෙන්ම ඉරාන ජනතාව අතරද නව ජනපතිවරයා දැඩි විවේචනයට ලක්වී තිබිණි. ඉස්ලාම් ආගමික නායකයකු ද වන ඉබ්‍රාහිම් රයිසි ඉරානයේ ජනාධිපතිවරයා ලෙස තේරී පත්වී ඇත්තේ ඡන්ද 62% කට ආසන්න ප්‍රතිශතයකි.

කෙසේ වුවත් මෙවර ඉරාන ජනාධිපතිවරණය ඉතිහාසයේ අඩුම ඡන්ද සංඛ්‍යාවක් වාර්තා කළ ජනාධිපතිවරණය බවට පත්වී ඇත. ජනාධිපතිවරණය වර්ජනය කිරීමට එරට අතිවිශාල ජනකායක් කටයුතු කර තිබූ බවත්, මිලියන 59ක් වන සමස්ත ඡන්දදායකයන්ගෙන් ඡන්දය භාවිත කර ඇත්තේ මිලියන 28.9ක් පමණක් බවත් විදෙස් පුවත් සඳහන් කළේය. එම ඡන්ද සංඛ්‍යාව අතරින් ද මිලියන 3.7ක ජනතාවක් තම ඡන්දය ශුන්‍ය කිරීමට කටයුතු කර තිබිණි. අපේක්ෂකයන් සිව්දෙනකු ඉදිරිපත් වූ මෙවර ඉරාන ජනාධිපතිවරණයේ භාවිත කර තිබූ සමස්ත ඡන්ද සංඛ්‍යාවෙන් මිලියන 17.9ක් රයිසිට හිමි වූ අතර, හිටපු හමුදා නායකයකු වූ මොහ්සෙන් රෙසායි ලැබූ ඡන්ද සංඛ්‍යාව මිලියන 3.4කි. හිටපු ජනාධිපති හසන් රුහානිගේ සමීපතමයකු වූ එරට මහ බැංකුවේ හිටපු සභාපති අබ්දුල් නසීර්ට ඡන්ද මිලියන 2.4ක් ලැබී තිබූ අතර, ඉතිරි අපේක්ෂකයා වූ අමීර් හොසේන්ට හිමි වූ ඡන්ද සංඛ්‍යාව මිලියනයකට වඩා අඩු විය.

# ග්වාඩර් මුහුදු තීරයේදී ධීවරයන් උද්ඝෝෂණයක



පාකිස්තානයේ ග්වාඩර් මුහුදු තීරයේ ධීවරයන්ගේ ආදායම් මාර්ග රැක ගැනීම සඳහා චීන ට්‍රෝලර් යාත්‍රාවලට දී ඇති ධීවර බලපත්‍ර අවලංගු කරන ලෙස ඉල්ලමින් බලුකිස්තානයේ ධීවරයන් විශාල පිරිසක් සහ දේශපාලන හා සමාජ ක්‍රියාකරුවන් රැසක් උද්ඝෝෂණයක නිරත වූ බව විදෙස් පුවත් වාර්තා කළේය.

ධීවරයන් ඇතුළු පිරිසක් ග්වාඩර් පළාතේ මාධ්‍යවේදීන්ගේ (ප්‍රෙස් ක්ලබ්) සමාජශාලාව ඉදිරිපිට එක්රොක් වී ඉම්රාන් ඛාන්ගේ රජයට එරෙහිව උද්ඝෝෂණයක නිරත වී ඇති අතර, පාකිස්තාන ජාතික පක්ෂය සහ බලුකිස්තාන ශිෂ්‍ය සංවිධානය එක්ව එම උද්ඝෝෂණය සංවිධාන කර තිබිණි. සින්ද් ප්‍රාන්තයේ ධීවරයන් දැනටමත් තම මුහුදු සීමාව උල්ලංඝනය කරමින් ධීවර කටයුතුවල නිරතව සිටීමේ ගැටලුවට මුහුණ පාමින් සිටියදී විදෙස් ට්‍රෝලර් යාත්‍රාවලටත් ධීවර කටයුතු සඳහා බලපත් දීමෙන් තමන් දැඩි පීඩාවට පත්වී සිටින බව ග්වාඩර් පළාතේ ධීවරයෝ කියති.

# හිල්ටන් හෝටලය ඉදි කිරීමට විරෝධය

චීනයේ ෂින්ජියෑං පළාතේ මුස්ලිම් දේවස්ථානයක් ඩෝසර් කරමින් හිස් කළ භූමියේ ඉදි කිරීමට සැලසුම් කර ඇති හෝටල් ව්‍යාපෘතිය වහා ඉවත් කරගන්නා ලෙස අමෙරිකාවේ විශාලතම මුස්ලිම් මානව හිමිකම් සංවිධානය වර්ජිනියා ප්‍රාන්තයේ පිහිටා ඇති හිල්ටන් හෝටල් සමූහ ව්‍යාපාරයේ මූලස්ථානයෙන් ඉල්ලා සිටී.

අමෙරිකාව කේන්ද්‍ර කරගත් 'අමෙරිකන් - ඉස්ලාමික් රිලේෂන්ස්' නමින් හඳුන්වනු ලබන මේ මානව හිමිකම් සංවිධානය සඳහන් කරන්නේ අතිසුඛෝපභෝගී හිල්ටන් හෝටලයක් සහිත වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට සැලසුම් කර ඇති චීනයේ පිහිටි එම භූමිය මුස්ලිම් දේවස්ථානයක් ඩෝසර් කරමින් හිස් කළ ස්ථානයක් බවය.

උයිගර් මුස්ලිම් ජනතාවට චීන රජයෙන් සිදුවන අගතිය පිටු දැකීමටත්, එමගින් සෙසු ප්‍රමුඛ පෙළේ ව්‍යාපාර සමාගම්වලට ආදර්ශයක් සැපයීමටත් හිල්ටන් සමූහ ව්‍යාපාරයට කදිම අවස්ථාවක් ලැබී ඇති බව එම මානව හිමිකම් සංවිධානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එඩ්වර්ඩ් අහමඩ් මිචෙල් සඳහන් කර ඇත. එබැවින් නිවැරදි තීරණය ගෙන එම හෝටල් ව්‍යාපෘතියෙන් ඉවත්වන ලෙස එම සංවිධානය හිල්ටන් හෝටල් සමූහයෙන් ඉල්ලා සිටී.




# චීනයේ වයස්ගත පුද්ගලයන් වැඩි වෙයි

කොවිඩ් වසංගතය සහ මේ වසරේ චීනයේ ජාතික සංගණනය මඟින් එරට ක්‍රමයෙන් වයස්ගත වෙමින් සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව අනාවරණය වී ඇතැයි 'වොෂින්ටන් ටයිම්ස්' පුවත්පත වාර්තා කළේය. එරට ජනගහණයෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් සීඝ්‍ර ලෙස මහලු බවට පත්වෙමින් තිබෙන බව පමණක් නොව සෞඛ්‍ය ආරක්ෂාව සහ වෛද්‍ය යටිතල පහසුකම්වල ද අඩුලුහුඬුකම් පෙන්නුම් කෙරෙන බව ද එහි සඳහන් වී ඇත.

මෑතකදී චීනයේ කළ ජනසංගණයකින් එරට සමස්ත ජනගහණයෙන් මිලියන 190.64ක් (සියයට 13.5ක්) අවුරුදු 65 හෝ ඊට වැඩි පුද්ගලයන් වන අතර, එය 2010 දී පැවැති සියයට 8.9ක ප්‍රතිශතයට වඩා සැලකිය යුතු වර්ධනයක් බව වාර්තා වේ. එමෙන්ම එරට අවුරුදු 60 හෝ ඊට වඩා අඩු වයසේ පුද්ගලයන් මිලියන 264.02ක ප්‍රමාණයක් (සියයට 18.7ක් නියෝජනය කරමින් ) වාර්තා වන අතර, එය මීට දශකයකට පෙර පැවැතියේ සියයට 13. 26ක ප්‍රතිශතයක බවත් එම පුවත්පත පෙන්වා දී තිබේ. ඒ අනුව චීනයේ සාමාන්‍යය වයස් මට්ටම අවුරුදු 38.8ක් බවත් එහි වැඩි දුරටත් සඳහන් වෙයි.

# අංක 84

## ප්‍රොබේට් නිලධරයා විසින් පළ කළ යුතු දැන්වීම

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 529 (2) වන වගන්තිය යටතේ දැන්වීම

මේ උපලේඛනයේ විස්තර කර ඇති මියගිය තැනැත්තන්ගේ බූදලය සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රය ඔප්පු කිරීමට / ප්‍රොබේට් බලපත්‍රය / අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය / උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීම සඳහා පහත දැක්වෙන ඉල්ලුම් ඉදිරිපත් කර ඇති බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කළේ යයි ප්‍රකාශ කරන්නා වූ ආඥාවක් සිදු කිරීමට හෝ අන්තිම කැමති පත්‍රයක් අමුණා හෝ එසේ නොමැතිව ප්‍රොබේට් බලපත්‍ර හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර ප්‍රදානය කිරීමට හෝ පෙත්සමේ නම් කර ඇති තැනැත්තාට උරුමය පිළිබඳ සහතික නිකුත් කිරීමට විරෝධතා ඇති යම් තැනැත්තෙකු විසින් එම විරෝධතා ලිඛිතව දිවුරුම් පෙත්සමක් මගින් සනාථ කර පහත දැක්වෙන අදාළ දිසා අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක දී හෝ ඊට පෙර ගොනුකරනු ලැබිය යුතුය.

**උපලේඛනය**

### කඩුවෙල දිසා අධිකරණය

**විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2021.07 මස 20 වන දින**

**උප ලේඛනය**

| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
|---|---|---|---|
| දිසා අධිකරණයේ ලියා පදිංචි කිරීමේ අංකය | මිය ගිය තැනැත්තාගේ නම හා ලිපිනය | මිය ගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය |
| 773/T | උක්වත්ත ආරච්චිගේ ප්‍රේමරත්න අංක 4/392, දුටුගැමුණු මාවත, තලංගම උතුර, බත්තරමුල්ල. | නැත | උක්වත්ත ආරච්චිගේ සඳුන් චින්තක උක්වත්ත අංක 4/392, දුටුගැමුණු මාවත, තලංගම උතුර, බත්තරමුල්ල. |
| 764/T | දෙන් ප්‍රෙඩි ස්ටැන්ලි කොළඹගේ නොහොත් දෙන් ප්‍රෙඩි ස්ටැන්ලි කොළඹගේ අංක 329/01, කඩුවෙල පාර, බත්තරමුල්ල. | නැත | දෙන් සුදේශ් ප්‍රියංකර කොළඹගේ, අංක 25/06, සිරිගල් මාවත, කොහුවල, නුගේගොඩ. |
| 733/බූදල් | විල්ආරච්චිගේ නන්දසිරි, අංක 126/1 ඒ, පහළ බෝමිරිය, කඩුවෙල. | නැත | දෙව්පුර ආරච්චිගේ පද්මලතා අංක 126/1 ඒ, පහළ බෝමිරිය, කඩුවෙල. |

දිනය: 2021.04.29 — ප්‍රොබේට් නිලධාරී – කඩුවෙල දිසා අධිකරණයේදීය.

### බණ්ඩාරවෙල දිසා අධිකරණය

**විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2021-07-20 දින**

**උපලේඛනය**

| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
|---|---|---|---|
| දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය | මියගිය තැනැත්තාගේ නම සහ ලිපිනය | මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද යන වග | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය |
| T/137 | පියසේන දේවසුරේන්ද්‍ර | නැත | ලන්දෙ බඩල්ගේ පියසීලී අංක 33 (129), 05 වන හරස් පටුමග, අඹතැන්න වත්ත, බණ්ඩාරවෙල. |

දිනය : 2021-04-30 — ප්‍රොබේට් නිලධාරී – බණ්ඩාරවෙල දිසා අධිකරණයේ දීය.

### කඩුවෙල දිසා අධිකරණය

**විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2021 ක්වූ 07 මස 22 වන දින**

**උපලේඛනය**

| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
|---|---|---|---|
| දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය | මියගිය තැනැත්තාගේ නම හා ලිපිනය | මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය |
| 684/T/2020 | රංජිත් ප්‍රියන්ත කැරගල අංක 1044/1, පොතුඅරාව පාර, තලංගම උතුර, මාලබේ. | නැත | අයෝමා වසන්ති ගමගේ අංක 1044/1, පොතුඅරාව පාර, තලංගම උතුර, මාලබේ. |
| 736/T/2021 | කෝට්ටෙගේ රංජනී පෙරේරා අංක 788, 3 වන පටුමග, මුවන්හෙලවත්ත, තලංගම උතුර, මාලබේ. | නැත | වසන්ත පණ්ඩිත ගුණවර්ධන අංක 788, 3 වන පටුමග, මුවන්හෙලවත්ත, තලංගම උතුර, මාලබේ. |
| 739/T/2021 | කුරුප්පු ආරච්චිගේ අජිත් රවීන්ද්‍ර පෙරේරා 407, තෝමිස් වේරගල මාවත, හෝකන්දර. | ඇත | සරත් අබේනායක 448H, මහරගම පාර, හෝකන්දර උතුර, හෝකන්දර. |
| 742/T | ගමගෙදර රත්බණ්ඩා අංක 25/5, මල්වත්ත, හෝකන්දර දකුණ, හෝකන්දර. | අන්තිම කැමති පත්‍රයක් නැත | පින්නදූව හේවා පද්මිකා චිරාති ද සිල්වා අංක 25/5, මල්වත්ත, හෝකන්දර දකුණ, හෝකන්දර. |
| 743/T | ඇල්ලගේ හර්බට් ජයරත්න අංක 132/E, කහන්තොට පාර, මාලබේ. | නැත | මුදියන්සේලාගේ සේපාලි කුමාරි මැණිකේ සමරකෝන් අංක 132/E, කහන්තොට පාර, මාලබේ. |
| 751/T | මොනිකා කස්තුරි ආරච්චි අංක E/350, පස්වන පටුමග, ඉසුරුපුර, මාලබේ. | නැත | ලියදුපිටිය විජේසිංහ කෝරාලලාගේ දෙන් ජෝන් ක්‍රිස්ට් අංක E/350, පස්වන පටුමග, ඉසුරුපුර, මාලබේ. |
| 753/T/2021 | දසනායක කුසුම් සුචිනීතා කොස්තා හෙවත් සුචිනීතා කුසුම් කොස්තා දසනායක අංක 15/23, තුන්වන පටුමග, කොස්වත්ත පාර, නාවල. | ඇත | මනීෂා ශමිස්ත්‍රා පෙරේරා විජේගුණවර්ධන අංක 50/7බී, බංගලාවත්ත පාර, හේවාගම, කඩුවෙල. |
| 5147/21/T | ගාල්ලගේ දෝන නිමල් චන්ද්‍රලතා නො 63/E, කටුවාවල, බොරලැස්ගමුව. | නැත | ගල්පොත්තගේ දුමිඳු නිශාන් චතුරංග පෙරේරා 63/E, කොළඹ පාර, කටුවාවල, බොරලැස්ගමුව. |

දිනය: 2021.06.10

ප්‍රොබේට් නිලධාරී – ගල්කිස්ස දිසා අධිකරණයේදීය.

### නුගේගොඩ දිසා අධිකරණය
**විරෝධතා ගොනු කිරීමේ අවසාන දිනය 2021 ක් වූ 08 මස 27 වන දින**

උපලේඛනය

| I තීරය | II තීරය | III තීරය | IV තීරය |
|---|---|---|---|
| දිසා අධිකරණයේ ලියාපදිංචි කිරීමේ අංකය | මියගිය තැනැත්තාගේ නම සහ ලිපිනය | මියගිය තැනැත්තා විසින් අන්තිම කැමති පත්‍රයක් තබා ඇත්ද යන වග | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය |
| T/1411/21 | ඇල්බැර්තුලාගේ මැක්ඩොනල්ඩ් පැට්‍රික් ප්‍රනාන්දු නොහොත් ඇල්බාර්තුලාගේ මැක්ඩොනල්ඩ් පැට්ට්‍රික් ප්‍රනාන්දු නොහොත් මැක්ඩොනල්ඩ් පැට්ට්‍රික් ප්‍රනාන්දු අංක 91/5, ලංකා ලයිට් පාර, කොරලවැල්ල, මොරටුව. | නැත | මහයලාගේ මොරින් සීබල් සිල්වා නොහොත් මොරින් සීබල් අංක. 74/27, ජය පාර, උඩහමුල්ල, නුගේගොඩ. |
| T1319/2020 | විජේසේකර පතිරානගේ ශමිලා එරන්දි අංක. 655/10/2, ගිල්බට් එදිරිසිංහ මාවත, ඇරැව්වල, පන්නිපිටිය. | නැත | පන්නිල ආරච්චිගේ දේන සුමනාවතී අංක. 665/10/2, ගිල්බට් එදිරිසිංහ මාවත, ඇරැව්වල, පන්නිපිටිය. |

දිනය : 2021-06-07

ප්‍රොබේට් නිලධාරී – නුගේගොඩ දිසා අධිකරණයේ දීය.

# ප්‍රසම්පාදන දැන්වීම

## ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කර්මාන්තය සඳහා ලංසුපත් කැඳවනු ලැබේ.

| අංකය | කර්මාන්තය | CIDA අවම ලියාපදිංචිය | ආපසු නොගෙවන තැන්පත් මුදල (රු.) | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු. මිලියන) | මුළු පිරිවැය ඇස්තමේන්තු වටිනාකම (රු. මිලියන) | කාලය (දින) |
|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නව ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර - II | C 4 හෝ ඊට වැඩි | 25,000.00 | රජය පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. මි. 1.7 ක් වටිනා ලංසු සුරක්ෂණය | 143.99 | 350 |

01. සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, ලංසුපත් 2021-06-23 දින සිට 2021-07-13 දක්වා සතියේ වැඩ කරනු ලබන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ 2021-07-14 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ආයතන අංශයෙන් ලබාගත හැකිය. ලංසුපත් ලබා ගැනීම සඳහා ලංසුකරුගේ CIDA ලියාපදිංචි සුදුසුකම් තහවුරු කළ යුතුය.
02. 2021-06-23 දින සිට 2021-07-14 දින ප.ව. 2.00 දක්වා ලංසුපත් භාරගනු ලබන අතර, ලංසුපත් භාර ගැනීම අවසන් වූ වහාම මෙම කාර්යාලයේදී ලංසුපත් විවෘත කරනු ලැබේ. ඒ සඳහා ලංසුකරුට හෝ ඔහු වෙනුවෙන් ලිඛිත බලය පවරනු ලබන නියෝජිතයෙකුට සහභාගී විය හැක.
03. ලංසු සම්බන්ධයෙන් වැඩි විස්තර සතියේ වැඩ කරන දිනවල සාමාන්‍ය කාර්යාල වේලාවේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ආයතන අංශයට පැමිණ හෝ 047-2256285 දුරකථනය මගින් ලබාගත හැකිය.

**එච්.පී. සුමණසේකර**
**ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් / දිසාපති,**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.**
**දිනය : 2021-06-19**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

**(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සභාපති, ප්‍රසම්පාදන කමිටුව විසින් පහත උප ලේඛනයෙහි විස්තර සඳහන් ලං.ජ.කා.අ. ආයතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | ව්‍යාපෘතියේ නම | අවම ලියාපදිංචිය | ඉල්ලුම්පත්‍ර ගාස්තුව | තැන්පතුව |
|---|---|---|---|---|
| CGTTI/TB/01/02/CVL/2021 | Roof repair work at Auto Electrical Section | C8 and C7 | Rs. 1,000.00 | 60,000.00 |
| CGTTI/TB/01/03/CVL/2021 | Roof repair work at Auto Mobile Section | C8 and C7 | Rs. 1,000.00 | 60,000.00 |
| CGTTI/TB/01/04/CVL/2021 | Roof repair work at Basic A Section | C8 and C7 | Rs. 1,000.00 | 60,000.00 |
| CGTTI/TB/01/05/CVL/2021 | Roof repair work at Welding Section | C8 and C7 | Rs. 1,000.00 | 60,000.00 |

ලංසුපත් 2021 ජූනි මස 23 වන දින සිට 2021 ජූලි 13 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ආපසු නොගෙවන රු. 1,000.00 ගාස්තුවක් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය නමින් ලංකා බැංකුව, මොරටුව ශාඛාවේ ඇති 681490 ගිණුමට තැන්පත් කර ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ගිණුම් අංශයෙන් ලබාගත හැක. (විද්‍යුත් තැපැල ලිපිනය ඉදිරිපත් කර ද ලබාගත හැකිය.)

2021 ජූලි 14 වන දින ප.ව. 2.00 දක්වා සම්පූර්ණ කරන ලද ලංසුපත් භාරගනු ලබන අතර, එදිනම ප.ව. 2.00 ට ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේදී විවෘත කරනු ලැබේ. අසම්පූර්ණ හා ප්‍රමාද වී ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසුපත් ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ලං.ජ.කා.අ. ආයතනය, නො. 582, ගාලු පාර, ගල්කිස්ස යන ලිපිනයට එවිය හැකිය. නැතහොත් පැමිණ භාර දෙන ලංසුපත් ආරක්ෂක කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අදාළ වැඩ විෂය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති.**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,**
**582, ගාලු පාර, ගල්කිස්ස.**

**දු.අ. 011-2605625 / 011-2605535.**

2021 ජූනි 23 බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
පාර භූමියේ හරිතාතන්ද්‍රය
සැලසුම
2021 ජූනි 23 බදාදා



රස...

ඡායාරූපය - කෞෂ් දිසානායක

# ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීයෝ


අලි මානාවා



ගැට කිඹුලා


අලියා


දාර කැස්බෑවා


දිවියා




වලහා

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014දී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීහු සත් දෙනා නම් කරනු ලැබීය. මේ නම් කිරීමේදී ඔවුන්ගේ විශේෂ ශරීර ලක්ෂණ, අනුවර්තන මෙන්ම හැසිරීම් රටා ද වෙනත් සත්ත්ව විශේෂ අතර ඔවුන්ට ලැබී ඇති ආකර්ෂණය ද සැලකිල්ලට ගැනිණි.

මෙලෙස ප්‍රමුඛ වනජීවීන් නම් කිරීම ඒ සත්ත්ව විශේෂවල ආරක්ෂාව සහ සංරක්ෂණය උදෙසා වැදගත් වන අතරම සංචාරක ව්‍යාපාරයට ද යහපත් බලපෑමක් ගෙන දෙයි.

මෙකී වනජීවීන් සත්දෙනාට ගොඩබිම සහ සාගරවාසීන් ඇතුළත් වන අතර ලොව පුරා වෙසෙන විශාලතම ක්ෂීරපායි සත්ත්ව විශේෂය මෙන්ම සාගරයෙහි වෙසෙන විශාලතම සත්ත්ව විශේෂය ද වන නිල් තල්මසා සහ ගොඩබිම වෙසෙන විශාලතම සත්ත්ව විශේෂය වන අලියා ද ඇතුළත් වෙයි. තව ද මේ වනජීවී විශේෂ හත රුහුණු ජාතික වනෝද්‍යානය සහ කුමන ජාතික වනෝද්‍යානය (යාල නැගෙනහිර) ගොඩබිම සහ සාගරයෙහි වාසය කිරීම ද විශේෂත්වයකි.

ශ්‍රී ලංකා වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත මඟින් මේ වනජීවී විශේෂ හත ආරක්ෂිත හෝ දැඩි ආරක්ෂිත



ලෙස නම් කර ඇති අතර, ලෝක සංරක්ෂණ සංගමය (IUCN) රතු දත්ත නාමාවලියෙහි වඳ වී යෑමේ තර්ජනයට ආසන්න (Critically Endangered) සත්ත්ව විශේෂ හෝ අන්තරායට ලක් වූ (Endangered) සත්ත්ව විශේෂ ලෙස ද, වඳ වී යෑමට ආසන්න (Near Threatened) හෝ අන්තරායට භාජනය විය හැකි (Vulnerable) ලැයිස්තුවලට ඇතුළත් වී ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වනජීවීහු සත්දෙන (Top Seven Wild Species of Sri Lanka) මෙසේ වෙති:

**01. ආසියානු අලියා** - Asian Elephant - *Elephas maximus maximus*

**02. දිවියා** - Leopard - *panthera pardus kotiya*

**03. වලහා** - Sloth bear - *Melursus ursinus*

**04. අලි මානාවා** - Black neeked stork - *Ephippiorhynchus asiaticus*

**05. ගැට කිඹුලා** - Saltwater Crocodile - *Crocodylus prosus*

**06. දාර කැස්බෑවා** - Leatherback sea Turtle - *Dermochelys coriacea*

**07. නිල් තල්මසා** - Blue Whale - *Balaenoptera musculus*

වර්ෂ 2016 ජනවාරි මස 26 වන දින ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය මඟින් නිකුත් කරන ලද Top Seven Wild Sri Lanka මුද්දර පෙළ මඟින් මෙම වනජීවී විශේෂ හත නිරූපණය කර ඇත.

## ආසියානු අලියා

දිවයිනෙහි බොහෝ ප්‍රදේශවල වන අලින්ගේ ජීවිතවලට හානි සිදු වීම පිළිබඳ වාර්තා වේ. ස්වාභාවික වනාන්තර, ලඳු කැලෑ ප්‍රදේශ විනාශ කිරීම, අලිමංකඩවල් විනාශ කිරීම, වගා භූමි ඇතුළු මිනිස් ක්‍රියාකාරකම් නිසා වන අලීන්ගේ ජීවිතවලට එල්ල වන තර්ජන මෑත කාලයේ සිට ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත.

## දිවියා

වඳ වී යෑමේ තර්ජනයට ලක්ව ඇති දිවියන් ශ්‍රී ලංකාවේ වෙසෙන බළල් පවුලේ විශාලතම සාමාජිකයායි.

කඳුකර ප්‍රදේශවල වෙසෙන දිවියන් මරණයට පත් වීම මෑතක සිට ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත.

## වලහා

බොහෝ විට වියළි කලාපීය වනාන්තරවල වෙසෙන වලසා සර්ව භක්ෂකයෙකි. වන ගහනය අඩු වීම නිසා මොවුන්ගේ වාසස්ථාන අඩු වෙමින් පවතී.

## අලි මානාවා

මෙරට වෙසෙන උසම පක්ෂියා වන අලි මානාවා අඩි 5ක් පමණ උස ඉතා ස්වල්ප ගහනයක් ඇති ජලජ පක්ෂියෙකි.

## ගැට කිඹුලා

දිවයිනෙන් හමු වන කිඹුල් විශේෂ දෙකෙන් විශාලම කිඹුල් විශේෂයයි. පිරිමි සතකු මීටර 4.3 - 5.2ක් දිගු වන අතර, ගැහැනු සතකු මීටර 2.3 - 3.5ක් පමණ දිගුය.

## දාර කැස්බෑවා

ලොව වෙසෙන විශාලම කැස්බෑ විශේෂයයි.


මීටර් 2ක් පමණ දිගුය. වැඩුණු සතකුගේ බර කි.ග්‍රෑ. 500ක් පමණ වෙයි.

## නිල් තල්මසා

මිහිතලය මත වෙසෙන විශාලම ක්ෂීරපායි සත්ත්වයායි. මීටර් 30ක් පමණ දිගුය.

කල්යාන් කාරියවසම්


නිල් තල්මසා











# හිම අරතෝ – සිරීපාදේ මං සලකුණු – නොදන්න දේ



ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට පමණක් දෙවැනි වූ ශ්‍රී පාදස්ථානය නොහොත් 'ශ්‍රීපාදය' ලොව පුරා බෞද්ධයන්ගේ මෙන්ම අනෙකුත් ආගම්වල ජනතාවගේ ද ඉමහත් ගෞරවයට ලක් වන සිද්ධස්ථානයකි. බුදුන් වහන්සේගේ තෙවැනි ලංකාගමනයේදී සුමන සමන් දිව්‍ය රාජයාගේ ආරාධනයෙන් සමනොළ කඳු මුදුනේ උන් වහන්සේගේ වම් සිරිපතුල් ලාංඡනය පිහිටු වූ බව කවුරුත් දන්නා පිළිගන්නා කරුණ වේ. රත්නපුර දිස්ත්‍රික්කයටත් නුවරඑළිය දිස්ත්‍රික්කයටත් මායිම්ව පිහිටා ඇති සමනොළ කඳු මුදුන ශ්‍රී ලංකාවේ තෙවැනියට උසම කන්දය.

ශ්‍රී පාදස්ථානය වන්දනා කිරීම හඳුන්වන්නේ 'කරුණා කිරීම' ලෙසය. සෑම වසරකම දෙසැම්බර් මාසයේ උඳුවප් පොහොයෙන් සිරිපා කරුණා වාරය ආරම්භ වේ. එය මැයි මාසයේ වෙසක් පොහොයෙන් අවසන් වන්නේ උඩ මළුවේ සමන් දේවාලයේ ඇති සමන් දේව පිළිමය පලාබද්දල රාජ මහා විහාරයට ගෙන ඒමෙන්ය. ඉන් පසු යළි උඳුවප් පොහොය දක්වා කාලය 'අවාරය' ලෙස හඳුන්වයි. සිරිපා වාරයේදී සෞම්‍ය දේශගුණයක් මෙහි ඇතත් අවාරයේදී අධික වැසි සහිත කාලගුණික තත්ත්වයක් පවතී. එම කාලය සිරිපා වන්දනාව දෙවියන් උදෙසා වෙන් කර ඇති බව බෞද්ධයන්ගේ පිළිගැනීමය. වාරයේදී මෙහි මාර්ගවල ඇති කඩ සාප්පු සියල්ල අවාරයේදී වැසී යයි. විදුලි සැපයුම ද නවතා තබයි. උඩ මළුව ද ඉබි යතුරු දමා වසා දමයි.

සමනොළ කන්ද පිහිටා ඇත්තේ සමනොළ රක්ෂිතය මැද්දේය. ශ්‍රී ලංකාවේ පිරිසුදුම වන රක්ෂිතය වන්නේ ද සමනොළ රක්ෂිතයය. ශ්‍රී ලංකාවේ සියලු දිශාවන්ට ජලය සපයන ජල මූලාශ්‍රයවල ආරම්භය මේ සමනොළ රක්ෂිතයයි. මෙය ඉතා සංවේදී පරිසර පද්ධතියකි. කළු ගඟ, කැලණි ගඟ යන ප්‍රධාන ගංගා ඇතුළු ගංගා විශාල ප්‍රමාණයක උපත සිදු වන්නේ සිරිපා රක්ෂිතයෙනි. ශ්‍රී ලංකාවට ආවේණික ශාක වර්ග, සතුන් වර්ග රාශියක් මේ බිම තම නිවහන කරගෙන සිටිති. සමනොළ කන්ද මෙන්ම සමනොළ රක්ෂිතය ද භාරව සිටින්නේ සුමන සමන් දෙවියන්ය.

සමනොළ කන්ද ඇතුළු මේ පරිසර පද්ධතිය ඉතා හාස්කම් ඇති බව බොහෝ දෙනා විස්වාස කරති. එය කෙසේ වෙතත් කඳු මුදුනේ ඇති කුඩා ඉඩකඩ ලක්ෂ ගණනින් වන්දනාකරුවන් පැමිණිය ද කිසිම තදබදයක් ඇති නොවීම නම් පුදුම කරුණකි.

සිරිපා වන්දනාව තුළ වෙනම සංස්කෘතියක් පවතී. පළමුවෙන්ම වන්දනා කරන කුඩා දරුවෝ 'කිරි කෝඩුකාරයෝ' ය. පළමුව වන්දනා කරන වැඩිහිටියෝ 'දඬුකෝඩු' ය. ඉහළ නැඟීම සහ පහළට බැසීම 'කරුණා කිරීම' ලෙස හඳුන්වයි. කරුණා කිරීමට පෙර සීතගඟුලෙන් පිරිසුදු වීම සිරිතය. පිරිසක් කරුණා කරයි නම් එය නඩයකි. එහි ප්‍රධානියා 'නඩේගුරා' ය. කරුණා කරන විට තුන් සරණේ කවි කීමත් හමු වන අයට කවියෙන් සෙත් පැතීමත් සිදු කරති.

*"ඉහළ නගින මේ නඩේට, බුද්ධං සරණේ සරණයි,*

*පහළට යන මේ නඩේට, සුමන සමන් දෙවි පිහිටයි"*

සිරිපා කරුණා කිරීමට ප්‍රධාන මාර්ග 6ක් ඇත. අවසානයේ මාර්ගයන් එක් වී ප්‍රධාන මාර්ග දෙකක් ලෙස උඩ මළුවට පැමිණේ.

## හැටන්-නල්ලතන්නිය මාර්ගය

හැටන් නගරයට දුම්රියෙන් හෝ බස් රථවලින් පැමිණ නල්ලතන්නිය දක්වා බස් රථයකින් ගමන් කළ හැකිය. නල්ලතන්නියේ සිට යා යුත්තේ පාගමනිනි. මේ මාර්ගයේ පඩිපෙළ සකසා ඇති අතර, මළුව දක්වාම කිලෝමීටර් හයක පමණ දුරක් කන්ද නැඟ සිරිපා මළුවට ළඟා විය හැකිය. සිරිපා කරුණා කිරීමට ඇති ළඟම පාර මේ හැටන් පාරය. විදේශිකයන් ද කරුණා කරන්නේ මෙම මාර්ගයෙනි. නල්ලතන්නියේදී සීත ගඟුලේ පහළින් එගොඩ වී කල්ප වෘක්ෂ මහා විහාරය, අසූමහාශ්‍රාවක මහා බුද්ධ මන්දිරය, මකර තොරණ, ජපන් සාම චෛත්‍යය පසු කර කරුණා කරන විට වත්පිළිවෙත් සිදු කරන සීත ගඟුල යළි හමු වෙයි. මස්කෙළි ඔය හෙවත් කැලණි ගඟේ ඉහළ මේ සීත ගඟුලය. සීත ගඟුල පසු කර මළුව දෙසට යන විට 'ඉදිකටුපාණ' හෙවත් 'ගෙත්තම්පාණ' හමු වෙයි. ගෙත්තම්පාණෙන් දකුණට ඇති අඩි පාර රත්නපුරා පාරේ ආඩියාමළතැන්නට යන හරස් අතුරුපාරකි. ගෙත්තම්පාණ පසු කර මහගිරිදඹය ඔස්සේ ඉදිරියට යන විට 'ඇහැළ කණුව' හමු වෙයි. ඇහැළ කණුව පසු කර ඉදිරියට යන විට 'භගවා ලෙන' හමු වෙයි. එතැනින් පසු සිරිපා මළුව හමු වෙයි.





## කුරුවිට-එරත්න පාර

කුරුවිට-එරත්න පාර ඉපැරණිම සිරිපා පාරය. සිරිපා මළුව මුලින්ම සොයාගෙන ඇත්තේ මේ ආශ්‍රිත ප්‍රදේශ හරහා ගමන් ගත් කොටකු විසින් යැයි ජනප්‍රවාදයේ එයි. මඟ දෙපස විදුලි ආලෝකය ඇත. ගමන දුර වුවත් අතිශය සුන්දර පරිසරයකින් යුතුය. ජම්බලගස්යට අම්බලම, සරුවත් අම්බලම පසු කළ විට වර්ණගල හමු වෙයි.

ඉන් පසු සුළුවැල්ල ඔස්සේ සීතගඟුල දක්වාම තැන්නය. සීත ගඟුලට 'තුම්මෝදර' යැයි ද කියනු ලබයි. කුරු ගඟේ ඉහළ ප්‍රදේශය මේ සීත ගඟුලය.

සීත ගඟුල පසු කර ඉදිරියට යන විට බේරුමණ්ඩිය ද, මැදහින්න ද හමු වෙයි. මැදහින්නේ ද දකුණු පැත්තෙන් ඇති අඩිපාර දැරණියගල සිට මාලිබොඩ හරහා සිරිපා කරුණා කරන මාර්ගයයි. ඉන් පසු ඉදිකටුපාණ හමු වෙයි. එතැනට ද ගෙත්තම්පාණයැයි කියති. එරත්න පාරේ ඉදිකටුපාණේ සිට ගල්වංගෙඩිය දක්වා දුර තරමක නැග්මකි. ගල්වංගෙඩියේදී රත්නපුර පාර හමු වෙයි. දකුණට ගිය විට 'හැරමිටිපාණ' ය. කෙළින් ගමන් කරන විට ආඩියාමළතැන්න හමු වෙයි. ආඩියාමළතැන්නෙන් වමට ඇති පාරෙ හැටන් පාරේ ඉදිකටුපාණටය. කෙළින් ඇති අඩිපාර සිරිපා මළුවටය. කුරුවිට සහ රත්නපුරා පාරවලින් එන බැතිමතුන්ට 'මහගිරිදඹය' හමු වන්නේ ඉදිකටුපාණේදීය. මහගිරිදඹය ඔස්සේ ඉහළට යන විට ඇහැළකණුව හමු වෙයි. ඇහැළකණුව පසු කර ඉහළට කරුණා කරන විට 'හුළං කපොල්ල' හමු වෙයි. ඉන් අනතුරුව සිරිපා මළුවයි.

## රත්නපුර 'රජමාවත' හෙවත් පලාබද්දල පාර

රත්නපුර නගරයට පැමිණ මල්වල, ගිලීමලේ පසු කර පලාබද්දල දක්වා වාහනයකින් පැමිණිය හැකිය. පලාබද්දල සිට පවනැල්ල, දොරලකඬේ, කොකටියකන්ද, ලිහිණිහෙල, කටුකිතුල, ගෝණතල්ල, ගැටනිටුල, කොඩිය හෙළ, ධර්මරාජගල, ගල්පොත්ත කඬේ, සෙවලගල පසු කර කරුණා කරන විට සීත ගඟුල හමු වෙයි. මේ සීත ගඟුල කළු ගඟේ ඉහත්තාවයි. ඉන් පසු හීන් ගඟුල පසු කර ඉදිරියට කරුණා කරන විට හැරමිටිපාණ හමු වෙයි. හැරමිටිපාණ පසු කර පල්ලමට බහින විට ගල්වංගෙඩියයි. එතැනදී කුරුවිට-එරත්න පාර හමු වෙයි. මේ පාර ද විදුලි ආලෝක පහසුකම් සපයා ඇත. පලාබද්දල පාරෙන් මළුවට කිලෝමීටර් පහළොවක් පමණ ඇත.

## දැරණියගල පාර හෙවත් මාලිබොඩ පාර

දැරණියගල සිට උඩ මාලිබොඩ දක්වා වාහනයකින් පැමිණ, එතැන් සිට පන්දිනය හරහා මහ වන මැදින් පැමිණ පාගමනින් එන පාර ද එරත්න පාරේ මැදහින්නට වැටෙයි. මාලිබොඩ පාර ලෙස නම් කර ඇති මේ පාරෙන් එන විට සීත ගඟුල වන්නේ ද කුරු ගඟේ ඉහත්තාවයි. විදුලි ආලෝක පහසුකම් හෝ අම්මබලම්, තාවකාලික වෙළෙඳසල් මැදහින්න දක්වාම නැත.

## මූක්කුවත්ත පාර

රත්නපුර මල්වල හන්දියෙන් වේවැල්වත්ත පාර ඔස්සේ ගලබඩ හන්දිය තෙක් ගමන් කර එතැනින් හපුගස්තැන්නේ හද්දාරගහවත්ත තෙක් වාහනයකින් ගමන් කළ හැකිය.

එතැන් සිට බෙරුහීන්න, බෝතියදොළ, බෝටිය දොළ පසු කළ විට ඌරුමලේ හෙවත් ගෙත්තම්පාන හමු වෙයි. තවත් ඉදිරියට යන විට රත්නපුර පාරේ ඇහැළ කණුව ආසන්නයේදී රත්නපුරා පාරට එක් වෙයි. විදුලිබල පහසුකම් හෝ වන්දනාවාරයට වෙළෙඳසල් මේ පාරේ නැත.

## රාජමලේ පාර හෙවත් මරේවත්ත පාර

මස්කෙළියේ මරේවත්තේ රාජමලේ පැත්තෙන් ඇති වනගත පාරකි. මේ පාරට ඇහැළ කණුව අසලදී හැටන් පාර හමු වෙයි.

සිරිපා කරුණාවේ නැරඹිය හැකි තවත් විශේෂ දෙයක් වන්නේ ඉර සේවයයි. වලාකුළු අතුරින් උදෑසන හිරු උදාව නැරඹීමට ලොව බොහෝ දෙනා පැමිණෙන්නේ සමනොළ කඳු මුදුනටයි. ඉර උදා වන විට බටහිර දෙස බැලුවොත් සමනොළ කන්දේ සෙවණැල්ල කේතුවක හැඩයකින් දැක ගත හැකිය.

සිරිපා කරුණාවේදී ඔබේ සිත මෙන්ම ගත ද සංවර විය යුතුය. මේ අධි-සංවේදී පරිසර පද්ධතිය කැළිකසළ දමා විනාශ නොකළ යුතුය. අනාගත පරපුර වෙනුවෙන් සමනොළ අඩවිය රැක ගැනීම සියලු දෙනාගේම වගකීමකි.



ඩේසික ජයන්ත

ඔබගේ අදහස් හා යෝජනා පමණක් නොව
ලිපි හා ඡායාරූප ද පහත ලිපිනයට අප වෙත එවිය හැකියි.
'පැලැස්ස', දිනමිණ, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10
pelessa@lakehouse.lk 0112 429 245 / 246

සංස්කරණය
චතුමි
පිටිපන

# පරිසරයට නොම අනතුරු සංචාරක මඟ විසිතුරු



පරිසරය යන කුලකය යටතට ගස් වැල්, දිය ඇලි, ගංගා, වැව්, පොකුණු, ක්ෂුද්‍ර ජීවීන්, සතාසිව්පාවුන්, මිනිසුන් ආදි නොයෙකුත් අංග අන්තර්ගතය. මෙහිලා මිනිසා වන අප ද පරිසරයේම නිර්මාණයක් සහ සංරචකයක් වන බැවින් එය සුරැකීම අපගේ මහත් යුතුකමකි.

වර්තමානය වන විට පරිසරය මූලික කර ගනිමින් ව්‍යාපාරික මූලයන්ගේ වර්ධනාත්මක පැතිකඩක් දැක ගත හැකි අතර 'වන කර්මාන්ත' එහි මූලිකාංගයකි. මේ වන කර්මාන්තයේ දියුණුව උදෙසා පහත කාරණා කිහිපය දළ වශයෙන් හේතු වී ඇත.

1. කඩදාසි කර්මාන්තයේ වර්ධනය
2. වන කළමනාකරණ ප්‍රතිපත්ති
3. තාක්ෂණික ක්‍රමවල දියුණුව
4. ඉදිකිරීම් තාක්ෂණයේ වර්ධනය
5. අලෙවිකරන තත්ත්ව වැඩි දියුණු වීම
6. සංචාරක කර්මාන්තයේ දියුණුව

මෙහි ප්‍රධාන මාතෘකාවට අනුව සංචාරක කර්මාන්තය පිළිබඳ තවදුරටත් විමසා බැලීමේදී එය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්: සංස්කෘතික සංචාරක කර්මාන්තය හා පාරිසරික සංචාරක කර්මාන්තය ලෙසය. ශ්‍රී ලංකාව වැනි රටක විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මාර්ගයන්ගෙන් එකක් ලෙස සංචාරක කර්මාන්තය කැපී පෙනේ.

එහිදී පරිසරය වනාහි සංචාරක කර්මාන්තයේ මුදුන් මුල ලෙස හැඳින්විය හැකිය. මෙය පාරිසරික සංචාරක ව්‍යාපාරයක් හා විකල්ප සංචාරක ආකල්පයක් ලෙස අද වඩාත් පෙරමුණට පැමිණ ඇත.

පරිසරය සංරක්ෂණය කෙරෙන අතරම දේශීය ජනතාවගේ සුභසාධනය පදනම් කර ගත් ස්වාභාවික හා පරිසර පද්ධතියට වගකීම් සහගතව සංචරණය කිරීම පාරිසරික සංචාරක ව්‍යාපාරය ලෙස නිර්වචනය කර ඇත.

පාරිසරික සංචාරක ව්‍යාපාරය කරුණු කිහිපයක් නිසාම මෙතෙක් ලොව පවතින ගතානුගතික සංචාරක ව්‍යාපාරයට වඩා වෙනස් වේ. ස්වාභාවික සහ සංස්කෘතික පරිසරයන්ට අනුකූල වන සේ සම්ප්‍රදායානුකූල ගොඩනැඟිලි ද්‍රව්‍ය යොදා ගනිමින් ඉදි කරන ලද පාරිසරික නිවහන්හි ගත කිරීම මෙන්ම පක්ෂීන් නැරඹීම, ස්වාභාවික මං පෙත් අතුරින් ඇවිද යෑම, හබල්ගාමින් ගංගා, ඇළදොළවල සැරිසැරීම වැනි දෑවලින් යුතුව ස්වභාවධර්මය විඳ දරා ගැනීම පාරිසරික සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන අංග කිහිපයකි.

පාරිසරික සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් මෑතකදී ලෝක සංචාරක සංවිධාන විසින් නිකුත් කර ඇති ප්‍රකාශයකට අනුව තිරසර සංචාරක සංවර්ධනය උදෙසා පදනම් කර ගත යුතු මූලික කරුණු 4ක් දක්වා තිබේ. එනම් හිතකාරීව හා වගකීම් සහිතව සැලසුම් කිරීම, ධරණියත්වයේ සිද්ධාන්තවලට අනුකූලව සංවර්ධනය හා අදාළ ප්‍රතිපත්ති හා නිර්ණායක ක්‍රියාත්මක කිරීම.

මුළුමනින්ම රජයේ හා පෞද්ගලික අංශයේ කැප වීම, සහයෝගය දීම සහ සිවිල් සමාජයේ හා දේශීය ප්‍රජාවගේ සහභාගිත්වයයි.

මේ අනුව ගත් කල සංචාරක කර්මාන්තය හා පරිසරය අතර ඇත්තේ නොබිඳිය හැකි සබඳතාවයකි. පරිසරයට ස්වාභාවිකව හා මානව නිර්මිත පරිසර පමණක් නොව එම පරිසර තුළ වාසය කරනු ලබන ජනතාවගේ ක්‍රියාකාරකම් ද ඇතුළත් වේ. සංචාරක ව්‍යාපාරය බිහි වීමේලා සංචාරක කර්මාන්තය මූලික වී ඇති අතර පරිසරයේ විනාශය සංචාරක ව්‍යාපාරයේ විනාශයට ද හේතු වන බව පිළිගැනේ. කොටින්ම කිව හොත් සංචාරක ව්‍යාපාරයේ මූලික පදනම පරිසරය ලෙස හැඳින්වීම නිවැරදිය.

මේ පාරිසරික සංචරණය තුළ ස්වාභාවික සංචරණය බිහි වී ඇත. ඒ තුළ වනාන්තර ඇතුළු ස්වාභාවික ස්ථාන ආශ්‍රිත සංචරණය, මුහුදු වෙරළ ආශ්‍රිත සංචරණය හා ප්‍රාග් ඓතිහාසික ස්ථාන සංචරණය හඳුනාගත හැකිය.

වර්තමානයේ බොහෝ සෙයින් වනාන්තර ආශ්‍රිත සංචරණය දැක ගත හැකිය. ශ්‍රී ලංකාව තුළ ඉතා අඩු භූමියක විවිධ වෘක්ෂලතාගහන සහ වනජීවීන් ප්‍රමාණයක් දැක ගත හැකි අතර, දකුණු ආසියානු කලාපයේ එක් වර්ග මීටරයකට වැඩිම ජෛව විවිධත්වයක් අප රට තුළ දක්නට ලැබීම සුවිශේෂී කරුණකි. තව ද, ලෝකයේම ඉතිරි වී තිබෙන 7%ක වර්ෂා වනාන්තර අතුරින් එකක් වන සිංහරාජ වනාන්තරය ද ශ්‍රී ලංකාවේ පිහිටා තිබේ. නිවර්තන පතනශීලි වනාන්තර, වැසි වනාන්තර, තෘණ භූමි, කඩොලාන ආදි ස්වාභාවික වෘක්ෂලතා කලාප ලංකාව තුළ දක්නට ලැබේ. මේ හේතුවෙන් ලංකාවේ සංචාරක කර්මාන්තය බොහෝ සෙයින් රැඳී ඇත්තේ පරිසරය මූලික කරගෙනය. වනාන්තර ඇතුළු ස්වාභාවික ස්ථාන ආශ්‍රිත සංචරණය විවිධ අංගවලින් සමන්විත වේ.

එනම් ත්‍රාසජනක සංචරණය, ස්වාභාවික පරිසරයේ යම් යම් විශේෂිත අංග මත පදනම් වූ සංචාරක ක්‍රියාකාරකම් (සෆාරි සහ වන ජීවීන් නැරඹීම, පරිසර සංචරණය, සාමුද්‍රික සංචරණය ආදිය) ස්වාභාවික උරුම ස්ථාන ආරක්ෂා කිරීම සඳහා යොමු වූ සංචරණය (දෙස් සංචරණය, ජාතික උද්‍යාන, රක්ෂිත ආශ්‍රිත සංචරණය) යි.

ශ්‍රී ලංකාවේ වනාන්තර ආශ්‍රිත සංචාරක කර්මාන්තය ගත හොත් වැදගත්ම සංචාරක ආකර්ශනයක් ලෙස සිංහරාජ වනාන්තරය හැඳින්විය හැකිය. එය 1978 දී යුනෙස්කෝ ආයතනය විසින් 'මිනිසා සහ ජෛව ගෝලීය රක්ෂිතයක්' ලෙසත් 1988 දී 'යුනෙස්කෝ ලෝක උරුමයක්' බවටත් පත් විය. මෙහි සත්ත්වයන් ගත් විට සමනලයන්, මත්ස්‍යයන්, උරගයන්, උභයජීවීන්, පක්ෂීන් සහ ක්ෂිරපායීන්ගේ ඉතා ඉහළ ආවේණිකත්වයක් දක්නට ලැබේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යාන වන යාල, බුන්දල, කුමන, උඩවලව, වස්ගොමුව, විල්පත්තු ආදී ජාතික වනෝද්‍යාන, වන රක්ෂිත ආදිය ද තෙත් බිම්, වගුරු බිම් ද දක්නට ලැබේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සෑම ජාතික වනෝද්‍යානයකම හා රක්ෂිතයකම සුබෝපභෝගී ජංගම සෆාරි ක්‍රියාත්මක වේ. තවද ගුහා සංචරණය පර්වත සංචරණය ද මීට සමගාමීව සිදු වේ.

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් ශ්‍රී පාද තරණය, පිදුරුතලාගල, රිටිගල වැනි කඳු තරණය ත්‍රාසජනක ලෙස භාවිත කරයි.

මේ අනුව වනාන්තර මූලික කොට ගත් සංචාරක ව්‍යාපාරයන් ශ්‍රී ලංකාව තුළ පමණක් නොව බොහෝ රටවල ක්‍රියාත්මක වනු දැක ගත හැකිය.

වෙරළ ආශ්‍රිත සංචරණය ද පාරිසරික සංචාරක කර්මාන්තය තුළ විශේෂ ස්ථානයක් ගනී. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි රටක සංචාරක කර්මාන්තය වඩාත් රැඳී පවතින්නේ වෙරළ ආශ්‍රිත සංචරණය හේතු කොට ගෙනය. එනම් හිරු එළිය, මුහුද සහ වැලි මූලික කොට ගෙන සංචාරකයන් වැඩි වශයෙන් පැමිණීම සිදු වේ.

එහිදී ත්‍රිකුණාමලයේ නිලාවැලි සිට දකුණු පළාතේ ගාල්ල, උණවටුන, කොග්ගල, වැලිගම, මිරිස්ස, පොල්හේන, තංගල්ල, මෙන්ම ගල්කිස්ස, බේරුවල, හික්කඩුව, අම්බලන්ගොඩ, විශේෂයෙන්ම මීගමුව ප්‍රදේශවල වෙරළ සංචරණය ප්‍රමුඛස්ථානයක් ගනී. මේ ප්‍රදේශවල සංචාරක හෝටල් සහ නිකේතන රාශියක් සංචාරක කර්මාන්තය වෙනුවෙන් ඉදි වී තිබේ.

මේ ආශ්‍රිතව සර්ෆ් කිරීම, බෝට්ටු පැදීම, දිය යට කිමිදීම ඇතුළු ජල ක්‍රීඩා රැසක් මෙන්ම අවුව තැපීම වැනි දෑ කරණ කොට ගෙන සංචාරකයන් වෙරළ ආශ්‍රිත සංචරණයට යොමු වී ඇත. තව ද කඩොලාන නැරඹීම, කොරල්පර නැරඹීම, ජලජ මසුන් නැරඹීම, ඒ ආශ්‍රිත පක්ෂීන් හා විවිධ ශාක ගහන නැරඹීම ද මේ ආශ්‍රිතව සිදු වේ. පාරිසරික සංචාරක කර්මාන්තය තුළ ආකර්ෂණීය සංචාරක විධික්‍රමයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය.

තවද පරිසරය මූලික කොට ගත් සංචාරක කර්මාන්තය තුළ තවත් සංචාරක විධික්‍රමයක් ලෙස ගුහා සංචරණය හඳුනා ගත හැකිය. ශ්‍රී ලංකාව තුළ ද මෙලෙස ගුහා සංචරණය බොහෝ සෙයින් සිදු වේ. මේ ගුහා සංචරණයේදී අතීත පරිසරය ගැන හැදෑරීමට අවශ්‍ය තොරතුරු අධ්‍යයනය කිරීම බොහෝ සෙයින්ම සිදු වේ. අතීතයේ පැරණි මිනිසා භාවිත කළ ශිලා, මෙවලම්, ආහාරයට ගත් සත්ත්ව අවශේෂ ආදිය අධ්‍යයනය කරනු ලබයි. මේ තුළ ස්වාභාවික ගුහා මෙන්ම මානව නිර්මිත ගුහා ද දැක ගත හැකිය.

















පාහියන් ගුහාව, බටදොඹ ලෙන, අත්තනගලු අළු ලෙන, මානියම්ගම බෙලි ලෙන, වාරණ ගුහාව, පොතාන ගුහාව ආදි ගුහා රාශියක් ශ්‍රී ලංකාව පුරා දැක ගත හැකිය.

මීට අමතරව මානවයා විසින් නිර්මාණය කරන ලද පරිසරය මූලික කොට ගෙන බොහෝ සෙයින් සංචාරක කර්මාන්තය සිදු වේ. ඒ තුළ ඓතිහාසික උරුම ස්ථාන සීගිරිය, පොළොන්නරුව, අනුරාධපුරය වැනි ස්ථාන ආශ්‍රිතව සිදු වන සංචාරක කර්මාන්තය ප්‍රධාන වේ.

ශ්‍රී ලංකාවේ පමණක් නොව, ලෝකයේ අනෙකුත් බොහෝ රටවල සංචාරක කර්මාන්තය සඳහා මූලික පදනම වන්නේ පරිසරයයි. ඒ අනුව ඔවුන් පාරිසරික සංචරණය තුළ නවතම සංචාරක වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ජල සංචරණය නම් වූ අලුත් මාදිලියේ සංචාරක වැඩසටහනක් නෙදර්ලන්තය විසින් පසුගිය කාලයේදී හඳුන්වා දෙනු ලැබීය. බෝට්ටුවලින් හා කුඩා පරිමාණයේ නෞකාවලින් සමස්ත සංචාරයම නිම කිරීම මෙහි ඇති සුවිශේෂත්වයය.

එමෙන්ම කෘෂිකාර්මික සංචාරය ද ලෝකයේ සංචාරක ප්‍රජාවගේ අවධානයට පාත්‍ර වෙමින් පවතී. විවිධ ගොවිපොළ නැරඹීම එම ගොවිපොළවල කෙටි කාලයක් ගත කරමින් නැවුම් එළවළු, පලතුරු රස විඳීම මෙන්ම ග්‍රාමීය සමාජයේ පිහිටි වනාන්තරවල චාරිකා කිරීම ඇළදොළ ආදියෙහි ඔරු පැදීම හා කඳු තරණය ද මේ කෘෂිකාර්මික සංචරණයට සාමාන්‍ය වශයෙන් ඇතුළත් අංග වේ.

අනාගත සංචාරක පරපුර පෘථිවිය මත සාමාන්‍ය ප්‍රදේශවල චාරිකා කිරීමෙන් තෘප්තියට පත් නොවෙතැයි සංචාරක සැලසුම් ශිල්පියෝ දැන් විශ්වාස කරති. එනිසා අනාගත පරපුර වෙනුවෙන් අභ්‍යවකාශයේ සහ සාගර පත්ලේ මෙන්ම ධ්‍රැවාසන්න ශීත කලාපය කේන්ද්‍ර කරගෙන සුවිශේෂ මාදිලියේ සංචාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත. අවශ්‍ය ස්ථානයක පරිසර හානිය අවම වන ලෙස ඉදි කළ හැකි ගලවා හකුළන හෝටල් ධ්‍රැවාසන්න ප්‍රදේශවල හෝ වැසි වනාන්තරවල හෝ අවශ්‍ය අවස්ථාවක ඉදි කිරීමේ හැකියාව අත්හදා බලා තිබේ. කාමර සිය ගණනකින් සමන්විත මෙවැනි හෝටල්වලින් පිට කෙරෙන අපද්‍රව්‍ය පවා හෙලිකොප්ටර් මඟින් ඉවත් කිරීමට කටයුතු සම්පාදනය කෙරේ.

සංචාරකයන්ගේ අවශ්‍යතා මත මෙවැනි ගලවා හකුළන හෝටල් කාමරවල ප්‍රමාණය කාමරයේ පසුතලය ආදි අංග ද වෙනස් කළ හැකිය. වැසි වනාන්තර පසුබිමක හෝ මුහුදු වෙරළක පසුබිමක හෝ හිම මිදුණු කඳු නිම්නයක වූ හුදෙකලා පසුබිමක් හෝ තමන්ගේ විවේකය ගත කිරීමට තෝරා ගත් කාමරයේ පසුබිම ලෙස සැලසුම් කර ගත හැකි වීම මෙහි විශේෂත්වය වේ. සංචාරකයන් මේ තාවකාලික හෝටල්වලට පැමිණීම සහ ඉවත්ව යෑම සඳහා හෙලිකොප්ටර් යානා භාවිත කිරීමට අපේක්ෂා කරන අතර ඔවුන්ගේ පාද ස්පර්ශයවත් මෙවන් සුවිශේෂ පරිසර පද්ධතිවලට හානියක් වීම වැළැක්වීම එම ස්වාභාවික පරිසරයන්ට හානියක් නොකරමින් මේවා සිදු කිරීම අනාගත සංචාරක සැලසුම් ශිල්පීන්ගේ අරමුණ වී ඇත.

සාගර පත්ලේ අනාගතයේ ඉදි වන මහා හෝටල් සංකීර්ණවල තම විවේක කාලය ගෙවා දමන සංචාරකයන්ගේ ප්‍රමාණය සුළුපටු නොවනු ඇත. සියලු අංගවලින් සමන්විත වෙළෙඳ සංකීර්ණ, නාට්‍ය ශාලා සහ සිනමා ශාලාද, ශරීර සුවතා මධ්‍යස්ථාන ද කෘත්‍රිම ක්‍රීඩාංගණ ද සාගර පත්ලේදී සංචාරකයා ගොඩබිම මතදී මෙන්ම ක්‍රියාශීලිව තබනු ඇත.

අතීතයේ ශ්‍රී ලංකාවේ වන ආවරණය ඉතා සතුටුදායක මට්ටමක පැවතිණි. එහෙත් විදේශීය ආක්‍රමණවලින් පසු වැවිලි භෝග ස්ථාපනය කිරීම හා ක්‍රමිකව සිදු වූ ජන සංඛ්‍යා වර්ධනයේ අවශ්‍යතා ශීඝ්‍රයෙන් වර්ධනය වීම මත වන ගහනය අඩු විය. 1956දී කරන ලද වන සංගණනයට අනුව වන ආවරණය මුළු භූමි ප්‍රමාණයෙන් 44%ක් වුව ද, 1983දී එය 27% දක්වාත් වර්තමානය වන විට එය 22.5% දක්වාත් ක්‍රමයෙන් විනාශ වෙමින් පවතියි.

කොවිඩ් 19 වසංගත කාල පරිච්ඡේදයේ සංචාරක කර්මාන්තය ලද දිගු විවේකය අග ලොවට දායාද කළ හැකි මේ වටිනා වැඩපිළිවෙළ ශ්‍රී ලංකාව වැනි සංචාරක පාරාදීසයක නව ගමන් මඟකට ජීවයක් වනු නොඅනුමානය.

**අමාදි සංජනා දසනායක**
**සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණ (විද්‍යාවේදී විශේෂ)**
**කළමනාකරණ පීඨය**
**රජරට විශ්වවිද්‍යාලය**

**ඡායාරූප - රංග විජේවර්ධන / සසික සංජීව**





# හිලෙවූ අපි බිබිලේ පැණි දොඩම් ගහලේ



අපේ රටේ ප්‍රධාන නගරවල පලතුරු වෙළෙඳසල් පුරවලා තියෙන්නෙ රටින් ගෙන්වන කහ පාට දොඩම්වලින්. දේශීය නිෂ්පාදනයක් වන කොළ පාට පැණි දොඩම් වෙළෙඳසල්වල දක්නට නැති තරම්. අප අද රටින් ගෙනා කහ පාට දොඩම් කෑවත් එදා විදේශිකයන් කෑවෙත් අපේ කොළ පාට බිබිලේ පැණි දොඩම්. බිබිලේ දොඩම් කහ පාට රට දොඩම්වලට වඩා දහ ගුණයක් රසයෙන් වැඩි වස-විස නැති ස්වාභාවික ගුණයෙන් වැඩි බව පෝෂණවේදීන් පවසනවා. මේ දොඩම් අපේ රටේ අලෙවි කළෙත්, විදේශවල අලෙවි කළෙත් බිබිලේ පැණි දොඩම් කියලයි. කලක් අභාවයට ගොස් තිබුණු දොඩම් වගාව පසුගිය දශක දෙක-තුන තුළ නව තාක්ෂණය භාවිත කරමින් නවීකරණය වෙලා යළි වගාව ආරම්භ කර තිබෙනවා. එදා තරම් ජනප්‍රිය නැතත් බිබිලේ දොඩම් වගාවේ නව පිබිදීමක් ඇති වීම සතුටට කරුණක්.

*Citrus Sinensis* (සිට්‍රස් සිනේන්සිස් ) යන උද්භිද විද්‍යා නාමයෙන් හඳුන්වන දොඩම්වල නිජබිම චීනය ලෙස සැලකෙනවා. දොඩම් ගසේ නිජබිම චීනය වුවත් ආසියාතික රටවල සහ බටහිර රටවල දොඩම් වගාව ව්‍යාප්ත කිරීමේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ දේශ ගවේෂකයකු වූ වස්කෝදගාමා. ලංකාවේ පැණි දොඩම් වගාව ආරම්භ වී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලකයන් ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමගයි. කෙසේ නමුත් දොඩම් වගාව ආරම්භ කළ මුල් යුගයේ එතරම් සතුටුදායක ප්‍රතිඵල අත් කර ගැනීමට හැකි වී නැහැ. ආරම්භයේදී දොඩම් වගාව අසාර්ථක වුවත් 1940 ගණන් වන විට බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්වල පැණි දොඩම් වගාව යම් සාර්ථකත්වයක් ළඟා කර ගෙන තිබෙනවා. එහෙත් 1950 ගණන්වල ඇති වූ ට්‍රෙස්ටෙසා නම් වයිරස් රෝගයක් නිසා දොඩම් වගාව විනාශ වුවත් 1960 ගණන්වල බිබිලේ දොඩම් වගාව පුනර්ජීවයක් ලබනවා. එතැන් සිට 1980 පමණ වන තෙක් ඉතා සාර්ථක දොඩම් වගාවක් මොනරාගල සහ බිබිල ප්‍රදේශවල දක්නට තිබුණා. 1978 සිට ක්‍රියාත්මක වුණ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ විදේශවලින් කහ පාට දොඩම් විශාල වශයෙන් ආනයනය කිරීම නිසා බිබිලේ පැණි දොඩම්වලට කණකොකා හඬන්න පටන් ගත්තා. රටින් ගෙනා දොඩම් සමග වෙළෙඳපොළේ තරග කළ නොහැකි නිසා නිෂ්පාදනය පහළ වැටුණා.

පිටරට දොඩම් ආනයනය කළ බහු ජාතික සමාගම්වල ප්‍රචාරක කටයුතු නිසාත් බිබිලේ දොඩම් කල් තබා ගැනීමට නොහැකි වීම නිසාත් බිබිලේ පැණි දොඩම්වලට තිබුණු ඉල්ලුම සංකෝචනය වුණා. ඒ නිසා දොඩම් වගාකරුවන් දොඩම් වගාවෙන් ක්‍රමයෙන් ඉවත් වී වෙනත් වාණිජ භෝග කෙරෙහි යොමු වුණා. එසේ වුවත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විවිධ පර්යේෂණ කරමින් දේශීය පැණි දොඩම් වගාව නඟාසිටුවීමට විශාල කාර්යභාරයක් ඉටු කළා. එහි ප්‍රතිඵලයක් හැටියට වර්තමානය වන විට සාම්ප්‍රදායික පැණි දොඩම් වෙනුවට විස්මිත ඵලදාවක් සහිත නව දොඩම් වර්ග කිහිපයක්ම හඳුන්වා දී තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිලේ දොඩම් පර්යේෂණායතනය, මදුරුකැටිය කෘෂිකර්ම පර්යේෂණායතය සමග මේ ආයතනවලට අනුබද්ධ මුතුකන්ඩිය හා බිබිල විශේෂ පර්යේෂණ මධ්‍යස්ථාන දෙකක් ද පිහිටුවා තිබෙනවා. මේවායේ උසස් වර්ගයේ පැණි දොඩම්, ජම නාරං, රෝපණ ද්‍රව්‍ය නිපදවීම හා පැඟිරි ප්‍රභේද පිළිබඳ පර්යේෂණ සිදු කරනවා. මෙහි ප්‍රතිඵලයක් විදියට නව දොඩම් ප්‍රභේද රාශියක් දැනට ගොවීන් අතර බෙදාහැර තිබෙනවා. නව පැණි දොඩම් ප්‍රභේද අතර බිබිලේ පැණි දොඩම්, බිබිලේ පැණි දොඩම් බීජ රහිත, ආරෝග්‍යා, සිසිල සහ මදුරුකැටිය පැණි දොඩම් යන වර්ගවලට ප්‍රධාන තැනක් හිමි වනවා.

බිබිලේ පැණි දොඩම් විශේෂය වියළි සහ අතරමැදි කෘෂිකර්ම කලාප සඳහා වඩාත් සුදුසු යැයි නිර්දේශ කර තිබෙනවා. බිබිලේ අනෙක් පැණි දොඩම් වර්ගය බීජ රහිතයි. මෙය සිසිල් අතරමැදි හා තෙත් කෘෂි කලාපයට වඩාත් සුදුසුයි. මෙහි විශේෂය නම් බීජ රහිත වීමයි. ආරෝග්‍යා නමින් තවත් ප්‍රභේදයක් තිබෙනවා. මෙම වර්ගයේ යුෂ වැඩි ප්‍රමාණයක් තිබුණත් බිබිලේ පැණි දොඩම් මෙන් ප්‍රණීත රසක් නැහැ. එහෙත් වසරකට තෙවරක් පල දරනවා. මදුරුකැටිය කෘෂි පර්යේෂණායතනයෙන් දියුණු කළ වර්ගය මදුරුකැටිය පැණි දොඩම් ලෙස හඳුන්වයි. මෙයට අමතරව කෝට්ටේ පැණි දොඩම් සහ වවුනියා ප්‍රභේද දැන් අභාවයට ගොස් ඇත.




දොඩම් වගාව ආරම්භ කිරීම වසරේ සැප්තැම්බර්-ඔක්තෝබර් මාසවල ආරම්භ කළ හැකියැයි නිර්දේශ කර ඇතත් ඕනෑම කාලයක වගා කළ හැකිය. වියළි හා අතර මැදි කලාප දොඩම් වගාව සඳහා නිර්දේශ කෙරේ. වසර පුරා පැතිරුණ වර්ෂාව පැණි දොඩම් වගාවට අහිතකරය. වගාවට මාස 2-3ක වියළි කාලයක් අවශ්‍යය. මුළු දිවා කාලයම හිරු එළිය ලැබෙන ප්‍රදේශවල ගස් පලවලින් බර වේ. ගෙඩි හට ගන්නා කාලයේ පසේ තෙතමනය මනාව පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. පසේ pH අගය 5-6 අතර තිබිය යුතු අතර එය අඩු හෝ වැඩි වීමෙන් පසේ මූල ද්‍රව්‍යවල ඌනතා ඇති වී වගාව දුර්වල විය හැකිය. බිබිලේ පැණි දොඩම් දැන් ශ්‍රී ලංකාව පුරාම වගා කෙරේ. ඒ අනුව නුවරඑළිය, මහනුවර, කෑගල්ල, බිබිල, මොනරාගල, බදුල්ල, කුරුණෑගල, රත්නපුර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව, පුත්තලම, වවුනියාව, යාපනය, කිලිනොච්චිය, හම්බන්තොට, අම්පාර ආදි ප්‍රදේශවල බිබිලේ පැණි දොඩම් සාර්ථකව වගා කෙරේ. දොඩම් වගාවේදී බීජ පැළ මෙන්ම බද්ධ පැළ යොදා ගත හැකිය. එහෙත් බීජ පැළ කිරීමෙන් නිපදවනු ලබන පැළවල ප්‍රභේදය බොහෝ දුරට වෙනස් වීමට ඉඩ තිබේ.

එසේ වුවත් පැළ වී මාස 6ක් පමණ යන විට පැළවල ප්‍රභේද ලක්ෂණ හොඳින් පරීක්ෂා කොට තහවුරු කර හොඳින් වැඩුණු පැළ සිටුවිය හැකියි. බීජ පැළ කිරීමේදී වයිරස් රෝග බෝ නොවීම වාසියකි. එහෙත් ප්‍රථම වරට මල් පිපීමට (පිදීමට) වසර 5ක් පමණ ගත වීම බීජවලින් පැළ ගැනීමේ අවාසියකි.

බද්ධ පැළ මඟින් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉතා පලබර ගස් ඇති කරගත හැකිය. වයිරස් රෝග බෝ වීමේ ප්‍රවණතාව වැඩියි. උසස් වර්ගයේ පැණි දොඩම් ගසකින් අංකුර ගෙන රෆ් ලෙමන්, පිලිපීන දෙහි, රාම්පූර් දෙහි, ට්‍රියිපොලියනා (තුන්පත් කුරුඳු) බීජ පැළවලට බද්ධ කිරීමෙන් වඩා හොඳ පැණි දොඩම් ලබා ගන්න පුළුවන්. වගාවේදී වැදගත් කරුණක් වන්නේ පාංශු සංරක්ෂණයයි. බෑවුම් සහිත ඉඩම්වල පාංශු සංරක්ෂණය බිම් සකස් කිරීමේදීම සකස් කළ යුතුය. බුරුල් පසක නම් පැළ සිටුවීමට 60X60X60 ප්‍රමාණයක වළක් සුදුසුය. මේ වළ තුළට දිරා ගිය පොහොර වළෙන් අඩක් පමණ යොදා මතු පිට පස් සමග වළ තුළ මිශ්‍ර කළ යුතුය. පැළ සිටුවීමට දින 4-5කට පෙර පැණි දොඩම් මූලික පොහොර මිශ්‍රණය යොදා පැළ සිටුවීම යෝග්‍යය. පැළ මීටර් 4X5 පරතරයකින් සිටුවිය යුතුය. හෙක්ටයාරකට බද්ධ පැළ 555ක් ප්‍රමාණවත් බව නිර්දේශ කර ඇත. දොඩම් ගසේ මනා වර්ධනයට දියර පොහොර ඉසීම වඩා හොඳ ප්‍රතිඵල ගෙන දේ.

දියර පොහොර සති දෙකකට වරක් පත්‍ර හොඳින් තෙමෙන සේ ඉසීම් කළ යුතුය.

දොඩම් වගාවේදී ගොවීන්ට ඇති වැදගත් වාසිදායක තත්ත්වය නම් ඉඩමේ අතුරු භෝගයක් වගා කරගැනීමට හැකි වීමයි. පැළ සිටුවා වසර දෙක තුනක කාලයක් තුළ කෙසෙල් වගා කළ හැකිය. කෙසෙල්වලට අමතරව ෆැෂන් ෆෲට්, අන්නාසි, පැපොල් මෙන්ම එළවළු මෙන්ම ධාන්‍යද වගා කළ හැකිය.

බීජවලින් බිහි කරගත් පැණි දොඩම් පැළයක් සිටුවා වසර 4-6කදී පළමුවරට මල් පිපේ. බද්ධ පැළ වසර 2-3කින් මල් පිපේ. ගෙඩියක් මේරීමට මාස 4-6ක් පමණ ගත වේ. ගසක් සාමාන්‍යයෙන් වසර 25-30ක් පමණ පවතී. එය රඳා පවතින්නේ වගාව නඩත්තු කරන ආකාරය අනුවයි. හොඳින් වැඩුණු නීරෝගි දොඩම් ශාකයකින් වසරකට ගෙඩි 300-400ක් පමණ ලබා ගත හැකිය.

පැණි දොඩම් පලතුරු අතර ඉතා රසවත් ගුණවත් පලතුරකි. එහි පෝෂණ පදාර්ථ රාශියක් අඩංගු වේ.

කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන්, මේදය, ආහාරමය තන්තු මෙන්ම, විටමින් හා ඛනිජ ලවණ රාශියක් අඩංගු වේ. ඒ අතර ෆෝ ලේට්, නියසින්, තයමින්, විටමින් C, විටමින් A, පොටෑසියම්, කොපර්, අයන්, මැග්නීසියම්, සින්ක්, බීටා කරොටින්, මැන්ගනිස්, ඇල්ෆා කරොටින් අඩංගු වේ. දොඩම් ඉතා මිහිරි වගේම එපා නොවන පානයකි.ශරීරය ප්‍රාණවත් වීමට හේතු වන බැවින් නීරෝගී අයට මෙන්ම රෝගීන්ට යෝග්‍ය පානයකි. විටමින් C අඩංගු නිසා ප්‍රතිශක්තිය වැඩි කරයි. විටමින් C ප්‍රතිඔක්සිකාරකයක්ද වේ. සෛලවල එක්රැස් වන විෂ ඉවත් කරයි. හොඳින් ආහාර දිරවයි.තන්තු බහුලව ඇති නිසා මළබද්ධය ඇති නොකරයි. අධික තරබාරුව ඇති අයට පැණි දොඩම් වඩා ගුනදායක බව කියවේ. විටමින් A අඩංගු නිසා ඇස් පෙනීම යහපත් කරයි. සම නීරෝගි කරයි. සිරුරේ පටක වර්ධනය කරයි.දොඩම් ලෙල්ලේ මේදය අඩංගු නිසා එයින් රූප ලාවණ්‍යවලට අවශ්‍ය ඖෂධ වර්ග නිෂ්පාදනය කර ඇත. වමනයට අත්බේතක් ලෙස දොඩම් යුෂ භාවිත කරයි. අගය එක් කළ නිෂ්පාදයක් ලෙස බහුලව වෙළෙඳපොළේ ඇත්තේ සිසිල් බීම සහ දොඩම් කෝඩියල් වශයෙනි.

දොඩම් අපේ ලෙඩ රෝග වැළැක්වුවත් ව්‍යාධීන්ට ප්‍රතිකාරයක් වුවත් දොඩම් වගාවට ලෙඩ රෝග රාශියකට මුහුණ පෑමට සිදු වී ඇත. දොඩම් වගාවට බැක්ටීරියා රෝග රාශියක් වැලඳේ. රක්තපටල රෝගය, මැලියම් වෑස්සීම, කබොලු රෝගය, පිටිපුස් රෝගය, පාදස්ථ කුණු වීම, ට්‍රිස්ටෙසා වයිරස රෝගය ඒ අතර ප්‍රධාන වේ. දොඩම් වගාවට එන ඉල් මැස්සාගේ හානිය ප්‍රබල අභියෝගයකි. මේ රෝගවලට සුදුසු ප්‍රතිකාර නිසි වේලාවට නොකළ හොත් මුළු දොඩම් වගාව වුව විනාශ විය හැකිය.

දොඩම්වලට නිසි මිලක් නොලැබීම නිසා වගාකරුවන් බොහෝ දෙනෙක් වගාවෙන් ඉවත් වන බවක් පෙනෙන්න ඇත. මේ සඳහා බලපෑ ඇති තවත් හේතුවක් නම් ඉතා ඉක්මනින් අස්වැන්න ලබාගත හැකි උක්, බඩඉරිඟු වැනි භෝග වගා කෙරෙහි වගාකරුවන් යොමු වී ඇත. කල් තබා හැකියාවක් නොවීම නිසා දේශීය පැණි දොඩම්වලට විදේශීය දොඩම් සමග වෙළෙඳ පොළේ තෙරග කිරීමට නොහැකි වීම බිබිලේ පැණි දොඩම් මුහුණපාන තවත් ගැටලුවකි.

**(කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බිබිල බීජ සහතික කිරීමේ සේවයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ කෘෂිකර්ම උපදේශක රත්නපාල ජයලත් මහතා සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරෙනි)**

**කෝනාර එම්. ගුණපාල**

# කාබනික පොහොර තරගයට හදන අපේම ගොවි ජනතාව



එස්.කේ.රේනිස් මහතා

කාබනික පොහොරින් සරු වුණු වගාවක්

කාබනික පොහොර භාවිතයට මෙරට ජනතාව හුරු කර වීම සඳහා රජය විසින් ගෙන ඇති රසායනික පොහොර තහනම ප්‍රඥාගෝචර වේ. අතීතයේ පෙරදිග ධාන්‍යාගාරය ලෙසින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාද්වීපයේ කෙත් වතු එකල සරුසාර වූයේ රසායනික පොහොරින් නොවේ. ගොවියන් විසින්ම කොළ අතු එකතු කොට සාදන ලද කොම්පෝස්ට් පොහොර සහ ගොම සහ කුකුල් පොහොර ඇතුළු ස්වාභාවික සත්ත්ව පොහොරවලිනි. එකල වී වගාව මෙන්ම එළවළු වගාව ද සශ්‍රීක විණි. මිනිසුන් හඳුනා නොගත් ලෙඩ රෝගවලින් මිය ගියේ නැත. ඔවුහු බොහෝ ආයුෂ දැරූහ.

මේ වන විට හඳුනා නොගත් වකුගඩු රෝග ඇතුළු රෝග ගණනාවකින් ජනතාව මිය යති. මෙයට හේතුව ලෙස විද්වතුන් හඳුන්වා දෙනු ලබන්නේ රසායනික පොහොර තුළ පවතින විෂ රසයනිකයන් ආහාර දාම දිගේ මිනිසාගේ ශරීරය තුළට නැවත පැමිණෙන බවය. ඉදිරි පරම්පරාව හෝ මෙවැනි රෝගවලින් ආරක්ෂා කර ගැනීම සඳහා මේ මොහොතේ සිට හෝ රසායනික පොහොරවලට නැවතීමේ තිත තබා ස්වාභාවික පොහොරින් රට ස්වයංපෝෂිත කිරීම ආරම්භ කළ යුතු වේ.

රසායනික පොහොර ගෙන්වීම රජය විසින් නතර කරනු ලැබූ විට රට පුරාම සිටින ගොවියන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කළ යුතුය. වසර එකොළහකට වැඩි කාලයක් පුරා කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන අනුරාධපුර නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිදෝගම සුහදගම එස්.කේ.රේනිස් මහතා පොල් වගාවට, එළවළු වගාවට, පලතුරු වගාවට, කෙසෙල් වගාවට මෙන්ම බුලත් වගාවට ද කාබනික පොහොර යොදමින් සාර්ථක අස්වැන්නක් ලබා ගෙන ඇති බව සඳහන් කරයි.

මෙ වන විට එම ගොවි මහතා කාබනික පොහොර කිලෝ 10,000 ක් පමණ නිෂ්පාදනය කරමින් නාච්චාදූව ගොවි ජනතාවට ද අලෙවි කරනු ලබයි. රජය හෝ යම් අයෙක් රේනිස් මහතාට උදව් කරනවා නම් ගුණාත්මක බවින් වැඩි කාබනික පොහොර කිලෝ 25000 ක් පමණ ලබා දීමට හැකි බව ද ඔහු පවසයි.

ඒ වාගේම ගුණාත්මක බවින් වැඩි ඉස්තරම් කාබනික පොහොර හදන ආකාරය පිළිබඳව ද යම් ආයතනයක් හෝ යම් අයෙක් ඉල්ලීමක් කළ හොත් ඒ සඳහා කටයුතු කර දීමට ද ඔහු සූදානම්ය.

වගාවන් සඳහා කාබනික පොහොර එක් කිරීම සම්බන්ධව එස්.කේ. රේනිස් මහතා දැක්වූයේ මෙවන් අදහසක්.

"මෙතෙක් කලක් රාජ්‍ය නායකයෙක් මේ වාගේ රටට වැදගත් තීන්දුවක් ගත්තේ නැහැ. හැමෝම රසායනික පොහොර නතර කිරීමට බය වුණා. රසායනික පොහොර නිෂ්පාදනය කරන මහා පරිමාණයේ බහු ජාතික සමාගම්වලින් ලැබෙන මුදල ගැන හිතා රාජ්‍ය නායකයින් මේ වාගේ තීරණ ගත්තේ නැහැ. කාබනික පොහොර හදන්න බැහැ, විකුණන්න බැහැ, අස්වැන්න නැහැ, වී වගාව කරන්න බැහැ, පොල් වගාවට දාන්න බැහැ, යන බොරු බිල්ලෝ පෙන්වා ජනතාව බය කරලා තිබෙන්නේ.

නමුත් අපේ රටට සහ දුප්පත් ජනතාවට ආදරය කරන ජනාධිපතිතුමා රසායනික පොහොර නතර කිරීමට තද දැඩි තීරණයක් ගෙන තිබීම අප අගය කරන්න ඕනෑ. දැන් ගොවි ජනතාව කාබනික වගාවට යන්න සූදානම් වෙලා ඉන්නේ.

කාබනික පොහොර යොදන්න කිසිම අයුරකින්වත් බිය විය යුතු නැහැ. පොල් ගසකට කාබනික පොහොර කිලෝ 30 ක් දමන්න ඕනෑ. දැනට තිබෙන පොල් අස්වැන්න දෙගුණ වෙනවා. මම අත්දැකීමෙන් කියන්නේ. මම කාබනික පොහොර යොදලා තිබ්බටු පැළ දෙකක් සිටවා තිබෙනවා. අක්කර කාලක් පමණ ඒ ගස් විහිදිලා තිබෙනවා. ඒ තිබ්බටුවලට මම කාබනික පොහොර දාලා තිබෙන්නේ. සති දෙකකට මම රුපියල් 3000ක් උපයා ගන්නවා.

පොල් වගාවට මම කාබනික පොහොර දාලා අස්වැන්න වැඩි කර පෙන්වා දුන්නාට පොල් සංවර්ධන මණ්ඩලයෙන් මට දිරි දීමනාවකුත් දුන්නා. මගේ අක්කර දෙකක පොල් වගාවට මම කාබනික පොහොර යොදා තිබෙනවා. මම හොඳ අස්වැන්නක් ගන්නවා.

රසායනික පොහොර නතර කරන එකට විරුද්ධව කටයුතු කරන්නේ ඖෂධ නිෂ්පාදකයින් වගේම රසායනික පොහොර නිෂ්පාදකයින්. ඒ වාගේම බේත් මාපියාකාරයින්.

අපේ ප්‍රදේශවලට අවශ්‍ය පොහොර ටික අපි හදා දෙන්නම්. ගොවි ජනතාව ඒ සදහා සූදානම් වී සිටීම නිසා අනුරාධපුරයේ මේ වන විට කාබනික පොහොර හදන එක තරගයක් වෙලා.

**චිත්‍රාරත්න කළුආරච්චි**



කාබනික පොහොරින් සරු වූ පොල් වගාවක්



# කෝපි කාලේ කෝපි කතා

තේ වගේම කෝපි බොන්නත් එක සේ ප්‍රිය කරන පිරිසක් අපේ රටේ වගේම පිට රටවලත් සිටිනවා. ගමේ ගෙවත්තේ හැදෙන කෝපි ගහකින් හොඳින් ඉදුණු කෝපි ගෙඩි ටිකක් කඩාගෙන ඇවිත් හොඳින් වේළලා කබලේ දාලා බැදලා හොඳින් කුඩු කර ගත්තාම නැවුම් කෝපි සුවඳකුත් එක්කම බොන විට දැනෙන්නේ දිව පිනා යන රසයක්. මේ වගේම රසට කෝපි හදන කෙනෙක් තමයි මාතලේ මීගස්තැන්න ප්‍රදේශයේ එල්.ඒ. නලීන් ප්‍රියන්ත.

**ඔබ හදන කෝපිවල තිබෙන විශේෂත්වය කුමක් ද?**

මම හදන්නේ ‘ඇරබිකා’ කියන කෝපි වර්ගය. ඒක විශේෂයි. එහි විශේෂ රසයක් තිබෙනවා. ගොඩක් පිරිසුදුවට සහ ප්‍රමිතියකින් යුක්තවයි මම මේ වැඩේ කරන්නේ. මම ගොවියන්ගෙන් කෝපි ගෙනාවට පස්සේ ඒවා අතින් තෝරනවා. ඒවායේ පණු ගෙඩි තිබෙනවා ඒවා අයින් කරනවා. ඊට පස්සේ ඒ කෝපි බදිනවා. ජපානයෙන් ආනයනය කරපු රෝස්ටින් මැෂින්වලින් (බදින යන්ත්‍ර) තමයි ඒවා බදින්නේ. පසුව ඒවා ඇසුරුම් කරලා ශ්‍රී ලංකාවේ කෝපි කරන කැෆේවලට, හෝටල්වලට වගේම පිටරටවලටත් යවනවා.



එල්. ඒ. නලීන් ප්‍රියන්ත

**කුමන රටවලට ද යවන්නේ?**

ඔස්ට්‍රේලියාව, ජපානය සහ බ්‍රිතාන්‍යය වගේ රටවලට. මම සුළු වශයෙන් තමයි කෝපි අපනයනය කරන්නේ.

**ඔබ ශ්‍රී ලංකාවේ කුමන පළාත්වලින් ද ගොවියන්ගෙන් කෝපි මිල දී ගන්නේ?**

ඇරබිකා කියන මේ කෝපි වර්ගය හැදෙන්නේ සාමාන්‍යයෙන් මුහුදු මට්ටමේ සිට අඩි 900 පමණ ඉහළ භූමි භාගවල. ඒ කියන්නේ ගොඩක් මධ්‍යම කඳුකරය ආශ්‍රිතව තමයි 99%ක්ම වැවෙන්නේ. මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්වල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ පමණයි මේ කෝපි වර්ගය වැවෙන්නේ. ඒ පළාත්වල ගොවියන්ගෙන් තමයි මම මේවා එකතු කර ගන්නේ.

**හොඳ කෝපි තෝරා ගන්නේ කොහොම ද? ඒවා කඩන්නේ කෝපිවල පැහැය අනුව ද?**

කෝපි කැඩීමේදී ක්‍රම දෙකක් අනුගමනය කරනවා. පළමු ක්‍රමය තමයි Wet (තෙත්) ක්‍රමය. මෙහිදී ඉදුණු කෝපි අරගෙන රතු පාට පොත්ත ඉවත් කරනවා. පැණි සහිත බීජ සියල්ල හොඳින් සෝදලා දවස් 10ක් පමණ හොඳින් වියළා ගන්නවා. ඊට පසුව සුද්ද කරලා ගන්නවා. අනෙක් ක්‍රමය තමයි ස්වාභාවික ක්‍රමය (Natural process). මේ ක්‍රමයෙදි ඉදුණු සහ පැහුණු කෝපි දෙකම ගෙඩිය පිටින් වේළා ගන්නවා. පසුව ඒවා සුද්ද කරලා පණුවො විදපු ඒවා සහ බොල් ඒවා අතින් තෝරලා අයින් කරනවා. හොඳම කෝපි ටික තමයි බැදීමේ යන්ත්‍රවලට දාන්නේ.

**ඔබ හදන ඇරබිකා කෝපි සහ පහත රට හැදෙන කෝපි අතර තිබෙන වෙනස කුමක් ද?**

බොහෝ විට පහත රට වැවෙන්නේ රොබස්ටා කියන කෝපි විශේෂය. මේවායේ තිබෙන කැෆේන් ප්‍රමාණය අනෙක් ඒවාට වඩා වැඩියි. තිත්ත ගතියත් වැඩියි. ඒ වගේම සුවඳ සහ රසයත් ගොඩක් අඩුයි. සමහර වෙලාවට ඇරබිකා සහ රොබස්ටා දෙවර්ගයම එකට දාලා කුඩු කරන අවස්ථාත් තිබෙනවා. ඒ කියන්නේ ඇරබිකා 70%ක් සහ රොබස්ටා 30%ක් දාලා කුඩු කරනවා. මේවා කැෆේවල කැපචිනෝවලට (cappuccino) ගන්නවා.

**ශ්‍රී ලංකාවේ තිබෙන්නේ මෙම කෝපි දෙවර්ගය විතර ද?**

මේවාට අමතරව ලයිබරිකා කියලා විශේෂයකුත් තිබෙනවා. මේවා ශ්‍රී ලංකාවේ තිබෙන්නේ බොහොම අල්ප ගස් ප්‍රමාණයක්. මේවා ගොඩක් දුරට පාවිච්චියට ගන්නේ නැහැ. මේවා ගොඩක් තිත්තයි වගේම ගස් අනෙක් ගස්වලට වඩා විශාලයි.



**ඔබ ගන්නා කෝපි වගාවේ කිසියම් වෙනස් ක්‍රම වේද භාවිත වෙනවා ද?**

මෑත කාලයේ වවන්න පටන් ගත් කෝපි ගස්වලට බොහෝ දුරට වෙනස්කම් කෙරෙනවා. දැන් තමයි අපේ රටේ මිනිස්සු කෝපි වගා කරන්නේ. ඉස්සර කෝපි වගා කළේ නැහැ ස්වාභාවිකව ගෙවතුවල වැවෙන කෝපි තමයි අපි කඩා ගෙන ආවේ. මේවාට රසායනික ද්‍රව්‍ය කිසිවක් භාවිත කරන්නේ නැහැ. ගෙවතුවල අතුරු භෝගයක් විදියටයි මේවා වැව්වේ. දැනටත් අපිට 99%ක්ම එන්නේ කිසිම රසායනික පොහොර වර්ගයක් දාන්නේ නැතිව හදන කෝපි.

**ඔබට මෙරට වෙළෙඳපොළට සහ විදෙස් වෙළෙඳපොළට යවන්න ප්‍රමාණවත් තරම් කෝපි ලැබෙනව ද?**

නැහැ. දැනට මට අපනයන කටයුතු සඳහා අවශ්‍ය වන ගුණාත්මක කෝපි ලැබෙන්නේ ඉතා අල්ප ප්‍රමාණයක්. දැන් තමයි ගොවියෝ හුරු කර ගෙන, සමිති හදලා මේ වැඩේ කර ගෙන යන්නේ. රජයත් මේ අපනයන අවශ්‍යතාව දැනෙන නිසා ආණ්ඩුවෙත් කෝපි වගා කරන්න ලොකු උනන්දුවක් තිබෙනවා. ඒ නිසා නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහ ඒ දිස්ත්‍රික්කයේ සිටින ප්‍රාදේශීය ලේකම්වරු සමඟ එකතු වෙලා තනිකර කෝපි වැටි සහ ග්‍රාමීය වශයෙන් කෝපි ව්‍යාප්ත කරන වැඩපිළිවෙළක් අපනයන කෘෂි දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව අපි මේ වෙන කොට විශාල පැළ ප්‍රමාණයක් හදා තිබෙනවා. අපිට පැළ තවාන් 18ක් පමණ තිබෙනවා. මාසෙකට පැළ 40,000ක් පමණ ගොවියන්ට බෙදා දෙනවා.

**කෝපි කඩන්න කිසියම් කාලසීමාවක් තිබෙනව ද? අවුරුද්දකට කී පාරක් කෝපි කඩන්න පුළුවන් ද?**

ප්‍රධාන වශයෙන් සීසන් එකයි තිබෙන්නේ. ඒත් මේ කාලෙට (ජූනි) අතුරු සීසන් එකක් එනවා. ඒ කියන්නේ කෝපි කුඩා ප්‍රමාණයක් කඩන්න පුළුවන්. කිලෝ 1000ක් කඩන ප්‍රදේශයකින් කිලෝ 100ක් වගේ අතුරු කාලෙට කැඩෙනවා. ප්‍රධාන වශයෙන් කෝපි කැඩෙන්නේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල.

**ඔබ හදන කෝපිවලට තිබෙන ඉල්ලුම කොහොම ද?**

ශ්‍රී ලංකාවේ කෝපිවලට ලොකුම ඉල්ලුම තිබෙන්නේ මට. පිටරටවලත් ලොකු ඉල්ලුමක් තිබෙනවා. දැනට තිබෙන ගැටලුව තමයි අපනයනයට සුදුසු බීජ සකස් කර ගන්න අවශ්‍ය ගොවියො ටික දැනුම්වත් කරන්න එකයි. ඒක හරියට කර ගන්න පුළුවන් නම් ශ්‍රී ලංකාවේ කෝපි විශාල ප්‍රමාණයක් අපනයනය කර ගන්න පුළුවන්.

**(කෝපි පිළිබඳ කිසියම් උපදෙසක් ගැනීමට හෝ කෝපි වගාකරුවකු වීමට කැමති ඕනෑම අයකුට cofeenalin17@gmail.com ඊ-මේල් ලිපිනය ඔස්සේ නලීන් ප්‍රියන්ත මහතා සමඟ සම්බන්ධ විය හැකියි)**

**චතුමී පිටිපන**







2021 ජූනි 23 කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.